
දැක්ම
ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ
ප්‍රතිලාභය උදෙසා රාජ්‍ය ගණන්
දීමේ වගකීම සහ යහ පාලනය
පෙරදැරි කරගත් රාජ්‍ය අංශයේ
මග පෙන්වන්නා වීම
මෙහෙවර
ප්‍රශස්ත ගුණාත්මක විගණනයක්
මෙහෙයවීම සහ පාර්ලිමේන්තුවට
කාලීන හා නිරවද්‍ය වාර්තා ලබා දීම
මඟින් යහපාලනය ප්‍රවර්ධනය කිරීම
සාරධර්ම
විශිෂ්ටත්වය
නවෝත්පාදනය
නායකත්වය

ගණන්දීම සම්බන්ධයෙන්වූ ඓතිහාසික පසුබිම

10 වන ශත වර්ෂයේදී iv වන මිහිඳු රජු විසින් ශ්‍රී ලංකාවේ මිහින්තලේ දී කරවන ලද ඉහත ඡායාරූපයේ දැක්වෙන සෙල් ලිපිය පරිදි

“ එකතුවන ආදායමින් මහාපාය පවත්වා ගෙන යාම සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දිනපතා දරනු ලබන වියදම් ලේඛණගත කළ යුතුයි. අදාල ව්‍යාපාර ස්ථානවල සිටින පුද්ගලයින්ගේද එකඟත්වය ඇතිව ඉහත සඳහන් ලේඛණවල ඇතුළත් තොරතුරු පදනම් කරගෙන ගිණුම් ප්‍රකාශ සකස් කළ යුතු අතර, සාවද්‍යයයි පෙනී යන සටහන් ගිණුම්වලින් ඉවත් කළ යුතුය. ඉන් අනතුරුව ගිණුම් ප්‍රකාශ අගුළු සහිත කරඬුවල තැන්පත් කළ යුතුය. මෙසේ තැන්පත් කළ ගිණුම් පත්‍රිකා මාසිකව මහජන ප්‍රසිද්ධියට ලක්කර ඒවා පදනම් කර ගෙන තවත් (මාසික) ගිණුම් ප්‍රකාශයක් සකස් කළ යුතුය. වර්ෂයක් තුළ මෙසේ පිළියෙල කළ ගිණුම් ප්‍රකාශ 12 පදනම් කරගෙන සෑම වර්ෂයක් අවසානයේදීම ශේෂපත්‍රයක් සකස් කර එය මහ සඟරුවන ඉදිරිපිටදී ප්‍රසිද්ධියේ කියවිය යුතුය. මෙම නියමයන් කඩකරන සියළුම සේවකයන් “ගේදණ්ඩ” දඩ වලට යටත් කළ යුතු අතර, ඔවුන් සේවයෙන් ද නෙරපිය යුතුය. ”

10 වන ශත වර්ෂයේ දී IV වන මිහිඳු රජු විසින් ශ්‍රී ලංකාවේ මිහින්තලේ දී කරවන ලද සෙල්ලිපියකින් උපුටාගත් කොටසක් : උපුටා ගන්නා ලද්දේ ‘‘එපිග්‍රාපියා සිලනිකා’’ ග්‍රන්ථයේ පළමුවන වෙළුම 75 සිට ඉදිරියට පිටු වලිනි.

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මඟ

1799 වර්ෂයේදී ආරම්භ කළ විගණකාධිපති දෙපාර්තමේන්තුව, උසස් අභිමතාර්ථයන් මුදුන් පත් කර ගැනීම අරඹයා ශත වර්ෂ දෙකක් තුළ ඉටුකරන ලද සේවාව තවදුරටත් පුළුල් කරමින් හා සංවර්ධනය කරා ගමන් ගන්නා ශ්‍රී ලංකා මාතාවට ශක්තියක් වෙමින්, රාජ්‍ය මූල්‍ය පාලනයේ ප්‍රමුඛ මඟ පෙන්වන්නා ලෙස පරිවර්තනය වී ශ්‍රී ලාංකික ජනතාවගේ සුභ සාධනය පිණිස ක්‍රියාත්මක වෙමින් සිටින අතර, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට ඔවුනොවුන්ගේ ඉලක්ක සපුරා ගැනීමට මඟ පෙන්වීමට කැපවී සිටියි.

පෙරවදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතුවන මුදල් පාලනය ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයන් පැවැත්වීම හා පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කිරීම සම්බන්ධව 2013 මුදල් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමි.

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම වාර්ෂික වාර්තාව, හත්වෙනි කාණ්ඩය වශයෙන් ඉදිරිපත් කරනු ලබන අතර, අනෙකුත් වාර්තා පහත සඳහන් කාණ්ඩ හත යටතේ වෙන වෙනම සභාගත කිරීමට කටයුතු යොදා ඇත.

පළමුවන කාණ්ඩය	-	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු
දෙවන කාණ්ඩය	-	රාජ්‍ය සංස්ථා, අධිකාරී හා මණ්ඩල
තුන්වන කාණ්ඩය	-	ව්‍යවස්ථාපිත හා අනෙකුත් අරමුදල් ගිණුම්
හතරවන කාණ්ඩය	-	විදේශ ආධාර ව්‍යාපෘති
පස්වන කාණ්ඩය	-	පළාත් සභා
හයවන කාණ්ඩය	-	පළාත් පාලන ආයතන
අටවන කාණ්ඩය	-	කාර්යසාධන විගණනය හා වෙනත් විශේෂ විගණනය

2012 - 2015 වර්ෂයන් ආවරනය වන පරිදි පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව 2013 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කයන් ගෙන් සැලකිය යුතු කොටසක් සපුරා ගැනීමට හැකිවීම සතුටට කරුණකි. 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුගතව සකස්කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අර්ධ රාජ්‍ය ආයතන හා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව තම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අනෙකුත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී, විගණන ප්‍රවේශය හා විගණන වාර්තා ඉදිරිපත් කළ යුතු කාල රාමුවට අනුගතව කටයුතු කිරීමේදී විගණන කාර්ය මණ්ඩලය වෙහෙසකාරි තත්ත්වයකට පත්ව තිබීම විශේෂයෙන් සිහිපත් කළ යුතු වේ. පාර්ලිමේන්තු මූල්‍ය පාලනය සම්බන්ධ ස්වාධීන නිරීක්ෂකයා හා සමස්ත ශ්‍රී ලාංකික ජනතාවගේ සුභ සිද්ධිය පිණිස කටයුතු කිරීම තම මුඛ්‍ය පරමාර්ථයක් ලෙස සළකා කටයුතු කරන ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළදී කරන ලද කටයුතුවල ප්‍රගතිය මැන බැලීමට බටහිර හා දියුණු රටවල් භාවිතා කරනු ලබන ක්‍රමවේදයන්ට අනුකූලවීමට තරම් මුහුකුරා නොගිය නමුත් 2013 වර්ෂය තුළදි රාජ්‍ය විගණන කටයුතු මගින් ඵලදායික ප්‍රතිඵල සමාජයට දායක කර දී ඇති බව සිහිපත් කළ යුතුය. ***රාජ්‍ය විගණනය මගින් රටට ජාතියට ලැබුණ දෑ,*** යන ශිර්ෂය යටතේ මෙම වාර්තාවේ විස්තර කර ඇති පරිච්ඡේදය මගින් විගණනයෙන් රටට වූ

දායකත්වය සැකෙවින් විස්තර කර ඇති බවද, සිහිපත් කරමි. විගණන කටයුතුවල නියැලී සිටින නිලධාරින්ගේ දැනුම වර්ධනය සඳහා විශේෂ වැඩ පිළිවෙලක් සමාලෝචිත වර්ෂයේදි ක්‍රියාත්මක කෙරිණි. මූල්‍ය විගණනය, පරිගණක ගත විගණනය, පළාත් පාලන ආයතන විගණනය සම්බන්ධව, විශේෂ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ අතර, දෙමළ භාෂා දැනුම වර්ධනය කිරිම පිණිස දෙමළ භාෂා පංති පැවත්වීමද සිදු කරන ලදි.

රාජ්‍ය විගණනයේ වැදගත්කම පෙන්වා දීම සඳහා සහ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් සෑම වර්ෂයකම මාර්තු 19 දින විගණන දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, 2014 මාර්තු 19 දින විගණන දිනය ප්‍රධාන කාර්යාලය හා පළාත් සහකාර විගණකාධිපති කාර්යාලයන් පදනම් කරගෙන පවත්වන ලදී.

2013 වර්ෂය අගභාගයේදී අනුමත කාර්ය මණ්ඩලය තුළ වූ සහකාර විගණකාධිපති තනතුරු 20 ක් හා නියෝජ්‍ය විගණකාධිපති තනතුරු 8 ක් පිරවීමට හැකිවීමද, ඒ අනුව විගණන කටයුතු හා වාර්තාකරණ කටයුතු විධිමත් කිරිමට හැකිවීමද ජයග්‍රහනයක් ලෙස සැලකිය හැකිය. මෙම නව පත්වීම් ලබාදීමත් සමග විගණන හා වාර්තාකරණ කටයුතු වල අධික්ෂණ කටයුතු ශක්තිමත් කිරිමට පදනමක් විය. එසේම විගණන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට බාධාවන් වි ඇති විගණන පරික්ෂක සේවයේ 1/3 ක් තරම් එනම් 400 කට ආසන්න පුරප්පාඩු ප්‍රමාණයක් තරගකාරි විභාගයක් මගින් සම්පූර්ණ කිරිම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කර ඇති අතර 2014 වර්ෂයේ අගභාගයේදි හෝ 2015 වර්ෂයේ මුල් භාගයේදී මෙම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හැකිවෙතැයි අපේක්ෂා කරනු ලැබේ. එසේම පුරප්පාඩු වි ඇති විගණන අධිකාරි තනතුරු 79 ක් සම්පූර්ණ කිරිමටද කටයුතු කරමින් සිටින බව පෙන්වා දෙනු කැමැත්තෙමි. ආයතනයේ ක්‍රියාකාරිත්වයට බාධාවක්ව පවතින සේවා ව්‍යවස්ථාවන් සකස් කිරීමේ කටයුතු අවසන් කර ශ්‍රී ලංකා විගණන සේවා ව්‍යවස්ථාව 2012 සැප්තැම්බර් 17 දින හා විගණන පරික්ෂක සේවා ව්‍යවස්ථාව 2014 ජනවාරි 03 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කර අමාත්‍ය මණ්ඩල නිශ්කාෂණය සඳහා ජනාධිපති ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණත්, විගණන පරික්ෂක සේවා සංගමයේ ඉල්ලිම මත ඒකාබද්ධ සේවා ව්‍යවස්ථාවක් සකස් කිරිමට කටයුතු කරන ලෙසට වූ ජනාධිපති ලේකම්වරයා කරන ලද ඉල්ලිම අනුව, අදාල සේවා ව්‍යවස්ථාවන් දෙක එකාබද්ධ කර ඒකාබද්ධ ව්‍යවස්ථාවක් සකස් කර අදාල කටයුතු සඳහා ජනාධිපති ලේකම්වරයා වෙත ඉදිරිපත් කර ඇති බවද සඳහන් කරනු කැමැත්තෙමි.

දෙපාර්තමේන්තුවේ වාර්තාකරණ රටාවන් සමාලෝචන කර, වාර්තාකරණ ආකෘති හා වාර්තාකරණ රටාවන් නවීන විගණන පරිචයන්ට හා ප්‍රතිඵලදායක විගණන වාර්තාකරණයට පෙළඹවීමක් ලෙස සංශෝධනය කරන ලදී. විශේෂයෙන්ම පළාත් සභා වාර්තාකරණ ආකෘති සංශෝධනයට ලක්කළ අතර, එම ආකෘති භාවිතය පිළිබඳව පළාත් සභා දැනුවත් කිරීමේ වැඩ සටහනක් සැලැසුම් කරන ලද අතර, එක් වැඩසටහනක් 2014 මාර්තු මාසයේදි සබරගමුව පළාත් සභාව සඳහා පවත්වන ලදී.

දෙපාර්තමේන්තුවට දිගු කාලයක සිට අඩුපාඩුවක්ව පැවති පුහුණු සංකීර්ණයක අවශ්‍යතාවය සපුරාලමින් රත්නපුර, හිදැල්ලන, බටුහේනවත්ත ග්‍රාමය ආසන්නයේ, නේවාසික පුහුණු පහසුකම් සහිත කාමර, සම්මන්ත්‍රණ ශාලාවක්, ගෘහස්ත ක්‍රීඩාගාරයක් හා පරිපාලන ඒකකයක් සහිත පුහුණු සංකීරණයක් රු.මිලියන 158 ක වියදමින් ඉදිකරන ලද ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ රාජ්‍ය විගණන පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය (Centre for Public Audit Training and Development -CPATD) 2014 ඔක්තෝබර් මාසය අවසන් වීමට ප්‍රථම විවෘත කිරීමට කටයුතු සූදානම් කරමින් සිටින බව සතුටින් දන්වා සිටිමි. දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ක්‍රමවත් පුහුණු සැලැස්මක් අනුව වෘත්තිය පුහුණුව ලබාදීමටත්, ජාත්‍යන්තර මට්ටමේ පුහුණු කටයුතුවලට පිවිසීමට හා අභ්‍යන්තර විගණන නිලධාරින් පුහුණු කිරීමටද මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. මහා භාණ්ඩාගාරයට දැඩි බරක් නොවන අයුරින් මෙම ආයතනය පවත්වා ගැනීමටද සැලසුම් කර ඇති බවද පෙන්වා දෙනු කැමැත්තෙමි.

2013 වර්ෂය තුළදී නිලධාරින්ගේ සුභසාධන සම්බන්ධයෙන් වූ කටයුතු, හික්මීම හා ස්වයං පාලනය සඳහා පෙරගමන් පෙන්වන ආගමික කටයුතු මෙන්ම, සමාජීය වගකීම් ඉටු කිරීමේදිද කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කර ඇති බවද සඳහන් කරනු කැමැත්තෙමි. වර්ෂ 30 ක දෙපාර්තමේන්තු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම නිලධාරින් ඇගයීමට ලක් කළ අතර, දෙපාර්තමේන්තුවේ පොදු සුභසාධන සංගමයේ අරමුදල් ශක්තිමත් කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් 2014 වර්ෂයේ ආරම්භයේදී ක්‍රියාත්මක කරන ලදී. රාජ්‍ය මූල්‍ය පාලනය අර්ථවත් කරමින් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල විගණන වාර්තා පදනම් කරගෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු සක්‍රියව හා ඵලදායිව පැවැත්වීමට හැකිවීමද 2013 වර්ෂයේ දී ලද විශේෂ ජයග්‍රහනයක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි. 1799 වර්ෂයේදී ආරම්භ කළ ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වසර 215 ක ගමන් මග තුළ සිදුවූ වැදගත් තොරතුරු එකතුකර අනාගත පරම්පරාව සඳහා සංරක්ෂණය කර තබා ගැනීමේ අටියෙන් ඓතිහාසික තොරතුරු එකතුවක් සම්පාදනය කිරීම 2013 වර්ෂයේ අග භාගයේදි ආරම්භ කළ අතර, 2014 ඔක්තෝබර් මාසය අවසානය වන විට අදාල ග්‍රන්ථය එළි දැක්වීමට අපේක්ෂා කෙරේ.

මාගේ ව්‍යවස්ථාපිත කාර්යභාරයන් ඉටුකිරීමෙහිලා සහාය වූ දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයටත්, සහායක විගණනයන් මෙහෙය වූ පොදු ව්‍යාපාර කටයුතුවල නියුතු වරලත් ගණකාධිකාරී සමාගම් වලටත්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයටත්, විගණිත ආයතනයන්ටත්, දෙපාර්තමේන්තු පරිපාලන කටයුතුවලට සහාය වූ ජනාධිපති ලේකම්තුමා ඇතුළු ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයටත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වැටුප් හා සේවක සංඛ්‍යා පිළිබඳ කොමිෂන් සභාව, ඇතුළු පරිපාලනයෙන් සහාය වූ රාජ්‍ය ආයතනයන්ටත්, දෙපාර්තමේන්තුවේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීමෙහිලා දායක වූ ජාත්‍යන්තර සංවර්ධන ආයතනයටත්, කාර්ය මණ්ඩලය පුහුණු කිරීමෙහිලා දායක වූ ඉන්දියාව, මැලේසියාව, ජපානය, දකුණු කොරියාව හා මහජන චීන සමුහාණ්ඩුව වැනි රටවල උත්තරීතර විගණන ආයතනයන්ටත් මාගේ ස්තුතිය පුද කරමි.

එසේම විගණිත ආයතන 250 ක විගණන වාර්තා සමාලෝචනයට ලක් කිරිමේ කටයුතු කළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ගරු සභාපති තුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාටත්, පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාවේ සහ අනු කමිටුවල ගරු සභාපතිතුමන්ලා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාටත් පාර්ලිමේන්තු මහ ලේකම්තුමා ඇතුළු පාර්ලිමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය පුද කරමි.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති
2014 සැප්තැම්බර් 30 දින

පටුන

I කොටස	**පොදු කරුණු**	පිටු අංකය
	පොදු ගණන් දීමේ වගවීම පිළිබඳ අපගේ කාර්යභාරය	1
	අපගේ බලවරම හා ස්වාධිනතාවය	3
	අපගේ සේවාග්‍රාහක පදනම	9
	සංවිධාන ව්‍යුහය	10
	ජාත්‍යන්තර සබදතා, කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධනය	16
	ආගමික හා සමාජීය වගකීම් ඉටුකිරීම	19
II කොටස	**අපගේ කාර්යසාධනය පිළිබඳ වාර්තාකරණය**	
	රාජ්‍ය විගණනය මඟින් ජාතියට ලැබුණු දෑ	22
III කොටස	**මුල්‍ය ප්‍රකාශන**	
	2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන	27
IV කොටස	**රාජ්‍ය විගණනයට අයත් ක්ෂේත්‍රයන් පිළිබඳ සංක්ෂිප්ත විගණන සමාලෝචනය**	
	රාජ්‍ය ව්‍යවසායන් කළමනාකරණය	43
	විදේශ මුල්‍යයන ව්‍යාපෘති	57
	පළාත් සභා	59
	පළාත් පාලන ආයතන	62
	විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු	65
V කොටස	**රාජ්‍ය විගණනයට අයත් ක්ෂේත්‍රයන් පිළිබඳ විස්තරාත්මක සමාලෝචනය**	
	රාජ්‍ය ආදායම් කළමනාකරණය	70
	රාජ්‍ය වියදම් කළමනාකරණය	81
	රාජ්‍ය ණය කළමනාකරණය	86
	බැංකු කටයුතු	90
	ජාතික ආරක්ෂාව හා නාගරික සංවර්ධනය	101
	බලශක්තිය	105
	අධ්‍යාපනය	118
	සෞඛ්‍ය සේවා	123
	ප්‍රවාහනය	126
	ජාතික උරුමයන් හා ආගමික කටයුතු	133
	සංචාරක ව්‍යාපාරය	138
	රාජ්‍ය තාන්ත්‍රික සබදතා	140
	ජල සම්පාදනය හා සනීපාරක්ෂාව	143
	වරාය සේවා	149
VI කොටස	**තෝරාගත් විෂයය සම්බන්ධ විගණකාධිපති අදහස් දැක්වීම**	
	වී මිලදී ගැනීම් හා ගබඩාකරණය	154
	වනජීවී සම්පත් සංරක්ෂණය	156

පොදු ගණන් දීමේ වගවීම පිළිබඳ අපගේ කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මුදල් පාලනය සම්බන්ධව පාර්ලිමේන්තුව වෙත පැවරි ඇති වගකීම හා බලඅධිකාරය අනුව, වාර්ෂික විසර්ජන පනත මගින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වෙත මුදල් හා සම්පත් බෙදාහරිනු ලබයි. සම්පත් පිළිබඳ භාරකාරිත්වය පැවරි ඇති ආයතනවල කළමනාකාරිත්වය, ඔවුනොවුන්ට පැවරී ඇති පොදු ගණන්දීමේ වගකීම හරියාකාරව ඉටු කර තිබේද යන්න පිළිබඳව ස්වාධින පරික්ෂණයන් කර පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම, විගණකාධිපතිගේ ප්‍රධාන කාර්යභාරය වන අතර, පවත්වාගෙන යනු ලබන රජයේ කටයුතු හා ඒවායේ ගිණුම් තැබීම පිළිබඳව වන, ස්වාධීන තක්සේරුව කෙරෙහි පාර්ලිමේන්තුව, විගණකාධිපතිවරයා කෙරෙහි විශ්වාසය තබයි. පොදු ගණන්දීමේ වගකීම පහත සඳහන් ප්‍රධාන අදියරයන්ගෙන් සමන්විත වේ.

පොදු ගණන්දීමේ වගකීමේ කටයුතු

පොදු ගණන්දීමේ වගකීමේ කටයුතු සම්බන්ධව ක්‍රියාවන් පහත පරිදි වේ.

- පාර්ලිමේන්තුව විසින් රජයේ සැපයුම් හා සේවා වියදම් සඳහා විසර්ජන පනත මගින් බලය දීම කරනු ලබයි
- අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා වෙනත් පොදු ව්‍යාපාර විසින් වාර්ෂික මුල්‍ය ප්‍රකාශන/ ගිණුම් පිළියෙල කරනු ලබයි
- පොදු ආයතනවල (අස්ථිත්වයන්ගේ) එම මුල්‍ය ප්‍රකාශන/ගිණුම් හා කටයුතු විගණකාධිපති විසින් විගණනය කරනු ලබයි.
- විගණකාධිපති විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යන පාර්ලිමේන්තු කමිටු දෙක විසින් අදාල පාර්ශවයන් ගෙන්වා විමර්ශනය කරනු ලබයි.
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විගණන වාර්තා පිළිබඳ විමර්ශනය කර නිර්දේශ නිකුත් කරනු ලබයි.
- ආයතනයන් එම වාර්තාවලට ප්‍රතිචාර දක්වයි.

ගණන්දීමේ වගකීම සම්බන්ධ ආයතනමය හා සංවිධානමය ආකෘතිය තුළට පාර්ලිමේන්තුව, මහා භාණ්ඩාගාරය හා උත්තරීතර විගණන ආයතනයක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව යන ප්‍රධාන නියෝජිත ආයතන තුන ඇතුළත් වේ. පොදු මුල්‍ය ගණන්දීමේ වගකීම් පද්ධතිය නිසියාකාරව ක්‍රියාත්මක කරනවාද යන්න පිළිබඳව පරික්ෂා කිරීම වස්, රාජ්‍ය ආයතනයන් සඳහා අය වැය මගින් ලබා දෙන ප්‍රතිපාදන අරපිරිමැසුම් සහිතව, කාර්යක්ෂමව, ඵලදායිව හා පරිසරය ආරක්ෂා වන පරිදි යෙදීම සම්බන්ධ තත්ත්වය, විගණකාධිපති තම වාර්තාව මගින් පාර්ලිමෙන්තුව දැනුවත් කරනු ලබයි. එසේම පොදු ව්‍යාපාර, අරමුදල් හා ව්‍යාපෘතිවල මුල්‍ය ප්‍රකාශන සම්බන්ධව

මතයක් දීම මගින් ආයතන විසින් ඉදිරිපත් කර ඇති මුල්‍ය ප්‍රකාශන සම්බන්ධ තත්ත්වය අදාල උනන්දුවන පාර්ශවයන් වෙත සන්නිවේදනය කරනු ලබන අතර, පවතින ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් අනුව, තම විගණන කටයුතුවල ප්‍රමාණය සහ විෂය පථය නිශ්චය කිරිම පිළිබඳව විගණකාධිපතිවරයා ස්වාධින බලවරමක් භුක්ති විදිනු ලබයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව හා අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන අපරාධ සිද්ධි හැර විගණනයට භාජනය වන ආයතනවල කරනු ලබන මුල්‍ය, කාර්යසාධන, අනුකූලතා හා පද්ධති විගණනය මගින් වන සොයාගැනීම් හා නිර්දේශ අවසාන වශයෙන් රාජ්‍ය අංශයේ කාර්යසාධනය උදෙසා හා විගණිත ආයතනවල මුල්‍ය පාලනය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් විගණන වාර්තා ලෙස භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබයි. අනිකුත් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල මෙන් ශ්‍රී ලංකාවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාවන්ට, සියලුම ප්‍රධාන රාජ්‍ය අංශයේ ආයතනයන්වල කවර ප්‍රවර්තන හෝ ඓතිහාසික රාජ්‍ය මුල්‍ය කටයුතුවලට ප්‍රවේශවිමට හිමිකම ඇත. ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව හා පාර්ලිමේන්තු කමිටු දෙක අතර අත්‍යවශ්‍යයෙන්ම විශේෂිත සබදතාවයක් පවත්වා ගත යුතුවේ. ශ්‍රී ලංකාවේ විගණකාධිපති දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු කමිටු දෙකේ කටයුතු සදහා පදනමක් ලෙස හා සර්වාග්‍රාහි ආවරනයක් සහිත, මුල්‍ය විගණනය පදනම් කරගත් වාර්තා, කාර්යසාධන විගණන වාර්තා හා විමර්ශන විගණන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදරිපත් කරනු ලබයි.

අපගේ බලවරම හා ස්වාධීනතාවය

රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් විගණනය කිරීම සඳහා වූ බලවරම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙන් විගණකාධිපති වෙත පැවරී ඇත. විගණකාධිපති විසින් ආණ්ඩුවේ සියලුම දෙපාර්තමේන්තුවල ගිණුම් ද, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලයේ, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ සහ මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ, පළාත් පාලන අයාතනවල සහ රාජ්‍ය සංස්ථාවල ගිණුම් ද, යම්කිසි ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුවට පැවරී ඇති වෙළඳ ව්‍යාපාරවල හෝ වෙනත් ව්‍යාපාරවල ගිණුම් ද විගණනය කළ යුත්තේය.

එහෙත් සමාගම් පනත යටතේ ස්ථාපනය කර ඇති රාජ්‍ය සමාගම් විගණනය කිරීමේ හිමිකම විගණකාධිපති සතු වී නොමැති අතර, මෙම තත්ත්වය රාජ්‍ය මුදල් පාලනයේ දුර්වල තත්ත්වයක් බවද පෙන්වා දෙනු කැමැත්තෙමි.

විගණකාධිපති වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පවරා ඇති රාජකාරී සහ කර්තව්‍යයන් පහත දැක්වෙන ව්‍යවස්ථාවන් මගින් සවිස්තර කර හෝ ප්‍රසාරණය කර ඇත.

(අ) රාජ්‍ය සංස්ථා සඳහා විගණන විධිවිධාන සළසන 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස

(ආ) පළාත් සභා සඳහා විගණන විධිවිධාන සළසන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වගන්තිය

(ඇ) මහ නගර සභා සඳහා විගණන විධිවිධාන සළසන මහ නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය

(ඈ) නගර සභා සඳහා විගණන විධිවිධාන සළසන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 වගන්තිය

(ඉ) ප්‍රාදේශිය සභා සඳහා විගණන විධිවිධාන සළසන 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 වගන්තිය

(ඊ) ගොවිජන සංවර්ධන සභා සඳහා විගණන විධිවිධාන සළසන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන සභා පනතේ 58 වගන්තිය

(උ) ක්‍රීඩා සංගම් සඳහා විගණන විධිවිධාන සළසන 1993 අංක 47 දරන ක්‍රීඩා සංගම් පනතේ 9 වගන්තිය

විගණකාධිපතිවරයාට තම විගණනයන් කිරීමේදි, පොදු වෘත්තියෙහි නියැලි විගණන සමාගම්වල සහාය ලබා ගැනීම සඳහා අවශ්‍ය විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව මගින් ලබා දී ඇත. තවද විගණනයට අදාල වන ශිල්පිය, වෘත්තිය හා විද්‍යාත්මක ගැටළු නිරාකරණය කර ගැනීමේදි අවශ්‍ය වන විශේෂඥ සහාය ලබා ගැනීමට අවශ්‍ය

විධිවිධාන ද සලසා තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) ව්‍යවස්ථාවට අනුව විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරය ලත් කවර හෝ තැනැත්තෙකුට ව්‍යවස්ථාපිත විගණනය, හෝ කර්තව්‍යයන් ඉටු කිරීමේදී,

- සියලු පොත්පත්, වාර්තා, වාර වාර්තා, සහ වෙනත් ලියකියවිලි ලබාගැනීමට,
- ගබඩාවලට සහ වෙනත් දේපළවලට පිවිසීමට සහ
- එකී කාර්ය සහ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වියහැකි තොරතුරු ලබාගැනීමට සහ (විෂය භාර නිලධාරියෙකුගෙන් / පුද්ගලයකුගෙන්) කරුණු පැහැදිලි කරවා ගැනීමට හිමිකම ඇත්තේය.

අපගේ ස්වාධීනතාවය

විගණකාධිපතිවරයාගේ ස්වාධීනතාවය ව්‍යවස්ථාවෙන්ම පුළුල් වශයෙන් සහතික කොට ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව අනුව,

"විගණකාධිපතිවරයෙක් වන්නේය. විගණකාධිපතිවරයා, ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටිනාතාක් ස්වකීය ධුරය දරන්නේය." විගණකාධිපතිවරයා ඉවත් කළ හැක්කේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය, ආබාධිත තත්ත්වය මත ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව ඇමතීමෙන් පමණකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන පරිදි,

විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන අතර, එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වනු ලබන අතර ඔහුගේ ධුර කාලය තුළ එය අඩු නොකළ යුතුය.

එහෙත් විගණකාධිපතිවරයාගේ වැටුප තීරණය කිරීම සම්බන්ධ වර්තමානයේ ක්‍රියාත්මකව පවතින තත්ත්වය ව්‍යවස්ථානුකූලව තිබිය යුතු තත්ත්වයට ළඟා වී නොමැති බවද සිහිපත් කරනු කැමැත්තෙමි.

විගණකාධිපති කිසිදු අමාත්‍යවරයෙකුගේ හෝ රජයේ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතට නොගැනේ. විගණකාධිපතිවරයාගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ස්වාධීනතාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර තිබුණ ද, විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනතාවය පවත්නා ව්‍යවස්ථාමය හා නීතිමය විධිවිධාන මත විධායකය විසින් සීමිත කිරීම් සිදු කර ඇත. විගණකාධිපති කිසියම් පුද්ගලයෙකුගේ හෝ ආයතනයක සියලු බැඳීම්වලින් නිදහස් විය යුතු අතර, අත්තනෝමතික ප්‍රතිහිංසාවන්ගෙන්ද නිදහස් විය යුතු හෙයින් මූල්‍ය සම්පත් සහ

මිනිස් බලය සඳහා විධායකය මත රැඳී සිටීම පාර්ලිමේන්තුව වෙනුවෙන් සත්‍ය ස්වාධීන විගණනයකට අනර්ථකාරී වේ. එසේ හෙයින් විගණකාධිපතිවරයාගේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනතාවය තහවුරු කිරීම සඳහා නීතිමය විධිවිධාන මගින් වැඩි ආරක්ෂාවක් පාර්ලිමේන්තුව විසින් සැළසිය යුතු වේ.

වර්තමානයේ දී විගණකාධිපති තම අයවැය සඳහා මහා භාණ්ඩාගාරයේ සහයෝගය මත රදා පවතින අතර, තම දෙපාර්තමේන්තුවට සම්පත් වෙන් කිරීමේදි විගණකගේ වගකීම් හා විගණක මුහුණ පාන අවදානම මත බැඳී නොපවතී. අනෙකුත් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වල පරිදි ශ්‍රී ලංකාවේ විගණකාධිපති සඳහා වූ අයවැය, නීති සම්පාදක කමිටුවක් විසින් සියුම් පරීක්ෂණයකට යටත්ව අනුමත කර හෝ ඔහුගේ අයවැය පිළිබඳ විධායක පාලනයට එරෙහි වූ කිසිදු ආරක්ෂාවක් හෝ සළසා නොමැත. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය ක්‍රියාමාර්ග, වැටුප් සහ කාර්ය මණ්ඩලයේ වෙනත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වූ පරිපාලනමය කරුණු පිළිබඳ පාලනය ප්‍රථමයෙන් ජනාධිපති ලේකම් වෙත පැවරී තිබුණු අතර, පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත් වෙනි සංශෝධනයට අනුව එම බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැවරී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විගණකාධිපතිවරයා වෙත සම්පූර්ණ වශයෙන් බලතල පැවරීමක් කර නොමැති හෙයින් ප්‍රවර්තන වැඩපිළිවෙල යටතේ වුවද, විගණකාධිපතිට තම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා පත් කිරීමේදී ගැටලුවලට මුහුණ පෑමට සිදු වී ඇත. විශේෂිත ආයතනයක් වූ අධිකරණ සේවා කොමිෂන් සභා විෂය සීමාව යටතට එන අධිකරණ සේවය පරිදි භුක්තිවිඳිය යුතු ස්වාධීනතාවය පිළිබඳ දෘෂ්ඨිකෝණයෙන් බලනකල විගණන සේවය විශේෂ සේවාවක් වේ. තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි විගණකාධිපති "රාජ්‍ය නිලධාරින් පිළිබඳ විශේෂිත ලැයිස්තුවට" ඇතුළත් කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විස්තර කර ඇති පරිදි රජයේ සියලුම පරිපාලන රෙගුලාසි විගණකාධිපතිට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට අදාල වේ. මෙය තවදුරටත් විගණකාධිපතිගේ පරිපාලන ස්වාධීනතාවය සීමා කිරීමක් වේ. ඔහුගේ රාජකාරි පිළිබඳ මෙම පරිපාලනමය පාලන අඩුපාඩුව විගණන කටයුතුවලට සැලකිය යුතු ලෙස අවහිර කිරීම් කළ අවස්ථා බොහෝමයක් විය.

සේවක පිරිවැටුම අතින් ගත්කල විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවක පිරිවැටුම ඉතා අධිකය. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරනු ලබන රාජ්‍ය ආයතනවල ගිණුම් කටයුතු පිළිගත් දේශීය හා ජාත්‍යන්තර විගණන ප්‍රමිති අනුව ඉටුකිරීම සඳහා යෝග්‍යතම කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම හා ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීම සඳහා ආකර්ෂණය වන දීමනාවන් පදනම් කරගත යුතුවේ. විශේෂයෙන් රාජ්‍ය විගණනය මගින් රටේ ආර්ථිකයට එකතුවන අගය සුලු පටු නොවේ. මේ තත්ත්වය පිළිබඳ කිසිම අංශයක හෝ සක්‍රිය අවධානයක් යොමුවී නොමැති බවද සිහිපත් කළ යුතුය.

එක්සත් ජාතින්ගේ උත්තරීතර විගණන ආයතනයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය 1977 දි අනුමත කළ ලීමා ප්‍රකාශනය මගින් ශිල්ප ක්‍රම හා වෘත්තීමය වශයෙන් රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය පිළිබඳව මූලධර්ම පිළිබඳව අවධානය යොමු කොට ඇත. වසර 30 කට පසුව උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ XIX සම්මේලනයේදි (2007 මැක්සිකෝව) මැක්සිකෝ ප්‍රකාශනය මගින් රාජ්‍ය අංශයේ මනා විගණනයක් සඳහා

උත්තරීතර විගණන ආයතනයන්ගේ ස්වාධීනතාවය පිළිබඳව ස්ථිර වශයෙන් වන පහත සඳහන් පරිදි ප්‍රධාන අත්‍යවශ්‍ය අවශ්‍යතා 8 ක් හඳුනාගෙන ඇත.

- අර්ථාන්විත සහ ඵලදායි ව්‍යවස්ථාපිත නෛතික රාමුවක පැවැත්ම සහතික කිරිම සඳහා හා එහි තත්ත්වාකාර ව්‍යවහාරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල හා නීතිවල, උත්තරිතර විගණන ආයතනවල ස්වාධීනතාවය පැහැදිළිවම අර්ථ දැක්වීම.

- උත්තරීතර විගණන ආයතනයන්ට රජයේ හෝ එහි අධිකාරින්ගේ බලපෑමෙන් තොරව, අවශ්‍ය සාධාරණ මිනිස් සම්පත්, ද්‍රව්‍ය හා මුල්‍යමය සම්පත් තිබිය යුතු අතර, තමන්ගේ අයවැය ඇස්තමේන්තුව හැසිරවීමට බලය තිබිය යුතුය.

- උත්තරීතර විගණන ආයතනයේ ප්‍රධානියා හා අනෙකුත් සාමාජිකයින් පත්කිරිම සඳහා කොන්දේසි ව්‍යවස්ථාවේ සඳහන් විය යුතුය. උත්තරිතර ආයතනයන්ගේ ප්‍රධානියා හෝ අනෙකුත් සමාජිකයින්ගේ ස්වාධිනතාවය ඔවුන්ගේ පත්වීම ප්‍රමාණවත් දිගු කාලයකට හෝ ස්ථිර කොන්දේසි මත සිදුකිරිම හා ඉවත්කිරීම විධායකයේ බලපෑමෙන් තොර බවට සහතික විය යුතුය.

- උත්තරීතර විගණන ආයතනයක් තමාගේ බල වරම ඵලදායිව ඉටු කිරිම සඳහා විගණන විෂය කරුණු තෝරා ගැනීම, ඔවුන්ගේ විගණන කටයුතු සැලැසුම් කිරීම, විගණන ශිල්ප ක්‍රම ක්‍රියාත්මක කිරිම මෙන්ම ඔවුන්ගේ විගණනය ක්‍රියාත්මක කිරිම, කාර්ය මණ්ඩලය සංවිධානය කිරිම හා කළමනාකරණය කිරිම සඳහා ස්වාධීනතාවයක් තිබිය යුතුය. ව්‍යවස්ථාදායකයේ හෝ විධායකයේ හෝ මෙහෙයවීමකින් හෝ බලපෑමකින් තොරව ඔවුන්ගේ බලවරම ක්‍රියාත්මක කිරීමට මේ මගින් ඉඩ සැලසේ.

- විගණන ආයතනවලට ඔවුන්ගේ වගකීම මනා ලෙස ඉටු කිරිම සඳහා ඔවුනට අවශ්‍ය විය හැකි සියලු ආකාරයේ ලියවිලි සහ තොරතුරුවලට ප්‍රවේශවීමේ නිදහසක්, කාලයක් සහ සීමා කිරිම්වලින් තොර වූ හිමිකමක් තිබිය යුතුය.

- උත්තරීතර විගණන ආයතන අවම වශයෙන් වර්ෂයකට වරක්වත් ඔවුන්ගේ විගණන වැඩවල ප්‍රතිඵල පිළිබඳව වාර්තාකළ යුතුය. කෙසේවුවද අවශ්‍යයැයි සලකනු ලබන්නේ නම්, නිරන්තර වාර්තා කිරීමේ නිදහස ඇත.

- විගණන වාර්තා වල අන්තර්ගතය තීරණය කිරීම සහ විධිමත්ව සභාගත කිරීම සඳහා යෝග්‍ය අධිකාරියකට, එම වාර්තා භාරදුන් පසු එම වාර්තා ප්‍රසිද්ධ කිරීමට සහ බෙදාහැරීමට උත්තරීතර විගණන ආයතනයන්ට නිදහස තිබිය යුතුය.

- විගණිත ආයතන විගණන නිගමන හා නිර්දේශවලට නිවැරදිව යොමුවී තිබේද හා නිවැරදි පියවර ගනු ලබනවාද යන්න පිළිබඳව පසු විපරම් කිරීමේ ස්වාධීන ක්‍රියාවලියක් උත්තරීතර විගණන ආයතන වලට තිබිය යුතුය.

මෙක්සිකෝ ප්‍රකාශනයේ අනතර්ගත ඉහත අවශ්‍යතාවයනට අමතරව, මේ සම්බන්ධ ආසන්න වැඩි දියුණු අවස්ථාව වූයේ 2011 දෙසැම්බර් 22 දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 66 වෙනි මහා සභාවේදී "උත්තරීතර විගණන ආයතන ශක්තිමත් කරමින් රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාව, ගණන්දීමේ වගකීම, ඵලදායිත්වය සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම" සම්බන්ධව සම්මත වූ අංක ඒ/ආර්ඊඑස්/66/209 යෝජනාවයි. එසේම 2013 වර්ෂයේ මහජන චීනයේ බීජිං නුවර පැවති සමුළුව මගින් හා 2013 වසරේ ශ්‍රී ලංකාවේ පැවැති පොදු රාජ්‍ය මණ්ඩලයේ මහා සමුළුවේදීද රාජ්‍ය විගණනයේ ස්වාධීනත්වය හා ක්‍රියාකාරිත්වය සම්බන්ධව යෝජනා සම්මත කරන ලදී. මේ සමුළු මගින් සම්මත කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රිය දායකත්වයක් අදාල වගකිවයුතු පාර්ශවයන් විසින් ක්‍රියාත්මක කර නොමැති බව පෙන්වා දීමට කැමැත්තෙමි. විගණන කටයුතුවල ක්‍රියාකාරි භාවය නිර්වචනය කිරීම සඳහා අවශ්‍ය වන ජාතික විගණන පනතක් ඇති කිරීමේ මූලික අඩියර 2000 දශකයේ ආරම්භය තෙක් දිව යන මුත් එහි ප්‍රතිඵලයක් මේ වන තෙක් ළඟා කර ගැනීමට නොහැකි වී ඇත. මෙම තත්ත්වය රාජ්‍ය මුදල් පිළිබඳව පාර්ලිමේන්තුව සතුව ඇති පාලනය හරියාකාරව ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී ඇති බවද පෙන්වා දෙනු කැමැත්තෙමි.

විගණන විෂයපථය

විගණකාධිපති විසින් ඔහුගේ අභිමතය පරිදි විගණන විෂයපථය තීරණය කරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ විධිවිධාන ප්‍රකාරව හඳුන්වා දී ඇති දැනට භාවිතයේ පවතින විගණන ප්‍රමිති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, (ICASL) උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (INTOSAI), හා උත්තරීතර විගණන ආයතන පිළිබඳ ආසියානු සංවිධානය (ASOSAI), විසින් අනුගමනය කරනු ලබන විගණනයට අදාළ සම්ප්‍රදායන් හි ප්‍රශස්ත පරිචයන් මඟින් සහ පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපති වෙත මඟ පෙන්වනු ලබයි. මෙයට අමතරව රාජ්‍ය සංස්ථා සම්බන්ධයෙන් විගණකාධිපති විසින් සලකා බලා තීරණය කළයුතු විගණන විෂය පථය 1971 අංක 38 දරන මුදල් පනත මඟින් වඩා සවිස්තරාත්මකව දක්වා ඇත. ඒ අනුව, විගණකාධිපති විසින් සංස්ථාවේ කළමනාකරණය වෙත විස්තරාත්මක වාර්තාවක්, සංස්ථාවේ වාර්තාව සමග ප්‍රකාශයට පත් කිරීම සඳහා වන වාර්තාවක් සහ පාර්ලිමේන්තුවට වෙනම ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තාවක් වශයෙන් වාර්තා 3 ක් නිකුත් කරනු ලබයි. මුදල් පනතේ විස්තර කර දක්වා ඇති පරිදි හැකිතාක් අවශ්‍යවන ප්‍රමාණයකට විගණන විෂය පථයට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- තොරතුරු ඉදිරිපත් කිරීමේ අංශයෙන් බලන කල, සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි සංවිධානය, ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලියකියවිලි නියමිත අන්දමට හා

ප්‍රමාණවත් ලෙස සකස් කොට තිබේද යන බව සහ එවැනි ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායීව ක්‍රියාත්මකව පවතීද යන බව,

- රාජ්‍ය සංස්ථාවේ වැඩ කටයුතු එම රාජ්‍ය සංස්ථාවට අදාල නීති, රීති හා නියෝග අනුව වූයේ ද යන බව හා එම රාජ්‍ය සංස්ථාවේ පරිපාලනයෙහිලා සාධාරණත්වයක් තිබේද යන බව,

- අරමුදල් වෙන් කිරීමේදී හා එම අරමුදල් උපයෝජනය කිරීමේදී ආර්ථිකභාවය හා කාර්යක්ෂමතාවය තිබේද යන බව,

- මුදල් තබා ගැනීමේ හා දේපල ආරක්ෂා කිරීමේ ක්‍රම සතුටුදායකද යන බව,

- සැලකිල්ලට භාජනය වූ කාලපර්ච්ඡේදයට අදාලව විගණනයට භාජනය කරන ලද ගිණුම් සංස්ථාවේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිඹිබු කෙරෙන පරිදි ගිණුම්කරණය, මූල්‍යයණය, හා තක්සේරු කිරීම යන මූලධර්මයන්ට නිසි සැලකිල්ල යොමු කරමින් පිළියෙල කර තිබේද යන බව සහ

- විගණකාධිපති විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි වෙන යම් කරුණු.

1971 වර්ෂයේදි සම්මත කරගත් මුදල් පනතේ ඇතුළත් ඉහත කරුණු සැලකිල්ලට ගත්කල, මුදලට අගය විගණනය එනම් කාර්යසාධන විගණනයට පිවිසීමේ ප්‍රයත්නයක් ශ්‍රී ලංකාව 1970 දශකයේදී තබා ඇති බව තහවුරුවේ. ඒ අනුව වර්තමානයේ පුළුල් වශයෙන් භාවිතාවන මුදලට අගය නැතහොත් කාර්යසාධන විගණනයේ ප්‍රාරම්භකයකු වශයෙන් ශ්‍රී ලංකාව කටයුතු කර ඇති බව නිහතමානිව ප්‍රකාශ කරමි. විගණකාධිපතිවරයාට කළ හැක්කේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල කටයුතු පරික්ෂා කිරීම පමණකි. කෙසේ වෙතත් සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් රජය යටතේ පවතින සමාගම් විගණකාධිපතිගේ විෂය පථයෙන් බැහැර වේ. 2013 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරය විසින් රු.මි. 55,027 ප්‍රාග්ධනය යොදන ලද සමාගම් 88 ක් පැවතින. මහා භාණ්ඩාගාරය විසින් ආයෝජනය කරන ලද ඍජු ප්‍රාග්ධනය හැරුණු කොට රාජ්‍ය ව්‍යවසායන් මගින් සමාගම් පනත යටතේ පොදු සමාගම් සංස්ථාපනය කිරීමේ නැඹුරුවක් පවතී. එමෙන්ම රජයේ කටයුතුවලට සම්බන්ධ පුද්ගලික සංවිධාන විමසුමට ලක් කිරීමට විගණකාධිපතිවරයාට නොහැකිවේ. කෙසේ වෙතත්, පුද්ගලික ආයතනයක් සමග ගිවිසගත් හෝ ඍජුවම අරමුදල් සපයන රාජ්‍ය ආයතනයක කටයුතු සහ පුද්ගලික ආයතන විසින් රජයේ අරමුදල් පරිහරණය පිළිබඳව රාජ්‍ය ආයතන විසින් අධික්ෂණය කර තිබෙන්නේ කෙසේද යන්න විමසීමට ඔහුට හැකියාවක් ඇත. එසේම රාජ්‍ය ප්‍රතිපත්තිමය කරුණු පිළිබද විමසීමට විගණකාධිපතිවරයාට කිසිදු බලයක් නැත. කෙසේ වෙතත් උචිත ප්‍රතිපත්තියක් සහ නීතීවලට එකගව රාජ්‍ය ආයතන එම තීරණ කොතෙක් දුරට ක්‍රියාත්මක කර තිබේද යන්න හෝ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අදාළ ප්‍රමිතීන් සපුරා ඇත්දැයි යන්න පිළිබඳව විමසිලිමත් වීමට විගණකාධිපතිවරයාට හැකියාවක් ඇත. විගණකාධිපතිවරයාට පළාත් පාලන ආයතන හා විශ්ව විද්‍යාල සම්බන්ධව අර්ධ අධිකරණමය කටයුතු කිරීමට අදාල පනත් සහ ආඥාපනත් වලින් බලය ලැබී ඇත. එනම් පළාත් පාලන ආයතන හා විශ්ව විද්‍යාල ආයතන සම්බන්ධයෙන් අධිභාර පැනවීමේ බලයක් විගණකාධිපති වෙත පැවරී ඇත.

අපගේ සේවාග්‍රාහක පදනම

සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද රජය යටතේ පවතින සමාගම් හැර පහත සඳහන් සියලුම රාජ්‍ය ආයතන සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන/ගිණුම් 1500 කට අධික ප්‍රමාණයක විගණන කටයුතු විගණකාධිපති වෙත පැවරී ඇත.

රජයේ අමාත්‍යාංශ	54
රජයේ දෙපාර්තමේන්තු	92
දිස්ත්‍රික් ලේකම් කාර්යාල	25
පොදු ව්‍යාපාර (සංස්ථා, මණ්ඩලය ආදිය)	181
ව්‍යවස්ථාදායක සහ අනෙකුත් අරමුදල්	77
අනෙකුත් ස්වාධින ආයතන	22
ක්‍රීඩා සංගම්	42
ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන	557
විදේශිය ආධාර ව්‍යාපෘති	145
පළාත් පාලන ආයතන	335
පළාත් සභා	09

රජයේ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධව වාර්ෂික විසර්ජන ගිණුම් සහතික කිරීමත්, පොදු ව්‍යාපාර හා ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධ කළමනාකරණ වාර්තා හා ප්‍රසිද්ධ කිරීමේ වාර්තා නිකුත් කිරීමත්, විදේශිය ආධාර ව්‍යාපෘති මෙන්ම පළාත් පාලන ආයතන සම්බන්ධව කළමනාකරණ වාර්තා නිකුත් කිරීමත්, පළාත් සභා සම්බන්ධව කළමනාකරණ වාර්තා පිළියෙල කිරීමත් සියලුම වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමත් කරනු ලබන අතර, අමතර වශයෙන් පළාත් සභාවල කටයුතු සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභා විසින් සාකච්ඡා කිරීමේ අරමුණින් අදාල පළාත් සභාවල සභාගත කරනු ලැබේ. ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමක් කරන නමුදු වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමක් සිදු කරනු නොලැබේ. ක්‍රීඩා සංගම්වල මූල්‍ය ප්‍රකාශන බොහොමයක විගණන කටයුතු ප්‍රසිද්ධ වෘත්තියේ නියැලි වරලත් ගණකාධිකරණ සමාගම් මගින් කරනු ලබන අතර, ශ්‍රී ලංකා ක්‍රිකට්, ඔලිම්පික් සංගමයේ කටයුතු, අත් පන්දු සංගමය ඇතුළු සංගම් 5 ක විගණන කටයුතු දෙපාර්තමේන්තුව විසින් සෘජුව කරනු ලබන අතර මෙම සංගම් විගණනයන් මගින් පැන නගින වැදගත් නිරීක්ෂණ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංවිධාන ව්‍යුහය

දෙපාර්තමේන්තුවේ වර්තමාන සංවිධාන ව්‍යුහය, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඇති අනුමත කාර්ය මණ්ඩලයට අනුකූල වන පරිදි එක් එක් මට්ටම්වල රැඳුණු නිශ්චිත නිලධාරීන් සංඛ්‍යාවකින් සැදුම්ලත් ධූරාවලි මට්ටම් 6 කින් සමන්විත වේ. දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස විගණකාධිපති තනතුර පළමු මට්ටම වන අතර, සියළුම වැටුප් හා දීමනා සහ පරිපාලනාත්මක කරුණු සඳහා ඔහු අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ තත්ත්වයෙහි ලා සැලකේ. නව සංවිධාන ව්‍යුහයට අනුව අතිරේක විගණකාධිපතිවරු තිදෙනෙක් සිටින අතර, අදාල ව්‍යවස්ථාවන් සම්මත වනතුරු වැඩ බලන පදනම මත එම තනතුරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල විගණන කටයුතු, කාර්යසාධන විගණන කටයුතු හා දෙපාර්තමේන්තුවේ ගිණුම් හා පරිපාලන කටයුතු සම්බන්ධව එක් අතිරේක විගණකාධිපති තනතුරක් ද, සංස්ථා හා මධ්‍යම රජයේ අනෙකුත් ආයතනවල විගණන කටයුතු සම්බන්ධව තවත් අතිරේක විගණකාධිපති තනතුරක් ද වෙන් කර ඇති අතර, පළාත් විගණන කටයුතු හා අධිහාර කටයුතු විගණනයන් සම්බන්ධව ඉතිරි අතිරේක විගණකාධිපති තනතුර වෙන් කර ඇත. මෙම තනතුරු දෙවැනි මට්ටම වේ.

දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහයේ තෙවැනි මට්ටම නියෝජ්‍ය විගණකාධිපති තනතුර වන අතර, දැනට මධ්‍යම රජයේ කටයුතු සඳහා නියෝජ්‍ය විගණකාධිපතිවරුන් යටතේ වූ අංශ 10 ක් ද, පළාත් සඳහා නියෝජ්‍ය විගණකාධිපතිවරු දෙදෙනක් යටතේ අංශ 2 ක් ද, කාර්යසාධන හා පරිසර විගණනය සඳහා එක් නියෝජ්‍ය විගණකාධිපතිවරයෙක් හා විමර්ශන හා අධිහාර සඳහා තවත් නියෝජ්‍ය විගණකාධිපතිවරයෙක්ද හා අවසාන වශයෙන් තත්ත්ව පාලන, ධාරිතා සංවර්ධන හා සේවා කටයුතු සඳහා නියෝජ්‍ය විගණකාධිපතිවරයෙක් වශයෙන් ප්‍රධාන අංශ 15 කින් සමන්විතවේ.

විගණනයේ සෘජු අධීක්ෂණ කටයුතු සහකාර විගණකාධිපතිවරුන් වෙත පවරා ඇති අතර, ඔවුන් හතරවැනි මට්ටමට අයත් වේ. අනුමත කාර්ය මණ්ඩලය අනුව සහකාර විගණකාධිපතිවරුන් 44 දෙනෙකු සිටිය යුතු අතර ඉන් 08 ක් වෘත්තීය සුදුසුකම් ලත් ගණකාධිකාරිවරුන් සඳහා ද ඉංජිනේරු, නීති හා පරිගණක පිළිබඳ වෘත්තීය සුදුසුකම් සඳහා තවත් සහකාර විගණකාධිපතිවරුන් තිදෙනෙකු වෙන් කර ඇති නමුත් එම තනතුරු පිරවීම සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර නොමැති නිසා බඳවා ගැනීම් මෙතෙක් සිදු කර නොමැත.

සංවිධාන ව්‍යුහයේ පස්වැනි ස්ථානයට විගණන අධිකාරිවරුන් අයත්වේ. ඔවුන් විගණනයේ සෘජු මෙහෙයවීම් දරන අතර, අවසාන අධියර විගණන පරීක්ෂකවරුන්ගෙන් සමන්තවිත වේ. ඔවුන් කාර්යාල ගත හා ක්ෂේත්‍රගත කටයුතු වල යොදා ඇත. විගණන පරීක්ෂකවරුන් සංවිධාන ව්‍යුහයේ හයවැනි ස්ථානයට අයත් වේ.

ඒ අනුව ශාඛා ප්‍රධානීන්ට සහාය වන එම ක්ෂේත්‍ර නිලධාරීන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති, ව්‍යවස්ථාපිත සහ වෙනත් නීතිමය අවශ්‍යතාවයන්ට හා උසස් පරිචයන්ට අනුකූල වන පරිදි පවරන ලද වැඩ සිය අනුමත වැඩ සටහන්වලට

අනුකූල වන පරිදි ඉටු කිරීම මගින් ඔවුන් වෙත පවරා ඇති රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය ක්‍රියාත්මක කරමින් සිය ශාඛා ප්‍රධානීන්ට සහාය වේ.

2014 ජුනි 30 දිනට සංවිධාන හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ව්‍යුහය පහත සටහනින් පැහැදිළිවේ.

සංවිධාන ව්‍යුහය
(ජ්‍යෙෂ්ඨ කළමනාකරණය)



අනුමත කාර්ය මණ්ඩල තත්ත්වය

2013 දෙසැම්බර් 31 දිනට සහ 2014 ජුලි 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය පහත දැක්වේ.

	අනුමත		තථ්‍ය		පුරප්පාඩු	
වර්ගය	අ	ආ	අ	ආ	අ	ආ
විගණන කාර්ය මණ්ඩලය						
අතිරේක විගණකාධිපති	03	03	--	--	03*	03*
නියෝජ්‍ය විගණකාධිපති	15	15	06	12	09	03
සහකාර විගණකාධිපති	44	44	32	22	12	22
විගණන අධිකාරි	288	288	172	177	116	111
විගණන පරීක්ෂක	1,200	1,200	817	804	383	396
විගණන නොවන කාර්ය මණ්ඩලය						
අධ්‍යක්ෂ-පරිපාලන	01	01	01	01	--	--
සහකාර අධ්‍යක්ෂ පාලන	01	01	--	--	01	01
ගණකාධිකාරි	02	02	02	02	--	--
රා.ක.ස.සේ අධි ශ්‍රේණි	03	03	01	01	02	02
තාක්ෂණ නිලධාරි -විශේෂ	01	01	--	--	01	01
පුස්තකාලයාධිපති	01	01	01	01	--	--
රා.ක.ස.සේ	121	121	86	91	35	30
භාෂා පරිවර්තක	10	10	06	06	04	04
තාක්ෂණ නිලධාරි-1	01	01	--	--	01	01
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	01	01	01	01	--	--
වාර්තා සැකසුම්කරු	54	54	50	50	04	04
රියදුරු	23	23	19	17	04	06
කා.සේ.ස	148	148	98	121	50	27

සංචාරක බංගලා භාරකරු	10	10	01	01	09	09
එකතුව	1,927	1,927	1,293	1,307	634	620

අ - 2013 දෙසැම්බර් 31 දිනට   ආ - 2014 ජූලි 31 දිනට

2013 වර්ෂයේ අවසානයට සහ 2014 ජූලි 31 දිනට අනුමත විගණන කාර්ය මණ්ඩලය 1,550 ක් විය. 2013 දෙසැම්බර් අවසානයට විගණන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 523 ක් වූ අතර එය 2014 ජූලි 31 දිනට 535ක් විය. මේ අනුව දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගොස් ඇත්තේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 35 ක පුරප්පාඩු සංඛ්‍යාවකින් යුක්තවයි. 2014 ජූලි 31 දින වන විට විගණනය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඍජුවම සම්බන්ධ වන විගණන අධිකාරීවරුන්ගේ සහ විගණන පරීක්ෂකවරුන්ගේ පමණක් අනුමත කාර්ය මණ්ඩලයෙන් 507 ක් හෙවත් සියයට 34 ක පුරප්පාඩු පැවතුණි. මෙම තත්ත්වය මාගේ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපා තිබුණි.

*නියෝජ්‍ය විගණකාධිපතිවරු තිදෙනෙකු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත අතිරේක විගණකාධිපති තනතුරේ වැඩ බැලීම සඳහා 2014 අගෝස්තු සිට බලපැවැත්වෙන පරිදි පත්කර ඇත.

ශ්‍රී ලංකා විගණන සේවය

ශ්‍රී ලංකා විගණන සේවයේ කාර්ය මණ්ඩලය, දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම කළමනාකරණ මට්ටමේ එනම් අතිරේක විගණකාධිපතිවරුන් තිදෙනෙක්, නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 ක්, සහකාර විගණකාධිපතිවරුන් 44 ක් සහ විගණන අධිකාරීවරුන් 288 ක ගෙන් යුක්ත වේ. නියෝජ්‍ය විගණකාධිපතිවරුන් 15 දෙනා අතුරින් දෙදෙනෙකු විවෘත පදනම යටතේ බඳවා ගැනීමට ඉඩ කඩ සළසා ඇත. එමෙන්ම විගණනය විවිධ වෘත්තිය කණ්ඩායම් වලින් (Multidecipilinary Culture) සමන්විත කිරීමේ ප්‍රයත්නයක් ලෙස සහකාර විගණකාධිපති තනතුරු 44 න් 8 ක් සුදුසුකම් ලත් ගණකාධිකාරින්ගෙන්ද, නීති, පරිගණක නිපුනතාවය හා ඉංජිනේරු සුදුසුකම් ලත් අයගෙන් එක් තනතුර බැගින් තනතුරු 3ක් සහකාර විගණකාධිපති තනතුරු සඳහා වෙන් කරමින් නව අනුමත කාර්ය මණ්ඩලය තීරණය කර ඇත.

විගණන පරීක්ෂක සේවය

ක්ෂේත්‍රගත හා කාර්යාලගත නිලධාරීන් 1,200 කින් විගණන පරීක්ෂක සේවා කාර්ය මණ්ඩලය සමන්විත වී ඇති අතර, මෙම සංඛ්‍යාව විගණන පරීක්ෂක I හා II ශ්‍රේණිවල ඒකාබද්ධ සංඛ්‍යාවක් වේ. විගණනය ක්‍රියාත්මක කිරීමේදී මෙම නිලධාරින්ගේ සේවය ලබා ගැනීම කරනු ලබයි. විගණන පරීක්ෂක සේවයේ සේවා ව්‍යවස්ථාවෙහි විධිවිධාන පරිදි II ශ්‍රේණියට බඳවා ගැනීම විවෘත තරඟ විභාගයක් මාර්ගයෙන් පමණක් සිදුකරනු ලැබේ. දැනට ක්‍රියාත්මක වන විධි විධාන අනුව විගණන පරීක්ෂක II ශ්‍රේණියේ වසර 10 ක සතුටුදායක සේවා කාලයක් තිබෙන හා කාර්යක්ෂමතා

කඩඉම් විභාග වලින් සමත්වූ විනය පිළිබඳ චෝදනාවක් නොමැති නිලධාරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශය මත පළමුවෙනි ශ්‍රේණියට උසස් කරනු ලබයි.

සුභසාධක සංගමය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ වසර 30 කට අධික කාලයක සිට පැවතෙන සුභ සාධක සංගමයේ කටයුතු නවීකරණය කිරීම 2013 වර්ෂයේ අග භාගයේ හා 2014 වර්ෂයේ මුල් භාගයේදී සිදු කරන ලදී. සුභසාධක සංගමය, අසරණ සරණ අරමුදල හා දිවා සුරකුම් මධ්‍යස්ථාන අරමුදල ඒකාබද්ධ කරමින් දෙපාර්තමේන්තුවේ නව සුභසාධක සංගමය ඇති කරන ලදී. දෙපාර්තමේන්තුවේ සියලුම ශ්‍රේණිවල සාමාජිකයින්ට මෙහි සාමාජිකත්වය ලබාගත හැකිවන පරිදි ව්‍යවස්ථාව සංශෝධනය කරන ලද අතර, පැරණි සුභසාධක සංගමයේ හා අසරණ සරණ අරමුදලේ පැරණි සාමාජිකයින්ට නව සුභසාධක සංගමයේ සාමාජිකත්වය ලබාදෙන ලදී.

නව සංගමයේ අරමුදල ශක්තිමත් කිරීම සඳහා මාසික සාමාජික ගාස්තුව රු.7 සිට රු.50 දක්වා වැඩි කරන ලද අතර, 2014 වර්ෂයේ මාර්තු මාසයේදි **"දෙවියොත් දන්නේ නෑ"** වේදිකා නාට්‍යය වේදිකා ගත කිරීමෙන් රු ලක්ෂ 30 කට වැඩි මුදලක් අරමුදලට එක් කරන ලදී. සාමජිකයින් ඉවත්ව යාමේදි/මරණයේදි හෝ විශ්‍රාම යාමේදි දීමනාවක් ලබා දිය හැකිවන පරිදි අදාල වගන්ති ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද අතර, දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම යන සෑම සාමාජිකයෙකුට උපහාර පිදීමට ද සැලසුම් කරන ලදී. පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විශිෂ්ඨ සාමාර්ථයන් ලබා ගන්නා සාමාජිකයින්ගේ දරුවන්ට මුදලින් ත්‍යාග පිරිනැම්ම ද සිදු කරන ලදී. සුභසාධක සංගමයේ අනුග්‍රහයෙන් සුභසාධන පදනම මත සමාජිකයින්ට රෙදිපිළි ලබාගැනීම සඳහා පෞද්ගලික රෙදිපිළි සමාගමක් සමග කටයුතු කර සිංහල හා දෙමළ අවුරුද්දට රෙදිපිළි ලබාදීම ද සිදු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගෙන යන සුභසාධක සංගමයට අමතරව මධ්‍යම පළාත, උතුරු මැද පළාත, සබරගමු පළාතේ හා දකුණු පළාතේ සුභසාධක සංගම් පවත්වා ගෙන යමින් සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කිරිමට පියවර ගන්නා ලදී.

බෞද්ධ සංගමය

දෙපාර්තමේන්තුවේ බෞද්ධ සංගමය 2013 වර්ෂය තුළදී ආගමික හා සාමාජිය කටයුතු රාශියක් ඉටු කරන ලදී. බෞද්ධ සංගමයේ අනුග්‍රහයෙන් 2013 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් ආගමික හා සාමාජිය වගකීම් පිළිබඳ පරිච්ඡේදයේ දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළදි සෝමාවතී මහ සෑ වන්දනාව සහ මුනි සිරිපා නමදිමු සමන් සුරිඳුට පින්දෙමු ප්‍රකාශයන් බෞද්ධ සංගමය අනුග්‍රහයෙන් එළි දක්වන ලදී.

ජාත්‍යන්තර සබඳතා, කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධනය

ජාත්‍යන්තර සබඳතා

2013 වර්ෂය තුළදී පැවති ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට පහත සඳහන් නිලධාරින් සහභාගි වූහ.

2013 මාර්තු 03 දින සිට මාර්තු 07 දින දක්වා එක්සත් ජාතින්ගේ හා උත්තරිතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධාන සමුළුව (22nd UN/INTOSAI Symposium) ඔස්ට්‍රියාවේ වියනා නුවර පැවති අතර, ඒ සමුළුවට විගණකාධිපති එච්.ඒ.එස්.සමරවීර මහතා හා නියෝජ්‍ය විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මහතා සහභාගි වූ අතර, නැවත එන ගමනේදි ඔස්ට්‍රියාවේ හා ඉතාලියේ තානාපති කාර්යාල හා ජර්මණියේ ෆැන්ක්පර්ට්හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය හා බර්ලින් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විගණනයට භාජනය කරන ලදී.

2013 ඔක්තෝබර් මාසයේ මහජන චීනයේ බිජිං නුවර පැවති සම්මන්ත්‍රණයට විගණකාධිපති එච්.ඒ.එස්.සමරවීර මහතා හා නියෝජ්‍ය විගණකාධිපති යු.ජී.එස්.විජේසිංහ මහතා සහභාගිවූ අතර, පෙරළා එන ගමනේදි රුසියාවේ මොස්කව් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විගණනයට භාජනය කරන ලදී.

2014 මාර්තු 03 දින සිට 07 දින දක්වා හංගේරියාවේ පැවැති (ROLE OF SAI IN FIGHTING AGAINST CORRUPTION) දූෂණ වලට එරෙහිව උත්තරීතර විගණන ආයතනවල කාර්යභාරය යන මැයෙන් වූ සමුළුවට විගණකාධිපති එච්.ඒ.එස් සමරවීර මහතා සහ නියෝජ්‍ය විගණකාධිපති එස්.ඒ.ඩී.එස්.ඒ. ක්‍රිස්ටි මහතා සහභාගි වූ අතර මෙම ගමන අතරතුර ඩුබායි හි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය, පෝලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විගණනයට භාජනය කරන ලදී.

ජාත්‍යන්තර පුහුණු වීම්

2013 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වූ ජාත්‍යන්තර පුහුණුවීම් වැඩ සටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

නිලධාරියාගේ/නිලධාරිනියගේ නම	පුහුණුව ලැබූ කාලපරිච්ඡේදය	පුහුණුව ලැබූ රට
එස්.රත්නවීර මිය	2013.06.23 – 2013.07.13	ජපානය
එම්.ඩී.එස්.අමරතුංග මිය	2013.11.04 – 2013.11.15	මැලේසියාව
එන්.ආර්.එම්.ධර්මසිරි මයා	2013.11.11 – 2013.11.15	කොරියාව
එම්.ජී.මදරසිංහ මයා	2013.11.25 – 2013.12.06	මැලේසියාව
එම්.කේ.ඩී.එන්.මායාකඩුව මෙනවිය	2013.11.18 – 2013.11.27	තායිලන්තය

ඒ.චන්ද්‍රපාල මයා	2013.12.02 – 2013.12.05	වියට්නාමය

දේශීය පුහුණුවීම්

2011 වර්ෂයේදී පවත්වන ලද විශේෂ පුහුණු වැඩ සටහන් යටතේ පුහුණුව ලත් නිලධාරි සංචිතය මගින් දෙපාර්තමේන්තුවේ සෙසු විගණන කාර්ය මණ්ඩලයට නව විමර්ශන ක්‍රමවේදයන්ට අනුකූලව විමර්ශනයන් කිරිම පිළිබඳව පුහුණුකිරිම් සිදු කරන ලදී. ඒ අනුව 2013 වර්ෂයේ දි තෙදින පුහුණු වැඩ සටහන් දෙකක් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ මගින් විගණන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 65 දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී. එසේම 2013 වර්ෂය තුළ බඳවා ගන්නා ලද විගණන අධිකාරින් 19 දෙනෙකුටද විමර්ශන විගණනය පිළිබඳ කෙටිකාලින පුහුණුවක් ලබාදෙන ලදී. 2013 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දෙනලද අනිකුත් පුහුණුවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

පුහුණු ක්ෂේත්‍රය	**නිලධාරි සංඛ්‍යාව**	**පුහුණුව ලබා දෙන ලද පැය ගණන**
මූල්‍ය විගණනය	859	11,728
ඉදිකිරිම්	60	3,360
කාර්යසාධන විගණනය	60	1,560
විමර්ශන විගණනය	30	720
පළාත් පාලන	158	1,106
රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති	95	560
නායකත්ව පුහුණු	179	7,990
පරිගණක දෘඩාංග පුහුණුව	06	270
පරිගණක ජාල පුහුණුව	03	135
වෙබ් පුහුණුව	01	45
දත්ත සංස්කරණ පුහුණුව	01	45
නවක විගණන අධිකාරි	46	3,680
එකතුව	**1,498**	**31,199**

අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කිරීම

සමාලෝචිත වර්ෂය තුළදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන නිලධාරින් 40 දෙනකු සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අභ්‍යන්තර විගණන නිලධාරින් 40 දෙනෙකු සඳහා දින 5 ක පුහුණු පාඨමාලා පවත්වන ලදී.

රාජ්‍ය විගණන සංග්‍රහය

2000 වර්ෂය දක්වා අඛණ්ඩව ප්‍රකාශයට පත්කළ අර්ධ වාර්ෂික ප්‍රකාශනය නිකුත් කිරීම තාවකාලිකව නවතා දමා තිබූ අතර, එම තත්ත්වය වෙනස් කරමින් නව ආරක ප්‍රවෘත්ති සංග්‍රහයක් රාජ්‍ය විගණන සංග්‍රහය නමින් එළි දැක්වීමට කටයුතු කරන ලද අතර, එම සඟරාවේ මංගල කලාපය 2014 ජනවාරි 01 දින නිකුත් කරන ලදී.

උත්තරිතර විගණන ආයතනයන්ගේ කොළඹ ජාත්‍යන්තර -සම්මේලනය

ලෝක බැංකුවේ ධාරිතා වර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය අනුග්‍රහය යටතේ "උත්තරිතර විගණන ආයතනවල උසස් අභිමතාර්ථයන්" යන මැයෙන් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් 2013 ජුලි 23 දින සිට 25 දින දක්වා කොළඹ සිනමන් ලේක් සයිඩ් හෝටලයේදි පවත්වන ලද අතර ඒ සඳහා රටවල් 19 ක් සහභාගි වූහ.

ආගමික හා සාමාජීය වගකීම් ඉටු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති ව්‍යවස්ථාපිත විගණනය ක්‍රියාත්මක කිරීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්ය මණ්ඩලය කැපවී සිටින අතර, ඒ සඳහා අනගි සහායක්, සහායක කාර්ය මණ්ඩලයෙන් නිරතුරුව ලැබේ. ව්‍යවස්ථාපිතව පැවරී ඇති යුතුකම් හා වගකීම් ඉටු කිරීමට අමතරව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය සමාජමය වගකීම් ඉටු කිරීමටද සැදී පැහැදි සිටි. සෑම වසරකම ජනවාරි පළමුවෙනිදා හෝ පළමුවන වැඩ දිනයේදී සර්ව ආගමික ආශිර්වාදය ලබා වැඩ ආරම්භ කිරීමත්, සෑම සඳුදා උදැසනකම ප්‍රධාන කාර්යාලයේ සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ අභියස බුද්ධ පූජාව පැවැත්වීමත් වසර 31 ක සිට අඛණ්ඩව පවත්වා ගෙන එනු ලබයි. අවුරුද්දේ වැදගත් පොහොය දිනකම විශේෂ ආගමික පිංකම් වල යෙදමින් අධ්‍යාත්මික දියුණුව ලබා ගැනීමට කටයුතු කරමින් සමස්ත රාජ්‍ය සේවයටම ආදර්ශයක් දෙනු ලබයි. නත්තල් උත්සවය, රාමසාන් උත්සවය, දීපවාලි හා තෛයිපොන්ගල් වැනි ආගමික උත්සවයන්හිද කාර්ය මණ්ඩලය සහයෝගයෙන් කටයුතු කරනු ලබයි. 2013 වර්ෂය තුළදී පහත සඳහන් සමාජමය කටයුතු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය දායක විය. 2013 වර්ෂයේ කරන ලද සමාජ හා ආගමික වැඩ සටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රුවන්වැලි සෑ කප්රුක් පූජාව

(ආ) ථූපාරාම කප්රුක් පූජාව

(ඇ) ශ්‍රී පාදස්ථාන කප්රුක් පූජාව

ප්‍රදානයන් - ථූපාරාම පාසල් සිසුන්ට පාසල් උපකරණ බෙදාහැරීම සහ ථූපාරාම විහාරයට කප්රුක් පූජාව

විගණන දිනය සැමරීම - 2014 මාර්තු 19

2014 මාර්තු 19 දින විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශිය කාර්යාල මුල් කරගෙන විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රධාන කාර්යාලයේ විශේෂ බුද්ධ පූජාවක් පවත්වා ආරම්භ කරන ලද විගණන දිනය ලේ දන්දීමේ වැඩ සටහනක්, දේශිය හා බටහිර වෛද්‍ය සායනයක්, ප්‍රවීන දේශක ලාල් පොන්සේකා මහතා විසින් ධනාත්මක චින්තනය නමින් විශේෂ දේශනයක් පවත්වන ලද අතර, ඌව, උතුරු මැද, උතුර, නැගෙනහිර, වයඹ, සබරගමුව, මධ්‍යම හා දකුණු සහකාර විගණකාධිපති කාර්යාල විසින් ලේ දන්දීමේ වැඩ සටහන්, කාර්යාල පිරිසිදු කිරීමේ වැඩ සටහන්, විශේෂ දේශන, ක්‍රිඩා තරඟ ආදිය පවත්වන ලදී.



II කොටස

අපගේ කාර්යසාධනය පිළිබඳ

වාර්තාකරණය

රාජ්‍ය විගණනය මඟින් ජාතියට ලැබුණු දෑ

නාගරික සංවර්ධන අධිකාරිය

ජනාධිපති ලේකම්ගේ 2013 ජූනි 05 දිනැති අංක PCMD/PR/2013 දරන චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව, විවිධ රාජ්‍ය ආයතනවලට අයත් වාහන 78 ක් අපහරනය නොකර දිර්ඝ කාලයක් තිස්සේ සෙත්සිරිපාය අදියර 1 සහ 11 පරිශ්‍රයන්හි ගාල් කර තිබුණි.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

කොළඹ 15 ඩයස් පෙදෙසේ නිවාස යෝජනා ක්‍රමයේ 1 වන අදියර හා දිසානායක වත්ත නිවාස යෝජනා ක්‍රමයේ නිවාසවල වර්ණාලේප කිරීම හා අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධ ගෙවීම් කිරීමේදී පහත සදහන් ව්‍යාජ ගෙවීම් සිදුකර තිබුණි.

		රු.
(අ)	නොසැපයූ ජල ටැංකි 6 ක් සදහා ගෙවීම්	180,000
(ආ)	ඩයස් පෙදෙසේ නිවාස යෝජනාක්‍රමයේ වැසිකිළි හා නානකාමර අලුත් වැඩියා කටයුතු සදහා වූ ඇස්තමේන්තුවේ ඉටු නොකළ වැඩ විෂයයන් 15 ක් වෙනුවෙන් ගෙවීම්	544,277
(ඇ)	නොසපයන ලද තාවකාලික වැසිකිළි සදහා වූ ගෙවීම්	153,000
(ඈ)	දිසානායක වත්ත නිවාස යෝජනාක්‍රමයේ වැසිකිළි හා නානකාමර අලුත් වැඩියා කටයුතු සදහා වූ ඇස්තමේන්තුවේ ඉටු නොකළ වැඩ විෂයයන් සදහා ගෙවීම්	2,012,529
(ඉ)	ඉහත නිවාස යෝජනාක්‍රමයේ නොසපයන ලද අතිරේක වැසිකිළි පහසුකම් සදහා ගෙවීම්	510,000
	එකතුව	**3,399,806**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය හා ලංකාපුර යන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශවල පිහිටි කහඹිලියා ඔය ගංවතුර පාලන ව්‍යාපෘතිය මගින් කහඹිලියා ඔයේ වක්‍ර ස්ථාන හා බාධක ඉවත් කිරිම සදහා කුඹුක්, මී හා කෝන් ආදි වටිනා ගස් 1885 ක් කපා ඉවත් කිරිමට සැලැසුම් කර තිබූ අතර, විගණන පරික්ෂණ දිනය වන විට ගස් 250 ක් පමණ කපා දමා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සදහන් දුර්වලතා නිරික්ෂණය විය.

(අ) 1988 අංක 56 දරන සංශෝධන පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23 (ඔ) වගන්තිය ප්‍රකාර 1993 ජුනි 24 දින ප්‍රකාශිත අංක 772/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද

නිවේදනය පරිදි හෙක්ටයාර 5 කට වැඩි ඉඩම් ප්‍රදේශයක ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධව මධ්‍යම පාරිසරික අධිකාරියෙන් අවසර ලබාගත යුතු වුවත්, හෙක්ටයාර් 25 කට වැඩි ආවරණයක් සහිත ඉහත ව්‍යාපෘතිය සඳහා එම අවසරය ලබාගෙන නොතිබුණි.

(ආ) පැති බැම්මක් ගොඩනැගීමද ඇතුළත් ඉහත ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් හෝ ඉංජිනේරුමය උපදෙස් ලබා ගෙන ක්‍රියාත්මක වීමක් සිදු කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය සඳහා මූල්‍ය යෝජනා සකස් කර නොතිබුණි.

(ඈ) ගස් ඉවත් කර තිබුණත් ඒවායේ මුල් ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමයක් සැලැසුම් කර නොතිබුණ අතර ඉවත් කරන ලද දැව නිසි පරිදි රාජ්‍ය දැව සංස්ථාවට භාරදීමේ ක්‍රමයක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතිය සඳහා සහභාගිවන විවිධ රාජ්‍ය ආයතන අතර විධිමත් සම්බන්ධිකරණයක් නොතිබුණි.

මොණරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

2006 - 2011 කාලපරිච්ඡේදය තුළ සමෘද්ධි සිප්දොර ද්විතියික අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩ සටහනින් සහ සමාජ ආරක්ෂණ අරමුදලින් මරණ, විවාහ හා දරු ප්‍රසූතිය වෙනුවෙන් ගෙවීම් කිරීමේදි පිළිවෙලින් රු.3,407,300 ක් හා රු.1,252,680 ක් වශයෙන් එකතුව රු. 4,659,980 ක් වංචා සහගත ලෙස ගෙවීම් කර තිබුණි.

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය

2006 ජුනි 30 දින සිට 2011 ජනවාරි 24 දින දක්වා කාලපරිච්ඡේදය තුළ තේ පැළ මිලදී ගැනීම සඳහා රු.30,270,000 ක් වටිනා ගිවිසුම් 22 කට එළඹ තිබුණ අතර අත්තිකාරම් ගෙවීමේ බැදුම්කරයක් නොමැතිව හා ලබාදිය හැකි සියයට 20 ක වැඩ පූර්ව අත්තිකාරම් මුදල ඉක්මවමින් අවස්ථා 17 කදී එකතුව රු.22,638,000 ක අත්තිකාරම් සැපයුම්කරුට ගෙවා තිබුණි. ඉහත ගිවිසුම් 22 අතුරින් 2006 හා 2007 වර්ෂවලට අදාල ගිවිසුම් 6 කට අදාල තේ පැළ සැපයීම මාස එකේ සිට මාස දහතුනක කාල පමාවක් සිදු වී තිබියදී, 2008 දෙසැම්බර් 29 දින තවත් ගිවිසුම් 10 කට එළඹ එකතුව රු.9,000,000 ක අත්තිකාරම් ද, 2011 ජනවාරි 24 හා 2011 ජනවාරි 26 දිනයන්හි තවත් ගිවිසුම් කිහිපයකට අදාලව රු.3,600,000 බැගින් අවස්ථා දෙකකදි එකතුව රු.7,200,000 ක අත්තිකාරම් ද ගෙවා තිබුණි. විගණන දිනය වූ 2013 මැයි 27 දින වන විට වසර 2 1/2 සිට වසර 4 1/2 දක්වා කාල පරිච්ඡේදයක් තුළ බාහිර පාර්ශවයක් විසින් පියවා නොතිබූ රු. 18,034,507 ක මුදල, අයකරගත යුතු රු. 5,687,260 ක පොළී මුදල හා දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු. 5,930,442 ක් අයවිය යුතු ලෙස පැවතුණි.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මහජන චීනයෙන් යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේ දී රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට, ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යාංශයට, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හා මාර්ග සංවර්ධන අධිකාරියට නිකුත් කිරීම සඳහා ඉදිකිරීම් යන්ත්‍ර ඒකක 725 ක් මහජන චීනයේ සමාගමකින් ණය පදනම මත එක්සත් ජනපද ඩොලර් 115,853,893 ක (රු. මිලියන 14,504) වටිනාකමකට මිලදී ගෙන තිබුණි.

2011 ජුනි 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය එකී සමාගම සමඟ සැපයුම් ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර, අමාත්‍ය මණ්ඩල තීරණයේ 3.2 වගන්තියේ දැක්වෙන පරිදි රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් එම සමාගම සමඟ ණය ගිවිසුමකට ඇතුළත් විය යුතු වුවද එලෙස කටයුතු කර නොතිබුණි.

ණය පදනම යටතේ උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් එකී විදේශීය සමාගමට ණය මුදලේ ණය වාරික සහ පොලිය වශයෙන් රු. මිලියන 3,454 ක් 2011 සහ 2012 වර්ෂ වලදී ඒකාබද්ධ අරමුදලින් ගෙවා තිබුණ ද, එම ණය මුදල රාජ්‍ය ණයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා රේගුව

1869 රේගු ආඥා පනතේ (235 අධිකාරය) 164 හා 165 වගන්තිවලට අනුව ශ්‍රී ලංකා රේගුව විසින් පනවන ලද දණ්ඩන සංශෝධනය කිරීමේ හෝ ඉවත් කිරීමේ බලතල මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති තත්ත්වයක් යටතේ වුවද එවැනි ක්‍රමවේදයක් අනුගමනය නොකරමින්, ආනයනික භාණ්ඩ වර්ගීකරණ අංකය වූ 7614.10 (Harmonized System Classification) සදොස් ලෙස 8544.60 වශයෙන් දක්වා ඇති බවට වාර්තා කර මුළුමනින්ම රාජ්‍ය ආයතනයක් වන ලංකා විදුලි බල මණ්ඩලයෙන් රු.208,283,881 ක දඩ මුදලක් අයකර ගැනීම හා ඉන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් එනම් රු.104,141,940 ක් නිලධාරීන් කිපදෙනෙකුට ත්‍යාග මුදල් සඳහා වෙන් කිරීම, සියයට 20 ක් එනම් රු.41,656,776 ක් නිලධාරීන්ගේ සුභසාධන කටයුතු සඳහා වෙන් කිරීම හා නියමිත වැටුප්, දීර්ඝ දීමනා, අතිකාල හා වෙනත් දීමනා ලබන රේගු කටයුතු කිරීම රාජකාරිය ලෙස සැලකිය යුතු එක් නිලධාරියෙකුට රු.60,000,000 ත්‍යාග ගෙවීම දිවයිනේ රාජ්‍ය සේවයේ පාරිශ්‍රමික සම්බන්ධව පවතින බලවත් විෂමතාවයක් මෙන්ම, අනෙකුත් රාජ්‍ය අංශයේ කටයුතුවලට ලබාදෙන තත්ත්වය පිළිබඳ බලවත් අසමානතාවයකින් යුක්ත වීම මොනවට පැහැදිලි කරයි. නූතන අවශ්‍යතාවලට අනුකූලව සංශෝධනය නොවුනු ප්‍රතිපාදනවලින් සමන්විත රේගු ආඥා පනතේ විධිවිධාන සංශෝධනය කිරීම පිළිබඳව වගකීම දරන්නන්ගේ නිසි අවධානය යොමු නොවූ අංශයක් බවද පෙන්වා දෙමි.

අධිභාර

මහ නගර සභා ආඥා පනතේ 226(1) උප වගන්තිය, නගර සභා ආඥා පනතේ 182(1) උප වගන්තිය හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) උප වගන්තිය අනුව නීතියට පටහැනි විෂයයන්, නොසැලකිල්ල හෝ විෂමාචාරය හේතුවෙන් සිදුවී ඇති සියළුම ඌනතා හා පාඩු, ගිණුම්වල දැක්විය යුතු නමුත් ගිණුම් වල දක්වා නැති විෂයයන් සම්බන්ධව අධිභාර කිරීමේ අයිතිය විගණකාධිපති සතුවේ.

මේ අනුව 2008 ජනවාරි සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පුද්ගලයින් 392 ක් වෙනුවෙන් එකතුව රු.29,258,218 ක අධිභාර සහතික 48 ක් නිකුත් කර තිබුණි. එයින් 2014 මැයි 31 දින වන විට එකතුව රු.1,006,303 ක මුදලක් පමණක් අයවී තිබුණි.

2013 වර්ෂය තුළදී එකතුව රු.3,738,830 ක් වූ අධිභාර සහතික 10 ක් පාර්ශවකරුවන් 104 ක් වෙත නිකුත් කරනු ලැබූ අතර එම මුදල් මෙතෙක් අයවී නොතිබුණි.

2014 ජුනි 30 දින වන විට පාර්ශවකරුවන් 96 ක් වෙනුවෙන් එකතුව රු.245,205,168 ක්වූ අධිභාර නිවේදන 08 ක් නිකුත් කරන ලදී.

III කොටස

මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සළසා දෙන ලද ප්‍රතිපාදනවලින් ජනිතවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමෙන් ඒවායේ පාලනය මෙන්ම රටක් වශයෙන් රජය සතු වත්කම්වල වටිනාකම ගණනය කිරීමෙන්, ඒවායේ ආරක්ෂාව තහවුරුවන පරිදි වගකීම පැවැරීමටත් හැකි තත්ත්වයක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හඳුන්වාදීම මගින් නිර්මාණය වන බව සඳහන් කළ යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශනවල සඳහන් උපචිත පදනම මත ගණනය කළ ආදායම හා වියදම සමඟ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් ආදායම් හා වියදම් සැසඳිය හැකිවීම මගින් ආදායම් රැස්කීමට හා වියදම් පාලනයක් ඇති කර ගත හැකිය.

වාර්ෂික විසර්ජනයන්

2013 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදනය කරන ලද මුළු අරමුදල් ප්‍රමාණය රු.මිලියන 1,024 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ප්‍රතිපාදනය රු.මිලියන 1,088 ක් විය. මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 263 ක් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය විසින් ධාරිතා වර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සළසා දෙන ලදී. 2013 වර්ෂයේදී ව්‍යාපෘතියේ තථ්‍ය වියදම රු.මිලියන 153 ක් වූ අතර ඊට අනුරූපිය ඉකුත් වර්ෂයේ වියදම රු.මිලියන 216 ක් විය.

2013 වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන බලමණ්ඩල, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු ලෙස රු.මිලියන 97 ක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රැස්කිරීමට අපේක්ෂා කළ විගණන ගාස්තුව රු.මිලියන 45 ක් වුවත්, එම ඇස්තමේන්තුව රු.මිලියන 52 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු රැස්කිරීමට හැකි වී තිබුණි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

වත්කම් පාලනය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය මැන බැලීම සඳහා මෙවලමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ මූලික වැඩ කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කෙරුණි. යටත් විජිත සමයේ සිට විසර්ජන ගිණුම් පමණක් ඉදිරිපත් කරමින් පවතින ආයතන කාණ්ඩය යටතේ පවතින දෙපාර්තමේන්තුවලට ප්‍රථම වතාවට මෙම ගිණුම්කරණය හඳුන්වා දුන් අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ සිට සෑම අමාත්‍යාංශයකටම හා දෙපාර්තමේන්තුවකටම මෙම ගිණුම් ක්‍රමය 2013 ජනවාරි 24 දිනැති අංක එස්ඒ/ඒඑස්/ඒඒ/චක්‍රලේඛ දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙන් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් හඳුන්වා දී ඇත. ඒ අනුව ආරම්භක පියවරක් වශයෙන් දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මුළු රාජ්‍ය ක්ෂේත්‍රයටම ආදර්ශයක් වී ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඇස්තමේන්තුව 2013		සටහන	2013	2012 ප්‍රතිශෝධිත
රු.000			**රු.000**	**රු.000**
	ආදායම			
45,000	විගණන ගාස්තු	01	104,185	90,589
200	කුලී		134	215
9,000	පොලී		10,303	11,155
--	දඩ මුදල් හා රාජසන්තක කිරීම්		--	187
2,000	අනෙකුත්		2,225	4,941
--	වත්කම් අපහරණයෙන් ලාභ	02	571	739
56,200	**මුළු මෙහෙයුම් ආදායම**		**117,418**	**107,826**
747,180	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය	03	736,482	744,980
803,380	**මුළු ආදායම**		**853,900**	**852,806**
	වියදම			
638,080	පුද්ගල පඩිනඩි	04	635,327	606,614
21,900	ගමන් වියදම්	05	19,425	15,212
16,500	සැපයීම්	06	15,498	13,048
14,200	නඩත්තු වියදම්	07	9,746	6,366
48,519	සේවා	08	42,268	44,587
10,114	මාරු කිරීම්	09	10,054	9,073
1,000	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය		316	174

--	ක්ෂයවීම්	10	73,774	60,563
26,000	රාජ්‍ය අංශයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතියේ පුනරාවර්තන වියදම්		25,058	44,541
67	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් කපා හැරීම		67	--
27,000	විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය ක්‍රමක්ෂය	11	25,607	22,944
803,380	**මුළු වියදම**		**857,140**	**823,122**
--	**වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය/(ඌනතාවය)**		**(3,240)**	**29,684**

විගණකාධිපති දෙපාර්තමේන්තුව

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2013 දෙසැම්බර් 31		2012 දෙසැම්බර් 31 ප්‍රතිශෝධිත	
	සටහන	රු.000	රු.000	රු.000	රු.000
ජංගම වත්කම්					
මුදල් ශේෂය		--		15	
රජයේ නිලධාරීන්ට අත්තිකාරම්	12	251,605		265,787	
ලැබිය යුතු විගණන ගාස්තු	13	189,456		193,086	
මුළු ජංගම වත්කම්			441,061		458,888
දෙපාර්තමේන්තු විගණන ක්‍රමවේදය	11		207,522		206,496
ජංගම නොවන වත්කම්					
දේපල,පිරියත හා උපකරණ	10		1,028,548		1,010,046
කෙරීගෙන යන වැඩ			179,064		--
මුළු වත්කම්			**1,856,195**		**1,675,430**

ජංගම වගකීම්					
ගෙවිය යුතු වියදම්		162,892		1,699	
නිරවුල් නොකළ අග්‍රිම		--		15	
ගෙවිය යුතු තැන්පත්		8,456		43,878	
මුළු ජංගම වගකීම්			**171,348**		**45,592**
සමුච්චිත අරමුදල		191,387		161,703	
ජනවාරි 01 දිනට ශේෂය		(3,240)		29,684	
වර්ෂයේ අතිරික්තය/(ඌනතාවය)			**188,147**		**191,387**
දෙසැම්බර් 31 දිනට ශේෂය					
දායකය					
භාණ්ඩාගාරය	14	662,610		653,160	
රාජ්‍ය අංශයේ ධාරිතාවය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	15	834,090	1,496,700	785,291	1,438,451
මුළු බදු ගෙවන්නන්ගේ ස්කන්ධය			**1,856,195**		**1,675,430**

පිටු අංක 31 සිට 34 දක්වා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 41 දක්වා වූ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ. මෙම මූලය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම විගණකාධිපති සතුවේ.

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති
30 සැප්තැම්බර් 2014

එස්.ජී. සේනාරත්න
ප්‍රධාන ගණකාධිකාරී

ගිණුම් ප්‍රතිපත්ති

1 වාර්තා කිරීමේ අස්ථිත්වය

විගණකාධිපති දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් කිසියම් විශේෂ නීතියක් නොමැත. කෙසේ වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාවෙහි විගණකාධිපතිවරයෙක් විය යුතු බව දක්වා ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හා (3) ව්‍යවස්ථාවල සඳහන් ආයතනවලට විගණන සේවා සැපයීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වේ.

2 වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය

වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය ජනවාරි 01 දිනෙන් ආරම්භ වී දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ලිත් වර්ෂය වේ.

3 සකස් කිරීමේ පදනම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද අතර සියලුම වටිනාකම් ආසන්නම රුපියල් දහසේ වටිනාකමට වටයා ඇත.

4 ආදායම්

භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන, විගණන ගාස්තු, ණය සඳහා පොළී, ගොඩනැගිලි කුළී, සංචාරක බංගලා ගාස්තු, වත්කම් විකිණීමෙන් ලාභ, දඩ හා ගාස්තු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන අතර ඒවා උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. ආදායම ඒවාට ලැබුණු ප්‍රතිෂ්ඨාව අනුව සාධාරණ පදනම මත ගණනය කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන ආයතන, විශ්වවිද්‍යාල හා ව්‍යවස්ථාපිත අරමුදල්වලින් විගණන ගාස්තු අයකරනු ලබයි. කාලපරිච්ඡේදයට අදාල ආදායමක් ලෙස ගාස්තු හඳුනාගනී. විගණන ගාස්තුවල වටිනාකම, විගණනය සඳහා ගත කරනු ලබන කාලය හා එම විගණනය සඳහා වැය කරන ඍජු පිරිවැය පදනම් කරගෙන තීරණය කරනු ලැබේ.

ණය සඳහා පොලී, ගොඩනැගිලි කුලී, සංචාරක බංගලා ගාස්තු, දඩ හා ගාස්තු, වත්කම් විකිණීමට අදාල ආදායම් ගණන්දීමේ නිලධාරියා වෙනත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වුවත්, දෙපාර්තමේන්තුවට අදාල එම ආදායම් එකතු කරන නිලධාරියා විගණකාධිපති වන හෙයින් හා එකතු කරන ලද ආදායම සමස්ථ ආදායමෙන් සුළු ප්‍රතිශතයක් වන හෙයින්, එම ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. මුදල් පදනම මත භාණ්ඩාගාර පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදාන ගිණුම්ගත කරන නමුත් ස්ථාවර වත්කම් ක්ෂයවීම් ලැබිය යුතු පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදානයන් ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

5 වියදම්

උපචිත පදනම යටතේ සියළු පුනරාවර්තන වියදම් ගිණුම්ගත කරනු ලැබේ.

6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුව සිදුවන දිනට පවතින විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. එම ගනුදෙනු පියවීමේදී සිදුවන විදේශ විනිමය ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ.

7 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් හා බැංකුවල ඇති වැඩි ද්‍රවශීලතාවයෙන් යුක්ත කෙටිකාලින තැන්පතු මුදල්වලට අයත් වේ.

8 ණයගැතියන් හා අනෙකුත් ලැබිය යුතු මුදල්

ණයගැතියෝ හා ලැබිය යුතු දෑ සාධාරණ අගයට ගිණුම්ගත කරනු ලැබේ. ලැබිය යුතු ශේෂය පිළිබඳ මූලික කොන්දේසිවලට අනුව දෙපාර්තමේන්තුවට මුදල් අයකර ගැනීමට නොහැකි බවට සාක්ෂි තිබෙන විට ලැබිය යුතු මුදලක් හානි වූ ලෙස සලකනු ලැබේ.

9 දේපල, පිරියත හා උපකරණ

ඉඩම්, ගොඩනැගිලි, ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ, පරිගණක දෘඨාංග, මෝටර් රථ හා කුඩා පරිමාණ මුද්‍රණාලය හා විදුලි සෝපානය යනාදියෙන් දේපල, පිරියත හා උපකරණ සමන්විත වේ. දේපල පිරියත හා උපකරණ පිරිවැයට සමුච්චිත ක්ෂය අඩු කර දක්වනු ලැබේ. 2009 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ශේෂ පදනම් කරගෙන පළමුවරට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර 2010 ජනවාරි 01 දිනට

පැවැති සියළුම ඉඩම් හා ගොඩනැගිලි මැණුම් දෙපාර්තමේන්තුවේ සැලැසුම්වලට අනුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කරන ලද තක්සේරුවට අනුව ගිණුම් ගත කරන ලදී. සියළුම මෝටර් රථ වාහන රජයේ තක්සේරුකරු විසින් කරන ලද ප්‍රත්‍යාගණනය පදනම් කරගෙන ගිණුම්ගත කර ඇති අතර, ලීබඩු, පරිගණක හා වෙනත් විෂයයන් ස්වාධීන තක්සේරු කණ්ඩායමක් විසින් සිදුකරන ලද තක්සේරුව මත පදනම් කරගෙන ගිණුම්වලට ගන්නා ලදී. දේපල පිරියත හා උපකරණ විෂයයක පිරිවැය වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ විෂයය සමඟ සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ වියහැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේ නම් හා එම විෂයෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය.

බොහෝ අවස්ථාවලදී දේපල පිරියත හා උපකරණ විෂයයන් එහි පිරිවැයට හඳුනාගනු ලැබේ. පිරිවැය රහිතව අත්කර ගත් හෝ නාමික පිරිවැයට අත්කර ගත් වත්කමක පිරිවැය, එම වත්කම අත්කර ගත් දිනයේදී සාධාරණ අගයට හඳුනාගනු ලැබේ.

9.1 අපහරණයන්

අපහරණයේදී ලැබෙන මුදල වත්කමෙහි ධාරණ වටිනාකම සමඟ සසඳා අපහරණයෙන් උද්ගතවන ලාභය හා පාඩුව තීරණය කරනු ලැබේ. අපහරණය මත ලාභ හා පාඩු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

9.2 පසුව සිදුවන පිරිවැය

මුල් අත්පත් කර ගැනීමෙන් අනතුරුව දරනු ලබන පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එමගින් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ හෝ ලැබිය හැකි සේවා දෙපාර්තමේන්තුවට ගලා එන්නේනම් සහ එම විෂයන්හි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි අවස්ථාවන්හිදීය.

9.3 ක්ෂය කිරිම

පිරියත හා උපකරණවල පිරිවැය අඩුකළ ඇස්තමේන්තුගත අවශේෂ වටිනාකම් සහ ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය අනුපාතයට අනුව සියළුම පිරියත හා උපකරණ සඳහා ක්ෂය සරල මාර්ග පදනම මත ප්‍රතිපාදනය කරනු ලබයි. ප්‍රධාන වත්කම්වලට ප්‍රයෝජනවත් ආයු කාලය හා සම්බන්ධිත ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි ඇස්තමේන්තු කර ඇත.

වත්කම	ආයුකාලය	ක්ෂය අනුපාතය
	වර්ෂ	ප්‍රතිශතය
ගොඩනැගිලි	50	2.0
කුඩා පරිමාන මුද්‍රණාලය	20	5.0
විදුලි සෝපානය	20	5.0
මෝටර් වාහන	8	12.5
ලී බඩු හා උපකරණ	5	20.0
පරිගණක හා දෘඩාංග	4	25.0

10. **ගෙවිය යුතු මුදල්**

ශේෂපත්‍ර දිනට පවතින වටිනාකමට ගෙවිය යුතු මුදල් ගිණුම්වලට ගනු ලැබේ. මුලිකව සාධාරණ අගයට ගෙවිය යුතු මුදල් ගණනය කරනු ලැබේ.

11. **වාර්ෂික ඇස්තමේන්තු**

පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන පනත මගින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන සංඛ්‍යා ප්‍රධාන ඇස්තමේන්තුවේ සංඛ්‍යා වේ. මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ වීරමොං පරිපාටියෙන්ද, පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් හා පරිපූරක ඇස්තමේන්තු මගින් ගැලපීම් කිරීමෙන් පසුව මෙම සංඛ්‍යා අවසාන සංඛ්‍යා ලෙස දක්වනු ලැබේ.

12. **විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම්**

ප්‍රතිපත්ති යොදා ගැනිම සහ වාර්තා කරන ලද වත්කම් හා බැරකම්, ආදායම් හා වියදම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු කිරිම්, උපකල්පනයන් මෙම මුලා ප්‍රකාශන ඉදිරිපත් කිරිම සඳහා අවශ්‍ය වේ. අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගැලපෙන පරිදි ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පනයන් ඓතිහාසික අත්දැකීම් හා වෙනත් විවිධ කරුණු මත පදනම් වේ.

මූල්‍ය ප්‍රකාශනවල සටහන්

සටහන් 01 විගණන ගාස්තු

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
45,000	**ලැබීම්**		
	රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන	42,986	28,106
	පළාත් පාලන ආයතන	16,324	9,984
	ගොවිජන සේවා මධ්‍යස්ථාන	489	374
45,000	**එකතුව**	**59,799**	**38,464**
	ලැබිය යුතු		
	රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා රජයට අයත් අනෙකුත් ආයතන	16,004	37,281
	පළාත් පාලන ආයතන	26,704	14,013
	ගොවිජන සේවා මධ්‍යස්ථාන	1,678	831
		44,386	**52,125**
45,000	**මුළු එකතුව**	**104,185**	**90,589**

සටහන් 02 වත්කම් අපහරණය

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
	වාහන අපහරණය		
--	වාහනවල විකුණුම් වටිනාකම	--	700
--	විකුණුම් පිරිවැය	--	(591)
--	වාහන අපහරණයෙන්(ලාභ/(අලාභ)	--	**109**

--	**ලීබඩු හා උපකරණ අපහරණය**		
--	ලීබඩු හා කාර්යාල උපකරණ විකුණුම් වටිනාකම	710	948
--	පිරිවැය	(139)	(318)
--	ලීබඩු හා උපකරණ අපහරණයෙන් ලාභය	**571**	**630**
--	**වත්කම් අපහරණයෙන් ලාභය**	**571**	**739**

සටහන් 03 පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
747,180	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම	637,650	661,473
--	ක්ෂයවීම් සඳහා ලැබිය යුතු අග්‍රිම	73,774	60,563
--	විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය	25,058	22,944
747,180	පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකය	**736 482**	**744,980**

සටහන් 04 පුද්ගල පඩිනඩි

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
342,380	වැටුප් හා වේතන	340,820	348,564
3,000	අතිකාල හා නිවාඩු දින දීමනා	2,584	2,619
292,700	අනෙකුත් දීමනා	291,923	255,431
638,080	එකතුව	**635,327**	**606,614**

සටහන 5 ගමන් වියදම්

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
13,000	දේශිය	12,555	11,344
8,900	විදේශීය	6,870	3,868
21,900	එකතුව	**19,425**	**15,212**

සටහන 6 සැපයීම්

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
9,000	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	8,652	6,677
7,000	ඉන්ධන	6,398	6,204
500	ආහාර පාන හා නිල ඇඳුම්	448	167
16,500	එකතුව	**15,498**	**13,048**

සටහන 7 නඩත්තු වියදම්

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
8,100	මෝටර් වාහන	5,406	4,821
2,100	පිරියත, යන්ත්‍ර හා උපකරණ	1,016	1,329
4,000	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	3,324	216
14,200	එකතුව	**9,746**	**6,366**

සටහන 8 සේවා

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
5,000	ප්‍රවාහන	4,110	4,004
10,000	තැපැල් හා සංනිවේදනය	7,915	8,047
13,500	විදුලිය හා ජලය	11,212	11,437
700	බදු කුලී හා පළාත් පාලන ආයතන බදු	622	253
19,319	අනෙකුත්	18,409	20,846
48,519	එකතුව	**42,268**	**44,587**

සටහන 9 මාරු කිරීම්

ඇස්තමේන්තුව 2013	විස්තරය	2013	2012
රු.000		**රු.000**	**රු.000**
500	දායක මුදල් හා සම්මාදම්	440	276
9,614	රජයේ නිලධාරීන්ගේ දේපල ණය මත පොළී	9,614	8,797
10,114	එකතුව	**10,054**	**9,073**

සටහන 10 දේපල, පිරියත හා උපකරණ

	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් වාහන	පරිගණක හා දෘඩාංග	ලීබඩු හා උපකරණ	කුඩා පරිමාණ මුද්‍රණාලය	විදුලි සෝපානය	එකතුව
	රු.000	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**	**රු.000**
පිරිවැය	253,140	569,027	88,208	105,962	55,691	2,602	7,960	1,082,590
ජනවාරි 01 දිනට ශේෂය	3,007	12,486	-	25,095	27,540	23,421	867	92,416
එකතු කිරීම	256,147	581,513	88,208	131,057	83,231	26,023	8,827	1,175,006
අපහරණය කිරීම	-	-	-	-	(174)	-	-	(174)
දෙසැම්බර් 31 දිනට ශේෂය	256,147	581,513	88,208	131,057	83,057	26,023	8,827	1,174,832

ක්ෂය කිරීම්	-	-	-	-	-	-	-	-
ජනවාරි 01 දිනට ශේෂය	-	13,528	19,355	26,997	12,136	130	398	72,544
අපහරණය කළ වත්කම්වලට අදාල ක්ෂයවීම්	-	-	-	-	(35)	-	-	(35)
එකතු කිරීම්	-	11,630	11,026	32,764	16,612	1,301	441	73,774
දෙසැම්බර් 31 දිනට ශේෂය	-	25,158	30,381	59,761	28,713	1,431	839	146,283
දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය	256,147	556,355	57,827	71,296	54,344	24,592	7,988	1,028,549

සටහන 11- විගණන ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ පිරිවැය

විස්තරය	2013	2012
	රු.000	**රු.000**
ජනවාරි 01 දිනට ශේෂය	206,496	--
වර්ෂයේ වියදම	26,633	229,440
ක්‍රමක්ෂය (වාර්ෂිකව මුළු පිරිවැයෙන් සියයට 10 බැගින්)	(25,607)	(22,944)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**207,522**	**206,496**

සටහන 12 - රජයේ නිලධාරීන්ට අත්තිකාරම්

විස්තරය	2013	2012
	රු.000	**රු.000**
දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරින්ගෙන් අය විය යුතු ශේෂ එකතුව	248,265	263,572
වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	1,730	285
විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	435	977
තනතුර අතහැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	580	560
සේවය අවසන් කළ නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂ එකතුව	595	514
ණය සහන සභා ශේෂය	--	6
වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පියවිය යුතු ශේෂ එකතුව	--	(127)
එකතුව	**251,605**	**265,787**

සටහන **13** – ලැබිය යුතු විගණන ගාස්තු

විස්තරය	2013	2012
	රු.000	**රු.000**
සංවර්ධන සභා	30	30
මහා නගර සභා	22,706	18,207
නගර සභා	47,732	45,401
ප්‍රාදේශීය සභා	24,443	25,247
රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා අනෙකුත් රාජ්‍ය ආයතන	86,153	97,182
ගොවිජන සේවා මධ්‍යස්ථාන	8,392	7,019
එකතුව	**189,456**	**193,086**

සටහන **14** – උපචිත වියදම්

විස්තරය	2013	2012
	රු.000	**රු.000**
දුම්රිය බලපත්‍ර - නිවාඩු	105	-
දුම්රිය බලපත්‍ර - රාජකාරී ගමන්	5	-
ඉන්ධන වියදම්	33	-
තැපැල් ගාස්තු	15	5
දුරකථන බිල්පත්	163	410
විදුලි බිල්පත්	945	1,140
ජල බිල්පත්	34	144
වාහන අළුත්වැඩියා වියදම්	10	-
රත්නපුර ගොඩනැගිල්ල - උපදේශක ගාස්තු	3,736	-
පොදු විකාශන පද්ධති ගාස්තු	441	-
රත්නපුර ගොඩනැගිල්ල - ලී බඩු වියදම්	14,210	-
විගණන ක්‍රමවේදය	26,633	
රත්නපුර ගොඩනැගිල්ල - ඉදිකිරීම්	116,562	
එකතුව	**162,892**	**1,699**

සටහන 15 – ප්‍රාග්ධන වැය සඳහා භාණ්ඩාගාර දායකය

විස්තරය	2013	2012
	රු.000	**රු.000**
රජයේ නිලධාරින්ට අත්තිකාරම් වෙනුවෙන්	251,605	265,787
තැන්පත් ගිණුම වෙනුවෙන්	(8,456)	(43,878)
ස්ථාවර වත්කම් වෙනුවෙන්	419,461	431,251
එකතුව	**662,610**	**653,160**

සටහන 16 – රාජ්‍ය අංශ ධාරිතා වර්ධන ව්‍යාපෘතියේ දායකය

විස්තරය	2013	2012
	රු.000	**රු.000**
ස්ථාවර වත්කම් වෙනුවෙන්	653,201	578,794
විගණන ක්‍රමවේදය වෙනුවෙන්	180,889	206,497
එකතුව	**834,090**	**785,291**

IV කොටස

රාජ්‍ය විගණනයට අයත් ක්ෂේත්‍රයන් පිළිබද සංක්ෂිප්ත විගණන සමාලෝචනය

රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය

රාජ්‍ය ව්‍යවසායක් යනු සම්පූර්ණයෙන් රජය සතු වෙනම නීතිමය ස්වභාවයක් සහිත සහ එහි භාණ්ඩ හා සේවා විකිණීමෙන් ආදායම උපයනු ලබන ආයතනයකි. ඒ අනුව එහි වත්කම් මත ප්‍රතිලාභයක් ඉපැයීම අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය වේ. නියාමන, ප්‍රවර්ධනාත්මක හා අධ්‍යාපනික රාජ්‍ය ව්‍යවසායන් සම්ප්‍රදායානුකූලව වාණිජ අංශයන්ට අයත් නොවන අතර එම ව්‍යවසායන් ලාභ නොලබන සංවිධානය ලෙස සැලකෙන අතර, ලාභදායීත්වය හැර වෙනත් නිර්ණායකයන් භාවිතා කරමින් ඒවායේ කාර්ය සාධනය පරික්ෂා කළ යුතු වේ. පහත සඳහන් ශීර්ෂයන් යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් පුළුල් ලෙස වර්ගීකරණය කළ හැක.

- ★ උපාය මාර්ගික ව්‍යාපාර ව්‍යවසායන්
- ★ රජය සතු සීමිත වගකීම් සමාගම්
- ★ නියාමන හා අධීක්ෂණ ආයතන
- ★ විශ්ව විද්‍යාල, පර්යේෂණ සහ වෙනත් පුහුණු ආයතන
- ★ වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතන

විදුලි බලය, ජලය, ඛනිජ තෙල් නිෂ්පාදිත, විදුලි සංදේශ හා ගුවන් ප්‍රවාහන ආදී ආර්ථිකයේ උපාය මාර්ගිකව ඉතා වැදගත් ක්ෂේත්‍ර රාජ්‍ය ව්‍යවසායන් මගින් මෙහෙයවනු ලැබේ. ආර්ථිකයේ සමස්ත හිමිකම් සහ තරඟකාරිත්වය කෙරෙහි සියළු රාජ්‍ය ව්‍යවසායන්හි ආයතනික පාලනය ඉතා වැදගත් වේ. 2013 දෙසැම්බර් 31 දිනට එක් එක් වර්ගයන්හි රාජ්‍ය ව්‍යවසායන් 181 ක මුළු වත්කම් වල සංයුතිය ඉකුත් වර්ෂය අවසානය සමඟ සසඳා පහත වගුවෙහි දැක්වේ.



ප්‍රස්ථාරය 1 – 2012 වර්ෂය සමඟ සසඳා 2013 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන්හි මුළු වත්කම්

2013 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන්ට දළ වශයෙන් රු.බිලියන 47.5 ක රජයේ ප්‍රදාන හා සහනාධාර ලබාදී ඇති අතර, එය රජයේ මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 3.8 ක් වූ අතර එයට අනුරූපී සංඛ්‍යාව පිළිවෙලින් රු.බිලියන 42.2 ක් සහ සියයට 3.8 ක් විය.

දුර්වල ලෙස ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවසායන් විසින් පෞද්ගලික අංශයෙන් ලබාගන්නා භාණ්ඩ හා සේවාවන් සඳහා ගෙවීම් දුර්වල වීම මඟින් පුද්ගලික අංශයේ සංවර්ධනය කෙරෙහි තවදුරටත් බාධාවක් විය හැකිය. රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය කෙරෙහි පහත දැක්වෙන කරුණු වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

කාර්ය සාධනය ඇගයීම

රාජ්‍ය ව්‍යවසායන් විගණනය මූල්‍ය හා අනුකූලතා විගණනයට පමණක් සීමා නොවන අතර අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමතාවය, ආර්ථික බව හා ඵලදායීතාවය කෙරෙහිද මෙහෙයුම් කෙරේ.

රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යක්ෂමතාවය හා ඵලාදායීතාවය පිළිබඳ විගණනය සමහර ප්‍රමිතින් හා නිර්නායකයන් මත පදනම්ව සිදු කෙරේ. ලාභය කාර්ය සාධනයේ ප්‍රධාන නිර්නායකය නොවන අතරම රාජ්‍ය අරමුදල් ආර්ථික භාවයන් හා කාර්යක්ෂමව යොදා ගැනීමේ කළමනාකරණයේ කාර්ය සාධනය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම වඩාත් ඵලදායී වේ. අරමුණු ව්‍යවසායෙන් ව්‍යවසායාට සමාන නොවේ. ව්‍යවසායක කාර්ය සාධනය විශ්ලේෂණය ඇගයීම ව්‍යවසාය පිහිටුවීමේ අරමුණ යම් දුරකට ඇගයේ. විගණනයේ එක් ප්‍රමුඛ කාර්යයක් වනුයේ ව්‍යව්‍යසායක කාර්ය සාධනය ඇගයීම සඳහා නිර්නායකය හඳුනා ගැනීමයි. නිෂ්පාදන ව්‍යවසායක උදාහරණයක් වශයෙන් ලංකා ඛනිජ තෙල් සංස්ථාව ගත් විට, අරමුණු සහ ආයෝජනයේ පදනම, ධාරිතාවය, පිරිවැය හා කාල සැලසුම්, පරිභෝජන නියමයන්, ඉපැයීම්, ඵලදායීතාවය, පිරිවැය, ප්‍රතිලාභ අනුපාතය ආදිය කාර්ය සාධනය මැනීමේ මිනුම් දඬු වේ. ව්‍යවසායක් වෙත ඇති දිගු හා කෙටි කාලීන ප්‍රාග්ධනය හා මෙහෙයුම් සැලසුම් කාර්ය සාධනය තක්සේරු කිරීමේ වෙනත් සමුද්දේශ ලක්ෂණයන් වේ.

භෞතික කාර්ය සාධනය ඇගයීමේදී අදාළ වන අවස්ථාවක ඒකකයක තක්සේරු කළ ධාරිතාවය පිළිගත හැකි මිණුම් ලකුණක් වේ. අනුපාතික ධාරිතාවය උපයෝජනය යනු අමු ද්‍රව්‍ය සහ උපයෝගීතා පරිභෝජනය සඳහා සම්මතයන් ඉපැයීම් හා ප්‍රතික්ෂේපිතයන් මෙන්ම විධිමත් නඩත්තුව හා උපකරණ සේවා කිරීම සඳහා අවශ්‍යතාවයන් සමඟ තක්සේරු කිරීමයි. කාර්ය සාධනය ඇගයීම සඳහා අනෙක් වැදගත් පදනම වන්නේ පිරිවැය කාර්යක්ෂමතාවයයි. ධාරිතා උපයෝජනය පරිභෝජනයන්, ඵලදායීතාවය, ඉපයීම් ආදිය පිළිබඳ සම්මතයන් මත පදනම්ව ප්‍රමිත හා පිරිවැය ඉලක්කයන් තීරණය කරනු ලැබේ. ආයතනික පාලනය, සාමාන්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, ඉදිකිරීම් කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායායක් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අතර මෙම මාර්ගෝපදේශ ව්‍යවසායයක කාර්ය සාධනය හා පද්ධති ඇගයීම් කිරීම සඳහා වෙනත් පදනමක් වේ. අභ්‍යන්තර හා

බාහිර විශේෂඥයින් විසින් සිදුකරන වෙනත් තාක්ෂණික අධ්‍යයනයන් හා ප්‍රමිතීන් මෙම මාර්ගෝපදේශයට පදනම් වන වෙනත් නිර්නායකයන් වේ.

විගණකාධිපතිවරයා විසින් පවත්වනු ලබන බාහිර විගණනය ගණන්දීමේ වගකීම් පිළිබඳ උපකරණයක් වේ. රජයට සහායක් සේම ව්‍යවසාය කළමනාකාරිත්වය ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලාදායිතාවය වැඩිදියුණු කර ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර විගණනය සමානවම වැදගත් වන කාරණයක් වේ. මූල්‍ය හා මෙහෙයුම් අඩුපාඩු පද්ධති ප්‍රමාණාත්මක නොවීම හෝ අකාර්යක්ෂමතාවය, කාර්ය සාධනයේ ඌනතාවයන්, නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් ආදිය සහ කාර්ය සාධනය පිළිබඳ පිළිගත හැකි ප්‍රමිතින් පිළිබඳ ඉලක්කයන් සපුරා නොගැනීම සම්බන්ධයෙන් හේතු විග්‍රහ කිරීම මඟින් මෙය සපුරා ගැනේ. මූල්‍ය කාර්ය සාධනය භෞතික කාර්ය සාධනය සමඟ සම්බන්ධවන අතර කාර්යක්ෂම හා ආර්ථික මෙහෙයුම් සහ සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු විගණන වාර්තාවෙන් අවධාරණය කෙරේ. ආයතනවල කළමනාකරිත්වය සමඟ මාගේ නිලධාරින් විසින් පවත්වන විධිමත් රැස්වීම් වලදී අවශ්‍ය පද්ධති හා මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ. විගණකාධිපතිවරයා විසින් නිරීක්ෂණය කෙරෙන අහිතකර සොයා ගැනීම් සඳහා, රාජ්‍ය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය පසු විපරම් කටයුතු සිදුකිරීම වැදගත් වේ. එකම කරුණ සඳහා වර්ෂයක් පාසාම කෙරෙන අහිතකර සොයා ගැනීම් නැවත නැවත සිදුවීම හා බොහෝවිට තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කිරීම නිසා මෙය නිසි පරිදි ඉටු නොවන බව පෙන්නුම් කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන්වන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විතව වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශන වලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම ආකාරයෙන් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය ව්‍යවසාය මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්ය සාධනය මූල්‍ය ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට යන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් දැක්වේ.

සිව් ආකාරයේ විගණන මතයන් ප්‍රකාශ කරනු ලැබේ. ඒවා නම් තත්ත්වාගණනය නොකළ, තත්ත්වාගණනය කළ අහිතකර සහ ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවය කළමනාකරණ එකඟ නොවීම හෝ කටයුතු සීමාවීම පිළිබඳ අවස්ථාවලදී මතය ව්‍යවනය කිරීම නම් වේ. විෂය පථය සීමාවීම මතය ව්‍යාවනය කිරීමට හේතුවන අතර නොඑකඟතාවය ඇතිවීම අහිතකර විගණන මතයක් ප්‍රකාශ කිරීමට හේතුවේ.

තත්ත්වාගණනය නොකළ විගණන මතය

රාජ්‍ය ව්‍යවසායක මූල්‍ය ප්‍රකාශනවල කිසිදු සැලකිය යුතු උල්ලංඝණය කිරීමක් හෝ සාවද්‍ය ප්‍රකාශනයක් නොමැතිවිටදී විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ විගණන මතයක් ප්‍රකාශ කෙරේ. මෙයට භාවිතා කරන විකල්ප නාමය පිරිසිදු මතයයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට යන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය තොරතුරු වාර්තා කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායේ හැකියාව පිළිබඳව යොමු කිරීමෙන් විගණකාධිපතිවරයා විසින් මෙම මතය ප්‍රකාශ කරනු ලැබේ. යම් ව්‍යවසායක් ලබන උසස් විගණන මතය මෙය වේ.

තත්ත්වාගණනය කළ විගණන මතය

රාජ්‍ය ව්‍යවසායක මූල්‍ය තොරතුරුවල යම් ගැටළුකාරී කරුණු සොයා ගැනේ නම් එහිදී විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කරයි. රාජ්‍ය ව්‍යවසායක කටයුතු පිළිබඳ පිරිසිදු මතයක් ලබාදීම සඳහා මෙම ගැටළු මඟින් විගණකාධිපතිවරයා වලක්වයි. තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා බොහෝ විට එකක් හෝ වැඩි ගණනක් විශේෂිත තත්ත්වාගණනයක් ඇත. ගිණුම්කරණ ප්‍රමිත වාර්තාකරණයෙන් බැහැරවීම් තත්ත්වාගණනයෙන් නියෝජනය වේ. ව්‍යවසාය අවිධිමත් ලෙස ප්‍රමිතින් යොදා ගෙන ඇති බව සහ සම්මත ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවන බව එයින් දැක්වේ. අනෙක් තත්ත්වාගණනය විෂය පථය සීමා කිරීමයි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් එකක් හෝ වැඩි ගණනක් විගණකාධිපතිවරයාට සමාලෝචනය කළ නොහැකි විට විෂය පථය සීමා කිරීමෙන් දැක්වේ ලිඛිත සාක්ෂි ලබාගැනීමට නොමැතිවීම හේතුවෙන් විගණකාධිපතිවරයාට සමාලෝචනය කළ නොහැකි වූ මූල්‍ය තොරතුරු සඳහා පමණක් මෙම තත්ත්වාගණනය අදාළ වේ.

විගණකාධිපතිවරයා විසින් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කරන අවස්ථා :-

(අ) විගණකාධිපතිවරයාට ප්‍රමාණවත් අදාළ විගණන සාක්ෂි ලබාගැනීමට හැකිවන, සාවද්‍ය ප්‍රකාශයක් ලෙස නිගමනය කිරීමට හැකි වන එකක් හෝ සමස්තයක් වශයෙන් නමුත් මූල්‍ය ප්‍රකාශනවලට පැතිරී නොයන විට, හෝ

(ආ) මතය පදනම්ව ප්‍රමාණවත් අදාළ විගණන සාක්ෂි ලබාගැනීමට නොමැති වුවත් සොයා ගනු නොලැබූ සාවද්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විය හැකි බලපෑම් තිබේ නම් නිගමනය වන ප්‍රමාණාත්මක වුවත් පැතිරී නොයන අවස්ථාවක

මතය ව්‍යාවනය කිරීම

මතය පදනම් කර ගැනීම සඳහා අදාළ ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වූ විට, විගණකාධිපති විසින් මතය ව්‍යාවනය කරන අතර, මූල්‍ය ප්‍රකාශනවල සොයා ගත නොහැකි වූ ප්‍රමාණාත්මක හා පැතිරී යා හැකි සාවද්‍ය ප්‍රකාශයන් වේ නම් විය හැකි බලපෑම් ඔහු නිශ්චය කර ගනී. අවිනිශ්චිතාවයන් සම්බන්ධවන දුබල තත්ත්වයකදී විගණකාධිපතිවරයා මතය ව්‍යාවනය කරන අතර එක් එක් තනි අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන් අදාළ ප්‍රමාණවත් විගණන සාක්ෂි තිබියදීත්, අවිනිශ්චිතතාවයන් පිළිබඳ විය හැකි අන්තර් ක්‍රියාවන් සහ මූල්‍ය ප්‍රකාශන වලට එමඟින් විය හැකි සමුච්චිත බලපෑම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට නොහැකි වේ.

අහිතකර මතය

අහිත කර මතයක් යනු සුවිශේෂී සෘණාත්මක විගණන වාර්තා සඳහා මතයන් දෙකක් අතරින් රාජ්‍ය ව්‍යවසායකට ලැබෙන ඉතා අයහපත් විගණන වාර්තාවන් සඳහා මතයකි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරයා සොයා ගැනෙන සැලකිය යුතු ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අහිතකර විගණන මතයකින් දැක්වේ. මූල්‍ය වාර්තාකරණය ප්‍රමිතීන් මූල්‍ය ප්‍රකාශයන්ගෙන් තහවුරු නොවන බව හා තොරතුරු වැරදි සහගත සහ විශ්වාසදායී නොවන බව මෙම සාවද්‍ය ප්‍රකාශයන් පිළිබඳ නියමානුකූල අර්ථයයි. අහිතකර විගණන මතයන් සහිත රාජ්‍ය ව්‍යවසායයන් බැංකු සහ ණය දෙන්නන් අහිතකර විගණන මතයන් සහිත රාජ්‍ය ව්‍යවසායයන් බැංකු සහ ණය දෙන්නන් විසින් නියමාකාරව මඟ හරිනු ලැබේ. අදාළ ප්‍රමාණාත්මක විගණන සාක්ෂි ලබා ගැනීමේදී, තනි තනිව හෝ සමස්තයක් වශයෙන් හා මූල්‍ය ප්රකාශනවල ප්‍රමාණාත්මකව හා පැතිරියන සාවද්‍ය ප්‍රකාශයන් බව අවස්ථාවකදී විගණකාධිපතිවරයා විසින් අහිතකර විගණන මතයක් ප්‍රකාශ කරයි. විගණකාධිපතිවරයා විසින් රාජ්‍ය ව්‍යවසායන්ට සාවද්‍ය ප්‍රකාශයන් නිවැරදි කර ගැනීමට හා නව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයා විසින් අහිතකර මතයක් ප්‍රකාශ කිරීම ඉතා විරලය. මෙම මතය ප්‍රකාශ කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් ඔහුගේ විගණන වාර්තාවේ විස්තර කෙරෙන කරුණුවල වැදගත් බව හේතුවෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලින් මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව දන්වයි.

2013 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 181 ක නිකුත්කල විගණන වාර්තාවල ඇතුළත් විගණන මතය ඉකුත් වර්ෂ දෙක සමඟ සසඳා පහත දැක්වේ.

විගණන මතයේ ආකාරය	2013	2012	2011
තත්ත්වාගණනය නොකළ	11	16	12
තත්ත්වාගණනය කළ	107	144	156

ව්‍යාචනය කළ	-	8	8
අහිතකර	-	4	3
මෙතෙක් තීරණය නොකළ	43	2	-
මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ	20	7	2

අහිතකර මතයක් ප්‍රකාශ කිරීම සඳහා සලස්වන බරපතල සාවද්‍ය ප්‍රකාශයන් හේතුවෙන් විගණකාධිපතිවරයාගේ උපදෙස් පරිදි රාජ්‍ය ව්‍යවසායන් කිහිපයක් අදාළ පාලක මණ්ඩල විසින් තම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගන්නා ලදි. නව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කර විගණකාධිපතිවරයාගේ පරීක්ෂාවට ඉදිරිපත් කිරීම සඳහා එම ආයතන වලට උපදෙස් ලබාදෙන ලදි. එසේ සිදුකර සැලකිය යුතු ප්‍රමාදයකින් පසුවත් සමහර ආයතන තම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුන් නිසා මෙතෙක් විගණන මතය නිශ්චය කර නැත.

ඉහත දත්ත විශ්ලේෂණය කිරීමෙන්, 2013 වර්ෂයේදී තත්ත්වාගණනය කළ, අහිතකර හා විගණන මතය ව්‍යාචනය කිරීම අඩු කිරීම මඟින් වාර්තාකරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ සංවර්ධනයන් ඇති බව පැහැදිලි වේ.

ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම

සාමාන්‍යයෙන් විධිමත් වාර්තා එනම් ස්ථාවර වත්කම් ලේඛන (RFA), උපලේඛන හා ජංගම නොවන වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම දුර්වල වන අතර සමහර අවස්ථාවලදී ඉතාම දුර්වල වේ. දේපල, පිරියත හා උපකරණ (PPE) වශයෙන් ගිණුම්කරණයේදී හැඳින්වෙන පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ නොහැකි වත්කම් හා දේපල ජංගම නොවන වත්කම් වේ. ඉඩම් හා ගොඩනැඟිලි, මෝටර් වාහන, ලී බඩු, කාර්යාල උපකරණ, පරිගණක සවිකිරීම් සහ පිරියත හා යන්ත්‍රෝපකරණ වැනි විෂයයන් සාමාන්‍යයෙන් ස්ථාවර වත්කම් වලට ඇතුළත් වේ. විශාල සංස්ථාවක විද්‍යානුකූලව, ක්‍රමවත්ව හා යාවත්කාලීනව අංකනය නොකෙරේ නම් නිශ්චිත ස්ථාවර වත්කම් හඳුනා ගැනීම හා ස්ථානගත කිරීම ගැටළු සහගත විය හැක. බොහෝ ව්‍යාපාර වල පොදු ගැටළුව වී ඇත්තේ ස්ථාවර වත්කම් ලේඛණය ක්‍රමවත්ව පවත්වා නොගැනීමය. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික සත්‍යාක්ෂණය අසාර්ථක කාර්යයක් බවට පත්වන බව නිරීක්ෂණය විය. විධිමත් වාර්තා පවත්වා ගැනීම සහ ස්වකීය වත්කම් ආරක්ෂා කර ගැනීම පිළිබඳ වගකීමක් ව්‍යවසායන්හි කළමනාකාරිත්වයන් සතු වේ. බොහෝ අවස්ථාවන්හිදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස වත්කම් පිළිබඳ පැවැත්ම හා තත්ත්වය තහවුරු කර ගත නොහැකි විය.

වගකිව යුතු නිලධාරීන් විසින් වැඩ නිම කිරීම් සහතික නිකුත් කිරීම ප්‍රමාදවීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ වලින් ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීත කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවන බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් හා ලංකා විදුලි බල මණ්ඩලය විසින්

නිම කරන ලද විදුලි බල ව්‍යාපෘති වලදී ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය විය. ජාතික අධිවේගී මාර්ග හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිම කරන ලද වෙනත් ප්‍රධාන මාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් ද මෙම තත්ත්වය නිරීක්ෂණය විය. ප්‍රාග්ධනිත කිරීමේ වැදගත්කම විගණනය විසින් පෙන්වාදීමෙන් පසුව මෙම තත්ත්වය පසුව නිවැරදි කර, මෙම මාර්ගවල පිරිවැය ප්‍රාග්ධනිත කර තිබූ අතර එය මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කර තිබුණි.

1978 දෙසැම්බර් 19 වෙනි අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුකූලවීම සඳහා සියළු රාජ්‍ය ව්‍යවසායන් විසින් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර තබාගත යුතු බව අවධාරණය කෙරේ. එක් එක් ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර තබා ගැනීමේ ක්‍රියාමාර්ගය වත්කම් පාලනය හා තහවුරු වීම හා වත්කම් සාවද්‍ය පරිහරණයෙන් වලක්වා ගැනීම තහවුරු කර ගැනීමට ආයතනයකට පහසුකම් සලසයි. ක්ෂය ගණනය කිරීම, බදු සඳහා සහ රක්ෂණ කාර්යයන් සඳහා ඉඩ සැලසෙන එයින් වත්කම් වල නිවැරදි වටිනාකම තබා ගැනීමේ ක්‍රියාමාර්ගයක්ද වේ. ස්ථාවර වත්කම් ලේඛනය කළමනාකරණ අවශ්‍යතාවලට ගැලපෙන සම්පූර්ණ සහ නිවැරදි වාර්තා ජනනය කරයි.

රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳ වාර්තාද අසම්පූර්ණ හා බව නිරීක්ෂණය වූ අතර පැවැත්ම හා අයිතිය තහවුරු කර ගැනීම සඳහා පිහිටි ස්ථානය හා ප්‍රමාණය සහිතව විස්තරාත්මක උපලේඛනයක් සැපයීමටද හැකි තත්ත්වයක නොවීය.

කෙසේ වුවද ආයතන සැලකිය යුතු සංඛ්‍යාවක් ඔවුන්ගේ වත්කම් අනිවාර්යෙන් සාධාරණ අගය පදනමට ගෙන ඒම සඳහා නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යොදා ගැනීමට දැනට ඔවුන්ගේ වත්කම් හඳුනා ගැනීම හා රජයේ ප්‍රධාන තක්සේරුකරු මඟින් තක්සේරු කර ගැනීම සිදුකරමින් තිබෙන බවද නිරීක්ෂණය විය.

වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා රඳවා ගැනීම සඳහා ස්වාධීනත්වය නොමැතිවීම

වානිජමය තීරණ ගැනීමේදී හා පුහුණු කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීමේ දී බලපාන විවිධ අනුමත කිරීමේ අවශ්‍යතාවයන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපානු ලබයි. මෙම සීමා කිරීම හේතුවෙන් බොහෝ ව්‍යවසායන් ඉහළ වැටුප් මත කොන්ත්‍රාත් පදනමින් වෘත්තීයන් බඳවා ගැනීම සිදුකරන බව නිරීක්ෂණ විය. පුද්ගලික අංශය සමඟ සැසඳීමේදී ඉතා අඩු වැටුප් ව්‍යුහයක් හේතුවෙන් විශේෂයෙන් ගණකාධිකාරිවරුන්, ඉංජිනේරුවරුන් හා තක්සේරුකරුවන් ආදී තනතුරු සඳහා බඳවා ගැනීමට හා වෘත්තීමය සුදුසුකම් ලාභීන් රඳවා ගැනීමට රාජ්‍ය ව්‍යවවසායන්ට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

අනුප්‍රාප්තික සැලැස්මක් නොමැතිවීම

ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් සංස්ථාව වැනි සමහර ප්‍රධාන ආයතනවල ප්‍රධාන කළමනාකාරිත්ව තනතුරු පුරප්පාඩු සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් පිරවීමට කටයුතු කිරීමෙන් තොරව දීර්ඝ කාලයක් පැවති බව නිරික්ෂණය විය. මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව ආයතනවල ප්‍රධාන තනතුරු ආවරණය කිරීම සඳහා කිසිඳු අනුප්‍රාප්තික සැලැස්මක් පිළියෙල කර නොතිබීමයි. මෙම තත්ත්වය, වැඩ බැලීම් ක්‍රියාවලියක් මඟින් කටයුතු කිරීමට එම ව්‍යවසායන්ට ඉඩදී තිබූ අතර අවසානයේදී වැඩ ප්‍රමාදවීම් සිදුවී තිබුණි.

ආයතන විසින් ගෙවන ලද උපයන විට ගෙවීම් බදු

රාජ්‍ය ව්‍යවසායන් 53 ක් විසින් ආදායම් බදු නීතිය මත ඇති මූලික තාර්කිකයට එරෙහිව තම අරමුදල් වලින් ස්වකීය නිලධාරින් සඳහා උපයන විට ගෙවීම් (PAYE) බදු ගෙවා තිබුණි. එබැවින් ආයතනයෙන් ආයතනයට වෙනස් නොවන පරිදි උපයන විට ගෙවීම් බදු පියවීම සම්බන්ධයෙන් ස්ථිර තීරණයක් මහා භාණ්ඩාගාරය විසින් ගත යුතු බව අවධාරණය කෙරේ. එසේ ගෙවන ලද මුළු මුදල 2013 වර්ෂය සඳහා රු.මිලියන 1,541 ක් වූ අතර 2012 වර්ෂය සඳහා රු.මිලියන 1,485 ක් විය. ඒ අනුව උපයන විට බදු ගෙවීමේ අරමුණු සාක්ෂාත් නොවන අතර අනිත් අතට සියළු රාජ්‍ය නිලධාරින්ට කරන සාධාරණ සැලකීම උල්ලංගණය කිරීමක්ද වේ.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

2013 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසායන් 160 ක මූල්‍ය ප්‍රකාශන 2013 සැප්තැම්බර් 30 වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වර්ෂය අවසානවී මාස 9 ක් ඉකුත්වීමෙන් පසුවත් ආයතන 15 ක් විසින් තම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම ආයතන පහත ලැයිස්තුගත කර ඇත. 2014 සැප්තැම්බර් 30 දින වන විට මාස 21 ක් ප්‍රමාද වී තිබුණද, ආයතන 07ක් විසින් 2012 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

ආයතනයේ නම	ආයතනයේ නම
මූල්‍ය අධ්‍යයන ආයතනය	වී අලෙවි මණ්ඩලය
සමූපකාර තොග වෙළඳ සංස්ථාව	රණවිරු සේවා අධිකාරිය
ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය	සෞම්‍යමූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම
ශ්‍රී ලංකා තක්සේරු ආයතනය	ශ්‍රී ලංකා පිඟන් සංස්ථාව
ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය	ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ මණ්ඩලය	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
	නාගරික සංවර්ධන අධිකාරිය

වගුව 11 - 2013 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකළ රාජ්‍ය ව්‍යවසායයන්

ආයතන 68 ක මූල්‍ය ප්‍රකාශනවල තිබූ බරපතල සාවද්‍ය ප්‍රකාශයන් මා විසින් පෙන්වා දීමෙන් පසුව අහිතකර විගණන මතයක් ප්‍රකාශ කිරීම වැලැක්වීම සඳහා ඔවුන්ගේ එම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගෙන තිබුණි.

2002 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනයට ලැබුණු දින සිට දින 30 ක කාලයක් ඇතුළත අදාළ රාජ්‍ය ව්‍යවසායට විගණන වාර්තාව නිකුත් කිරීම හැකි වන පරිදි රාජ්‍ය ව්‍යවසායන් විසින් ඔවුන්ගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා අදාළ මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු අතර අදාල මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත රාජ්‍ය ව්‍යවසායන් විසින් වාර්ෂික වාර්තා හා විගණිත මූල්‍ය ප්‍රකාශන පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. භාණ්ඩාගාර ලේකම් විසින් 2002 මැයි 24 දිනැති අංක පීඑෆ් /පීඊ/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් නියෝග නිකුත් කර තිබුණි.

අත්තිකාරම් නිරවුල් කිරීම

භාණ්ඩ දැනටමත් මිලදී ගෙන හා සේවා දැනටමත් ලබාගෙන තිබුණද, එම වියදම් ලෙස ගිණුම්ගත කිරීමෙන් තොරව දීර්ඝ කාලයක් අත්තිකාරම් ලෙස විශාල මුදල් ප්‍රමාණයක් ගිණුම්වල පවතින බව නිරීක්ෂණය විය. සමහර අවස්ථාවලදී පෙර ලබාදී තිබූ අත්තිකාරම් නිරවුල් කිරීමෙන් තොරව එම නිලධාරියාට නැවත අත්තිකාරම් කිහිපයක් ලබාදී තිබුණි.

පරිපාලිත සමාගම් සංස්ථාපනය කිරීම

සමහර අවස්ථාවලදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව ආයතන සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගම් සංස්ථාපනය කර තිබීම නිරීක්ෂණය විය. මෙසේ කටයුතු කිරීම ප්‍රධාන ආයතනයේ කාර්යයන් දියාරු කිරීමක් මෙන්ම ඒවායේ මෙහෙයුම් විගණකාධිපතිවරයාගේ පරීක්ෂාවට භාජනය කිරීමක්ද සිදුනොවේ. ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් සංස්ථාව වැනි සමහර උපාය මාර්ගික ආයතන විශාල ප්‍රමාණයක පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් පිහිටුවා ඇත. අදාල ආයතනයේ ප්‍රධාන කොටස් අයිතිකරු වශයෙන් පාලක මණ්ඩලයද නියෝජනය කරයි. එහෙත් අදාල ආයතනයන්හි පාලන බලතල ක්‍රියාත්මක කිරීම ඉතා දුර්වල තත්ත්වයක පවතින බවද තවදුරටත් නිරීක්ෂණය විය.

උපාය මාර්ගික ව්‍යාපාර ව්‍යවසායන් (SBES)

මෙම ව්‍යවසායන් වූ කලී වෙනත් පුද්ගලික සමාගම් මෙන් භාණ්ඩ සේවා සැපයීමේ යෙදී සිටින ව්‍යාපාරයන් හෝ සමහර අවස්ථාවලදී පුද්ගලික අංශය සමඟ සක්‍රීය තරඟකාරිත්වයක් ඇති ව්‍යාපාරයන් වේ. ආර්ථිකයේ සාමාන්‍යයෙන් ඒකාධිකාරී ලෙස සැලකෙන ක්ෂේත්‍රවල මෙම උපාය මාර්ගික ව්‍යවසායන් පොදුවේ දක්නට ලැබේ. අදාළ උපාය මාර්ගික ව්‍යවසායන් මඟින් පමණක් කටයුතු සිදුකරනු ලබන අතර තරඟකාරිත්වයට හා පුද්ගලික අංශයේ සහභාගීත්වයට පහසුවෙන් විවෘත නොවේ. සම්පත් හා උපයෝගිතා පදනම් ව්‍යාපාරයන්හි (උදා :- විදුලි බලය , ජලය, ඛනිජ තෙල් නිෂ්පාදන ආදිය) පුළුල්ව පැතුරුණු සහභාගීත්වයක් ඇත.

කෙසේ වුවද ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, රාජ්‍ය බැංකු වැනි ඇතැම් උපාය මාර්ගික ව්‍යවසායන්ද පවතී. ඒ අනුව ක්‍රියාත්මකව පවතින ව්‍යවසායන් 39 ක් (සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා විගණකාධිපතිවරයාගේ විෂය පථයට නොවැටෙන) උපාය මාර්ගික රාජ්‍ය ව්‍යවසායන් යටතේ වර්ගීකරණය කළ හැකි අතර එයින් ව්‍යවසායන් 28 ක් පමණක් 2013 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 30 වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2012 වර්ෂයේදී ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) පදනම්ව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අනුගමනය කිරීමත් සමඟ උපාය මාර්ගික ව්‍යවසායන්ටද ඒවා යොදා ගැනීමට යොමු කරවන ලදි. කෙසේ වුවද සාධාරණ අගය පදනම් කර ගෙන යම්තාක් දුරකට මෙම නව ප්‍රමිතීන් වලට අනුකූලවන පරිදි තම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට මෙම ව්‍යවසායන් බොහොමයකට හැකි වූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද නිපුණතාවය හා තාක්ෂණික සහාය නොමැතිවීම හේතුවෙන් තම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඇතැම් ව්‍යවසායන් මහත් පරිශ්‍රමයක් දරා තිබුණි. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම් පෙන්වාදීම මඟින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර ගැනීමට එම ආයතනයන්ට සාධාරණ අවස්ථාවන් ලබාදුන් බව මම මෙහිදී සඳහන් කළ යුතුය. මෙම බොහෝ ආයතන ධනාත්මක පියවරක් ලෙස මෙය භාරගනු ලැබූ අතර, අහිතකර විගණන මතයක් ප්‍රකාශ කිරීම වැළැක්වීම සඳහා හේතු සහගතව සාධාරණව තම මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබීය. මෙම නව වැඩ පිළිවෙල යටතේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් විය. ප්‍රමාදවීම් සිදුවී තිබුණද හේතු සහගතව සාධාරණව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් අවසානයේදී ගණන්දීමේ වගකීම බොහෝදුරකට ඉහළ නැංවී තිබුණි.

මෙම විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හි විශාල ආයෝජනයන් සැලකීමේදී, ස්වකීය ආදේශ කිරීම්, ව්‍යාප්ත කිරීම් හා වර්ධනයන් සඳහා ප්‍රමාණවත් අතිරික්තයක් ඔවුන් විසින් උත්පාදනය කර ගැනීම අපේක්ෂා කෙරේ. ව්‍යාපාර හා වාණිජමය ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් සිදුකරන රාජ්‍ය ව්‍යවසායන් පුළුල් කිරීම සඳහා ස්වයං මූල්‍යායනය විශේෂිත වගකීමක් ලෙස සිදුකර ගත යුතුය. ඔවුන්ගේ පිරිවැය ආවරණය කර ගැනීම සඳහා පමණක් නොව ආයතනයේ මූල්‍ය සංවර්ධන සැලසුම් සඳහා අතිරික්තයක්ද උත්පාදනය කර ගත යුතුය.

විගණනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද එම ව්‍යවසායන් 28 ක ඉකුත් වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් රු.මිලියන 362,192 ට සාපේක්ෂව 2013 වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් එකතුව රු.මිලියන 404,917 ක් විය.

අහිතකර ශුද්ධ වත්කම් තත්ත්වය

ලංකා ඛනිජ තෙල් සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය ආරම්භයේදී ලාභ පෙන්වා තිබුණද, මෑත කාලයේදී දිගින් දිගටම මෙම ව්‍යවසායන් දෙක පාඩු පෙන්වා තිබුණි. 2013 දෙසැම්බර් 31 වන විට සමුච්චිත පාඩු එකතුව සීඝ්‍රයෙන් වැඩිවී තිබුණු අතර මෙම තත්ත්වය මෙම ව්‍යාපාරයන්හි ශුද්ධ වත්කම් තත්ත්වයට අහිතකරව බලපා තිබුණි. ඉකුත් වර්ෂයේ රු.මිලියන 228,797 ක් වූ ඍණාත්මක ශුද්ධ වත්කම් අගය එකතුව සමඟ සැසඳීමේදී 2013 වර්ෂය අවසානයට එය රු.මිලියන 236,826 ක් විය. මෙම ව්‍යාපාරයන්හි ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු.මිලියන 288,993 කින් ඉක්මවා තිබුණු බව තවදුරටත් නිරික්ෂණය විය. ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර වූ අහිතකර වෙනස දීර්ඝ කාලයක සිට පැවත එමින් තිබුණි. ජංගම වත්කම් මඟින් ජංගම වගකීම් පියවීමේ නොහැකියාව අවිනිශ්චිත තත්ත්වයක් පෙන්නුම් කරන අතර මෙම ව්‍යාපාරයන් විශාල මූල්‍ය අර්බුදයකට මුහුණ දෙන අතරම මහා භාණ්ඩාගාරයේ සහාය නොමැතිව ඒවායේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැකයක්ද පවතී.

මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙම ආයතන 28 හි වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය එකතුව රු.මිලියන 48,261 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ පාඩුවේ එකතුව රු.මිලියන 101,320 ක් වුයෙන් රු.මිලියන 149,581 කින් ලාභයේ වැඩිවීමක් දැක්වුණි. 2013 වර්ෂයේදී මෙම ආයතනවල මූල්‍ය කාර්ය සාධනයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණේ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ පාඩුව අඩුකිරීම හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් එකතුව රු.මිලියන 18,593 ක් වූ ලාභයක් ඉපැයීමයි. 2013 වර්ෂයේදී එම ආයතන 28 අතුරින් ආයතන 3 ක් එකතුව රු.මිලියන 8,370 ක පාඩු දරා තිබුණු අතර ආයතන 25 ක් එකතුව රු.මිලියන 56,632 ක ලාභ උපයා තිබුණි. ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව, හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන ආයතන 3 විසින් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පසු ගිය වර්ෂ 4 ක කාලයක් සඳහා අඛණ්ඩව පාඩු දරා තිබුණි. මේ අතර ලංකා විදුලි බල මණ්ඩලය හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ඉකුත් වර්ෂයේ දරන ලද රු.මිලියන 61,489 ක පාඩුවට එරෙහිව එකතුව රු.මිලියන 18,712 ක ලාභ ඉපැයීම් මඟින් 2013 වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් දැක්වීමට හැකිවී තිබුණි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ද එහි අලාභය රු. මිලියන 81,836 කින් අඩුකර ගනිමින් 2013 වර්ෂයේ දී වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. ආයතන 16 ක් පමණක් තම ලාභය වර්ධනය කර ගැනීමට හෝ පසුගිය වර්ෂයේ පාඩුවට එරෙහිව ලාභ උපයා ගැනීමට සමත්වී තිබුණි. ආයතන 12 ක ලාභ ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී රු.මිලියන 17,226 කින් පිරිහී තිබුණි.

දුර්වල කාර්ය සාධනයක් ඇති ව්‍යවසායන්හි ලාභදායිත්ව මට්ටම් හා 2008 වර්ෂය සිට 2013 දක්වා ඔවුන්ගේ අදාළ කාර්ය සාධනයන් පිළිබඳ විශ්ලේෂණයේදී මෙම කාල පරිච්ඡේදයේ අවසන් වර්ෂය තුළදී දුර්වල කාර්ය සාධනයක් ඇති වීමට හේතුව එම කාල පරිච්ඡේදයේ මුල් වර්ෂයන්හි පැවති පිරිහීමේ ප්‍රවණතාවය උග්‍ර ලෙස වැඩිවීමේ ප්‍රතිඵලය

බව දැක්වේ. මෙම කාල පරිච්ඡේදය තුළ දුර්වල කාර්ය සාධනයක් දක්වන ව්‍යවසායන්හි සැබෑ ස්වරූපය ඒවායේ ලාභදායිත්වය වාර්ෂිකව විශාල ප්‍රමාණයකින් පහත වැටීම තුළින් නිරූපණය විය.

ප්‍රතිලාභ අනුපාතිකය මඟින් පෙන්වා ඇති පරිදි විශේෂිත ව්‍යාපාර රාජ්‍ය ව්‍යවසායන් අතර කාර්ය සාධනයේ විශාල විචලනයක් දැකිය හැක. රාජ්‍ය ව්‍යවසායන්හි මුළු වත්කම් මත ප්‍රාග්ධන යෙදවුම් මත ප්‍රතිලාභය (Roce) 2012 වර්ෂයේ සියයට - 43.4 සිට සියයට 90.5 දක්වා වූ පරාසය සමඟ සැසඳීමේදී 2013 වර්ෂයේ සියයට - 17.9 සිට සියයට 83.4 දක්වා වූ පරාසයකට විචලනය වී තිබුණි. 2013 වර්ෂය සඳහා සාමාන්‍ය වාර්ෂික ප්‍රාග්ධන යෙදවුම් මත ප්‍රතිලාභය සියයට 1.1 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ - 2.4 සමඟ සැසඳීමේදී 2013 වර්ෂයේ වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

කෙසේ වුවද ලංකා ඛනිජතෙල් සංස්ථාව හා ලංකා විදුලිබල මණ්ඩලය වැනි ව්‍යවසායන්හි ඌනතාවයන් ඉතා විශාල ලෙස වැඩි වුවද රාජ්‍ය ආදායමින් ඍජුව හෝ වක්‍රව කෙරෙන සහනාධාර සැපයීමෙන් අවශ්‍ය ඉතිරිය සපයන අතර ඇවර කිරීමක් නොමැතිව පවත්වා ගෙන යයි. මාගේ පෙර වර්ෂයේ වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දුන් පරිදි රාජ්‍ය බැංකු දෙකක් මඟින් ණය පහසුකම් සැපයීම මත ලංකා ඛනිජතෙල් සංස්ථාව සහ විදුලිබලය උත්පාදනයට ලංකා ඛනිජතෙල් සංස්ථාව විසින් දැවි තෙල් සපයන ලංකා විදුලි බල මණ්ඩලය වැනි විශාල රාජ්‍ය ව්‍යවසායන්හි අන්තර් යැපීම ඉතා අයහපත්වේ. රජය සතු වාණිජ බැංකු දෙකෙහි අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය පවත්වා ගැනීම කෙරෙහි මෙම තත්ත්වය ඉතා අහිතකර අන්දමින් බලපා ඇත.

මෙම රාජ්‍ය ව්‍යවසායන්හි අති විශාල ආයෝජනයන් සැලකීමේදී ස්වකීය ආදේශ කිරීම් ,ව්‍යාප්ත කිරීම් හා වර්ධනයන් සඳහා මෙන්ම ඉදිරි සංවර්ධනයන් සඳහා ඔවුන් විසින් ප්‍රමාණවත් අතිරික්තයක් උත්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. පුළුල් කිරීම් සඳහා ස්වයං මූල්‍යායනය, ව්‍යාපාර හා වාණිජ ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් කෙරෙන රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ විශේෂිත වගකීමක් සිදු කළ යුතුය. එවැනි ව්‍යවසායන් ඔවුන්ගේ පිරිවැය ආවරණය කිරීම පමණක් නොව රටේ මූල්‍ය සංවර්ධන සැලසුම් සඳහා අතිරිත්තයක්ද උත්පාදනය කළ යුතුය.

විශේෂිත ව්‍යාපාර ව්‍යවසායන්හි පාඩු හා දුර්වල කාර්ය සාධනය පහත සඳහන් විවිධ කරුණු ඇතුළත්ව හඳුනා ගත හැක.

- භාණ්ඩාගාරයේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම.
- සේවක අතිරික්තය, ඉහළ පොදු කාර්ය වියදම් හා අඩු ඵලදායීතාවය.
- පැහැදිලි ගණන් දීමේ වගකීම හා කාර්ය සාධන ඇගයීම් නොමැති විම.
- අයහපත් වාණිජ පරිචයන්.
- මිල පිළිබඳ රජයේ පාලනයන්.
- රජයේ ඉල්ලීම මත වාණිජමය නොවන කටයුතු ක්‍රියාවේ යෙදවීම.
- අදාළ නොවන පහසුකම්, පිරියත හා උපකරණ වල දුර්වල තත්ත්වය.

- පුහුණු කාර්ය මණ්ඩලය නොමැතිවීම හා ඉහළ සේවක පිරිවැටුම
- සාර්ථක හා අසමත්වීමේ පුද්ගල ප්‍රතිඵල නොමැතිවීම (සේවක පෙළඹවීම)

රජය සතු සීමිත වගකීම් සමාගම්

තවද රාජ්‍ය ආකාරයේ ව්‍යවසායන් කිහිපයක් රටේ පවතී. එම සමාගම්වල කොටස් වලින් වැඩි ප්‍රමාණයක් රජය (මහා භාණ්ඩාගාරය) සතු වේ. මෙම සමාගම්, සමාගම් පනත යටතේ ස්ථාපිත සමාගම් වන අතර, එබැවින් විගණකාධිපතිවරයාගේ පරීක්ෂාවට යටත් නොවේ. සමහර විට මෙම සමාගම් සම්පූර්ණයෙන් රජය සතුවන හෝ රාජ්‍ය පුද්ගලික බද්ධ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන කොටස් ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් රජය සතුවන සමාගම් වේ. සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යවසායන් කෙරෙහි වන බොහෝ ගැටළු වළක්වා ගැනීමට පුද්ගලික අංශයේ මැදිහත්වීම පාලන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමක් නොමැතිව අදාළ පුද්ගලික ව්‍යවසායන් මගින් ප්‍රාග්ධනය යොදවන පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ලෙස රාජ්‍ය ව්‍යවසායන් මගින් ඇති කරන ලද හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද රජය සතු සමාගම්ද පවතී. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තියෙන් අපේක්ෂිත පරිදි රාජ්‍ය මුල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුවට තබා ගැනීමෙහිලා සහාය වීමට හැකිවන පරිදි විගණකාධිපතිවරයාගේ විෂය පථය සහ ආවරණය පුළුල් කිරීමට අවශ්‍ය වේ.

රාජ්‍ය ව්‍යපාර කාරක සභාවේ පරීක්ෂාව සඳහා ඇතැම් සමාගම් කැඳවූ අවස්ථාවලදී එම සමාගම් විසින් පෙනී සිටීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවන්ද විය. රජය මගින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ එසේ නොමැති නම් සෘජුව හෝ වක්‍රව රාජ්‍ය සම්පත් සපයමින් ඕනෑම ලිඛිත නීතියක් යටතේ ඕනෑම කෙනෙකුට හෝ ස්ථාපනය කරන ලද අධිකාරියක් ආවරණය කිරීම සඳහා කෙටුම්පත් විගණන පනතට දැනටමත් සංශෝධන යෝජනා කර තිබූ බව නිරික්ෂණය විය. මෑත කාලයේදී ඇතැම් රාජ්‍ය ව්‍යවසායන් විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් තොරව පවා සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගම් විශාල ප්‍රමාණයක් සංස්ථාපනය කර තිබූ බව නිරික්ෂණය විය.

කොටස් වලින් සියයට 100 ක්ම රජය හෝ රාජ්‍ය ව්‍යවසායක් සතුවන සීමිත වගකීම් සමාගම්වල අධ්‍යක්ෂවරු පත්කිරීමේ බලය රජය සතුවන අතර කිසිදු පුද්ගලික තැනැත්තෙකුට ලාභයෙන් කොටසක් ලැබිය නොහැකිය.එය සැබැවින්ම රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රජය විසින් සරල කොටස් විකිණීමක් යන කරුණින් බැහැරව සාමාන්‍ය " පුද්ගලික අංශයේ " සමාගමකට පරිවර්තනය කිරීම ප්‍රමාණවත්වීම හා සමාන වේ.කොටස් වලින් සියයට 50 කට අඩු ප්‍රමාණයක් විකිණීමේදී ද සමාගම් අධ්‍යක්ෂවරු පත් කිරීමේ බලය රජය සතුවේ . කොටස් වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් විකිණීමේදීද රජය ආයතනික ප්‍රතිපත්තියට බලපෑම් කිරීමට හැකි වන ප්‍රමාණවත් බලවත් තත්ත්වයක ඇත. කෙසේ වුවද බොහෝ රාජ්‍ය සංස්ථා විසින් පරිපාලනයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත වුවද ඔවුන්ගේ පාලන බලතල පරිපාලනයන් සඳහා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

පසුගිය වර්ෂ කිහිපය තුළම ශ්‍රී ලන්කන් ගුවන් සමාගම හා මිහින් ලංකා සමාගම විශාල අඛණ්ඩ පාඩු ලබා තිබුණි.මෙම ගුවන් සමාගම් දෙක විසින් 2013 මාර්තු 31 දිනට ලබා තිබූ සමුච්චිත පාඩුව රු.මිලියන 90,963 ක් විය. මෙම තත්ත්වය මෙම සමාගම් දෙකෙහි ශුද්ධ වත්කම් තත්ත්වයට ඉතා අයහපත් අන්දමින් බලපා තිබූ අතර පෙර වර්ෂයේ ඍණාත්මක ශුද්ධ අගයේ එකතුව රු.මිලියන 35,833 සමග සැසඳීමේදී 2013 දෙසැම්බර් 31 දිනට ඍණාත්මක ශුද්ධ අගයේ එකතුව රු. මිලියන 52,912 ක් ලෙස වාර්තා විය. ජංගම වගකීම් රු. මිලියන 22,364 කින් ජංගම වත්කම් ඉක්මවා තිබුණු බවද නිරීක්ෂණය විය. ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර අහිතකර විචලනය 2007/2008 සිට අඛණ්ඩව පැවත එමින් තිබුණි.ජංගම වත්කම් වලින් ජංගම වගකීම් පියවීමට වන නොහැකියාව මෙම ගුවන් සමාගම් දෙක බරපතල මූල්‍ය අර්බුදයකට මුහුණ දීම මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සැක සහිත බවද සහිත අවිනිශ්චිත තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

ලාභ මූලික නොවන අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්

මෙම ව්‍යවසායන් නියාමන හා අධීක්ෂණ ආයතන, විශ්ව විද්‍යාල, පර්යේෂණ හා අනෙකුත් පුහුණු ආයතන හා වෙනත් සංවර්ධන හා ලාභ මූලික නොවන ආයතනයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනවල ප්‍රධාන ලක්ෂණය නම් වාර්ෂික රජයේ ප්‍රදාන හෝ සමහර භාණ්ඩ හා සේවා මත රජය පනවන ලද බදු එම ආයතනවල ප්‍රධාන ආදායම් ප්‍රභවය වීමයි. මෙම ආයතන 99 ක මූල්‍ය ප්‍රකාශන අනුව, මහා භාණ්ඩාගාරය විසින් 2013 වර්ෂයේදී මෙම ආයතන වලට ලබා දෙන ලද රු.මිලියන 21,850 ක පුනරාවර්තන ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසු එකතුව රු.මිලියන 48,730 ක්වූ වියදමට වැඩි අතිරික්තයක් උපයා තිබුණි. කෙසේ වුවද මහා භාණ්ඩාගාරයෙන් සපයන ලද පුනරාවර්තන ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසුවත් ආයතන 27 ක් එකතුව රු.මිලියන 772 ක ශුද්ධ ඌනතාවයන් දරා තිබුණි. එය ඉකුත් වර්ෂයේ ආයතන 28 ක එකතුව රු.මිලියන 1,256 ක ශුද්ධ ඌනතාවය සමග සැසඳීමේදී ශුද්ධ ඌනතාවයන්හි රු.මිලියන 484 ක සැලකිය යුතු අඩුවීමක් දැක්වුණි.

විදේශ මුල්‍යාපන ව්‍යාපෘති

විදේශ මුල්‍ය උපයෝජනය

ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායමේ කැපී පෙනෙන වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශ මුල්‍ය ණය සම්බන්ධ සංයුතියේ වෙනස්වීමක් සිදුවී තිබුණි. ඒ අනුව විදේශ අරමුදල් ප්‍රමාණය, එහි මුලාශ්‍රයන් හා සැකැස්ම ප්‍රවර්තන වර්ෂය තුළදී වෙනස්වී තිබුණි. විදේශීය සෘජු ප්‍රදාන හා සහනදායී කොන්දේසි මත ලබාගත් විදේශීය ණය ප්‍රමාණය විශාල වශයෙන් අඩුවී තිබුණු අතර ද්වි පාර්ශවික හා බහු පාර්ශවික මූලාශ්‍රයන් ලබාගත් ණය ප්‍රමාණය, මිශ්‍ර කොන්දේසි මත ලබාගත් ණය ප්‍රමාණය හා මුදල් වෙළඳපොලෙන් ලබාගත් ණය ප්‍රමාණය ඉහල ගොස් තිබුණි. 2013 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට ඇ.එ.ජ. ඩොලර් මිලියන 2,302 ක් විදේශ ණය වශයෙන්ද ඇ.එ.ජ. ඩොලර් මිලියන 205.6 ක් ප්‍රදාන වශයෙන්ද ලැබී තිබුණි. විදේශ ණය වලින් ඇ.එ.ජ. ඩොලර් මිලියන 1,479.4 ක් ද්වි පාර්ශ්වික වශයෙන්ද ඇ.එ.ජ. ඩොලර් මිලියන 455 ක් විදේශ ප්‍රදාන වශයෙන්ද ලැබී තිබුණි. ලබාගත් විදේශ ණය වලින් සියයට 17 ක් ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය සඳහාත් සියයට 12 බැගින් සෞඛ්‍ය හා සමාජ සංවර්ධන, විදුලි බල හා බල ශක්ති සහ ප්‍රවාහන අංශ සඳහාත් සියයට 9 ක් අධ්‍යාපන අංශය සඳහාත් වෙන්කර තිබුණි.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අනුව, 2013 වර්ෂය සඳහා පියවිය යුතු රජයේ විදේශ ණය ප්‍රමාණය ඇ.එ.ජ ඩොලර් බිලියන 18.9 ක් විය. සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගත් ණය සහ ජාත්‍යන්තර ස්වෛරීයත්ව බැඳුම්කර මත ලබාගත් ණයද මීට ඇතුළත් විය. 2013 වර්ෂය තුළදී ප්‍රාග්ධන ණය වාරික වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 70.5 ක් ගෙවා තිබුණු අතර පොලී වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 454 ක් ගෙවා තිබුණි. ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනය සමඟ සසඳන විට ණය සියයට 35 ක් විය. එය 2013 වර්ෂයේ අපනයන ආදායම හා සසඳන කළ සියයට 220 ක් විය. විදේශ ණය සේවා අනුපාතය දළ ජාතික නිෂ්පාදනය සමඟ සැසඳීමේදී සියයට 3.6 ක් වු අතර අපනයන ආදායම සමඟ සැසඳීමේදී විදේශ ණය සේවා අනුපාතය සියයට 15.2 ක් විය.

ශ්‍රී ලංකාවේ විදේශ ණය සංයුතියේ මෑත කාලීනව සිදුවූ වෙනස්වීම් පහත පරිදි සාරාංශ කර දැක්වේ.

(අ) විදේශ ණය සපයන ආයතන වලින් ණය ලබාගැනීම වෙනුවට ශ්‍රී ලංකා රජය රාජ්‍ය මුල්‍ය ඒකාබද්ධ උපක්‍රමශීලී සැලැස්ම යටතේ විදේශීය හා දේශීය ප්‍රාග්ධන වෙළඳපලෙන් සෘජු ණය ලබාගැනීම සඳහා රජය සතු ව්‍යාපාර පෙළඹවනු ලැබීය. මේ යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට සිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති 64 ක් මූල්‍යනය කිරීම සඳහා රු.බිලියන 151 ක් දේශීය බැංකු වලින් ණය ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික පාසැල (NSBM), කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය යන ආයතන සඳහා දේශීය බැංකු ක්‍රමයේ රු.බිලියන 51.82 ක මුදලක් ණය ගැනීමට අනුමැතිය පලකර තිබුණි.

(ආ) මිල නොකැඳවූ සංවර්ධන යෝජනාවන් (Unsolicited Development Proposals) මත ලබාගත් දේශීය හා විදේශීය ණය ප්‍රමාණය මෑතකදී වැඩිවී තිබේ. මේ අනුව 2010 අගෝස්තු 04 දිනැති අංක 444 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2011 මැයි 16 දිනැති අංක 444(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය යන චක්‍රලේඛ මඟින් එවැනි ණය යෝජනාවක් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් හඳුන්වාදී තිබේ. ඒ අනුව රේඛීය අමාත්‍යාංශ විසින් ලබාගනු ලබන සංවර්ධන යෝජනාවන් වලට සම්බන්ධ ශක්‍යතා අධ්‍යයන වාර්තා අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ. ඉන් අනතුරුව අදාල යෝජනා ජාතික සංවර්ධන සැලැස්මට අනුරූප වන පරිදි ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව යනාදී ආයතන විසින් විශ්ලේෂණය කරනු ලැබේ. මේ යටතේ ලබාගනු ලබන විදේශ ණය සම්බන්ධ අවශ්‍යතා විශ්ලේෂණය හා රාජ්‍ය ආයෝජන උපයාමාර්ග සමඟ සැසඳීම් යනාදිය විදේශ සම්පත් දෙපාර්මේන්තුව යටතේ වූ ණය ඇගයීම් කමිටුවක් මඟින් සිදුකරනු ලැබේ. මිල නොකැඳවූ සංවර්ධන යෝජනාවක් ක්‍රියාත්මක කිරීමේදී ලංසු කැඳවීම මඟින් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා ප්‍රමුඛත්වයක් නොලැබෙන බැවින් ඒ සම්බන්ධ රාජ්‍ය විගණන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම දෙපාර්තමේන්තුවට අභියෝගයක් වී තිබේ. මෙවැනි යෝජනා සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් විනිවිද භාවය හා වගකීම සුරක්ෂිත වන ආකාරයෙන් වඩා විධිමත් විය යුතු බව අවධාරණය කරනු ලැබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව 2013 වර්ෂය තුළදී නව විදේශ ව්‍යාපෘති ගිවිසුම් 62 කට එළඹ තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක කර තිබුණු විදේශ ව්‍යාපෘති සංඛ්‍යාව 138 ක් විය. ඒ අතරින් ව්‍යාපෘති 113 ක් විසින් විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණු අතර එහිදී නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු කිහිපයක් පහත දැක්වේ.

(අ) බොහෝ ව්‍යාපාර සම්බන්ධ ක්‍රියාත්මක කිරීමේ සැලැසුම් නොවීම හේතුවෙන් ලබාගත් විදේශ ණය අදාල ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය නොවීම.

(ආ) ක්‍රියාත්මක කිරීමේ ආයතන අතර මනා සම්බන්ධතාවය නොපැවැත්වීම හේතුවෙන් අරමුදල් උපයෝජනය කාර්යක්ෂම සිදුනොවීම.

(ඇ) ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සඳහා උපදේශකවරුන්ගේ දායකත්වය කාර්යක්ෂමව ලැබී නොතිබීම.

(ඈ) අභ්‍යන්තර විගණන අංශයන් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ව්‍යාපෘතිවල මූල්‍ය පාලනය විධිමත්ව සිදුනොවීම.

පළාත් සභා

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභා මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව පරිදි විගණනය කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලබන අතර විස්තරාත්මක පළාත් සභා වාර්තා අදාළ පළාත් සභාවේ සභාගත කිරීම සඳහා ඒ ඒ පළාත් සභා ආණ්ඩුකාරවරුන් වෙත නිකුත් කරනු ලැබේ.

බොහෝ පළාත් සභා විසින් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සිදුකර නොතිබුණු අතර, වත්කම් ගිණුම්ගත කිරීම සඳහා අනුගමනය කළයුතු විධිමත් මාර්ගෝපදේශයන් 2014 සැප්තැම්බර් 15 දින දක්වා නිකුත් කර නොතිබුණි. එහෙත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 2013 වර්ෂයට අදාලව ඉදිරිපත් කළ විසර්ජන ගිණුම්වල ස්ථාවර වත්කම් මිලදී ගැනීමේ පෙන්නුම් කර තිබුණි.

පළාත් සභා විසින් පළාත් සභා පනතේ විධිවිධාන නොමැතිව වියදම් සඳහා රජයෙන් ලැබෙන මුදල් ඌන උපයෝජනය හෝ පළාත් සභා ආදායම නිසිලෙස ඇස්තමේන්තු නොකර මධ්‍යම රජයෙන් ප්‍රතිපාදන ලබාගැනීම නිසා හෝ විශාල මුදල් ප්‍රමාණයක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. පළාත් සභා කිහිපයක එම විස්තර පහත දැක්වේ.

	2013 වර්ෂය	2012 වර්ෂය
	රු.	*රු.*
බස්නාහිර පළාත් සභාව	7,000,000,000	9,000,000,000
සබරගමුව පළාත් සභාව	3,371,763,491	1,182,077,159
දකුණු පළාත් සභාව	109,576,949	102,179,377
වයඹ පළාත් සභාව	748,452,671	1,152,378,365
මධ්‍යම පළාත් සභාව	940,220,288	855,099,433

කාර්ය සාධනය

සබරගමුව පළාත් සභාවේ 2013 ප්‍රාග්ධන වියදමට අදාල ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම සළකා බැලීමේදී පළාත් අමාත්‍යාංශ 04 ක අග්‍රිම නොලැබීම හේතුවෙන් එකතුව රු. 691,477,416 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එම තත්ත්වය පළාතේ සංවර්ධන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. එහෙත් 2013 දෙසැම්බර්

31 දිනට පළාත් සභාවේ ස්ථාවර තැන්පතු ශේෂය රු. 3,371,763,491 වූ අතර වර්ෂ කිහිපයක සිට පවත්වන ඉහත කී තැන්පතු උපයෝගී කරගෙන අග්‍රිම නොලැබීම මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට ඇති ඉඩ ප්‍රස්ථා සොයාබලා ඒවා ක්‍රියාත්මක කිරීමට පියවරගෙන නොතිබුණි.

තවද පළාත් සභා යටතේ ක්‍රියාත්මක අධිකාරී (ප්‍රඥප්ති අනුව පිහිටවූ) යටතේ ද ස්ථාවර තැන්පත්වල මුදල් ආයෝජනය කර තිබුණි. වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද අධිකාරී විසින් 2013 දෙසැම්බර් 31 දිනට රු. 362,714,688 ක මුදලක් ආයෝජනය කර එදිනට රු. 39,871,627ක පොළී ප්‍රමාණයක් උපයා තිබුණි.

ප්‍රඥප්ති මඟින් පිහිට වූ මෙම බොහෝ ආයතනවල වැටුප් ගෙවීම් සඳහා පළාත් සභාවෙන් මුදල් ලබාදී තිබුණි. පළාත් සභාවලට ප්‍රතිපාදන ලබාදීමේදී මුදල් කොමිසම පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් කර ඇති ආයෝජන පිළිබඳව සළකා බලා ප්රතිපාදන ලබාදීමට කටයුතු කර නොතිබුණි.

පොදු නිරීක්ෂණ

පළාත් සභා ක්‍රමය තුළ විගණනයේදී නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ. මෙම අඩුපාඩු 2013 දෙසැම්බර් 31 දිනට අදාල වන පරිදි ඒ ඒ පළාත් සභා යටතේ කටයුතු කරනු ලැබූ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ, ගණන් දීමේ නිලධාරීන්ගේ හා වගකිවයුතු නිලධාරීන්ගේ අවධානයට යොමු කරන ලදි.

- පළාත් පාලන ආයතනවලට ප්‍රේෂණය කළයුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු විශාල ප්‍රමාණයක් පළාත් සභා විසින් ප්‍රේෂණය නොකර අත රඳවාගෙන තිබුණි.

- විදුහල්පති ශ්‍රේණියේ නිලධාරීන් සිටියදී ඒ පිළිබඳව නොසලකා විදුහල්පති ශ්‍රේණිධාරීන් නොවන අය පත්කිරීම.

- වාර්තා වූ හානි හා පාඩු පිළිබඳව විධිමත් පරිදි කටයුතු කිරීමට ක්‍රියා නොකිරීම.

- 2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභා සතු ඇතැම් ආයතන සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා තිබුණු සමීක්ෂණ වලට අදාල වාර්තා වලින් පෙන්වාදෙනු ලැබූ අඩුපාඩු හා ඌනතා පිළිබඳව විධිමත් පරිදි කටයුතු කර නොතිබුණි.

- පළාත් සභා යටතේ පාලනය වන රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලාවන් හි ඖෂධ කල් ඉකුත් වීමට ප්‍රථම ප්‍රයෝජනයට ගැනීමට හෝ අවශ්‍ය වෙනත් ආයතනවලට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

- විගණකාධිපති වාර්තා පිළිබඳව පළාත් සභා ගිණුම් කාරක සභාවේදී පරීක්ෂාකර මතුවූ කරුණු පිළිබඳව ලබාදෙන නියෝග පළාත් සභාවේ විවිධ ආයතන විසින් එකිනෙකට වෙනස් ආකාරයට ක්‍රියාත්මක කිරීම.

- පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන විගණන හා කළමනාකරණ කමිටු ඵලදායී නියෝග මෙහෙයවීම සඳහා අවධානය යොමු කර නොතිබුණි.

- පළාත් සභාවල විවිධ ආයතන ක්‍රියාත්මක කළ කොන්ත්‍රාත් නිමකිරීමේදී ඇතැම් විෂයයන් සතුටුදායක ලෙස ඉටුකර නොතිබීම, ඇස්තමේන්තුව නිවැරදිව පිළියෙල නොකිරීම, නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකිරීම ආදී අඩුපාඩු පැවතීම.

පළාත් පාලන ආයතන

පළාත් පාලන බල මණ්ඩල බල ප්‍රදේශ තුළ සිටින බදු ගෙවන ජනතාව තෘප්තිමත් වන පරිදි ඔවුන්ගේ සමාජ, ආර්ථික හා සංස්කෘතික අවශ්‍යතා සැළකිල්ලට ගෙන අළුතෙන් ඇතිකළ යුතු හා දැනට පවත්නා පොදු උපයෝගිතා හා සේවා හඳුනා ගැනීම ක්‍රියාත්මක කිරීම හා ඇගයීම පළාත් පාලන බල මණ්ඩලවලට පැවරී තිබෙන ප්‍රධාන කාර්යයන් විය. 2013 දෙසැම්බර් 31 දිනට මහා නගර සභා 23 ක්, නගර සභා 41 ක් සහ ප්‍රාදේශිය සභා 271 ක් වශයෙන් පළාත් පාලන බල මණ්ඩල 335 ක් ක්‍රියාත්මක විය. සමාලෝචිත වර්ෂයට අදාළව පළාත් පාලන බල මණ්ඩල 335 කින් 2014 ඔක්තෝබර් 10 දිනට මූල්‍ය ප්‍රකාශන 310 ක් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 219, නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 181(1) සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172(1) වගන්තිවල විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අදාල පළාත් පාලන ආයතනවල විගණනයේදි නිරික්ෂණය කරන ලද කරුණු පහත පරිදි සාරාංශ කරනු ලැබේ.

- මහා නගර සභා ආඥා පනතේ 254(1), නගර සභා ආඥා පනතේ 170(අ)(1) සහ ප්‍රාදේශිය සභා පනතේ 166 වගන්තිවල දැක්වෙන ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් අදාල බලධාරින් නීතිමය පියවර ගෙන නොතිබීම නිසා බොහෝ පළාත් පාලන බල මණ්ඩලවල හිඟ ආදායම් ප්‍රමාණය වසරින් වසර වර්ධනය වී තිබුණි.

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ අනුමත කර ලියාපදිංචි කර ඇති හෝටල් සහ ලැගුම්හල් වල වාර්ෂික ලැබීම් වලින් සියයට 1 ක බද්දක් අයකිරිමට පළාත් පාලන බල මණ්ඩල ආඥා පනත්වල සහ පනත්වල විධිවිධාන සළස්වා තිබුණ ද, වාර්ෂික ලැබීම් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට අදාළ නීතිමය විධිවිධාන සකස් කර නොතිබීම හේතුවෙන් බොහෝ පළාත් පාලන බල මණ්ඩල වලට වාර්ෂිකව ලැබිය යුතු විශාල බදු මුදලක් අහිමි වි තිබුණි.

- නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ සඳහන් විධිවිධාන අනුව මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ සීමාවන් ඇතුළත අනුබෙදීම් කර විකුණනු ලබන ඉඩම් වලින් සියයට 10 ක ප්‍රමාණයක් වූ භූමි භාගයක් පොදු පහසුකම් සඳහා අදාල පළාත් පාලන බල මණ්ඩලවලට වෙන් කළ යුතු විය. විකුණූ ඉඩම්වලින් නියමිත ප්‍රමාණ ඉඩම් කොටස් පොදු පහසුකම් සඳහා වෙන් කර නොතිබූ අවස්ථා විගණනයේදි අනාවරණය වූ අතර වෙන් කර තිබූ බොහෝ ඉඩම් කොටස් පොදු පහසුකම්වලට යෝග්‍ය නොවූ ඒවාද විය. ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව විකුණුම් මිල මත සියයට 1ක බදු මුදලක් ද ඇතැම් පළාත් පාලන බල මණ්ඩල අයකරගෙන නොතිබුණි.

- සභා බල ප්‍රදේශ තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරණ දැන්වීම් පුවරු, ප්‍රදර්ශන නාම පුවරු සම්බන්ධයෙන් විධිමත්ව සමීක්ෂණය කර අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අවස්ථා ද තිබුණි.

- මහා නගර සභා ආඥාපනතේ 247 ඇ(1අ), නගර සභා ආඥාපනතේ 165(1)(අ) හා ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිවල විධිවිධාන අනුව අමාත්‍යවරයා විසින් නියෝග මගින් නිශ්චය කර ඇති ප්‍රමාණය නොඉක්මවන ව්‍යාපාර බද්දක් වෘත්තිකයින්ගෙන් අයකර ගැනීම සඳහා පළාත් පාලන බල මණ්ඩලවලට බලය පැවරී ඇත. එතෙකුදු වුවද යථෝක්ත විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නියෝග පනවා නොමැති බැවින් පළාත් පාලන බල මණ්ඩලවලට වෘත්තීන් සම්බන්ධන්ධයෙන් බදු පැනවීමේ හැකියාවක් නොතිබුණි.

- නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය විසින් 2009 වර්ෂයේ දී නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව දූරකථන/විදුලි සංදේශ කුළුණු වලින් නිශ්චිත පරිසර ගාස්තු ද අයකර ගැනීමට බොහෝ පළාත් පාලන බල මණ්ඩල අපොහොසත් වී තිබුණි.

- පළාත් පාලන බල මණ්ඩල හුරු පුරුදු වී ඇත්තේ, කාලානුරූපව ලැබෙන ආදායම් වර්ෂය තුළදී බිල් කිරීමටය. නව ආදායම් ප්‍රවේශ හඳුනාගෙන විධිමත් ක්‍රමවේදයක් මගින් ආදායම් ප්‍රවර්ධනය කිරීමට හෝ පැවරුන ආදායම් තුළ ආදායම් වර්ධනය කර ගැනීමට හෝ අවශ්‍ය ක්‍රමෝපායන් අනුගමනය කිරීම දුර්වල තත්ත්වයක පැවතුණි.

- මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග ඉදිකිරීමේදී ගිවිසුම්ගත පිරිවිතරවලට හා සම්මත නිර්ණායකයන්ට අනුගත වී නොතිබූ අවස්ථා බහුලව නිරීක්ෂණය විය.

- පළාත් පාලන බල මණ්ඩලවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද ක්‍රියාත්මක වී නොතිබුණි.

සමස්තයක් වශයෙන් ආයතනවලට පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යභාරයන් ඉටු කිරීම, මහජන උපයෝගී සේවා පවත්වා ගැනීම හා සංවර්ධනයට අවශ්‍ය ආදායම් ප්‍රමාණවත් පරිදි උත්පාදනය කරගත නොහැකිවීම පළාත් පාලන බල මණ්ඩල මුහුණ දී තිබෙන ප්‍රධානතම ගැටළු වේ. මෙම තත්ත්වය මත එකී ආයතන රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් මත යැපීමේ තත්ත්වයක තිබුණි.

මෙම තත්ත්වය මඟහැර ගැනීම සඳහා, පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි අධිකාරියේ අවධානය යොමු කලයුතු වේ.

- පළාත් පාලන බල මණ්ඩල ප්‍රදේශ තුළ පිහිටි අධිකරණ විසින් පළාත් පාලන බල මණ්ඩල වලට අදාලව අයකරනු ලබන දඩ මුදල් ඍජුවම අදාල පළාත් පාලන බල මණ්ඩලවලට ලබා ගැනීමට හැකිවන පරිදි කෙටුම්පත් ප්‍රඥප්තියක් සකස් කර ගැනිම,

- අනුබෙදීම් සැලැස්ම අනුමත කරන අවස්ථාවේදිම ඉඩමේ දළ වටිනාකම මත පළාත් පාලන බල මණ්ඩලයට අයවිය යුතු සියයට 1 ක බද්ද අත්තිකාරමක් වශයෙන් අයකර ගැනීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම හා,

- යල්පැනගිය අතුරු ව්‍යවස්ථා කාලීන අවශ්‍යතාවයන්ට ගැලැපෙන පරිදි සංශෝධනය කර මනාව සැලැසුම් කළ ආදායම් ප්‍රවර්ධන ක්‍රියාවලියක් පළාත් පාලන බල මණ්ඩලවල ක්‍රියාත්මක කිරිම සඳහා වූ ආයතනික රාමුවක් හඳුන්වා දීම කෙරෙහි, බලධාරින්ගේ අවධානය යොමු විය යුතුව ඇත.

විමර්ශන විගණනය හා මහජන නියෝජන පිළිබඳ විගණන කටයුතු

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත මහජන නියෝජනයන් 926 ක් ලැබි තිබුණ අතර, ඒ ඒ ක්ෂේත්‍ර සම්බන්ධව ලැබි තිබුණ තත්ත්වය පහත දැක්වේ.

ක්ෂේත්‍රය	පැමිණිලි සංඛ්‍යාව	ප්‍රතිශතය
අධ්‍යාපන	146	16
පළාත් පාලන	121	13
කෘෂිකර්මය	112	12
සෞඛ්‍ය	75	08
උසස් අධ්‍යාපන	66	07
වෙළඳ	47	05
වෙනත්	359	39
එකතුව	**926**	**100**

විශේෂ විමර්ශන ඒකකය විසින් 2013 වර්ෂය තුළදී විශේෂයෙන් හඳුනාගනු ලැබූ ක්ෂේත්‍ර සම්බන්ධයෙන්වූ මහජන පැමිණිලි 19 ක් සම්බන්ධව පරීක්ෂණ සිදුකර තිබුණු අතර, අනාවරණය වූ විශේෂ නිරීක්ෂණයන් පහත දැක්වේ.

අධ්‍යාපන අමාත්‍යාංශය - පාසැල් පද්ධතියේ අවිධිමත් මූල්‍ය පාලනයන්

ජාතික/පළාත් පාසැල් 5 ක් සම්බන්ධව 2013 වර්ෂයේදී සිදුකරන ලද විගණන පරීක්ෂාවන්හිදි අයෝග්‍ය මූල්‍ය පාලනයන් පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අවස්ථා 3 කදී දෙමාපියන් හා සිසුන් මගින් එක් එක් ව්‍යාපෘති සඳහා රු.14,258,750 ක මුදලක් එකතු කර තිබුණ නමුත්, එම මුදල් අදාල කාර්යයට වැය කර නොතිබුණි.

- විදුහල්පතිවරුන් අවස්ථා 17 කදී රු.409,522 ක් වංචණික ලෙස බැංකු ගිණුම් වලින් ඉවත් කර තිබුණ අතර, තවත් අවස්ථා 23 කදි රු.1,241,343 ක මුදල් අයථා ලෙස පරිහරණය කර තිබුණි.

- පිළිගත් ගෙවීම් පරිපාටීන් අනුගමනය නොකර එනම් අධිකාරි බලය, අනුමතිය හා ගෙවීම් සහතික කිරීමකින් තොරව අවස්ථා 11 කදී රු.1,181,506 ක් ගෙවා තිබුණි.

අධ්‍යාපන අමාත්‍යංශය - පාසැල් නිල ඇඳුම් සැපයීම

2013 වර්ෂයේ පාසැල් ළමුන් සඳහා නිල ඇඳුම් ද්‍රව්‍ය ආනයනයට එක්සත් ජනපද ඩොලර් 5,473,800 ක් වැය කර තිබුණ අතර, ඒ සම්බන්ධයෙන් කරන ලද විගණන පරික්ෂණයකදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රමයට උක්ත ප්‍රසම්පාදනයන් කර නොතිබුණි.

- නිල ඇඳුම් සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ, රාජ්‍ය ආයතනයක් වෙත නිශ්චිත හේතු දැක්වීමකින් තොරව සැපයීමේ ඇනවුම් භාර දී නොතිබුණ අතර, ඇනවුම් ලබාදි තිබූ ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් හා සසඳන කළ එය එම රාජ්‍ය ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ මිලට වඩා රු.68,419,000 ක් වැඩි මිලක් වී තිබුණි.

- නිල ඇඳුම් වර්ග 3 ක ප්‍රසම්පාදනය සඳහා වෙන වෙනම මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් තෝරා නොගැනීම නිසා රු.83,340,000 අලාභයක් වි ඇති බව සනාථ විය.

- නිල ඇඳුම් ආනයනය කර පාසැල් පද්ධතිය වෙත බෙදා හැරීමේදී, ගිවිසුම් ගත දිනට නොසැපයීම හා විධිමත් තත්ත්ව පරික්ෂණයක් සිදු නොකිරීම නිරික්ෂණය වූ අතර, විවෘත කරන ලද ණයවර ලිපි සඳහා නියමිත දිනට මුදල් බැංකුව වෙත නොගෙවීම නිසා රු.මිලියන 30.42 ක අතිරේක පොලියක් ගෙවීමට සිදුවිය. එසේම මුලු රෙදි සැපයුම් වලින් සියයට 58 ක ලබාදුන් ආයතන දෙකම එකම අයිතිකරුට අයත් ආයතන විය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - දිවි නැගුම වැඩසටහන-බීජ කට්ටල මිලදී ගැනීම

දිවි නැගුම ජාතික සංවර්ධන වැඩ සටහන යටතේ මහජනයා අතර නොමිලේ බෙදා හැරීම සඳහා 2013 වර්ෂයේදි රු.මිලියන 232 ක් වටිනා බිජ කට්ටල මිලදී ගැනීම හා බෙදා හැරීම සම්බන්ධව කරන ලද විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය

- ලංසු කොන්දේසිවලට අනුව බීජවල සියයට 98 ක භෞතික පාරිශුද්ධතාවයක් හා සියයට 75 ක අවම ප්‍රරෝහන ශක්තියත් තිබෙන බවට පරික්ෂණ වාර්තා මගින් සනාථ කළයුතු නමුත් ආයතනයට සපයන ලද බීජ සම්බන්ධයෙන් එසේ පරික්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර, එම තත්ත්වය නොසළකා ආයතනය බීජ භාරගෙන බෙදා හැර තිබුණි.

- බීජවල ගුණත්වය සහතික කර ගැනීම සඳහා කරන ලද නියැදි පරික්ෂාවේදි අවම පැලවීමේ ප්‍රතිශතය සියයට 11.9 ක් හා සියයට 75 ක් අතර පරාසයක තිබුණි. අවම පැලවිමේ ප්‍රතිශතයක් තිබු බීජ වල වටිනාකම රු.මිලියන 4.64 ක් විය. බීජ පැලවීම සියයට 75 ක්වු ප්‍රමාණය මුලු සැපයුමෙන් සියයට 7.2 සිට සියයට 15.6 ක පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණ අතර ප්‍රරෝහන ශක්තිය සියයට 1 සිට සියයට 10 දක්වා තිබීම, බිජ මිලදී ගැනීමේ ඵලදායිතාවය අඩු තත්ත්වයකට ගෙන ඒමට හේතු වි තිබුණි.

- බීජ කට්ටලයක තිබිය යුතු බීජ සංඛ්‍යාව අඩුවෙන් තිබු අවස්ථා නිරීක්ෂණය විය.

- බීජ වාර්තා නිකුත් කිරීම සඳහා ආයතනයේ පරිගණක මෘදුකාංගය භාවිතා කර නොතිබුණි.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - සුළං මාපක කුළුනු දහයක් ඉදි කිරීම

සුළං පිළිබඳ දත්ත එකතු කිරීමේ අරමුණින් සුළං මාපක කුළුනු දහයක් ඉදිකිරීමට අදාල රු.16,675,000 වටිනා කොන්ත්‍රාත්තුවකට හා සුළං මැණිමේ උපකරණ සැපයීම සඳහා රු.7,095,000 ක කොන්ත්‍රාත්තුවකට 2010 වර්ෂයේදි එළඹ තිබුණු අතර, ව්‍යාපෘතියේ සාර්ථකත්වය සම්බන්ධව කරන ලද පරික්ෂණයේදී පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

ගිවිසුම් ප්‍රකාරව නියමිත කාල සිමාව තුළදී කුළුනු ඉදිකර නොතිබුණ අතර, කුළුනු 5 ක් මාස 3 සිට අවුරුදු 2 ½ ක කාල පරාසයක පමාවක් සහිතව ඉදිකර තිබුණි. එක් කුළුණක් ඉදිකර නොතිබුණ අතර, ඉදිකර තිබු කුළුනු දෙකක් ක්‍රියාකාරිත්වයේ නොතිබුණි. දත්ත එක් රැස් කිරීම හා පරිගණක පද්ධතියට එකතු කිරීම අසාමාන්‍ය කාලයක් ගත වි තිබුණි.

විදුලි මෝටර් තුනක් නිෂ්පාදනය කිරීම

තාක්ෂණික සංවර්ධන වැඩ සටහන යටතේ වූ නව පරික්ෂණ ව්‍යාපෘතියක් ලෙස රු.මිලියන 9 කට විදුලි මෝටර් 3 ක් නිෂ්පාදනය කිරීම සඳහා 2007 සැප්තැම්බර් 7 දින ගිවිසුම්වලට එළඹ තිබුණ අතර එම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සම්බන්ධව කරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය නියමිත පරිදි සිදු කර හා අධික්ෂණ කටයුතු ද සාර්ථකව සිදු කර නොතිබුණි. 2009 දෙසැම්බර් 14 දින වන විට ව්‍යාපෘතිය සඳහා රු.7,887,600 ක් වැය කර තිබුණ නමුත් 2013 පෙබරවාරි 07 දින වන විටත් ආදර්ශ විදුලි මෝටර් නිෂ්පාදනය කර භාරදී නොතිබුණි.

V කොටස

රාජ්‍ය විගණනයට අයත් ක්ෂේත්‍රයන් පිළිබඳ විස්තරාත්මක සමාලෝචනය

රාජ්‍ය ආදායම් කළමනාකරණය

ආදායම් රැස්කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව මඟින් 2013 වර්ෂය සඳහා අනුමත වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව 2013 වර්ෂයේ දේශීය හා විදේශීය ණය ගැනීම් හැර ඇස්තමේන්තු කළ රාජ්‍ය ආදායම රු. මිලියන 1,283,500 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම වූ රු. මිලියන 1,129,899 සමඟ සැසඳීමේදී රු. මිලියන 153,601 ක් හෙවත් සියයට 13.59 ක වැඩිවීමක් විය. එහෙත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුව 2013 වර්ෂයේ දේශීය හා විදේශීය ණය ගැනීම් හැර සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 1,192,226 ක් වූ අතර, එය පාර්ලිමේන්තුවෙන් අනුමත වී තිබුණු ඇස්තමේන්තුගත ආදායමට වඩා රු.මිලියන 91,274 ක් හෙවත් සියයට 7.1ක අඩුවීමකි. සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තු කළ ආදායමින් රු.මිලියන 1,066,247 ක් හෙවත් සියයට 89ක් රැස්කර ගැනීමට හැකි වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ දී රැස්කළ රු.මිලියන 996,817 ආදායම් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී රැස්කළ ආදායම රු.මිලියන 69,430 ක් හෙවත් සියයට 6.97 ක වර්ධනයක් ලබාගෙන තිබුණි. එසේ වුවත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් වල සාරාංශය සහ 2013 මහ බැංකු වාර්තාවට අනුව 2012 වර්ෂයේ ඉපයූ රු.මිලියන 1,051,460 ආදායමට සාපේක්ෂව, 2013 වර්ෂයේ දී රැස්කල ආදායම රු. මිලියන 1,137,447 ක් වූයෙන් සියයට 8.2 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

රජයේ ආදායමින් සියයට 85කට ආසන්න දායකත්වයක් සපයන්නේ ප්‍රධාන රාජ්‍ය ආයතන 4ක් වන දේශීය ආදායම්, රේගු, සුරාබදු හා මෝටර් රථ ප්‍රවාහන යන දෙපාර්තමේන්තු හතර මගිනි. එම දෙපාර්තමේන්තු වල සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ කාර්යසාධනය පහත වගුවෙහි දැක්වේ.

	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		රේගු දෙපාර්තමේන්තුව		සුරාබදු දෙපාර්තමේන්තුව		මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	
	2013	**2012**	**2013**	**2012**	**2013**	**2012**	**2013**	**2012**
	රු (මිලියන)	*රු (මිලියන)*	*රු (මිලියන)*	*රු (මිලියන)*	*රු (මිලියන)*	*රු (මිලියන)*	*රු (මිලියන)*	*රු (මිලියන)*
ඇස්තමේන්තුගත ආදායම	575,606	511,960	405,622	361,742	68,138	65,225	8,279	6,482
තථ්‍ය ආදායම	467,162	418,424	362,782	341,999	66,041	60,081	7,726	7,952
ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය (ප්‍රතිශතය)	81	82	89	94	97	92	93	123

සංයුතිය (රජයේ මුළු ආදායමින් ප්‍රතිශතයක් ලෙස)	43.81	39.24	34.02	32.01	6.19	5.63	0.72	0.74

සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තුගත ආදායම් ඉක්මවා ආදායම් රැස්කිරීමට ඉහත දෙපාර්තමේන්තු සමත් වී නොතිබුණි. එසේ වුවත් රාජ්‍ය ආදායම් ව්‍යුහයේ 2012 වර්ෂය තුළ වූ සාපේක්ෂ දායකත්වය 2013 වර්ෂය වන විට තවදුරටත් පිරිහී ඇත්තේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පමණි. තවද, 2013 වර්ෂය තුළ ශ්‍රී ලංකා රජයේ එකතු කළ අගය මත බදු ආදායම රු. මිලියන 217,687 ක් වූ අතර, එම බදු ආදායම තුළ ශ්‍රී ලංකා රේගුව විසින් ආනයන මත එකතුකර තිබූ රු. මිලියන 104,517 ක බදු ප්‍රමාණය ද අඩංගු විය.

එසේම, රාජ්‍ය ආදායම, බදු ආදායම සහ බදු නොවන ආදායම ලෙස වර්ගීකරණය වන අතර සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ 04 තුළ එලෙස එකතු කරනු ලැබූ රාජ්‍ය ආදායම පහත වගුවෙහි දැක්වේ.

විෂයය	2013	2012	2011	2010	2009
	රු. මිලියන	*රු. මිලියන*	*රු. මිලියන*	*රු. මිලියන*	*රු. මිලියන*
බදු ආදායම	1,005,895	908,913	845,697	724,748	618,932
බදු නොවන ආදායම	131,552	142,547	122,165	92,532	80,712
මුළු ආදායම	**1,137,447**	**1,051,460**	**967,862**	**817,280**	**699,644**

මූලාශ්‍ර: මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වාර්ෂික වාර්තාව

රාජ්‍ය ආදායම ලෙස 2012 වර්ෂයේ දී වාර්තා වූ රු. මිලියන 1,051,460 ක වටිනාකමට සාපේක්ෂව, 2013 වර්ෂයේ දී වාර්තා කළ රාජ්‍ය ආදායම රු. මිලියන 1,137,447 දක්වා රු. මිලියන 85,987 කින් හෙවත් සියයට 8.18 කින් වර්ධනය වී තිබුණි. සමස්ථ ආදායමේ කාර්යසාධනය අනුව, 2012 වර්ෂයට සාපේක්ෂව බදු නොවන ආදායම රු.මිලියන 10,995 කින් හෙවත් සියයට 7.71 කින් අඩු වී තිබියදී, බදු ආදායම රු. මිලියන 96,982කින් හෙවත් සියයට 10.67 කින් වර්ධනය වීම සමස්ථ රාජ්‍ය ආදායමේ වර්ධනයට බලපා තිබුණි.

මුළු බදු ආදායමේ සියයට 10.67ක වර්ධනය සඳහා, ආදායම් බදු, දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු සහ ආනයනය මත පදනම් වූ බදු වල පිළිවෙලින් සියයට 19.2 ක, සියයට 10.9 ක හා සියයට 7.4 ක වර්ධනයන් බලපා තිබුණි.

බදු නොවන ආදායම, 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී රු.මිලියන 10,995කින් හෙවත් සියයට 7.71කින් පහළ බැස තිබූ අතර, මහ බැංකු පැවරුම් ලාභ හා ලාභාංශ ආදායම්වල අඩුවීම ඊට බලපා තිබුණි.

දළ දේශීය නිෂ්පාදිතය හා රාජ්‍ය ආදායම

සමාලෝචිත වර්ෂයේ දී රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.1 වී තිබුණු අතර, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ එම ප්‍රතිශතය සියයට 13.9 ක් විය. ඒ අනුව මෙම අඩුවීම සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 03 ක කාලය තුල සෑම වර්ෂයකම අඛණ්ඩව සිදුවී තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2013 වාර්ෂික වාර්තාව මඟින් මෙම අඩුවීම සඳහා ආර්ථික සේවා ගාස්තු ආදායම, වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු ආදායම් සහ ඛනිජතෙල් ආනයන මත නිෂ්පාදන බදු ආදායම අඩුවීම හේතු වශයෙන් වාර්තා කර තිබුණි. මෙම තත්ත්වය පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.



ප්‍රස්ථාරය 2 - රාජ්‍ය ආදායම දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2013

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායමේ අඩුවීමේ ප්‍රවණතාවය, පසුගිය වර්ෂ කිහිපය තුළ අඛණ්ඩව නිරීක්ෂණය වූ අතර, 2012 වර්ෂයේ පැවති සියයට 12 සිට 2013 වර්ෂයේදී සියයට 11.6 දක්වා තවදුරටත් අඩුවී තිබුණි.

බදු නොවන ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෙර වසරට වඩා සාපේක්ෂව අඩුවූ අතර, 2012 වර්ෂයේ දී එය සියයට 1.9 ක් වූ අතර, 2013 වර්ෂයේ දී එය සියයට 1.5 දක්වා අඩුවී තිබුණි.

රාජ්‍ය ආදායම සහ අයවැය හිඟය

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2013 වර්ෂය සඳහා රජයේ පුනරාවර්තන වියදම රු. මිලියන 1,253,509 ක් හා රාජ්‍ය ආයෝජන වියදම රු.මිලියන 455,578 ක් වී ඇත. එහෙත් රජය විසින් උපයා තිබූ සමස්ත ආදායම රු.මිලියන1,066,247 ක් වීම හේතුවෙන් එය 2013 වර්ෂයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමටවත් ප්‍රමාණවත් වී නොමැත. ඒ අනුව, සමස්ථ රාජ්‍ය ආදායම ඉක්මවා වැය වී ඇති පුනරාවර්තන වැය රු. මිලියන 187,262 ක් විය. මේ හේතුවෙන් රු.මිලියන 455,578 ක් වූ ආයෝජන වියදම් සමඟ ඇති වී ඇති සමස්ත අයවැය හිඟය වන රු.මිලියන 642,840 පියවා ගැනීම සඳහා දේශීය හා විදේශීය මූල්‍ය මාර්ග වෙත යොමුවීමට තවදුරටත් සිදුවී තිබේ. මෙම තත්ත්වය පහත ප්‍රස්ථාරයේ දැක්වේ.



ප්‍රස්ථාරය 3 - රාජ්‍ය ආදායම, වියදම සහ අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වාර්ෂික වාර්තාව - 2013

රාජ්‍ය ආදායම් කළමනාකරණය හා සම්බන්ධ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හා ආදායම් උපයන ආයතන වල කාර්යසාධනය ඇගයීමේදී පහත කරුණු වලින් රාජ්‍ය ආදායමට ඇතිවන බලපෑම බැහැර කළ නොහැක.

- විටින්විට සිදුකරනු ලබන බදු සංශෝධනයන්
- ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රමාණයන්හි වර්ධනය
- විදේශ විනිමය අනුපාතයන්හි ඇතිවන විචලනය
- ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා වල මිල ගණන් උච්චාවචනය

අයවැය හිඟය මූල්‍යනය කිරීම

2013 වර්ෂයේ දී, විදේශීය ප්‍රදානයන් ඇතුළු, මුළු විදේශීය මූල්‍යකරණය රු. මිලියන 104,280 දක්වා සියයට 54.44 කින් අඩුවී තිබූ අතර, ශුද්ධ දේශීය ණය ගැනීම් රු. මිලියන 482,073 දක්වා, 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 74.69 කින් වර්ධනය වී තිබුණි. පසුගිය වර්ෂයේ දී සියයට 74.38 ක් වූ මධ්‍ය හා දිගුකාලීන ණය ප්‍රමාණය, 2013 වර්ෂයේ දී සියයට 76.3 ක් වූ අතර, එයින් සියයට 83.8 ක් භාණ්ඩාගාර බැඳුම්කර විය.

රාජ්‍ය ආදායම කළමනාකරණය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද විශේෂ විමර්ශන හා එමගින් රාජ්‍ය ආදායමට සිදු වූ බලපෑම්

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් වරින්වර රාජ්‍ය ආදායම් කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකරන ලද විශේෂ විමර්ශන වලදී රාජ්‍ය ආදායම් කළමනාකරණයේ පවතින වැරදි, දුර්වලතා, අකාර්යක්ෂමතා හා අනාර්ථිකභාවයන් පෙන්වා දෙන ලදි. මේ පිළිබඳව විගණන විමසුම් සහ වාර්තා වලින් දිගින් දිගටම නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණද, එම අඩුපාඩු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීමේ මන්දගාමී බව රාජ්‍ය ආදායම් කළමනාකරණයට අහිතකර ලෙස බලපා ඇති බව පෙන්වා දීමට සිදු වී තිබේ. විශේෂයෙන් රාජ්‍ය ආදායම් එකතු කිරීමේ ප්‍රධාන රාජ්‍ය ආයතන හතර වන දේශීය අදායම්, ශ්‍රී ලංකා රේගු, සුරාබදු හා මෝටර් රථ ප්‍රවාහන යන දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන වලදී නිරීක්ෂණය කරන ලද මූලික අභ්‍යන්තර පාලන දුර්වලතා කිහිපයක සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

- ආදායම් සම්බන්ධ පද්ධතිවල විගණන අවදානම සහිත ක්ෂේත්‍රයන් විගණනය විසින් පෙන්වා දීමෙන් පසුවත් වැරදි හා වංචා වලක්වා ගැනීමට විශේෂිත වූ ක්‍රමවේදයන් හඳුන්වා දීමට ක්ෂණිකව ක්‍රියා නොකිරීම.

- රාජ්‍ය ආයතනවල තොරතුරු පවත්වා ගැනීමේ, වාර්තා කිරීමේ ක්‍රමවේදයන්හි පවතින දුර්වලතා මගහරවා ගැනීමට ක්‍රියා නොකිරීම.

- වගවීමේ (ගිණුම් කටයුතුභාවය) ක්‍රියාවලිය නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම.

- ආදායම් එකතු කිරීමේ බලධාරී ආයතන අතර අන්තර් සම්බන්ධිතවූත් යාවත්කාලීනවූත් තොරතුරු ජාල පද්ධතියක් නොතිබීම සහ ඒ ඒ ක්ෂේත්‍රයන්හි පවත්නා නීති රෙගුලාසි වල පවත්නා දුර්වලතා නිවැරදි කිරීම සඳහා සහයෝගයෙන් ක්‍රියා නොකිරීම.

- ආදායම් වංචා වැලැක්වීමේ ක්‍රමවේදයන්ට අදාල පද්ධති වරින්වර ශක්තිමත් නොකිරීම.

- අනාගත අවිනිශ්චිතභාවයන් හඳුනා ගනිමින් නිවැරදි ආදායම් තක්සේරු කිරීම සඳහා නිවැරදි දත්ත පද්ධතියක් පවත්වා ගෙන නොයෑම.

ඉහත අභ්‍යන්තර පාලන දුර්වලතා අවමකර ගනිමින් රාජ්‍ය අදායම සම්බන්ධයෙන් වඩා අවධානයට ලක්විය යුතු කරුණු වන්නේ,

- පවත්නා ආදායම් මාර්ග සුරක්ෂිත කර ගැනීම
- නව ආදායම් මාර්ග හඳුනා ගැනීම වේ.

සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ආදායමින් සියයට 34 ක ප්‍රතිශතයකට වැඩි ප්‍රමාණයක දායකත්වයක් ලබා දෙන ශ්‍රී ලංකා රේගුව ප්‍රධාන ආදායම් සංකේත 15 යටතේ රැස් කිරීම් ක්‍රියාවලියේ දී නිරීක්ෂණය වූ දුර්වලතා අතරින් කොටසක් පහත දැක්වේ.

- බහාළුම් නිදහස් කිරීමේ ක්‍රියාවලියට අදාල රේගු සටහන්කර අතරින් සියයට 84 කට ආසන්න ප්‍රමාණයක්, ලිහිල් රේගු පරීක්ෂා කිරීම් (Amber Channel) යටතේ නිදහස් කර ඇති බවත්, එම ක්‍රමවේදයන් යටතේ රේගු ආඥා පනතේ විධිවිධානයන්ට පටහැනි ආනයනයන් ද නිදහස් වීමට ඇති පුළුල් ඉඩකඩ සහ ඒ මඟින් රාජ්‍ය ආදායම අය නොවීමට ඇති අවස්ථාවන් ද පැවතීම.

- රේගු පරීක්ෂණ ක්‍රමවේදය තීරණය කිරීමට අදාල තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොමැති වීම, ස්වයංක්‍රීයව තෝරාදෙනු ලබන පරීක්ෂණ ක්‍රමවේදය නිලධාරීන්ගේ අභිමතය පරිදි වෙනස් කිරීම හේතුවෙන් ස්ක්‍රීන් අංශයේ නිලධාරියාගේ අභිමතය භාවිතා කිරීමෙන් සිදුවිය හැකි දුර්වලතා හේතුවෙන් ආදායම් අහිමි විය හැකි වීම.

- ඇමරිකානු ඩොලර් 15,600,000 ක් වැය කර මිළදී ගත් ස්කෑන් යන්ත්‍ර 04, සේවා කිරීම සඳහා පමණක් කාර්තුවකට රු. 3,876,000 ක් ද, අතිවිශාල නඩත්තු හා වැටුප් යනාදිය සඳහා විශාල පිරිවැයක්ද දරමින් තිබියදී මුළු රේගු සටහන්කර අතරින් සියයට 9.57 කට ආසන්න බහාළුම් සුළු සංඛ්‍යාවක් පමණක් ස්කෑන් පරීක්ෂාවකට යොමු කිරීම හේතුවෙන් රේගු වැරදි අනාවරණය කර ගැනීමට ඇති බඩකඩ සීමා වීම.

- ආනයන හා අපනයන ක්‍රියාවලියට සැළකිය යුතු දායකත්වයක් දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ආයතනවලට සම්බන්ධ ආනයනයන්ට සහ අපනයනයන්ට අදාල බහාළුම් සම්බන්ධ ඍජු අධීක්ෂණයක් ශ්‍රී ලංකා රේගුව සතුව නොමැති වීම හේතුවෙන් විය හැකි රේගු වැරදි අනාවරණය නොවීම්.

- ආනයනිත වාහන සඳහා බදු අය කිරීමේ වර්තමාන ප්‍රතිපත්තිය නිසා ජපානයේ වාහන වෙන්දේසිවලදී ඉහළ මිලක් ගෙවා මිලදී ගෙන ඇති වාහන බදු කටයුතු සඳහා ඉතා අඩු වටිනාකමක් සැළකිල්ලට ගැනීම බහුලව සිදු වීම හේතුවෙන් වන බදු අහිමි වීම්.

- නීති විරෝධී ලෙස ආනයනය කළ හෝ සකස් කරන ලද වාහන ලියාපදිංචිය සඳහා වෙනත් වාහනවලට අදාල රේගු සටහන්කර ව්‍යාජ ලෙස යොදා ගත නොහැකි වන අයුරින් ආනයනිත සියළුම දත්ත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට සම්ප්‍රේෂණය නොකිරීම හා අදාල දත්ත ශ්‍රී ලංකා රේගුව විසින් නැවත ලබාගෙන සැසඳීම නොකිරීම හේතුවෙන් වන ආදායම අහිමි වීම්.

- ගිලන් රථ සහ අවමංගල්‍යා රථ වැනි අඩු බදු වටිනාකමක් සහිත රේගු සංයෝජිත අංක යටතේ ව්‍යාජ ලෙස ආනයනය කරන ලද වාහන, වෙනත් සුඛෝපභෝගී වාහන වර්ගීකරණයන් යටතේ ලියාපදිංචි කර පරිහරණය කිරීම නිසා සිදුවන බදු වංචා වැළැක්වීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ශ්‍රී ලංකා රේගුව සතුව නොමැති වීම.

- නිෂ්පාදන බදු අයකිරීමේදී කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය, ඒවායේ නිරවද්‍යතාවය පරීක්ෂා නොකිරීම, අධීක්ෂණය කරන සෑම දිනකම නිෂ්පාදන කටයුතු සිදු නොවීම, බදු අධීක්ෂණය සඳහා එකම නිලධාරීන් කණ්ඩායමක් යෙදවීම, නිරීක්ෂණ වාර්තා ලිඛිතව පවත්වාගෙන නොයෑම වැනි ක්‍රියාමාර්ග මගින් බදු ආදායම අහිමිවීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ ඇඟලුම් නිෂ්පාදනයේ නියුක්ත නිෂ්පාදකයන්ට සහන සැළසීම සඳහා ක්‍රියාත්මක INFAC යෝජනා ක්‍රමය යටතේ සිදු කෙරෙන ආනයනයන් සහ අපනයනයන් සඳහා විධිමත් පාලනයක් හා අධීක්ෂණයක් නොමැති වීම නිසා ලබා දී ඇති සහන අයථා ලෙස යොදා ගැනීමේ අවස්ථාව පැවතීම.

- සුරක්ෂිතාගාර වලට අදාලව විධිමත් ගබඩා ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම, ස්ථාන මාරුවීම් වලදී ගබඩාව විධිමත් ලෙස භාර නොදීම, සුරක්ෂිතාගාර ලේඛන නිවැරදිව සහ යාවත්කාලීනව නොපැවැත්වීම, භාණ්ඩ / අයිතම සොයාගැනීමට අපහසු වීම, ගබඩාව තුළ ඇතැම් භාණ්ඩ විනාශ වෙමින් පැවතීම, මධ්‍යම අපහරණ අංශය විසින් අලෙවියට ඉදිරිපත් කරන අවස්ථාවලදී භාණ්ඩවල කොටස් අනවසර ලෙස ඉවත්කර ගෙන තිබීම හේතුවෙන් රාජ්‍ය ආදායමට ලැබිය යුතු දායකත්වය අහිමි වී තිබීම.

- තැපැල් රේගු කාර්යාලයීය රේගු නිදහස් කිරීම් වලදී සියයට 15 ත් සියයට 18 ත් අතර ප්‍රමාණයක පාර්සල් පමණක් රේගු පරීක්ෂා කිරීම් වලට ලක්කිරීම, රේගු පරීක්ෂා කිරීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අධීක්ෂණයක් නොකිරීම, තක්සේරු කිරීම සඳහා භාවිතා කරන නිශ්චිත ක්‍රමවේදයක් තැපැල් කාර්යාල

හරහා ආනයනය කරන භාණ්ඩ සම්බන්ධයෙන් තොරතුරු හා වාර්තා පවත්වාගෙන නොයෑම යනාදී දුර්වලතා හේතුවෙන් රාජ්‍ය ආදායම අහිමි වීමට ඉඩකඩ පැවතීම.

සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ආදායමින් සියයට 43.81 ක දායකත්වයක් දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියේදී නිරීක්ෂණය වූ දුර්වලතා අතරින් කොටසක් පහත දැක්වේ.

- එකතු කළ අගය මත බදු වලින් 1/3ක් රඳවාගෙන එම මුදල් දෙපාර්තමේන්තුවට එවීම නිසා බදු වලින් 1/3ක් ප්‍රමාදයකින් තොරව රාජ්‍ය ආදායමට බැර කරන්නට හේතු වී තිබුණු අතර, බදු අයවීම් පරීක්ෂා කිරීමට ද හැකි වී තිබුණි. එහෙත් 2011 අප්‍රේල් 01 දින සිට කරන ලද සංශෝධන හේතුවෙන් බදු බැරවීම ප්‍රමාද වීම මෙන්ම අයවීම් සම්බන්ධ පාලන ක්‍රමද දුර්වල වී තිබුණි.

- දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය සඳහා පවත්වාගෙන යනු ලබන පරිගණක පද්ධතියේ දෝෂ හේතුවෙන් බදු වාර්තා කිරීම්, ආපසු ගෙවීම් සහ අනෙකුත් තොරතුරු පිළිගත හැකි මට්ටමකට නොතිබීම හා දත්ත පරිගණකගත කිරීම සඳහා ලබාදී තිබුණු උපදෙස් නොසළකා කටයුතු කළ අවස්ථා පැවතීම.

- දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණු බදු සඳහා වූ පනත් සහ නීති රීති සංකීර්ණ වීම නිසා බදු ගෙවන්නන්ට පවත්නා බදු ක්‍රමය පිළිබඳව අවබෝධ කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් බදු ගෙවන්නන්ට ස්වෝත්සාහයෙන් බදු ගෙවීමට පෙළඹීමක් ඇතිවී නොතිබීම.

- හිඟ ආදායම් අයකර ගැනීමට කාලීන හා අර්ථාන්විත ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.

- බැංකුවලට ගෙවන ලද බදුවලට අදාල ප්‍රේෂණ පත්‍ර බැංකුවලින් ගෙන්වා නොගැනීම.

- බදු ගෙවන්නකු විසින් අදාල බද්ද බැංකුව මඟින් ගෙවීමේදී එම බදු මුදල් රජයේ ආදායමට බැරවීම දක්වා වූ ක්‍රියාවලියෙහි කාල ප්‍රමාදයන් පැවතීම සහ එම වාර්තා අතර වෙනස්කම් පැවතීම.

ආදායම් සංකේත 2ක් යටතේ ආදායම් රැස්කරනු ලබන සුරාබදු දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ආදායමින් සියයට 6.19 ක දායකත්වයක් ලබාදෙන අතර, එහි ආදායම් එකතුකිරීමේ කාර්යසාධනයේදී නිරීක්ෂණය කරන ලද දුර්වලතා අතරින් කොටසක් පහත දැක්වේ.

- සුරා බද්දේ හිඟ හිට ඇති ආදායම අයකර ගැනීමේ ප්‍රගතිය සතුටුදායක නොවීම හා හිඟ බදු අයකර ගැනීමට කාලීන හා අර්ථාන්විත ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.

- බලපත්‍රධාරීන්ගේ පැරණි ලිපිගොනු අස්ථානගතවීම හා විගණනයට ඉදිරිපත් නොකිරීම.

- මත්පැන් නිෂ්පාදනාගාරවලට අනුයුක්ත කර ඇති නිලධාරීන් මඟින් සිදුකරනු ලබන ආදායම් රැස් කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ සෝදිසි පරීක්ෂාවට ලක් නොකිරීම.

- පහසුවෙන් හා නිවැරදිව සුරාබදු ආදායම එකතු කිරීම හා ගිණුම්ගත කිරීමට සුදුසු පරිගණක ජාල පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබීම.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ආදායම් එකතු කිරීමේ දුර්වලතා

ප්‍රධාන ආදායම් සංකේත තුනක් යටතේ ආදායම් රැස්කරනු ලබන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් එකතු කරනු ලබන ආදායම මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 1ට වඩා අඩු දායකත්වයක් ලබාදෙනු ලැබුවද, ශ්‍රී ලංකා රේගුව විසින් එකතු කරනු ලබන මුළු බදු ආදායමෙන් සියයට 30කට වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරනු ලබන මෝටර් රථ ආනයනයේදී එකතු කරනු ලබන බදු ආදායමට ඉතාම අහිතකර ලෙස බලපාන සාධකයක් වන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පවතින අභ්‍යන්තර පාලන දුර්වලතා හා එහි ක්‍රියාකාරීත්වයන් යනාදිය වේ. එවැනි අවස්ථා පිළිබඳව විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

- මීට වසර ගණනකට පෙර G,H හා J යන ඉංග්‍රීසි අකුරු කාණ්ඩයේ මුල් අකුර ලෙස ඇති අංක කාණ්ඩයන් යටතේ, ලියාපදිංචි කිරීම මඟහැරී තිබූ අංක සඳහා මෙරටට රේගු බදු ගෙවීමෙන් තොරව නීති විරෝධී ලෙස ගෙන්වා ඇති වාහන වල තොරතුරු ව්‍යාජ ලෙස පරිගණක පද්ධතියට ඇතුළත් කර වංචනික ලෙස ලියාපදිංචි කර තිබීම.

- G,H හා J යන ඉංග්‍රීසි අක්ෂරවලින් පටන් ගන්නා පැරණි අංක කාණ්ඩයන් යටතේ ලියාපදිංචි කර ඇති මෝටර් සයිකල් සහ වෙනත් අඩු වටිනාකම් සහිත වාහනවල පරිගණක දත්ත සූක්ෂම ලෙස වෙනස් කිරීමෙන් නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද නවීනතම වාහනවල විස්තර පරිගණකයට ඇතුළත් කර වංචනිකව වාහන ලියාපදිංචි කර තිබීම.

- ත්‍රිවිධ හමුදාව විසින් වෙන්දේසි කරන ලද වාහන ලෙස ව්‍යාජ ලෙස ලියකියවිලි සකස් කර වංචනික ලෙස වාහන ලියාපදිංචි කර තිබීම.

- ව්‍යාජ ලෙස සකස් කළ ලිපි පදනම් කරගෙන නියමිත පරිදි රේගු ගාස්තු නොගෙවා මෙරටට නීති විරෝධී ලෙස ගෙන්වන ලද නවීනතම මෝටර් වාහන වංචනික ලෙස ලියාපදිංචි කර තිබීම.

- රේගු වෙන්දේසි මඟින් විකුණන ලද වාහන ලෙස ව්‍යාජ ලියකියවිලි සකස් කර, රේගු බදු නොගෙවා නීත්‍යානුකූල නොවන ලෙස ආනයනය කරන ලද වාහන ලියාපදිංචි කර තිබීම.

- ව්‍යාජ ආනයන රේගු සටහන් කර අංකයන් යොදාගනිමින් වංචනික ලෙස වාහන ලියාපදිංචි කර තිබීම.

- කැබ් රථ ලෙස ආනයනය කරන වාහන මෝටර් කාර් රථ වශයෙන් ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබීම.

- මෝටර් සයිකල් හා වෙනත් භාණ්ඩ ආනයනය කරන ලද රේගු සටහන් කර අංක හා වෙනත් ලියකියවිලි උපයෝගී කර ගනිමින් සුඛෝපභෝගී මෝටර් වාහන ලියාපදිංචි කර තිබීම.

- අත්ට්‍රැක්ටර් ලෙස රේගු බදු ගෙවා ව්‍යාජ ලිපිලේඛන භාවිතා කර සුඛෝපභෝගී මෝටර් වාහන ලියාපදිංචි කර තිබීම.

- ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයන බලපත්‍ර මත ආගමික ස්ථාන සඳහා ආනයන කරන ලද වෑන්රථ වල කොන්දේසි වංචනික ලෙස ඉවත්කර ලියාපදිංචි කර තිබීම සහ එකී රථ බොහොමයක සත්‍ය නිෂ්පාදන වර්ෂය සාවද්‍ය ලෙස වෙනස්කිරීම ඇතුලු වෙනත් අක්‍රමිකතා කිරීමට කටයුතු කිරීම මඟින් විශාල රේගු බදු අක්‍රමිකතාවයක් සිදු කිරීම.

- නීති විරෝධී ලෙස ආනයනය කරන ලද හෝ කොටස් එකලස් කර සකසන ලද යතුරුපැදි හා අත්ට්‍රැක්ටර් වංචනික ලෙස ලියාපදිංචි කර තිබීම.

- කැබ් රථ ලෙස රේගු බදු ගෙවා ආනයනය කරන ලද වාහන දොර පහේ සුඛෝපභෝගී මෝටර් රථ බවට හා සිංගල් කැබ් රථ ලෙස රේගු බදු ගෙවා ආනයන කරන ලද වාහන ඩබල් කැබ් රථ බවට පරිවර්තනය කිරීම මඟින් විශාල රේගු බදු අක්‍රමිකතාවයක් සිදු කිරීම.

- මෝටර් රථ අමතර කොටස් ගෙන්වන ලද රේගු සටහන්කර මඟින් මෝටර් වාහන වංචනික ලෙස ලියාපදිංචි කර තිබීම.

- රේගු සංයෝජිත අංක 8705 යටතේ භාණ්ඩ හෝ මඟින් ප්‍රවාහන අරමුණින් බැහැරවූ විශේෂිත අරමුණු සඳහා ආනයනය කරනු ලබන මෝටර් වාහන ද්විත්ව කාර්යය වාහන සහ මෝටර් ලොරි ලෙස ලියාපදිංචි කර තිබීම.

- එක් රටක සිට තවත් රටකට තාවකාලිකව එනු ලබන විදේශිකයන් හෝ ආයතන විසින් මෙරටට තුළදී භාවිතා කිරීම සඳහා රැගෙන එන වාහන සඳහා ලබාදෙන බලපත්‍ර (Carnet Permits) කාලය අවසන් වීමෙන් පසු බදු ගෙවීමකින් තොරව අවිධිමත් ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබීම.

- අනතුරකට පත්ව හෝ වෙනත් අයුරකින් ධාවනයෙන් ඉවත් කරන ලද වාහනවල හඳුනාගැනීමේ අංකය යටතේ නීති විරෝධී ලෙස ආනයනය කරන ලද හෝ සකසන ලද නවීනතම වාහන ලියාපදිංචි කර තිබීම.

- දැනටමත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පැරණි වාහන අංකයන් යටතේ වූ වාහනවල වැසි අංකය සඳහන් කර නවීනතම වාහන පැරණි අංක යටතේ ධාවනය කිරීමට අවකාශ සලසා දී තිබීම.

- 2009 අංක 08 දරන මෝටර් රථ වාහන (සංශෝධන) පනතේ 16 වන වගන්තිය මඟින් කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ මෝටර් වාහනයක් සකස් කිරීම, නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, අළුතින් නිර්මාණය කිරීම, අනුවර්තනය කිරීම විකරණය හෝ එහි නිර්මාණ වෙනස් නොකළ යුතු බව දක්වා ඇත. එහෙත් මෙකී විධිවිධාන උල්ලංඝණය කරමින් පැරණි නිර්මාණ ස්වරූපය මුළුමනින්ම වෙනස් කර ඇති බව තහවුරු වේ. එහෙත් එවැනි වාහන පරීක්ෂා කර නෛතික විධිවිධාන අනුව ක්‍රියාකිරීම වෙනුවට එම තත්ත්වය නීත්‍යානුකූල වන පරිදි දෙපාර්තමේන්තුවේ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර තිබුණි.

- පනතේ විධිවිධානවලින් බැහැරව සුඛෝපභෝගී බදු අයකළ යුතු වාහන වර්ගීකරණය වැරදි ලෙස යොදා ගැනීම හේතුවෙන් සුඛෝපභෝගී බදු අයකළ යුතු වාහනවලින් අර්ධ සුඛෝපභෝගී බදු අයකර තිබීම.

- ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි ලෙස ලියාපදිංචි කර තිබීම හේතුවෙන් විශාල සුඛෝපභෝගී බදු මුදලක් රජයට අහිමිවී තිබීම.

- හිඟ ආදායම් හඳුනාගත හැකි වන පරිදි ක්‍රමවත් ලේඛණ හා වාර්තා පවත්වාගෙන ගොස් නොතිබීම හා හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම.

- සුඛෝපභෝගී බද්දට යටත් ඇතැම් වාහනවලින් එකී බද්ද අයකර නොතිබීම සහ සුඛෝපභෝගී බදු මුදල් කාලීනව අයකර ගෙන නොතිබීම හේතුවෙන් වාර්ෂිකව විශාල පාඩුවක් රජයට සිදුවී තිබීම.

රාජ්‍ය වියදම් කළමනාකරණය

රාජ්‍ය ආදායම් ඉපයීම සහ රජයට ලැබිය යුතු වෙනත් මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළු මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අධීක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බව මුදල් රෙගුලාසි 124 හි සඳහන් වේ. සියළුම ආකාරයේ දෙපාර්තමේන්තුමය මුදල් ගනුදෙනු ඉටු කළ යුත්තේ සාමාන්‍යයෙන් කවර සීමාවක් ඇතුළතද යන වග අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබයි. සියළුම ලැබීම් හා ගෙවීම් පිළිබඳව පාර්ලිමේන්තුවට උත්තරදීම මුදල් අමාත්‍යවරයාගේ යුතුකම වන අතර, ඒ වෙනුවෙන් මහජන අරමුදල් එකතු කිරීම හා වැය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් එක් එක් අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වශයෙන් පත්කර භාණ්ඩාගාරයේ විධිවිධානයන්ට යටත්ව දෙපාර්තමේන්තු මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම ඒ අයට පවරනු ලබයි. අමාත්‍යාංශ ලේකම්වරුන්ට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(7) ව්‍යවස්ථාවෙහි නිශ්චිතවම සඳහන් කර ඇති දෙපාර්තමේන්තු භාර නිලධාරීන් ද එකී දෙපාර්තමේන්තු වල මුදල් ගනුදෙනු පිළිබඳ අධීක්ෂණය පවත්වා ගැනීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වගකීම ඉටුකිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වන්නේය.

රාජ්‍ය මූල්‍ය පාලනයට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන xvii පරිච්ඡේදයේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. 2013 වර්ෂය සඳහා රාජ්‍ය වියදමට අවශ්‍ය ප්‍රතිපාදන 2012 අංක 23 දරන විසර්ජන පනතින් සලසා තිබුණි. ඒ අනුව, වැය ශීර්ෂ 202 ක් සඳහා රු. බිලියන 827 ක් පුනරාවර්තන වියදම් සඳහා ද, රු. බිලියන 560 ක් මූලධන වියදම් සඳහා ද වශයෙන් එකතුව රු. බිලියන 1,387 ක ප්‍රතිපාදන සලසා තිබුණි. පවත්නා නීති මඟින් අනුමැතිය ලැබී ඇති ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු පුනරාවර්තන වියදම රු. බිලියන 462 ක් ද මූලධන වියදම රු. බිලියන 718 ක් ද වශයෙන් එකතුව රු. බිලියන 1,180 ක වියදමක් ද සමාලෝචිත වර්ෂයේ දී දැරිය යුතු විය. ඒ අනුව, රු. බිලියන 2,567 ක ප්‍රතිපාදන 2013 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ දක්වා තිබුණි. මීට අමතරව විශේෂ නීති සේවා සඳහා අතිරේකව ලබාදුන් රු. බිලියන 36 ක ප්‍රතිපාදනය සමඟ 2013 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රතිපාදනය රු. බිලියන 2,603 ක් විය. පාර්ලිමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා විසර්ජන ශීර්ෂය 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැඩසටහන 2 සංවර්ධන වැඩසටහනෙහි පුනරාවර්තන වියදම් සඳහා රු. බිලියන 37 ක් ද, මූලධන වියදම් සඳහා රු. බිලියන 37 ක් ද වශයෙන් එකතුව රු. බිලියන 74 ක ප්‍රතිපාදන සළසා තිබුණි.

අරමුදල් උපයෝජනය

2013 වර්ෂය වෙනුවෙන් රු. බිලියන 2,603 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර, උපයෝජනය කර තිබූ මුදල රු. බිලියන 2,412 ක් වීම නිසා රු. බිලියන 191ක ඉතිරියක් විය. ඉකුත් වර්ෂයේ ඉතිරිය වූ රු. බිලියන 101 සමඟ සැසඳීමේදී රු. බිලියන 90කින් ඉතිරියේ වැඩිවීමක් නිරීක්ෂණය විය. ඉහත සඳහන් පරිදි රු. බිලියන 2,603 ක ප්‍රතිපාදන වැය ශීර්ෂ වලට මාරු කර අදාල උපයෝජනයන් කර තිබුණත් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 38ක

රු. බිලියන 13 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. එය සමස්ත ඉතිරියෙන් සියයට 6.8 ක් වී තිබුණි. ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 76 ත් සියයට 99 ත් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිය රු. බිලියන 16 ක් වී තිබුණි. එය සමස්ත ඉතිරියෙන් සියයට 8.4 ක් වී තිබුණි. එසේම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ත් සියයට 75 ත් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිය රු. බිලියන 25 ක් වී තිබුණි. එය සමස්ත ඉතිරිවීම් වලින් සියයට 13.1 ක් වී තිබුණි. රු. බිලියන 191 ක සමස්ත ඉතිරියෙන් සියයට 70.2 ක් හෙවත් රු. බිලියන 134 ක් පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරියක් වූ අතර සමස්ත ඉතිරියෙන් සියයට 29.8 ක හෙවත් රු.බිලියන 57 ක මූලධන ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. 2013 වර්ෂයට අදාලව ණය ගෙවීම් හැර ඇස්තමේන්තුගත මූලධන වියදම රු.බිලියන 545 ක් වූ අතර, උපයෝජනය එයින් සියයට 83.7 ක් හෙවත් රු.බිලියන 456 ක් වී තිබුණි. එය පසුගිය වර්ෂයේ උපයෝජනය කළ මූලධන ප්‍රතිපාදනය වූ රු. බිලියන 471 සමඟ සැසඳීමේ දී රු.බිලියන 15 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 තුළ උපයෝජනය කළ පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන පහත වගුවේ දැක්වේ.

වසර	2013	2012	2011	2010	2009
	රු. බිලියන	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*
පුනරාවර්තන	1,956	1,721	1,562	1,404	1,381
මූලධන	456	471	399	347	366
එකතුව	2,412	2,192	1,961	1,751	1,747

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශනය , 2013

2013 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ රු.බිලියන 2,567 ක වියදම දේශීය අරමුදල් වලින් රු.බිලියන 2,344ක් හා විදේශ අරමුදල් වලින් රු.බිලියන 223 ක් ද වශයෙන් මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. විදේශ ණය ආධාර වලින් සමාලෝචිත වර්ෂයේ දී රු.බිලියන 199 ක් ලැබී තිබුණි. ඒ අනුව, අපේක්ෂිත උපයෝජනයන් සඳහා අවශ්‍ය කරන විදේශීය අරමුදල් ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ විදේශ අරමුදලින් සළසා තිබුණු ප්‍රතිපාදනය සියයට සියයක්ම උපයෝජනය කර තිබුණු අතර, එම වියදම රු.බිලියන 201 වී තිබුණි. ඒ අනුව ප්‍රතිපාදනයට වඩා රු.බිලියන 2ක ඉක්මවීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

	ශුද්ධ ප්‍රතිපාදනය	තථ්‍ය ලැබීම්	උපයෝජනය	ශුද්ධ ප්‍රතිපාදනය සඳහා ලැබී තිබූ විදේශ අරමුදල් ඉක්මවා වර්ෂය තුල උපයෝජනය කිරීම
	රු. බිලියන	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*
විදේශ ණය	208	183	186	(3)
විදේශ ප්‍රදාන	15	16	15	1
එකතුව	223	199	201	(2)

උපුටා ගැනීම - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශනය - 2013

2013 වර්ෂය සඳහා විදේශ ණය හා ප්‍රදාන වහයෙන් රු. බිලියන 223 ක් රැස්කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. නමුත් එම මූල්‍යානය ප්‍රභවයන්ගෙන් අපේක්ෂිත මුදල රු. බිලියන 24ක් අඩුවෙන් රැස්කරගෙන තිබුණි. විදේශ ප්‍රදාන වලින් අපේක්ෂිත ඉලක්කය වූ රු.බිලියන 15 කින් රු.බිලියන 16 ක් ලැබී තිබුණි. ඒ අනුව, විදේශ ප්‍රදාන වලින් රු.බිලියන 1 ක් වැඩියෙන් ලැබී තිබුණි. සමස්තයක් වශයෙන් ගත්කළ 2013 වර්ෂයේ අයවැයෙන් අපේක්ෂිත ඉලක්ක ඉටු කිරීමට අවශ්‍ය මූල්‍යනයෙන් අපේක්ෂා කල ප්‍රමාණයම ලබාගැනීමට භාණ්ඩාගාරයට හැකි වී නොතිබුණි.

පුනරාවර්තන, මූලධන හා ණය ආපසු ගෙවුම් වහයෙන් සමස්ත වියදම වර්ග කර පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ණය ආපසු ගෙවීම් ඉකුත් වර්ෂයට වඩා රු.බිලියන 58 කින් අඩුවුවත් දේශීය ණය ගෙවීම ඉකුත් වර්ෂයට වඩා රු. බිලියන 158 කින් වැඩිවීම හා පුනරාවර්තන වියදම ඉකුත් වර්ෂයට වඩා රු. බිලියන 135 කින් වැඩිවීම 2013 වර්ෂයේ සමස්ථ වියදම වැඩිවීමට බලපා තිබුණි. එම තත්ත්වය පහත සඳහන් වගුවෙහි දැක්වේ.

වියදම	2013	2012	2011	2010	2009	2008
	රු.බිලියන	*රු.බිලියන*	*රු.බිලියන*	*රු.බිලියන*	*රු.බිලියන*	*රු.බිලියන*
පුනරාවර්තන	1,535.5	1,118.3	1,020.2	951.5	881.9	736.5
රාජ්‍ය ආයෝජන	455.6	471.1	398.5	347.0	365.7	297.2
ණය ආපසු ගෙවීම්	702.5	602.8	542.3	452.6	499.4	379.2
මුළු වියදම	2,411.6	2,192.2	1,961.0	1,751.1	1,747.0	1,412.9
දළ දේශීය නිශ්පාදිතය	8,674.0	7,582.0	6,543.0	5,602.0	4,825.0	4,411.0
මුළු වියදම දතිශතයක් ලෙසප්‍ර.නි.දේ.	27.8	28.9	30.0	31.3	36.2	32.0

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශනය 2013

මුළු රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතය සමඟ සැසඳීමේ දී 2013 වර්ෂයේ දී රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 27.8 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයට වඩා සියයට 1.1 ප්‍රතිශතයක අඩුවීමකි.

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු. බිලියන 1.253.5 ක් වී තිබුණු අතර, එය මුළු රාජ්‍ය වියදමෙන් සියයට 51.9 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 14.5 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 14.7 ක් වූ එම ප්‍රතිශතය සමඟ සැසඳීමේදී අඩුවීමක් සමාලෝචිත වර්ෂයේ දී නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂවලදී මෙන් සමාලෝචිත වර්ෂයේදී ද පොළී ගෙවීම් සඳහා රු.බිලියන 464.5 ක් හෙවත් මුළු

පුනරාවර්තන වියදමෙන් සියයට 37 ක ප්‍රතිශතයක් වැය කර තිබූ අතර. එය ඉකුත් වර්ෂයේ වියදම වූ රු.බිලියන 408.9 හා සැසඳීමේදී රු.බිලියන 55.6 කින් සමාලෝචිත වර්ෂයේ දී වැඩිවී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී පුනරාවර්තන වියදම තුළ වූ සහනාධාර, ප්‍රදාන හා මාරු කිරීම් වෙනුවෙන් රු.බිලියන 24.8 කින් වියදම වැඩි කර සමාලෝචිත වර්ෂයේ දී රු.බිලියන 351.4 ක් වැය කර තිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂ වලදී මෙන් සමාලෝචිත වර්ෂයේදී ද පෞද්ගලික පඩි නඩි වෙනුවෙන් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 24.5 ක ප්‍රතිශතයක් හෙවත් රු.බිලියන 306.9 ක් වැය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ වියදමට වඩා රු.බිලියන 34.3 කින් වැඩි වී තිබුණි. මුළු පුනරාවර්තන වියදමෙන් පොලී, සහනාධාර, ප්‍රදානයන්, මාරු කිරීම් හා පෞද්ගලික පඩි නඩි වෙනුවෙන් වූ මුළු වියදම රු.බිලියන 1,123 ක් වැය කිරීමට සිදු වී තිබුණි. මුළු පුනරාවර්තන වියදම කෙරෙහි ඉහත සඳහන් වියදම් ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණු අතර, සමස්ථ පුනරාවර්තන වියදම පියවා ගැනීමට රැස්කළ ආදායම සමත් වී නොතිබුණි. පුනරාවර්තන වියදමේ කොටසක් හා රාජ්‍ය ආයෝජන හා ණය වාරික ගෙවීමට දේශීය හා විදේශ ණය හා ආධාර ලබා ගැනීමට සිදුවී තිබුණි.

අනෙකුත් පුනරාවර්තන වියදම් හා රාජ්‍ය ආයෝජන සඳහා දේශීය හා විදේශීය ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. ඒ වෙනුවෙන් වාර්ෂික පොලී හා ණය වාරික ගෙවීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවී තිබුණු අතර, එය වාර්ෂිකව වර්ධනය වන පිරිවැයක් ලෙස නිරීක්ෂණය විය.

පුනරාවර්තන වියදම් සඳහා රැස්කළ ආදායම ප්‍රමාණවත් නොවී තිබියදීත්, රාජ්‍ය ආයෝජනය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.බිලියන 455.6 ක් වැය කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ වියදම වූ රු.බිලියන 471.1 සමඟ සැසඳීමේ දී රු.බිලියන 15.5 කින් අඩුවී තිබුණි. රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතය සමඟ සැසඳීමේ දී 2013 වර්ෂයේ දී සියයට 3.2ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

2012 අංක 23 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව විසර්ජන ශීර්ෂය 240 යටතේ සංවර්ධන වැඩසටහන සඳහා රු.බිලියන 74 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සළසා දී තිබුණි.

රාජ්‍ය ව්‍යවසායන්වල ආයෝජන

2013 ජනවාරි 01 දින වන විට රාජ්‍ය වාණිජ සංස්ථා, රජයට අයත් සමාගම්, වැවිලි සමාගම් හා සංවර්ධන බැංකු වල කොටස් හිමිකම් හා ප්‍රාග්ධන දායකත්වය වෙනුවෙන් ආයතන 125 ක රු.බිලියන 176.6 ක් ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ආයතන 11 ක් රු.බිලියන 38 ක් ආයෝජනය කර තිබුණු අතර, වර්ෂය තුළ ආයතන 16 ක කොටස් ප්‍රාග්ධනය අඩුවීම නිසා මුළු ආයෝජන වටිනාකම රු.බිලියන 1.67 කින් අඩුවී තිබුණි. ඒ අනුව, 2013 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායවල මුළු ආයෝජන වටිනාකම රු.බිලියන 212.9 වී තිබුණි.

රජයට අයත් ආයතන 62 ක, වැවිලි සමාගම් 24 ක, සංවර්ධන බැංකු 02 ක හා ඇමරිකානු ඩොලර් වලින් ප්‍රකාශිත සංස්ථා 03 ක් ඇතුළු ආයතන 91 ක රු.බිලියන 82.90 ක් කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී ඉන් රු.බිලියන 33.75 ක් ආයෝජනය කර තිබුණු ආයතන 38 කින් රු.බිලියන 4.8 ක

ලාභාංශ රාජ්‍ය ආදායමට බැර වී තිබුණි. එම ආදායම මුළු ආයෝජන වටිනාකමින් සියයට 5.8 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. ඒ අනුව, රු.බිලියන 49.15 ක් ආයෝජනය කර තිබුණු ආයතන 67 කින් කිසිදු ලාභාංශයක් සමාලෝචිත වර්ෂයේ දී ලැබී නොතිබිණි. එමෙන්ම, රු. බිලියන 212.9 ක ප්‍රාග්ධන දායකත්වය ලබා දී ඇති ආයතන 125 න් ලාභාංශ නිකුත් නොවුන රජයේ සංස්ථා 34 ක් වූ අතර, එහි ආයෝජන වටිනාකම රු. බිලියන 130.0 ක් වී තිබුණි.

පොදු තැන්පතු

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන වල භාණ්ඩාගාරය විසින් පොදු තැන්පත් වශයෙන් ගෙවිය යුතු වූ රු.මිලියන 77,111.9 කින් භාණ්ඩාගාරයට ලැබිය යුතු වූ රු.මිලියන 2.6 ක ශේෂය හිලව් කිරීමෙන් පසු භාණ්ඩාගාරයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 77,109.3 ක් ලෙස දක්වා තිබුණි.

2009 ඔක්තෝබර් 29 දිනැති අංක 200/2009 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, 2009 නොවැම්බර් 01 දිනෙන් පසුව භාණ්ඩාගාර තැන්පත් (පැරණි) ගිණුමට කිසිදු තැන්පතුවක් බැර නොකර එම අංකය යටතේ වූ තැන්පත් ශේෂ නිරවුල් කිරීමෙන් පසු, එම තැන්පත් ගිණුම අහෝසි කලයුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

අයවැය හිඟය

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.බිලියන 650 ක් වූ ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය සමාලෝචිත වර්ෂයේ දී රු.බිලියන 664 ක් වී තිබුණු අතර. එය ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය හිඟය ඉක්මවා රු.බිලියන 14කින් එනම්, සියයට 2.1කින් වැඩිවීමකි. 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තියට අනුව ඇස්තමේන්තුගත අයවැය හිඟය ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5ක ප්‍රතිශතය නොඉක්මවිය යුතුව තිබුණි. 2013 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 8,674 ක් සමඟ එම ඇස්තමේන්තුගත අයවැය හිඟය සැසඳීමේදී සියයට 7.4 ක් වී තිබුණි.

රාජ්‍ය ණය කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ණය ඇතුළුව සම්පූර්ණ මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතු වන අතර, ජනරජයේ සියලු ණය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගත යුතු වේ. ඒ අනුව, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 2.1 (ආ) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව රු.බිලියන 1,303 ක සීමාවට යටත්ව ණය ලබාගැනීම සඳහා පාර්ලිමේන්තුව අනුමැතිය ලබාදී තිබුණි.

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දී විදේශීය ණය රු.බිලියන 183 ක් ද දේශීය බැංකු නොවන ණය රු. බිලියන 1,090 ක් ද වශයෙන් එකතුව රු.බිලියන 1,273 ක ණය ලබාගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ ලබාගෙන තිබුණු රු.බිලියන 1,092 ක ණය සමඟ සැසඳීමේ දී රු. බිලියන 181 ක හෙවත් සියයට 16.6 ක වැඩිවීමකි. එහෙත් 2013 වර්ෂයේ ප්‍රතිපාදන නොමැතිකම මත ගිණුම්ගත නොවූ ණය ගිවිසුම් 45 කට අදාල රු.බිලියන 61 ක්, 2008 හා 2011 වර්ෂ වෙනුවෙන් 2013 වර්ෂයේ ලැබී ඇති එහෙත් ගිණුම්ගත නොවූ රු.බිලියන 0.16 ක් සහ එම ණය වලට අදාල විනිමය ගැලපීමේ වෙනස වූ රු.බිලියන 0.94 ක් සමඟ මුළු එකතුව රු.බිලියන 62.1, සමාලෝචිත වර්ෂයේ ගිණුම් ගත වී ඇති ණය ප්‍රමාණය රු.බිලියන 1,273 ට එකතු වූ විට මුළු ණය මුදල රු.බිලියන 1,335.1 ක් වන බැවින්, පාර්ලිමේන්තු අනුමැතිය ලැබී ඇති ණය සීමාව, රු.බිලියන 32.1 කින් ඉක්මවා ගොස් තිබුණි.

මෙවරත් දේශීය ණය කෙරෙහි රජය වැඩි සැලකිල්ලක් දක්වා ඇති අතර, 2013 වර්ෂයේ දී ලබාගෙන තිබුණු දේශීය ණය මුදල රු.බිලියන 1,090 ක් වූ අතර, එය ඉකුත් වර්යේ ලබාගත් රු.බිලියන 726 ක් වූ දේශීය ණය මුදල හා සැසඳීමේ දී රු.බිලියන 364 ක් හෙවත් සියයට 50 කින් වැඩිවීමකි.

සමාලෝචිත වර්ෂය තුළ දේශීය ණය හා පොලී ගෙවීම සඳහා පිළිවෙලින් රු.බිලියන 608 ක් සහ රු.බිලියන 401 ක් වශයෙන් එකතුව රු.බිලියන 1,009 ක් වැය කර තිබුණි. එම වියදම සමාලෝචිත වර්ෂයේ ලබාගත් දේශීය ණය මුදලෙන් සියයට 92.6 ක ගෙන තිබුණි. ඒ අනුව, දේශීය ණය වලින් ජනරජයේ සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන තිබුණේ සියයට 7.4 ක් වූ ඉතාමත්ම අඩු ප්‍රතිශතයකි. සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ 04 තුළ දේශීය ණය ගැනීම් හා ණය වාරික සහ පොලී ගෙවීම් පහත පරිදි වේ.

වර්ෂය	2013	2012	2011	2010	2009	එකතුව
	රු. බිලියන	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*
ලබාගත් දේශීය ණය	1,090	726	695	639	786	3,936

ණය වාරික ගෙවීම්	608	450	470	383	387	2,298
ණය සඳහා පොලී ගෙවීම්	401	351	312	319	277	1,660
සංවර්ධන කටයුතුවලට උපයෝජනය කරගත් ණය මුදල	81	(75)	(87)	(63)	122	(22)
උපයෝජනය කළ මුදල ප්‍රතිශතයක් ලෙස	7.4	--	--	--	15.5	23

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශනය - 2013

සමාලෝචිත වර්ෂය තුළ විදේශීය ණය හා පොලී ගෙවීම සඳහා පිළිවෙලින් රු.බිලියන 95 ක් හා රු.බිලියන 63 ක් වශයෙන් එකතුව රු.බිලියන 158 ක් පියවා තිබුණු අතර, එම මුදල සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු මුළු විදේශීය ණය මුදලින් 86.3 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. ඒ අනුව, ජනරජයේ සංවර්ධන කටයුතු සඳහා රු.බිලියන 25ක් හෙවත් සියයට 13.7 ක් වැනි අඩු ප්‍රමාණයක් යොදවා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ පසුගිය වසර 04 තුළ ලබාගත් විදේශ ණයවලින් ආපසු ගෙවූ ණය වාර්ක හා පොලිය ගැලපූ පසු ජනරජයේ සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කරගෙන තිබුණේ එම ණය ප්‍රමාණයෙන් සියයට 45 ටත් වඩා අඩු ප්‍රතිශතයකි. විස්තර පහත සටහනේ දැක්වේ.

වර්ෂය	2013	2012	2011	2010	2009	එකතුව
	රු. බිලියන	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*
ලබාගත් විදේශ ණය	183	365	287	261	207	1,303
ණය වාරික ආපසු ගෙවීම්	95	153	72	69	112	501
පොලීගෙවීම්	63	58	40	28	26	215
සංවර්ධන කටයුතුවලට උපයෝජනය කරගත් මුදල	25	154	175	164	69	587
උපයෝජනය කළ මුදල ප්‍රතිශතයක් ලෙස	13.7	42.2	60.4	62.8	33.3	45.0

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූලය ප්‍රකාශනය - 2013

මේ අනුව නිරීක්ෂණය වන්නේ දේශීය හා විදේශීය වශයෙන් ලබා ගන්නා ණයවලින් වැඩි ප්‍රමාණයක් එම ණය වාරික හා පොලී ගෙවීම සඳහා යොදා ගන්නා බවය.

සමාලෝචිත වර්ෂයේ ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට රජය විසින් ගෙවිය යුතු ණය ශේෂය රු.බිලියන 5,996 ක් වී තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.බිලියන 5,409 ක ණය ශේෂය සමඟ සැසඳීමේ දී රු.බිලියන 587 කින් හෙවත් සියයට 10.8ක වැඩිවීමකි. නමුත්. මුදල් හා ක්‍රමසම්පාදන අමාතයාංශයේ ආර්ථික වර්ගීකරණයට අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.බිලියන 6,793.3 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ණය ශේෂය වූ රු.බිලියන 6,000.1 කට වඩා රු.බිලියන 793.2 ක වැඩිවීමකි. සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ 04 තුළ විස්තර පහත දැක්වේ.

රාජ්‍ය ණය සංයුතිය	2013	2012	2011	2010	2009
	රු. බිලියන	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*	*රු. බිලියන*
මුළු දේශීය ණය	3,833	3,233	2,804	2,566	2,401
රුපියල් ණය	56	59	62	88	112
භාණ්ඩාගාර බිල්පත්	700	629	591	514	441
භාණ්ඩාගාර බැඳුම්කර	2,452	2,095	1,819	1,644	1,514
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	369	223	184	174	168
මහ බැංකු අත්තිකාරම්	109	111	95	78	74
අනෙකුත්	147	116	53	68	92
මුළු විදේශීය ණය	2,960	2,767	2,329	2,025	1,761
ව්‍යාපෘති ණය	1,939	1,356	1,640	1,462	1,363
ව්‍යාපෘති නොවන ණය	1,021	1,411	689	563	398
මුළු නොපිය වූ රාජ්‍ය ණය	6,793	6,000	5,133	4,591	4,162
දළ දේශීය නිෂ්පාදිතය	8,674	7,582	6,543	5,602	4,825
නොපියවූ රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස	78.3	79.1	78.4	81.9	86.2

මූලාශ්‍රය - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2013

සමාලෝචිත වර්ෂයේ සමස්ත නොපිය වූ ණය ශේෂය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 78.3ක ප්‍රතිශතයක් ගෙන තිබූ අතර, එය ඉකුත් වර්ෂයට වඩා සියයට 0.8ක අඩුවීමකි.

ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, රජයේ මුළු ණය ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ මුළු බැරකම් වටිනාකම රු.බිලියන 6,345 ක් වේ. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රජයේ මුළු ණය ප්‍රමාණය ගත්විට සියයට 73.1 ක් වී තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේ සියයට 75.3 ට වඩා සියයට 2.2ක අඩුවීමකි. එහෙත් 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3 (ඊ) වගන්තිය අනුව 2013 ජනවාරි 01 දිනයෙන් ආරම්භ වන මුදල් වර්ෂයේ සිට මුළු බැරකම් වටිනාකම ඒ ඒ මුදල් වර්ෂයේ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60ක් නොඉක්මවිය යුතු බවට දක්වා තිබුණද 2013 වර්ෂයේ එම සීමාව සියයට 13.1කින් ඉක්මවා තිබුණි.

2013 දෙසැම්බර් 31 දින වන විට ජනරජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, පැවති මුළු ණය වර්ෂයේ ජනගහනය සමඟ සැසඳීමේ දී ඒක පුද්ගල ණය ප්‍රමාණය රු.331,655 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ඒක පුද්ගල ණය ප්‍රමාණය වූ රු. 296,106ට වඩා රු. 35,549ක වැඩිවීමකි.

බැංකු කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකු පනත යටතේ ශ්‍රී ලංකාවේ බැංකු අංශය නියාමනය කරනු ලැබේ.

බැංකු ක්ෂේත්‍රය ප්‍රමාණවත් ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් සමඟ ශක්තිමත් මට්ටමින් ප්‍රාග්ධනය පවත්වා ගනිමින් ස්ථාවරව පවතී. කෙසේ වුවද, 2012 වර්ෂය සිට පවත්වනු ලැබූ තද මූල්‍ය ප්‍රතිපත්තියේ ඇවිරීම් බලපෑම් හේතුවෙන් 2013 වර්ෂයේදී බැංකුව විසින් පුද්ගලික අංශයට ණය ලබාදීමේ අඩු ප්‍රසාරණය නිසා වර්ෂය තුළදී වත්කම් වර්ධනය සීමාවී තිබුණි. අඩු වූ බාහිර ඉල්ලුම විශේෂයෙන් වර්ෂයේ මුල් භාගය තුළදී වෙළඳ කටයුතු සම්බන්ධයෙන් බලපා තිබූ අතර 2012 ඔක්තෝබර් මාසයේදී ලෝක වෙළෙඳ පොළේ රන් මිල ස්ථාවරව අඩුවීම හේතුවෙන් බැංකුවල උකස් අත්තිකාරම් කළඹ සංවෘතවීමද සිදුවී තිබුණි.

මූල්‍ය ප්‍රවේශය වර්ධනය කරමින් බැංකු ශාඛා ජාලය 2013 වර්ෂයේදී තවදුරටත් ප්‍රසාරණය කරන ලදී. බැංකු අලෙවිසැල් (ශිෂ්‍ය ඉතුරුම් ඒකක ඇතුළත්ව) 89 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) 123 ක් විවෘත කිරීමත් සමඟ 2013 වර්ෂය තුළදී මුළු බැංකු ජාලය පුළුල් කරන ලදී. මෙයින් බැංකු අලෙවිසැල් 71 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 95 ක් බස්නාහිර පළාතෙන් බාහිරව ස්ථාපනය කරන ලදී. ඒ අනුව 2013 වර්ෂය අවසානයට, බැංකු අලෙවිසැල් 6,487 ක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,538 ක් සහිතව බැංකු පද්ධතිය ක්‍රියාත්මක කෙරුණි.

බැංකු ක්ෂේත්‍රයේ ව්‍යූහය

බැංකු ක්ෂේත්‍රයට ඇතුළත් වන්නේ,

- ❖ බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) — බලපත්‍රලාභී වාණිජ බැංකු 24 ක් පවතින අතර, ඒ අතරින් විශාලතම බැංකු දෙක (ලංකා බැංකුව හා මහජන බැංකුව) රජය සතු වේ. බැංකු 12 ක් දේශීය අංශය සතුව පවතින අතර, තවත් බැංකු 12 ක් විදේශ බැංකුවල ශාඛා ලෙස පවතී.

- ❖ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) — දිගුකාලීන ණය දෙන ආයතන, සංවර්ධන බැංකු, ඉතිරිකිරීමේ බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකු ආදියෙන් සමන්විත විශේෂිත බැංකු 09 ක් ක්‍රියාත්මක වේ. ඒවා වැඩි වශයෙන් රජය සතු හා බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් (LCBS) 1/5 ක් පමණ වන වෙළෙඳපොළ කොටස් අයිතිය සහිත බැංකු වේ. රජය සතු තනි විශාලතම බලපත්‍රලාභී විශේෂිත බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි.

සමස්ත වර්ධනය

වත්කම්

බැංකු ක්ෂේත්‍රයේ මුළු වත්කම් සියයට 16.5 කින් රු ට්‍රිලියන 5.9 දක්වා වර්ෂයෙන් වර්ෂය වර්ධනය වී තිබුණි. බැංකු ක්ෂේත්‍රයේ මුළු වත්කම් සැසඳීමේදී 2012 වර්ෂයේ සියයට 19.9 කින් වර්ධනය වී තිබුණි. ණය වර්ධනය සීමාවීම 2012 වර්ෂයේ සියයට 21.1 සිට 2013 වර්ෂයේ දී සියයට 8.8 දක්වා අඩුවීමේ ප්‍රතිඵලය වූයේ 2012 වර්ෂයේ දී මුළු වත්කම්වල ණය සහ අත්තිකාරම් කොටස සියයට 61.8 සිට 2013 වර්ෂයේ සියයට 57.7 දක්වා අඩුවීමයි.එම නිසා යොදවන ලද අරමුදල් අයෝජන කටයුතු සඳහා උපයෝජනය කළ බැවින් 2012 වර්ෂයේ මුළු වත්කම් වල අයෝජන කොටස සියයට 23.9 සිට 2013 වර්ෂයේ දී 28.5 දක්වා වැඩි වී තිබුණි. 2013 වර්ෂය තුළදී මුළු ආයෝජනයන් වැඩි විම සඳහා රජයේ සුරකුම් පත් විශාල ලෙස හේතු වී තිබුණි.

2013 වර්ෂය තුළදී ප්‍රධාන ආර්ථික කාර්යයන් ක්ෂේත්‍ර 5 කට ණය දීමෙන් ණය දීම් වර්ධනය වී තිබුණි. ඉදිකිරිම් (සියයට 26) වෙළඳ (සියයට 21) යටිතල (සියයට 20) නිෂ්පාදන (සියයට 17) සහ ප්‍රවාහන (සියයට 11) ණයදීම් වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වී තිබුණි. (ණය දිම වැඩි වීම සඳහා ඒවායේ අදාළ දායකත්වය වරහන් තුළ දැක්වේ) විශේෂයෙන්, පරිභෝජන සම්බන්ධ කාර්යයන් සඳහා ණය දීම 2013 වර්ෂයේ ණය වර්ධනයට සෘණාත්මකව දායක වී තිබුණි.

වගකීම්

බැංකු ක්ෂේත්‍රය තුළ තැන්පතු ප්‍රධාන අරමුදල් ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවතුණු අතර 2013 වර්ෂය අවසානයට එය මුළු වගකිම්වලින් සියයට 70.2 ක් විය. ණය ගැනීම් මගින් සම්ප්‍රයුක්ත මූල්‍ය පරතරය විශාල ලෙස යා කෙරුණු අතර අරමුදල් ප්‍රභවයන්හි ණය ගැනීම් කොටස 2012 වර්ෂය අවසානයේ සියයට 15.8 සිට 2013 වර්ෂය අවසානය වන විට සියයට 17.1 දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද, තැන්පතුවල හා ණය ගැනීම්වල වර්ෂයෙන් වර්ෂයේ වර්ධනය 2012 වර්ෂය අවසානයට පිළිවෙලින් සියයට 18 කින් හා සියයට 26.6 කින් සිට 2013 වර්ෂය අවසානයට පිළිවෙලින් සියයට 15 සහ සියයට 26.2 දක්වා අඩු වී තිබුණි. විශේෂයෙන්, විදේශීය ප්‍රභවයන්ගෙන් ණය ගැනීම් එජඩො මිලියන 1,618 කින් වැඩිවීම හේතුවෙන් මුළු ණය ගැනීම්වල විදේශ මුදල් ණය ගැනීම් කොටස 2012 වර්ෂයේ සියයට 54.8 සිට 2013 වර්ෂයේ 64.6 දක්වා වර්ධනය වී තිබුණි.

ලාභදායීත්වය

බැංකු ක්ෂේත්‍රයේ ලාභදායීත්වය 2013 වර්ෂය සඳහා රු.බිලියන 74.6ක බදු වලට පසු ලාභයක් වාර්තා කර තිබූ අතර, 2012 වර්ෂය සඳහා බදුවලට පසු ලාභය රු.බිලියන 82.7ක් ලෙස වාර්තා විය. මුළු තැන්පතුවලින් ඉහළ පිරිවැය සහිත කාලීන තැන්පතුවල කොටස වැඩිවීම, ණය වර්ධනයේ සීමා වීම සහ අඩු ඵලදායී වත්කම් වැඩි වීම හේතුවෙන් ශුද්ධ පොලී ආන්තිකය 2012 වර්ෂයේ සියයට 4.1 සිට 2013 වර්ෂයේ සියයට 3.5 දක්වා අඩු වී තිබුණි.

ශුද්ධ පොලී ආන්තිකය අඩුවීම, 2013 වර්ෂයේ දී බැංකු ක්ෂේත්‍රයේ ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම් අඩුවීමේ කොටසක් වශයෙන් නිරූපනය කරන අතර බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සහ ණය ලියා හැරීම් 2012 වර්ෂයේ රු.බිලියන 6.3 සිට 2013 වර්ෂයේ රු. බිලියන 18.4ක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද මෙහෙයුම් වියදම්වල සැලකිය යුතු වැඩිවීමක් නොවූ අතර මේ නිසා බැංකු ක්ෂේත්‍රයේ සියලු ලාභදායීත්ව දර්ශක එනම් ශුද්ධ පොලී ආන්තිකය (NIM), වත්කම් මත ප්‍රතිලාභ (ROA), හිමිකම් මත ප්‍රතිලාභ (ROE) වර්ෂය තුළදී අඩුවී තිබුණි.

බැංකු ක්ෂේත්‍රයේ අවදානම හා සම්පත්

ප්‍රධාන ස්ථාවර දර්ශක යොදාගැනිම මගින් රාජ්‍ය බැංකු හා පුද්ගලික බැංකු පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

ණය අවදානම

2012 වර්ෂයේ රු.බිලියන 23 සිට 2013 වර්ෂය තුළදී අක්‍රීය අත්තිකාරම් (NPAS) මුළු මුදල රු. බිලියන 37 දක්වා වර්ධනය වී තිබුණි. මුළු හිඟ ණයවලට අදාළ අක්‍රීය අත්තිකාරම් අනාවරණය 2012 වර්ෂයේ සියයට 5 සිට 2013 වර්ෂය අවසානයට සියයට 6.7 දක්වා වර්ධනය විය. අක්‍රීය ණය අත්තිකාරම් සඳහා එල්එෆ්සී ක්ෂේත්‍රයේ ගිණුම් ප්‍රතිව්‍යුහගත සමාගම් සමඟ අක්‍රීය අත්තිකාරම් සියයට 92 ක් සඳහා ප්‍රධාන දායකයන් වේ. ණය පාඩු ප්‍රතිපාදන සම්බන්ධයෙන් 2013 වර්ෂය අවසානයට ශුද්ධ අක්‍රීය අත්තිකාරම් අනුපාතය සියයට 2.5 ක් විය. අක්‍රීය ණය අත්තිකාරම් සඳහා මුළු ප්‍රතිපාදන ආවරණය පෙර වර්ෂයේ සියයට 55.6 සිට 2013 වර්ෂයේ සියයට 56.1 දක්වා සුළු වශයෙන් වැඩි වී තිබුණි.

රාජ්‍ය බැංකු වල කාර්යසාධනය

2013 වර්ෂය අවසානයට මුළු බැංකු ක්ෂේත්‍රයේ වත්කම්වලින් සියයට 49 ක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකු 8 ක් විසින් වාර්තා කර තිබුණි. මේ අතරින් ලංකා බැංකුව (BOC) සහ මහජන බැංකුව (PB) පිළිවෙලින් රු.බිලියන 1,193.6 ක සහ රු.බිලියන 926.6 ක වත්කම් පදනමත් සහිත විශාලතම බලපත්‍රලාභී වාණිජ බැංකු දෙක වේ. රු.බිලියන 655 ක වත්කම් පදනමත් සහිත ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන අතර, අනෙකුත් විශේෂිත බැංකු පහ වන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB), ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB), ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව (LDB), ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව (SLSB), සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC) රු.බිලියන 149.2 ක වත්කම් එකතුවක් අත්කරගෙන සිටී. රාජ්‍ය බැංකු වල වත්කම් පදනම 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ දී සියයට 14.3 කින් වර්ධනය වී තිබුණි.

2013 වර්ෂය තුළදී රාජ්‍ය බැංකුවල තැන්පතු පදනම රු. ට්‍රිලියන 2 ක් විය. මෙම බැංකුවල බදුවලට පසු ලාභය 2013වර්ෂයේ සියයට 25 කින් අඩු වී තිබුණු අතර ජාත්‍යන්තර රන් මිලෙහි තියුණු අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස රන් ණය අක්‍රීය අත්තිකාරම් විශාල ලෙස සියයට 71 කින් වැඩි වීම එයට හේතුවී තිබුණි.

සමස්ත බැංකු ක්ෂේත්‍රය සැසඳීමේ දී 2013 වර්ෂය සඳහා රජය සතු බැංකුවල ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් කිහිපයක් පහත වගුවෙන් දැක්වේ.

	බැංකු ක්ෂේත්‍රය	රාජ්‍ය බැංකු
	2013	**2013**
	රු. බිලියන	*රු. බිලියන*
වත්කම්	5,942.0	2,924.4
ණය සහ අත්තිකාරම්	3,427.0	1,718.5
අක්‍රීය අත්තිකාරම්	191.9	94.3
තැන්පතු	4,170.0	2,209.7
මුළු ණය ගැනීම්	1,015.0	387.2
ශුද්ධ පොලී ආදායම	196.7	92.6
බදු වලට පෙර ලාභය	104.7	32.1
බදු වලට පසු ලාභය	74.6	23.6
වත්කම් මත ප්‍රතිලාභ (ROA) (ප්‍රතිශතය)	1.26	0.8
හිමිකම් මත ප්‍රතිලාභ (ROE) (ප්‍රතිශතය)	15.2	17.8
අක්‍රීය අත්තිකාරම් අනුපාතය (ප්‍රතිශතය)	5.6	5.5

වගුව : රාජ්‍ය බැංකුවල ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්

මූලාශ්‍රය - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, රාජ්‍ය බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

ඒකාබද්ධ අරමුදලට දායකය

රාජ්‍ය බැංකු විසින් ලාභාංශ, බදු හෝ ලාභ කොටස ලෙස ඒකාබද්ධ අරමුදලට සිදුකරන ලද ගෙවීම් 2013 වර්ෂයේදී බිලියන 43.605 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ රු බිලියන 54.751 සමඟ සැසඳීමේ දී ප්‍රධාන

වශයෙන් අඩු ලාභදායිත්වය හේතුවෙන් සියයට 20 ක අඩුවීමක් දැක්වේ. රජය සතු බැංකු 6 මඟින් කරන ලද දායකත්වය වගුවෙහි දැක්වේ.



ප්‍රස්ථාරය - 2012 සහ 2013 වර්ෂවලදී ඒකාබද්ධ අරමුදලට රාජ්‍ය බැංකුවල දායකත්වය

බැංකු ක්ෂේත්‍රයේ කාර්ය සාධනය

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රය ඒකරාශිව පැවතේ. විශාලතම දේශීය බලපත්‍ර ලාභී බැංකු 6 එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව සහ සෙලාන් බැංකුව සමස්තව වැදගත් ලෙස හැදින්වේ.

වාණිජ බැංකු මඟින් 2013 වර්ෂයේදී රු බිලියන 175.9 ක් වූ ණය පුද්ගලික අංශයට ලබා දී තිබුණි. මෙය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 7.5 ක වැඩිවීමක් විය. කෙසේ වුවද 2012 වර්ෂයේදී පවත්වා ගෙන ගිය තද මුදල් ප්‍රතිපත්තියේ ඇවිරිම් බලපෑම් නිසා 2013 වර්ෂයේ පුද්ගලික අංශයට ණයදීමේ අඩු ප්‍රසාරණය හේතුවෙන් වර්ෂය තුළ වත්කම් වර්ධනය සීමා විය. අඩු වූ බාහිර ඉල්ලුම විශේෂයෙන් වර්ෂයේ මුල් භාගය තුළදී වෙළඳ කටයුතු සම්බන්ධයෙන් බලපා තිබු අතර 2012 ඔක්තෝබර් මාසයේදී ලෝක වෙළෙඳපොළේ රන් මිල ස්ථාවරව අඩුවීම හේතුවෙන් බැංකුවල උකස් අත්තිකාරම් කළඹ සංවෘතවීමද සිදුවී තිබුණි.

ප්‍රධාන විගණන අවධානයන්

ලංකා බැංකුව

අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු හේතුවෙන් 2013 වර්ෂය තුළදී පහත සඳහන් මූල්‍ය වංචා සිදු වී තිබුණි.

- මෙට්‍රොපොලිටන් ශාඛාව - රු මිලියන 5.8 ක අරමුදල් වංචනිකව මාරුකිරීම

  මෙට්‍රොපොලිටන් ශාඛාවේ මියගිය ගණුදෙනුකරුවකුගේ අනේවාසික විදේශ මුදල් ගිණුමකින් රු මිලියන 5.8 ක මුදලක් වංචනිකයකු විසින් කරන ලද වංචනික ඉල්ලීමක් මත බැංකුව විසින් 2013 ඔක්තෝබර් 23 දින දේශීය පුද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමකට මාරු කර තිබුණි.

  මූලික විමර්ශනයේ නිරීක්ෂණවලට අනුව, අරමුදල් මාරු කිරීමේදී කළමනාකරු සහ සහකාර කළමනාකරු විසින් සම්පූර්ණයෙන් නොසැලකිලිමත් ආකාරයෙන්, 'අත්සන වෙනස්' යනුවෙන් තබා තිබූ සටහන පිළිබඳව බැහැර වීමෙන් හා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමණාකරුට යොමු කිරීමෙන් තොරව තම රාජකාරීන් සිදු කර තිබූ බව අනාවරණය විය.

  විමර්ශනයන් තවදුරටත් කෙරෙමින් පවතින අතර මෙම කරුණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇත.

* පුද්ගල ශාඛාව - රු මිලියන 11.1 ක අරමුදල් වංචනිකව මාරු කිරීම.

  පුද්ගල ශාඛාවේ ගනුදෙනුකරුවෙකුගේ DFC ගිණුමෙන් රු මිලියන 11.1 කට USD 86,384 ක් අසත්‍ය ප්‍රභවයක් මත වංචනිකයකු විසින් කරන ලද වංචා සහගත ඉල්ලීමක් මත බැංකු විසින් සයිප්‍රස් බැංකුවේ ගිණුමකට මාරුකර තිබුණි.මෙම කරුණ සම්බන්ධ විමර්ශනයන් ප්‍රගතියේ පවති.

* බොගවන්තලාව ශාඛාව - රු මිලියන 8 ක් වටිනා රන් භාණ්ඩ වංචනිකව ඉවත්කර ගැනිම.

  බොගවන්තලාව ශාඛාවේ කළමනාකරු ලෙස කටයුතු කළ නිලධාරියකු විසින් සුරක්ෂිතාගාරයේ තැන්පත් කර තිබූ ගනුදෙනුකරුවන් විසින් උකසට තබන ලද රන් භාණ්ඩ වංචනිකව ඉවත් කර තිබුණි. ඉවත් කරගෙන තිබූ භාණ්ඩ සඳහා බැංකුව විසින් ගෙවන ලද මුළු අත්තිකාරම් දළ වශයෙන් රු මිලියන 8 ක් විය. කළමනාකරු බැංකු සේවයෙන් විශ්‍රාම ලබා සිටියද, ඇයගේ විශ්‍රාම ප්‍රතිලාභ බැංකුව විසින් රඳවාගෙන තිබුණි.මෙම කරුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇති අතර විමර්ශනයන් ක්‍රියාත්මක වෙමින් පවතී.

* බෝපිටිය ශාඛාව - උකස් අත්තිකාරම් රු මිලියන 18 ක් වංචනිකව නිර්මාණය කිරිම.

  බැංකුවේ කණිෂ්ඨ විධායක නිලධාරියකු විසින් රු මිලියන 18 ක මුදලක් වංචනිකව නිර්මාණය කර වංචා කර තිබුණි. වංචාව සොයා ගන්නා ලද අවස්ථාවේදී පද්ධතියේ උකස් අත්තිකාරම් විය. වංචාව සිදුකළනිලධාරියා රටින් පිටව ගොස් තිබුණ අතර ඔහුගේ සේවය තහනම් කර තිබුණි.සම්පූර්ණයෙන්ම නොසැලකිලිමත් ආකරයෙන් රාජකාරි සිදු කරන ලද කළමනාකරුට විනය ක්‍රියා මාර්ග අවසන් වනතුරු බැංකු සේවය තහනම් කරන ලදි. මෙම කරුණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇත.

- මාකදුර ව්‍යාප්ති කාර්යාලය - රුපියල් මිලියන 3 ක් වටිනා රන් භාණ්ඩ වෙනුවට ව්‍යාජ රන් භාණ්ඩ වංචනිකව ආදේශ කිරීම.

  මෙම කාරණයේදී බැංකුවට උකසට තබා තිබූ රන් භාණ්ඩ වෙනුවට මාකදුර ශාඛාවේ කළමනාකරු ලෙස කටයුතු කළ බැංකු නිලධාරියා විසින් ව්‍යාජ භාණ්ඩ වංචනිකව ආදේශ කර තිබුණි. ඉවත් කරන ලද රන් භාණ්ඩවල වටිනාකම දළ වශයෙන් රුපියල් මිලියන 3 ක් වූ අතර නිලධාරියාට බැංකු සේවය තහනම් කරන ලදී. තවදුරටත් විමර්ශනයන් ප්‍රගතියේ පවතී.

- මෙට්‍රොපොලිටන් ශාඛාව -අනුමැතිය නොමැතිව එ.ජ.ඩො. 750,000 ක අරමුදල් මාරු කිරීම.

  ගනුදෙනුකරුවෙකු විසින් එ.ජ.ඩො.784,562 ක්වූ (පොලිය සහිතව) තම ස්ථාවර තැන්පතුව බැංකුව විසින් අනුමැතිය නොමැතිව මාරු කර තිබූ බවට චෝදනා කර තිබුණි. මේ සඳහා අදාළ ඉල්ලීම් හා වෙනත් ලියකිවිලි ඊ මේල් මගින් භාර දී තිබුණි. යූ.ඒ.ඊ (UAE) හි බැංකු නියෝජිත නිලධාරියා හා මෙට්රොපොලිටන් ශාඛාවේ බැංකු කළමනාකරු විසින් ගනුදෙනුකරු හඳුනා ගැනීම දුරකථනය මගින් යළි තහවුරු කරගෙන නොතිබුණි.

  කෙසේ වුවද බැංකු කළමනාකරු විසින් තවදුරටත් ඉහළ අධිකාරියකින් උපදෙස් ලබා ගැනීමෙන් තොරව මෙම අරමුදල් මාරු කිරීම සිදුකර තිබුණි. ගනුදෙනුකරු විධිමත්ව හඳුනා ගැනීමෙන් තොරව නොසැලකිලිමත් ආකාරයෙන් බැංකුව විසින් එකී ගනුදෙනුව සිදු කර තිබුණි.

- පුද්ගල ශාඛාව - විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුමෙන් (SFIDA) අරමුදල් මාරු කිරීම.

  පුද්ගල ශාඛාවේ ගණුදෙනුකරුවෙකුගේ විශේෂ විදේශ ආයෝජන තැන්පතු (SFIDA) ඉතිරි කිරීමේ ගිණුමෙන් එ.ජ.ඩො 70,000 ක් හා (GBP) මහා බ්‍රිතාන්‍ය පවුම් 200,000 ක් වූ අරමුදල් ගනුදෙනුකරුවකු විසින් විවිධ ඊ මේල් යොදාගනිමින් කරන ලද වංචනික ඉල්ලීමක් මත චීන බැංකු ගිණුමකට හා යූ.ඒ.ඊ (UAE) බැංකු ගිණුමකට බැංකුව විසින් මාරු කර තිබුණි. මෙම කරුණ සම්බන්ධ විමර්ශනයන් ප්‍රගතියේ පවතී.

මහජන බැංකුව

❖ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 - මූල්‍ය උපකරණ ගණනය කිරීම හා හඳුනාගැනීම ප්‍රමිතිය උල්ලංඝණය කරමින් කල් පිරීම සඳහා තිබූ මූල්‍ය වත්කම් වටිනාකම මුල් ඵලදායී පොලී අනුපාතය යොදාගෙන ක්‍රමක්ෂය කරනු වෙනුවට සාමාන්‍ය පොලී අනුපාත ක්‍රමය පදනම්ව ගණනය කර තිබුණි. මෙම සාවද්‍ය

ගණනය කිරීම හේතුවෙන් කල් පිරීමට තිබූ මූලා වත්කම් වටිනාකම රු.36,960,694 කින් වැඩියෙන් දක්වා තිබුණි.

- ❖ බැංකුවේ වැටුප් දෙපාර්තමේන්තුව විසින් වැටුප් ලැයිස්තු නිවැරදිව සැකසීම් කිරීම පහසුවනු පිණිස සේවකයන් සම්බන්ධයෙන් විධිමත් හා ක්‍රමානුකූල වාර්තා පවත්වා නොතිබුණු බැවින් වැටුප් ලැයිස්තු හා මූලා ප්‍රකාශන අතර, රු.56,015,643 ක වෙනසක් නිරීක්ෂණය විය.

- ❖ ආයතනික බැංකු කටයුතු අංශය විසින් ගනුදෙනුකරුවකුට වෙළඳ මූලා ණය පහසුකම් ලබාදී තිබූ අතර, එම අක්‍රීය ණයවල මුළු හිඟ ශේෂය රු. 220,000,000 ක් වූ එහි වලංගු විකුණුම් වටිනාකම (Forced Sale Value) 2014 ජනවාරි 22 දිනට රු.792,352,875 කින් ඉක්මවා තිබුණි.

- ❖ 2014 ජනවාරි 28 දිනට අක්‍රීය ලෙස පවතින රු. 17,020,362 ක් වූ කෙටිකාලීන ණය පහසුකම් අයකර ගැනීමෙන් තොරව පැවති අතර කිසිදු නිශ්චල දේපලකින් සුරක්ෂිත කර නොතිබුණි.

- ❖ 2013 දෙසැම්බර් 31 දිනට සේවක ණය කළඹෙහි ඇතුළත් රු.260,050,066 ක් වූ ණය ශේෂයන් අක්‍රීය ණය ලෙස පැවති බව නිරීක්ෂණය විය.අක්‍රීය ශේෂයන් අයකර ගැනීම කෙරෙහි කළමනාකාරීත්වය ඵලදායී පියවර ගෙන නොතිබුණු අතර සේවක ණය ශේෂයන් එම වර්ගීකරණයට ඇතුළත්වීම වැළැක්වීමට හා විධිමත් අයකරගැනීම් තහවුරු කර ගැනීමට ඵලදායී පාලනයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

- ❖ හිමිකම් නොපෑ තැන්පතු සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල්

  2013 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපෑ තැන්පතු සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල රු.659,014,723 ක් විය. ලැබිය යුතු මුදලින් සියයට 24 ක් හෙවත් රු.160,986,618 ක් වර්ෂ 9 කට වැඩි කාලයක් ඉකුත්ව තිබුණි. වර්ෂ එකකට වැඩි කාලයක් ඉකුත් වූ මුදල් ප්‍රතිශතය සියයට 94 ක් විය.

  2013 වර්ෂය සඳහා මූලා ප්‍රකාශන අනුව, ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු පොලී ඇතුළත් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු හිමිකම් නොපෑ තැන්පතු වටිනාකම රු.957,891,777 ක් විය. කෙසේ වුවද ප්‍රතිපූර්ණයන් සඳහා හිමිකම් භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණද, මෙම මුදල ලැබී නොතිබුණි.

මිල ප්‍රකාශිත සමාගම්වල කොටස් ආයෝජන මත ප්‍රතිලාභ

- ❖ 2013 වර්ෂයේ වෙළඳ ආයෝජන කොටස් විකිණීමෙන් ප්‍රාග්ධන ලාභය රු.189,164,668 ක් විය. 2013 වර්ෂයේදී සමස්ත වෙළඳ ආයෝජන මත ප්‍රාග්ධන ලාභ අනුපාතය සියයට 3.68 ක් විය.

- 2013 වර්ෂයේදී මිල ප්‍රකාශිත සමාගම් 3 ක දිගුකාලීන ආයෝජනයන්ගෙන් ලැබුණු ලාභාංශ රු.150,223,421 ක් වූ අතර, සමාගම් 3 හි ආයෝජිත පිරිවැයෙන් සියයට 5.34 ක් එයින් නියෝජනය විය.

- සමාගම් 10 කින් කිසිඳු ලාභාංශයක් 2013 වර්ෂයේදී ලැබී නොතිබුණු අතර ආයෝජන පිරිවැය රු.1,193,572,481 ක් විය. 2013 වර්ෂය අවසානයට මිල ප්‍රකාශිත සමාගම්වල කරන ලද රු.7,950,328,654 ක් වූ මුළු ආයෝජනයවල පිරිවැයෙන් සියයට 15.01 ක් එම ආයෝජනයෙන් නියෝජනය විය.

ලාභාංශ නොමැතිව ආයෝජන වටිනාකම ක්ෂය වීම

- වත්කම් කළමනාකරණ අංශය විසින් මිල ප්‍රකාශිත සමාගම් 7 ක කරන ලද ආයෝජනවල පිරිවැය රු. 744,681,081 ක් වූ අතර ඒ සඳහා 2013 වර්ෂය අවසානයට කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. මිල ප්‍රකාශිත සමාගම්වල කරන ලද රු. 7,950,328,654 ක් වූ මුළු ආයෝජන පිරිවැයෙන් සියයට 9.37 ක් එම ආයෝජනවලින් නියෝජනය වූ අතර මෙම ආයෝජනයන්හි වෙළෙඳපොල වටිනාකම පිරිහීම රු.403,333,135 ක් විය.

- මිල ප්‍රකාශිත සමාගම්වල කරන ලද ආයෝජනවල වෙළඳපොල වටිනාකම රු. 276,650,081 ක් වූ අතර එය 2011,2012 හා 2013 වර්ෂ වලදී රු.157,440,880 කින් පිරිහී තිබුණි.

ප්‍රමාණවත් ප්‍රතිලාභ නොමැතිව ස්කන්ධ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම

2013 දෙසැම්බර් 31 දිනට රු. 1,267,575,023 ක ස්කන්ධ සුරැකුම්පත් 4 ක් විය. කෙසේ වුවද, රු. 57,363,543 ක් වූ එක් ස්කන්ධ සුරැකුම්පතකින් පමණක් රු. 6,090,000 ක් ලාභාංශ ලැබී තිබුණි. ඒ අනුව ස්කන්ධ සුරැකුම්පත්වල ආයෝජනය මත ප්‍රතිලාභය 2013 වර්ෂයේදී සියයට 0.48 ක්වූ ඉතා අඩු වටිනාකමක් විය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

- 2013 දෙසැම්බර් 31 දිනට ශාඛා 11 ක ස්ථාවර තැන්පතු හා ඉතිරිකිරීමේ ගිණුම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ශේෂය මඟින් හා පරිගණක පද්ධතිය මඟින් ජනනය වූ ශේෂයන් අතර රු. 31,217,166 ක් වූ වෙනස්කම් නිරික්ෂණය විය.

- 2013 වර්ෂය අවසානයට වෙන් නොකළ ගිණුම් සම්බන්ධයෙන් එකතුව රු. 150,378,908 ක් වූ මූල්‍ය ප්‍රකකාශනවල දක්වා තිබුණු ශේෂයන් හා එකතුව රු.160,602,178 ක් වූ පරිගණක පද්ධතියෙන් ජනනය වූ ශේෂයන් අතර රු. 10,212,122 ක වෙනස්කම් නිරික්ෂණය විය.

- ❖ වත්කම් වල පිරිවැය හා සමුච්චිත ක්ෂය සම්බන්ධයෙන් ලෙජරයේ දැක්වෙන ශේෂ හා ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන ශේෂ අතර පිළිවෙලින් රු. 6,369,435 ක් වූ හා රු. 7,384,579 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC)

- ❖ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 158.01 ක බදුවලට පසු ලාභයක් වූ ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදුවලට පසු ලාභය රු. මිලියන 55.53 ක් වූ හෙයින් බදුවලට පසු ලාභය රු. මිලියන 102.48 කින් එනම් සියයට 182 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ ආයෝජන දේපල මත රු මිලියන 95 ක ප්‍රත්‍යාගණන ලාභය හඳුනා ගැනීමයි.

- ❖ 2013 සැප්තැම්බර් 26 හා 2013 ඔක්තෝබර් 31 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සෑම හිඟ ණය ශේෂයක් සඳහාම ණය පරිපාලන ගාස්තුවක් ලෙස 2012 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි ගාස්තුවක් අයකිරීම මඟින් නව ආදායම් ප්‍රභවයක් ඇති කිරීම අනුමත කරන ලදී. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු. 88,382,116 ක් ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ ණය පරිපාලන ගාස්තු රු. 48,736,213 ක් බව නිරීක්ෂණය විය.

- ❖ තවද, 2003 අංක 15 දරන පනතින් හා 2011 අංක 45 දරන පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු පනතේ දැක්වෙන කාර්යය වන සමාජයේ ආර්ථික වශයෙන් අවාසි සහගත පුද්ගලයන්ට බැංකුව විසින් නිවාස සැපයීම සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම වුවද ඉහත කාර්යයන් එයට පරස්පර වන බව නිරීක්ෂණය විය.

- ❖ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන් ලබාදුන් "ශ්‍රම උදාන ණය" සඳහා සේවක අර්ථසාධක අරමුදලින් ණය පරිපාලන ගාස්තු ලෙස රු.46,541,725ක මුදලක් බැංකුව විසින් එම තීරණය පිළිබඳ ගනුදෙනුකරුවන්ට ලිඛිත දැන්වීම් සිදුකිරීමෙන් තොරව ඉල්ලා තිබූ බව නිරීක්ෂණය විය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

- ශුද්ධ ලාභ අනුපාතය 2012 වර්ෂයේදී වූ සියයට 11.21ට සාපේක්ෂව 2013 වර්ෂයේදී සියයට 3.61 දක්වා අඩු වී තිබුණි. ස්ථාවර තැන්පතු පිළිබඳ ඉහළ විශ්වාසය හේතුවෙන් පොලී වියදම වැඩි වීම සහ අක්‍රීය ණය වර්ධනය හේතුවෙන් හානිකරණය වැඩි වීම ලාභදායිත්වයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. 2013 වර්ෂයේදී බැංකුවේ මුළු ණය කළඹෙන් සියයට 7 කින් අක්‍රීය ණය නියෝජනය වූ අතර එය 2012 වර්ෂයේදී සියයට 4 ක් විය. රු.348,787,046 ක් වූ උකස් අත්තිකාරම් මත ප්‍රාග්ධන පාඩුව සඳහා කරන ලද විශේෂිත ප්‍රතිපාදන ලාභදායිත්වයේ අඩුවීමට හේතු වී තිබුණි.

- සාමාන්‍ය LSB අනුපාතය වූ සියයට 3.7 සමඟ සැසඳීමේදී 2013 දෙසැම්බර් 31 දිනට බැංකුව සියයට 5.92 ක ඉහළ පොලී ආන්තිකයක් වාර්තා කර තිබුණි.

- බැංකුවේ මුළු ආදායමට පොලී නොවන ආදායමේ දායකත්වය සියයට 5.04 ක් පමණක් වන අතර එය සාමාන්‍ය LSB අනුපාතය වූ සියයට 9.78 ට වඩා සැලකිය යුතු ලෙස අඩු වේ. එබැවින් බැංකුව විසින් පොලී ආදායම පිළිබඳ ඉහළ අවධානයක් යොමු කරන අතර පොලී අනුපාතයන් වෙනස් කිරීම අවදානම් සහිත වේ.

- 2013 වර්ෂයේ බැංකු ව්‍යාපාර විශ්ලේෂණයට අනුව, සාමාන්‍ය LSB අනුපාතය වූ සියයට 48ට සාපේක්ෂව පුද්ගල පිරිවැය, පොලී වියදම් හා ගාස්තු සහ කොමිස් වියදම හැර මුළු වියදමෙන් සියයට 72ක් ලෙස ඉහළම අනුපාතය වාර්තා කරන ලදි.

- 2013 දෙසැම්බර් 31 දිනට මුළු තැන්පතු වලින් සියයට 61 ක් නියෝජනය වන ඉහල පිරිවැයක් සහිත ස්ථාවර තැන්පතු මත බැංකුවේ තැන්පතු ව්‍යුහය ඉහල අවධානයක් යොමු කර තිබුණි.විශාල පිරිවැය සහිත ස්ථාවර තැන්පතු මත ඉහල විශ්වාසය අරමුදල් පිරිවැය සඳහා අහිතකර ලෙස බලපායි. 2013 දෙසැම්බර් 31 දිනට මුළු පොලී වියදමෙන් සියයට 83ක් ස්ථාවර තැන්පතු මත පොලී වියදම නියෝජනය කරයි.

- 2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ණය කළඹෙන් සියයට 38ක පමණ ප්‍රමාණයක් බැංකුවේ උකස් ණය කළඹ වේ. උකස් අත්තිකාරම් පිළිබඳ ඉහළ ණය අවධානය බැංකුවේ ද්‍රවශීලතාවයට බලපෑමක් විය හැකිය.

2013 වර්ෂයේ බැංකු ක්ෂේත්‍රයේ සංවර්ධනයන්

2013 වර්ෂයේ දී සියයට 8.76 ක පොලී අනුපාතිකයකට එකතුව එ.ජ.ඩො. මිලියන 750 ක් වූ ඩොලර් අරමුදල් වර්ෂ 5 කින් කල් පිරීම සමඟ ලබා ගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සාර්ථකව සමත් වූ අතර ලංකා බැංකුව එහි වර්ෂ 5 ක දෙවෙනි ජාත්‍යන්තර ඩොලර් බැඳුම්කරය වූ එ.ජ.ඩො. මිලියන 500 6.8 වාරයක් වැඩියෙන් දායකව සියයට 5.325 ක ඉහළ අනුපාතයකට ලබා ගැනීම මඟින් තවත් වැදගත් අවස්ථාවක් සනිටුහන් කරයි.

බැංකු ක්ෂේත්‍රයේ අභියෝග

වත්කම් තත්ත්වය, කළමනාකරණය, සීඝ්‍ර ප්‍රසාරණයේ දී අඩු ප්‍රාග්ධන පිරිවැයට ප්‍රවේශය, අයහපත් අවදානම් කළමණාකරණ ව්‍යවහාරයන් සහ අඩු පොලී පාලන ක්‍රම වල පටු ආන්තිකයන් ලෙස ලාභදායිත්වය පවත්වා ගැනීම සහ ණය අයකර ගැනීමේ දී දුර්වලතා ආදී සැලකිය යුතු අභියෝග වලට ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රය මුහුණ දෙයි.

ජාතික ආරක්ෂාව හා නාගරික සංවර්ධනය

ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍ය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කර ගැනීම, ජාතික ආරක්ෂාව සහ රට තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වන අතර එය ඉටු කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රණවිරු සේවා අධිකාරිය, ශ්‍රීමත් ජෙනරල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, සහ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය අයත්වේ.

ඉහත කාර්යයන් ඉටුකිරීමෙහිලා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තු විසින් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා දරා ඇති වියදම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

	2013	2012
	රු. මිලියන	*රු. මිලියන*
පුනරාවර්තන වියදම	241,034	220,743
ප්‍රාග්ධන වියදම	33,070	17,830
එකතුව	**274,104**	**238,573**

උතුරේ පැවති යුද්ධය අවසන් වීමෙන් පසුව ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්ගේ ශ්‍රම දායකත්වය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉටුකරන ප්‍රධාන ව්‍යාපෘති හරහා මෙන්ම ස්වාධීනව හමුදා යාන්ත්‍රණය තුළින් සුළු පරිමාණයේ සිට මහා පරිමාණය දක්වා විවිධ ව්‍යාපෘති වලට ලබාගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කිරීම තුළින් ඔවුන්ගේ ශ්‍රමය ද රටේ සංවර්ධනය සඳහා දායක කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත. ඉහත දත්තයන් විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ත්‍රිවිධ හමුදාව ප්‍රධාන කොට අමාත්‍යාංශයට අයත් සෑම ආයතනයකම වාර්ෂික වියදම ඉහළ ගොස් ඇති බවයි. 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති විශාල සංඛ්‍යාවකට ශ්‍රම දායකත්වය ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් කොළඹ නගරය ආශ්‍රිතව පැරණි ගොඩනැගිලි සංරක්ෂණය හා අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති 47 ක්, ක්‍රීඩා පිටි අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති 2 ක්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති 5 ක්, වැව් අමුණු ප්‍රතිසංස්කරණ කිරීමේ ව්‍යාපෘති 8 ක් ඇතුළු තවත් ප්‍රධාන පෙළේ

ව්‍යාපෘති 26 ක් ක්‍රියාත්මක කර තිබුණි. මීට අමතරව ස්වභාවික ආපදා අවස්ථාවලදී පොදු මහජනතාවට සහන සැලසීමේ කාර්යයන් 116 කට දායකත්වය ලබා දී තිබුණි. එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි සඳහා හට පිරිස් යෙදවීම හා උපකරණ සැපයීම් තුළින් ඇමරිකන් ඩොලර් 25,042,462 ක විදේශ විනිමයක් උපයාගෙන තිබුණි.

ශ්‍රී ලංකා නාවික හමුදාව 2013 වර්ෂයේ දී සෝමාලි මුහුදු කොල්ල කරුවන්ගෙන් ශ්‍රී ලංකා මුහුදු සීමාව ආරක්ෂා කර ගැනීම සාර්ථක ලෙස ඉටුකර තිබුණි. එමෙන්ම නීති විරෝධි සංක්‍රමණකයින් හා විගමනකයින් 1,019 දෙනෙකු අත් අඩංගුවට ගෙන තිබුණු අතර නාවික හමුදා බුද්ධි අංශ විසින් මත්ද්‍රව්‍ය සම්බන්ධ සැකකරුවන් 07 දෙනෙකු අත් අඩංගුවට ගෙන තිබුණි. නෞකා ආරක්ෂක අවි ගබඩා කිරීමේ ව්‍යාපෘතිය, මුහුදු ආරක්ෂකයින් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය, අවි පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය සහ මුහුදු ආරක්ෂකයින් වෙඩි තැබීම සඳහා පුහුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් 2013 වර්ෂයේ දී රු. 969,222,940 ක විදේශ විනිමයක් උපයා ගෙන තිබුණි. මීට අමතරව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ කටයුතු වලට සහාය වීම තුළින් පිළිවෙලින් රු.110,996,000 ක් සහ රු.48,617,000 ක් වටිනා ශ්‍රමදායකත්වයක් ලබා දී තිබුණි. එමෙන්ම රජය සතු ගොඩනැගිලි අළුත්වැඩියාව, රෝහල් වාට්ටු ඉදිකිරීම, රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම, මාර්ග සංවර්ධනය සහ ආගමික ස්ථාන සංවර්ධනය යනාදී කාර්යයන්ට රු.321,031,452 ක ශ්‍රමදායකත්වයක් ලබා දී තිබුණි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2013 වර්ෂය තුළදී ගුවන් පැය 10,283 ක පියාසර කටයුතු වල යෙදී තිබුණු අතර ඉන් පැය 2,681 ක් ගුවන් මෙහෙයුම් සඳහා යොදවා තිබුණි. නියමුවන් රහිත යානා මඟින් නිරීක්ෂණ පියාසර පැය 14.45 ක් පාබල හා නාවික මෙහෙයුම් වලට සහාය දී තිබුණි. එමෙන්ම පාබල , නාවික හා ගුවන් හමුදාවේ නිලධාරීන් 27,990 කට ගුවන් ප්‍රවාහන පහසුකම් සැපයීම හා කි.ග්‍රෑ. 83,673 ක් භාණ්ඩ ප්‍රවාහනය සිදුකර තිබුණි. ඉහත සේවාවන්ට අමතරව ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට ගුවන් යානා තාක්ෂණික ශිල්පීන් 6 දෙනෙකු සේවය සඳහා ලබා දීම, ගුවන් හමුදා ඉංජිනේරු හා තාක්ෂණික ශිල්පීන්ගේ දැනුම හා ක්‍රියාකාරීත්වය මඟින් කටුනායක හා රත්මලාන ගුවන් යානා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් ගුවන් යානාවල විවිධ ආකාරයේ අළුත්වැඩියා කටයුතු සිදු කර තිබුණි. ඊට අමතරව විශේෂයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා වෙනත් ව්‍යාපෘති 12 ක් සඳහා ශ්‍රමදායකත්වය ලබාදීම තුළින් ජාතික ආර්ථිකයට විශාල සේවාවක් ගුවන් හමුදාව මඟින් ලබාදී තිබුණි.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කටයුතු බළකා මූලස්ථාන 19 ක් සහ උප බළකා මූලස්ථාන 11 ක් මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. 2013 වර්ෂයේ ඉටු කරන ලද ව්‍යාපෘති අතර විහාර මහාදේවි උද්‍යානයේ සංවර්ධන කටයුතු, එල්ෆින්ස්ටන් රඟහල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ අලි වැට ඉදිකිරීම හා නඩත්තු කිරීම වැනි සංවර්ධන ව්‍යාපෘති ප්‍රධාන තැනක් ගන්නා ලදි. ඊට අමතරව දිවයින පුරා පිහිටි ආගමික ස්ථාන සංවර්ධන කටයුතු කිරීමට ශ්‍රමදායකත්වය ලබා දී ඇත.

විගණන නිරීක්ෂණයන්

- 2011 ජූලි 18 දින සිට 2014 ජූලි 30 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දී රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයට පුද්ගලයින්, පෞද්ගලික ආයතන, රාජ්‍ය ආයතන සහ තානාපති කාර්යාල 46කින් ත්‍යාග වශයෙන් මුදලින් ලැබී තිබුණු රු.127,647,083 ක් වූ මුදල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 170(2) ප්‍රකාරව කටයුතු කර, අදාල මුදල් රාජ්‍ය ආදායමට ''බැර'' කළයුතු වුවත්, එපරිදි කටයුතු නොකර එම මුදලින් රු. 107,308,091 ක මුදලක් වැය කර ඉතිරි මුදල වූ රු. 20,338,992 ක මුදල 2014 අගෝස්තු 31 වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

- ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් බාහිර පාර්ශවයන් වෙත ගොවිපල නිෂ්පාදන විකිණීම, සංගීත කණ්ඩායම් සැපයීම, ආපන ශාලා, සුභ සාධන වෙළඳසැල්, කරණවැමි සේවා සහ ටේලර් සේවා පවත්වාගෙන යාම මගින් උපයනු ලබන ආදායම්, කඳවුරු භූමිය තුල ඇති භෝග විකිණීම, සුනඛ සංදර්ශන පැවැත්වීම, ගුවන් යානා හා නෞකා මෙහෙයවීම් කටයුතු, ගුවන් යානා හා නැව් අලුත්වැඩියාකිරීම් මගින් ලැබෙන ආදායම් සහ රජයේ වත්කම් යොදාගනිමින් උපයාගන්නා අනෙකුත් සියළුම ආදායම් ඒකාබද්ධ අරමුදලට ''බැර'' කර, එපරිදි ඒකාබද්ධ අරමුදලට ''බැර'' කරන ලද මුළු ආදායම ම අපි වෙනුවෙන් අපි අරමුදලට ප්‍රදානයක් ලෙස ලබා දිය යුතු බවත්, බාහිර සේවා සැපයීමෙන් ලබන ආදායමෙන් කොටසක් අදාල කාර්යයන්හි නිරත වූ නිලධාරීන් අතර බෙදාදීමට කටයුතු නොකළ යුතු බවත්, 2009 ජනවාරි 23 දිනැති අංක එම්ඕඩී/එෆ්ඩී/අයිඒ/5/3(2) අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඒ මත ගත් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පැහැදිලිව දක්වා තිබියදීත්, 2014 අගෝස්තු 31 දින වන විටත් එම සියළුම ආදායම් නිලධාරින්ගේ සුභ සාධනය උදෙසා පවත්වා ගෙන යනු ලබන විවිධ අරමුදල්වලට ''බැර'' කර තිබුණි. එසේ රැස්කර තිබුණු ආදායම් පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලන ලද නමුත් එම තොරතුරු විගණනයට ලබා දී නොතිබුණි.

- හෝටල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ලබාදුන් ඉඩමක් වෙනුවෙන් ලැබී තිබුණු රු.19,817,306,000 ක් සහ 2014 ජූලි 31 දින දක්වා එයින් ඉපයූ ආදායම වූ රු. 4,853,809,345ක් ද වශයෙන් එකතුව රු.24,671,115,345ක ශේෂයක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වෙනි ව්‍යවස්ථාව හා රජයේ මුදල් රෙගුලාසි වලට අනුව රාජ්‍ය ආදායමට ''බැර'' කළයුතු වුවත් එසේ නොකර රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.7,120,497,622ක් ගෙවීම් කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.17,343,327,720 ක් විය.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේ සරසවි සිසු නායකත්ව පුහුණුව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ලබා දුන් මුදල් වලින් ඉතිරි මුදල් රු.39,682,343 ක් රජයේ මුදල් රෙගුලාසි 807 ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට ''බැර'' කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

- 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඡායා පිටපත් කඩදාසි පැකට් 31,500 සපයා ගැනීම සඳහා මිළ ගණන් කැඳවා තිබුණු අතර මිළ ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් නිසි පරිදි ඇගයීමට ලක් කර ඇති බවට සාක්ෂි නොතිබුණි. තවද තෝරාගත් සැපයුම්කරු විසින් ව්‍යාජ එකතු කළ අගය මත බදු අංකයක් ලබා දී තිබුණි. කඩදාසි පැකට් එකක් රු.375 බැගින් සැපයීමට ගිවිසගෙන 2011 දෙසැම්බර් 03 දින සිට 2011 දෙසැම්බර් 27 දින දක්වා වූ කාල පරාසය තුල කඩදාසි පැකට් 20,000ක් සපයා තිබුණු නමුත් එම කඩදාසි වර්ගය සැපයීමට එකඟ වූ කඩදාසි වර්ගය නොවන බව තහවුරු වී තිබුණි. එසේම සපයා තිබූ කඩදාසි පැකට් 11,750 ක් ගබඩාවට ලද බව ද සනාථ වී නොතිබුණි.

බලශක්තිය

ලංකා විදුලිබල මණ්ඩලය

සමස්ත ශ්‍රී ලංකාවට විදුලි බලය සැපයීම සංවර්ධනය කිරීමට හා කාර්යක්ෂම සම්බන්ධීකරණය සහිත ආර්ථික ක්‍රමයක් පවත්වා ගැනීම කෙරෙහි ලංකා විදුලි බල මණ්ඩලයට ව්‍යවස්ථාපිත වගකීමක් ඇත. 1969 අංක 17 දරන (සංශෝධිත) පනතින් ලංකා විදුලි බල මණ්ඩලය ස්ථාපනය කරන ලද අතර දැනට පරිපාලිතයන් 04 ක් හා උප පරිපාලිතයන් 12 ක් සහ එක් බද්ධ ව්‍යාපාරයක් මණ්ඩලය සතු වේ. විදුලි බලය හා බල ශක්ති අංශයේ නියාමක වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) විසින් උත්පාදන බලපත්‍රයක්, සම්ප්‍රේෂණ බලපත්‍රයක් හා බෙදාහැරීම් බලපත්‍ර 4 ක් නිකුත් කර ඇත. තවද ලංකා විදුලි බල මණ්ඩලයේ පරිපාලිතයක් වන ලංකා විදුලි සමාගම (LECO) විදුලි බලය බෙදාහැරීම සඳහා බලපත්‍රලාභී අනිත් ආයතනය වේ. ස්වාධීන විදුලි බලය නිපදවන්නන් රාශියක්ද ඇති අතර ලංකා විදුලි බල මණ්ඩලය විසින් එම විදුලි බල නිෂ්පාදනයන් මිලදී ගනී. දළ වශයෙන් මෙගාවොට් 2,970 ක මුළු ස්ථාපිත ධාරිතාවයක් ශ්‍රී ලංකා විදුලි බල පද්ධතිය සතුව ඇත. 2012 හා 2013 වර්ෂ තුළදී වාර්තාගත උපරිම ඉල්ලුම පිළිවෙලින් මෙගාවොට් 3,362ක් හා මෙගාවොට් 3,312 විය.

2013 වර්ෂය අවසාන වන විට මුළු ජනගහනයෙන් දළ වශයෙන් සියයට 94 ක ප්‍රමාණයක් ජාතික විදුලි බල පද්ධතියට සම්බන්ධ වී තිබුණි. එක් එක් අංශය මගින් ශක්ති පරිභෝජනයේ ප්‍රමාණය (එක් එක් ගාස්තු වර්ගය) 2009 වර්ෂය සිට 2013 වර්ෂය දක්වා හය රූප සටහනෙන් දැක්වෙන අතර 2013 වර්ෂයේ ආංශිකව විදුලි බලය පරිභෝජනය පස්වන රූප සටහනෙන් දැක්වේ. ගෘහස්ථ අංශයේ පරිභෝජනයට වඩා කර්මාන්ත හා වාණිජ අංශයන්හි විදුලිබල පරිභෝජනය වැඩි බව මෙම සංඛ්‍යාවලින් අනාවරණය වේ. දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය සඳහා අපේක්ෂා කරන ආර්ථිකයක් සඳහා මෙය සතුටුදායක තත්ත්වයකි.



රූප සටහන : 2013 වර්ෂයේ විදුලි බලය ආංශික උපයෝජනය කිරීම



රූප සටහන : 2009 – 2013 දක්වා විදුලි බලය ආංශික පරිභෝජනය ගි.වො. පැය වලින්

ලංකා විදුලි බල මණ්ඩලය විසින් නිෂ්පාදන පිරිවැයට සාපේක්ෂව අඩු මිලකට විදුලි බලය සපයයි. සාධාරණ හා දැරිය හැකි මිලකට පොදු ජනතාවට විදුලි බලය සැපයීමට හේතුව වන්නේ පාරිභෝගිකයන් ඉහළ උපයෝගිතා මට්ටමක තබා ගැනීමේ අරමුණ සඳහාය. ප්‍රමාණවත් ජල විදුලි බල උත්පාදනයක් තිබුණද, ඒකක පිරිවැය අඩු කිරීම සඳහා හිතකර බලපෑමක් ඇති නොවන විදුලි බල මිලදී ගැනීම් ගිවිසුම්වල ඇතුළත් ස්ථාවර පිරිවැය ලංකා විදුලි බල මණ්ඩලය විසින් දරනු ලැබේ. කෙසේ වුවද 2012 වර්ෂයේදී සාමාන්‍ය ඒකකයක පිරිවැය රු.23.66 ක් වූ අතර රු.15.56 කට විකුණා තිබුණි. 2013 වර්ෂයේදී පිරිවැය රු.17.70 දක්වා අඩු වී තිබූ අතර ඒකකයක් රු.17.93 බැගින් විකුණ තිබුණි. එයට ප්‍රධාන හේතුව වූයේ 2013 වර්ෂය තුළ පැවති වැඩි ජල විදුලි බල උත්පාදනයක් සඳහා වූ හිතකර කාලගුණික තත්ත්වයන්ය. මණ්ඩලය 2012 වර්ෂය තුළදී දරන ලද රු.බිලියන 61 ක පාඩුවට එරෙහිව 2013 වර්ෂයේදී රු.මිලියන 12 ක ලාභයක් ලබා තිබුණි. එය පහත වගුවේ සඳහන් පරිදි විශ්ලේෂණය කළ හැකි වේ.

කාණ්ඩය	ලාභය/(පාඩුව)
	රු. මිලියන
ගෘහස්ථ	(7,268)
ආගමික	(587)
සාමාන්‍ය කටයුතු	21,913
රජය	204
කර්මාන්ත	(3,313)
හෝටල්	392
වීථි ආලෝකකරණය	(1,848)
ලංවි ස විකුණුම්	3,357
එකතුව	**12,850**

වගුව 3 : ලාභ විශ්ලේෂණය

මණ්ඩලයේ මූල්‍ය අවධානයන් සාරාංශ කර, 4 වගුවෙහි දැක්වෙන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා සමඟ ඉදිරිපත් කළ හැක. 2013 වර්ෂයේදී ඉහත සඳහන් පරිදි ලාභ වැඩිවීමට පිරිවැය වැඩිවීම හා ජල විදුලි උත්පාදනය වැඩිවීම නිසා ඍජු පිරිවැය අඩුවීම හේතුවිය. 2011 වර්ෂයේ දී සියයට 20 ක් වූ පද්ධතිවල පාඩුව 2013 වර්ෂයේ දී සියයට 11.5 දක්වා අඩු වී තිබූ අතර, විදුලිය උත්පාදපනය, විදුලිය ප්‍රවාහයන් හා විදුලිය බෙදාහැරීම අංශ වලට යටතේ ක්‍රියාත්මක කල විදේශ මූල්‍ය ව්‍යාපෘති මින් ලැබුණු නවෝත්පාදනයන් ඊට හේතුවිය.

	2013	2012	2011	2010	2009
	රු.මිලියන	*රු.මිලියන*	*රු.මිලියන*	*රු.මිලියන*	*රු.මිලියන*
පිරිවැටුම	194,147	163,513	132,460	121,862	110,518
සෘජු පිරිවැය	(166,926)	(222,419)	(151,448)	(116,168)	(118,186)
දළ ලාභය/ (පාඩුව)	27,221	(58,906)	(18,988)	5,694	(7,668)
පරිපාලන වියදම්	(2,598)	(2,997)	(1,636)	(1,851)	(2,870)
මෙහෙයුම් ලාභය / (පාඩුව)	24,623	(61,903)	(20,624)	3,843	(10,538)
වෙනත් ආදායම්	5,106	4,225	3,810	3,063	3,412
මූල්‍ය පිරිවැය (ශුද්ධ)	(11,136)	(3,769)	(3,371)	(2,047)	(2,213)
බදු වලට පෙර ලාභය / (පාඩුව)	18,593	(61,447)	(20,185)	4,859	(9,339)
ශේෂ පත්‍රය					
මුළු වත්කම්	785,717	738,171	606,333	605,423	516,022
ප්‍රාග්ධනය හා සංචිත	212,769	193,230	257,464	287,032	275,208
ජංගම නොවන වගකීම්	482,806	407,585	281,835	229,128	141,883
ජංගම වගකීම්	92,872	137,356	122,034	89,263	98,931
මුදල්	(1,431)	(17,813)	(1,178)	(3,102)	(4,039)
විකුණුම් (ගි.වො.පැ)	10,621	10,424	10,023	9,268	8,441
උත්පාදනය (ගි.වො.පැ)	11,962	11,802	11,528	10,714	9,882
පද්ධති පාඩුව	1,341	1,378	1,505	1,446	1,441

වගුව 4: 2009 වර්ෂය සිට 2013 වර්ෂය දක්වා ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය අවධානයන්

මණ්ඩලයේ මූල්‍ය ප්‍රභවයන් පිළිබඳ සැලකීමේදී මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද ණය වලට අමතර වශයෙන් රු.බිලියන 50 ක් වූ වාණිජ ණය, මණ්ඩලය විසින් ලබා ගෙන තිබුණි. 2013 වර්ෂය සඳහා මණ්ඩලයේ පොලී පිරිවැය රු.මිලියන 12,813 ක් වූ අතර එයින් සියයට 66 ක් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය ගැනීම් මත පොලී වලින් නියෝජනය විය. ලංකා ඛණිජ තෙල් සංස්ථාවට තිබූ වගකීම ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම නිසා 2013 වර්ෂයේදී රු.මිලියන 20 සිට රු.මිලියන 6 දක්වා අඩු කර තිබුණි. එසේ වුවද ණය මූල්‍යයනය පිළිබඳව ප්‍රවණතාවය වැඩි වෙමින් පවතී. 2013 දෙසැම්බර් 31 දිනට ණය තත්ත්වය 5 වගුවේ පැහැදිලි කර ඇත.

	රු. මිලියන	රු. මිලියන
දිගුකාලීන ණය		
භාණ්ඩාගාර ණය	334,684	
බැංකු ණය	44,404	
කල් බදු ණය හිමියන්	252	
සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ණය	3,695	
බැංකු අයිරා	3,474	386,509
වෙනත් වගකීම්		
ලංකා ඛණිජතෙල් සංස්ථාව	6,358	
ස්වාධීන විදුලි බල සැපයුම්කරුවන්	14,921	
පුනර්ජනනීය බලය සැපයුම්කරුවන්	1,122	22,401
එකතුව		**408,909**

වගුව 5: - 2013 දෙසැම්බර් 31 දිනට ණය තත්ත්වය

* අමුද්‍රව්‍ය මිලදී ගැනීම් සහ තොගවල ඇතුළත් අමුද්‍රව්‍ය , සෘජු ශ්‍රමය හා පොදු කාර්ය පිරිවැය අයකර ගැනීම් සම්බන්ධයෙන් රු.මිලියන 1,898 ක් වූ මුළු ශුද්ධ මිල විචලනයන් කලාප 02 හි ආදායම් ලෙස සලකා තිබීම හේතුවෙන් එම මුදලින් ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

* තවද 2012 හා 2013 වර්ෂ තුළදී පුත්තලම ගල් අඟුරු විදුලි බල පිරියතෙහි බිඳ වැටීම් හා අකාර්යක්ෂමතාවයන් හේතුවෙන් රු.මිලියන 25,098 ක් පිරිවැය වූ මෙගාවොට් පැය 1,394.33 ක් අහිමි වී තිබූ බව සඳහන් කළ යුතුය.

* අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හේතුවෙන් 2013 වර්ෂය තුළදී වාර්තා වූ වංචා 35 ක වටිනාකම රු.මිලියන 49 ක් විය.

* භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද රු.මිලියන 128,240 ක් වූ ණය 04 ක් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමඟ උප ණය ගිවිසුම්වලට එළඹී නොතිබුණි. ඒ අනුව, ආපසු ගෙවීම් පිළිබඳ උපලේඛනය හා එම ණය පිළිබඳව පොලී විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

* උපයන විට ගෙවීම් බදු ගෙවීම ඊ ළඟ වැටුප් සංශෝධනයේ සිට එනම් 2009 වර්ෂය සිට සේවකයන්ට මාරු කිරීම සඳහා ගන්නා ලද 2007 දෙසැම්බර් 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව , මණ්ඩලය විසින් එහි සේවකයන්ගේ උපයන විට ගෙවීම් බදු මණ්ඩලයේ අරමුදල්වලින් ගෙවා තිබුණි. අමාත්‍ය

මණ්ඩල තීරණයට පටහැනිව 2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ගෙවන ලද උපයන විට ගෙවීම් බදු ප්‍රමාණය රු.මිලියන 1,312 ක් විය.

* 1994 ජූනි 04 දිනැති අංක 95 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයේ හෝ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මණ්ඩලය විසින් වරින්වර විවිධ සේවක දීමනා 39 ක් එහි සේවකයන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි. 2013 වර්ෂයේදී රු.මිලියන 642 ක් වූ එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

* ඇතැම් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් විසින් වෙනත් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගේ නඩත්තු කොන්ත්‍රාත්තු භාරගෙන තිබීම හේතුවෙන් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සිදු වී තිබුණි. ඒ අනුව ආනයනික අමුද්‍රව්‍ය සත්‍ය වශයෙන් විදුලිබල පිරියත නඩත්තුව සඳහා යොදාගත්තේද යන්න පරීක්ෂා කිරීමෙන් තොරව බදු ඇතුළත් වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීම පිළිබඳ අදාළත්වය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. 2013 වර්ෂයේදී සිදු කරන ලද ප්‍රතිපූර්ණයන් රු.මිලියන 78,356 ක් විය.

* රේගු ආඥාපනතේ (235 අධිකාරිය) 164 හා 165 වගන්ති යටතේ මුදල් අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් පනවන ලද දඩ පිළිබඳව සංශෝධනයක් හෝ අත්හැර දැමීමක් සඳහා මුදල් අමාත්‍යවරයාට අභියාචනයක් කිරීමෙන් තොරව ආනයනික භාණ්ඩ වර්ගීකරණය කිරීමේදී සිදු වූ දෝෂය හේතුවෙන් ශ්‍රී ලංකා රේගුව විසින් පනවන ලද රු.208,283,881 ක් වූ දඩ මුදලක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

* 2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ විධායක, මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවය, පුහුණු තාක්ෂණික සේවය, අර්ධ පුහුණු තාක්ෂණික සේවය සහ වෙනත් පුහුණු ශ්‍රේණිවල පැවති පුරප්පාඩු සංඛ්‍යාව 2,486 ක් විය.

* මණ්ඩලය එහි පරිපාලිතයන් හා උප පරිපාලිතයන් සමඟ එක් එක් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ඒවායේ පාලනය, මණ්ඩලය විසින් පවත්වාගෙන යාමක් නොවන බව සඳහන් කළ යුතු අතර, එබැවින් එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම, සීමාසහිත එල්ටීඑල් ගැල්වනයිසින් (පුද්ගලික) සමාගම, එල්ටීඑල් එනර්ජීස් (පුද්ගලික) සමාගම, සීමාසහිත පවන් දනවි (පුද්ගලික) සමාගම වැනි උප පරිපාලිතයන් මණ්ඩලයේ අනුමැතිය නොමැතිව ස්ථාපිත කර තිබුණි. මෙම උප - පරිපාලිතයන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජනයක් නොමැති හෙයින් පරිපාලිතයන් පිළිබඳ මණ්ඩලයේ පාලනය දුර්වල වී තිබුණි.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

1961 අංක 28 දරන ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනත මඟින් රාජ්‍ය ව්‍යවසායක් ලෙස ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (ල.ඛ.නී.ස.) ස්ථාපනය කරන ලද අතර පසුව තවදුරටත් ප්‍රධාන පනතට සංශෝධන සිදුකරන ලදි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ දැක්ම වන්නේ ජාතියේ සෞභාග්‍යය සඳහා දායකත්වයක් සපයමින් ගනුදෙනුකරුවන් සඳහා කටයුතු කෙරෙන පරිසර හිතකාමී, දේශයේ ඛනිජතෙල් සහ ඒ හා සම්බන්ධ කර්මාන්තවල ප්‍රධාන ව්‍යවසායකයා බවට පත්වීමයි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන අරමුණු වන්නේ ඛනිජතෙල් නිෂ්පාදිත ආනයනකරුවෙකු, අපනයනකරුවෙකු, විකුණුම්කරුවකු, සැපයුම්කරුවෙකු හා බෙදාහරින්නකු වශයෙන් ව්‍යාපාරය සිදුකරගෙන යාමට සහ ඛනිජතෙල් නිෂ්පාදිත උපයෝජනය නිෂ්පාදනය හා පිරිපහදු කිරීම සඳහා ගවේෂණාත්මකව ව්‍යාපාරය සිදුකරගෙනයාමට සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා ආනුෂාංගික වියහැකි හෝ හේතුවිය හැකි ඕනෑම එවැනි ව්‍යාපාරයක් සිදුකර ගෙන යාමයි.

2013 වර්ෂය සඳහා ඛනිජතෙල් නිෂ්පාදිත ආනයනය සඳහා දරන ලද මුළු පිරිවැය රු. බිලියන 535 ක් වූ අතර එය 2013 වර්ෂයේ වර්තමාන වෙළඳපොල මිලට රු. බිලියන 8,674 ක් වූ දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි) දළ වශයෙන් සියයට 6.2 ක් නියෝජනය විය. එසේම එය 2013 වර්ෂයේ රු. බිලියන 2,323 ක් වූ මුළු ආනයනයෙන් දළ වශයෙන් සියයට 23 ක් නියෝජනය විය.

මූල්‍ය ප්‍රතිඵල

සංස්ථාව 2013 වර්ෂය සඳහා රු. මිලියන 7,984 ක ශුද්ධ පාඩුවක් දරා ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 236,529 ක් වූ සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් ඇති වී තිබුණි. එසේම 2012 වර්ෂයේ සංස්ථාවේ ශුද්ධ පාඩුව වැඩිවීමට හෙජින් ගනුදෙනුවල සෘණාත්මක බලපෑම හේතු වී තිබුණි. පෙර වර්ෂයේ රු. මිලියන 97,308 ක් වූ ශුද්ධ පාඩුවට සාපේක්ෂව 2013 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු. මිලියන 89,324 ක වැඩිවීමක් තිබුණද 2008 වර්ෂයේ සිට සිදු වූ විශාල පාඩු සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය තව දුරටත් ඛාදනය වීමට හේතු වී තිබුණි. එබැවින් මහා භාණ්ඩාගාරයෙන් සහ වෙනත් මූල්‍ය ආයතනවලින් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වා ගැනීමට ඇති හැකියාව සැක සහිතය. 2013 වර්ෂය සහ පෙර වර්ෂ 6 ක් සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/(පාඩුව) සහ ශුද්ධ වත්කම් තත්ත්වය පහත 7රූප සටහනින් දැක්වේ.



රූප සටහන 7 : 2007 - 2013 කාල පරිච්ඡේදය සඳහා ලංකා ඛනිජතෙල් සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය

සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතාවලට මුහුණදීම සඳහා 2011, 2012 හා 2013 වර්ෂවලදී ඛනිජතෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ඉහළට සංශෝධනය කරන ලදි. මේ අතර, ලංකා විදුලි බල මණ්ඩලය විසින් විදුලිබල උත්පාදනය සඳහා යොදාගන්නා වැඩි සල්ෆර් හා අඩු සල්ෆර් ඉන්ධන තෙල් ලීටරයක මිල පිළිවෙලින් රු.90 හා රු. 100 බැගින් වන සේ 2013 අප්‍රේල් 01 සිට බලපැවැත්වෙන පරිදි ලීටරයක මිල රු. 25 කින් වැඩිකර තිබුණි. 2013 වර්ෂය තුළදී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ඛනිජතෙල් නිෂ්පාදිත සිල්ලර මිලෙහි සිදුකරන ලද ප්‍රධාන වෙනස්කම් පෙර වර්ෂයට සාපේක්ෂව පහත වගුවෙන් දැක්වේ.

බණිජතෙල් නිෂ්පාදිත	ලීටරයක මිල (බලපැවැත්වෙන දිනය)			වර්ෂය තුළ මිල වැඩිවීම (ලීටරයකට)			
	12 Feb. 2012	14 Dec. 2012	22 Feb. 2013	2012		2013	
	රු.	රු.	රු.	රු.	ප්‍රතිශතය	රු.	ප්‍රතිශතය
පෙට්‍රල් ඔක්ටේන් 95	167.00	167.00	170.00	12.00	7.7	3.00	1.8
පෙට්‍රල් ඔක්ටේන් 90/92	149.00	159.00	162.00	22.00	16.1	3.00	1.9
ලංකා ඔටෝ ඩීසල්	115.00	115.00	121.00	31.00	36.9	6.00	5.2
ලංකා සුපර් ඩීසල්	142.00	142.00	145.00	35.7	33.6	3.00	2.1
ලංකා කර්මාන්ත භූමිතෙල්	111.00	111.00	115.00	35.00	46.1	4.00	3.6

වගුව 6: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ඛනිජතෙල් නිෂ්පාදිත සිල්ලර මිල සඳහා කරන ලද වෙනස්කම්.

අංශ අනුව කාර්ය සාධනය

2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාව අනුව , පෙර වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ජාත්‍යන්තර බොරතෙල් මිල අඩුව පැවතුණි. ජාත්‍යන්තර බොරතෙල් සාමාන්‍ය මිල (බ්‍රෙන්ට්) 2012 වර්ෂයේ පැවති බැරලයක් එ.ජ.ඩො. 112.41 ට සාපේක්ෂව 2013 වර්ෂයේ බැරලයක් එ.ජ.ඩො. 109.56 ක් ලෙස පැවතුණි. ජාත්‍යන්තර මිල ප්‍රවණතාවයට අනුකූලව, සංස්ථාව විසින් ආනයනය කරනලද බොරතෙල් සාමාන්‍ය මිල 2012 වර්ෂයේ දී බැරලයක් එ.ජ.ඩො. 114.00 සිට 2013 වර්ෂයේදී බැරලයක් එ.ජ.ඩො. 109.84 දක්වා සියයට 3.6 කින් අඩු වී තිබුණි.

ආනයනය කරන ලද බොරතෙල්වල සාමාන්‍ය මිල අඩු වී තිබීම හා ඛනිජතෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල වැඩි අතට සංශෝධනය කර තිබුණද , පහත 7 වගුවේ විස්තර දැක්වෙන පරිදි සංස්ථාව අඛණ්ඩ පාඩු දරා තිබුණි.

අංශය	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු පාඩුව		
	2013	2012	2011
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
ප්‍රවාහන			
ලංකා ඔටෝ ඩීසල්	(6,235)	(29,654)	(62,045)
විදුලි බල උත්පාදනය			
නැප්තා	(1,081)	(1,048)	(798)
ඉන්ධන තෙල් - 3500	(1,184)	(8,718)	(9,206)
ඉන්ධන තෙල් - 1500	(1,231)	(23,223)	(18,313)
ඉන්ධන තෙල් - 1500 (අඩු සල්ෆර්)	(9)	(11,733)	(5,764)
ගුවන් යානා			
ඇවිටුවර් (Avteur) - ජාත්‍යන්තර	(1,251)	122	114
කර්මාන්ත			
ඉන්ධන තෙල් - 1500	(350)	(2003)	(4,248)
ඉන්ධන තෙල් - 800	(333)	(904)	(1,790)
කර්මාන්ත භූමිතෙල්	(126)	(364)	(832)
ලිහිසි තෙල් හා ග්‍රීස්	(271)	46	217
ගෘහස්ථ			
එල්.පී. ගෑස් (කි.ග්‍රෑ)	(436)	(377)	(224)
භූමිතෙල්	(2,449)	(3,525)	(6,886)
වගාකරුවන්			
කෘෂිකාර්මික රසායනික	(70)	(2)	(5)
අපනයන			
නැප්තා	(976)	(43)	(675)
දැවිතෙල් 1500	(2,690)	(70)	(329)
තොග (bunkering)			
ඩීසල්	(67)	-	-
ඉන්ධන තෙල් 1500	(729)	-	-

වගුව 7: නිෂ්පාදිත අනුව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් දරන ලද පාඩු

2013 වර්ෂය සඳහා සංස්ථාව පාඩු ලැබූ නිෂ්පාදිත, පෙර වර්ෂ දෙක සමඟ සසඳා ඉහත වගුවෙන් දැක්වේ. ඒ අනුව ගුවන්යානා අංශයේ ජාත්‍යන්තර - ඇව්ටුවර් සහ කර්මාන්ත අංශයේ ලිහිසි තෙල් හා ග්‍රීස් හැර අනෙකුත් සියළුම නිෂ්පාදිත අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

අඛණ්ඩ මූල්‍ය පාඩු සඳහා දායක වූ සාධක

සංස්ථාවේ අඛණ්ඩ මූල්‍ය පාඩු සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ සාධක වන්නේ, පිරිපහදු මෙහෙයුම් කටයුතුවල අකාර්යක්ෂමතාවය සහ ඉරානය සඳහා එක්සත් ජනපද සම්බාධක හේතුවෙන් බොරතෙල් ප්‍රභවයන්හි වෙනස්වීම් නිසා පිරිපහදු ආන්තිකයන් පහළ වැටීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සැපයුම් ඌනතාවයට මුහුණදීමට පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත ආනයනය වැඩිවීම, ලංකා විදුලි බල මණ්ඩලයට මිල සංශෝධනයන්ට පෙර ඉහළ සහනාධාර මිලකට දැව්තෙල් සැපයීම, සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගමට හා සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමට කොන්ත්‍රාත් ගනුදෙනුකරුගේ මිලට වඩා අඩුවෙන් සහනදායී මිලකට ගුවන් යානා ඉන්ධන විකිණීම, හෙජින් ගනුදෙනුව නිරවුල් කිරීමේදී සිදු වූ විශාල පාඩු , සංස්ථාවේ ඉන්ධන බිල් සඳහා මුදල් ගෙවීමට බැංකු අංශයෙන් ණය ගැනීම් වැඩිවීම් සහ සංස්ථාවේ ඛනිජතෙල් නිෂ්පාදිත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදු වී ඇති අකාර්යක්ෂමතාවයන් ආදියයි.

පිරිපහදු මෙහෙයුම් අකාර්යක්ෂමතාවය

සපුගස්කන්ද ඛනිජතෙල් සංස්ථා පිරිපහදුවෙන් දේශීයව සිදුකරන පිරිපහදු ක්‍රියාවලිය මඟින් රටේ වර්තමාන ඛනිජතෙල් නිෂ්පාදිත ඉල්ලුමෙන් ආනයනික බොරතෙල් වලින් දළ වශයෙන් 1/3 ක් සැපයීමට අපේක්ෂා කෙරේ. පිරිපහදුවේ නවීකරණයන් ප්‍රමාද වීම සහ පිරිපහදුව ප්‍රසාරණය කිරීමක් නොමැතිවීමෙන් පිරිපහදුවේ අඩු ඵලදායිතාවයක් සහ මෙහෙයුම් අසමත්වීම්ද ඇති වී තිබුණු අතර එය සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනයට සෘණාත්මකව බලපා තිබුණි.

සංස්ථාව විසින් ආනයනය කරන ලද බොරතෙල් ප්‍රමාණය 2011 වර්ෂයේ මෙට්‍රික් ටොන් 2,070,000 සිට 2012 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,486,720 දක්වා එනම් සියයට 28.2 කින් අඩු වී තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාව විසින් ආනයනය කරන ලද පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත 2011 වර්ෂයේ මෙට්‍රික් ටොන් 3,501,000 සිට 2012 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 3,961,000 දක්වා මෙට්‍රික් ටොන් 460,000 කින් හෙවත් සියයට 13.1 කින් වැඩි වී තිබුණි.

සංස්ථාව විසින් බොරතෙල් පිරිපහදු කිරීමේ ප්‍රමාණය (ඇතුල් කරන ප්‍රමාණය) 2012 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,596,058 ට සාපේක්ෂව 2013 වර්ෂයේදි මෙට්‍රික් ටොන් 1,643,218 දක්වා වැඩි වී තිබුණද දිනකට (stream day) ටොන් 6,900 ක් වන නිෂ්පාදන ධාරිතාවයකට හෝ 2013 වර්ෂය සඳහා මෙට්‍රික් ටොන් 2,415,000 ක් වූ ක්‍රියාවලි මට්ටමට ළඟා වී නොතිබුණි. 2013 වර්ෂය හා පෙර වර්ෂ 10 ක් සඳහා වාර්ෂිකව බොරතෙල් ඇතුල්කරන ප්‍රමාණය සහ අදාල වර්ෂ සඳහා නිෂ්පාදන ධාරිතාවය පහත 8 රූප සටහනින් දැක්වේ.



රූප සටහන : 2003 - 2013 කාල පරිච්ඡේදයේ පිරිපහදු මෙහෙයුම්

1969 වර්ෂයේදී ස්ථාපනය කර වර්ෂ 45 ක් පැරණි වූ දැනට පවත්නා පිරිපහදුව රටේ වැඩිවන ඛනිජතෙල් නිෂ්පාදන ඉල්ලුමට සැපයීම සඳහා ප්‍රමාණවත් නොවේ. අඩු පිරිවැයකට ඛනිජතෙල් නිෂ්පාදිත නිෂ්පාදනය කිරීමට සහ පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමතාවය උපරිම කළ හැකි පහසුකම් සහිත දියුණු තාක්ෂණික ක්‍රම සමඟ මෙහෙයුම් කරන නවීන ලෝකයේ පිරිපහදු සමග සැසඳිමේදී මෙම පිරිපහදුව ඉතා අඩු ආන්තිකයක් සහිතව මෙහෙයුම් කෙරේ. කෙසේ වුවද පිරිවැය ඵලදායී ආකාරයෙන් ඛනිජතෙල් නිෂ්පාදිත වෙළඳපොලට සැපයීම තහවුරු කර ගැනීමේ අරමුණින් වන යෝජිත " සපුගස්කන්ද තෙල් පිරිපහදුව ප්‍රසාරණය හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (SOREM) ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට තවමත් නොහැකි වී තිබුණි.

සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගමට (SLA) සහ සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමට සහනදායී මිලට ඉන්ධන සැපයීම.

සිමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම (SLA) සහ සිමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම කොන්ත්‍රාත් ගනුදෙනුකරුවන් වුවද, කොන්ත්‍රාත් ගනුදෙනුකරුවන්ට සපයන මිලට වඩා අඩු සහනදායී මිලකට ඔවුන්ට ඉන්ධන සපයා තිබුණි. කොන්ත්‍රාත් ගනුදෙනුකරු මිල සැසඳීමේදී එම සමාගම්වලට අතිවිශේෂ සහනදායී මිලකට ගුවන්යානා ටර්බයින් ඉන්ධන විකිණීමෙන් සංස්ථාව විසින් 2013 සහ 2012 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 2,009.7 ක හා රු. මිලියන 456.6 ක පාඩු දරා තිබුණි. විස්තර පහත වගුවෙන් දැක්වේ.

සමාගමේ නම	වර්ෂය තුළ දරන ලද ආදායම					
	2013		2012		2011	
	එ.ජ.ඩො. බිලියන	රු. මිලියන	එ.ජ.ඩො. බිලියන	රු. මිලියන	එ.ජ.ඩො. බිලියන	රු. මිලියන
සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම	14.10	1,866.39	3.29	423.97	5.47	627.16
සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම	1.08	143.29	0.25	32.58	0.38	42.61
එකතුව	**15.18**	**2,009.68**	**3.54**	**456.55**	**5.85**	**669.77**

මෙම සමාගම් දෙකට සහනදායී මිලකට ඉන්ධන සපයා තිබියදීත් , ඔවුන්ගේ දුර්වල මූල්‍ය කාර්ය සාධනය හේතුවෙන්, හිඟ ඉන්ධන බිල්පත් නිරවුල් කිරීම ඉතා දුර්වල විය. එනම් 2013 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2013 වර්ෂයේදී ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම රු. බිලියන 28.6 ක මෙහෙයුම් පාඩුවක් වාර්තා කර තිබූ අතර මිහින් ලංකා සමාගම රු. බිලියන 1.5 ක මෙහෙයුම් පාඩුවක් වාර්තා කර තිබුණි. 2013 වර්ෂය හා ඉකුත් වර්ෂ තුන අවසානයට හිඟ ශේෂයන් පහත දැක්වේ.

සමාගමේ නම	දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය			
	2013	2012	2011	2010
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම	29,520	25,890	12,351	542
සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම	4,314	3,416	1,227	361

2013 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 53,190 ක ලැබිය යුතු මුළු වෙළඳ ශේෂයෙන් සියයට 63.6 කට වැඩි ප්‍රමාණයක් ඉහත සමාගම් දෙකෙන් ලැබිය යුතු වෙළඳ ශේෂයෙන් නියෝජනය වන අතර, ඉකුත් වර්ෂ 3 සමඟ සැසඳීමේ දී වැඩිවන ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරේ.

බැංකු ක්ෂේත්‍රයෙන් වූ ණය ගැනීම් ඉහළ යාම

සංස්ථාව එහි ඉන්ධන බිල්පත්‍ර සඳහා මූල්‍යනය කිරීම සඳහා බැංකු අංශයෙන් ණය ගැනීම් වැඩි වී තිබූ අතර, පාඩු දැරීම වැඩිවීමට සහ සංස්ථාවේ ශුද්ධ වත්කම් තත්ත්වය බාදනය වීමට එය හේතු වී තිබුණි. තවද, පහත වගුවෙන් දැක්වෙන පරිදි ඉකුත් වර්ෂ තුනට සාපේක්ෂව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩිවන ප්‍රවණතාවයක් දැක්වෙන විශාල මූල්‍ය පිරිවැයක් සංස්ථාව දරා තිබූ බව නිරීක්ෂණය විය.

වර්ෂය	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවලින් ණය ගැනීම් රු. මිලියන	මූල්‍ය පිරිවැය රු. මිලියන	සාමාන්‍ය කටයුතු වෙනුවෙන් වාර්ෂික පාඩුව රු. මිලියන	සාමාන්‍ය කටයුතුවලින් වන පාඩුවේ ප්‍රතිශතයක් ලෙස මූල්‍ය පිරිවැය
2013	406,850	18,539.85	7,732.82	239.8
2012	399,520	18,359.68	89,569.18	20.5
2011	310,060	9,000.57	94,503.45	9.5
2010	168,020	6,858.90	26,922.82	25.5

පහත විස්තර දැක්වෙන පරිදි විදේශ ණය මුදල් සුරක්ෂිත කිරීම සඳහා සංස්ථාව වෙනුවෙන් වාණිජ බැංකුවලට නිකුත් කරන ලද මහා භාණ්ඩාගාර වන්දි පියවීමේ සීමාවන් සංස්ථාව විසින් ඉක්මවා තිබුණි.

බැංකුවේ නම	2013 දෙසැම්බර් 31 දිනට හිඟ මුදල		ඇපය - මහා භාණ්ඩාගාර වන්දි මුදල		ඇපය ඉක්මවන ලද මුදල	
	එ.ජ.ඩො. මිලියන	*රු. මිලියන.*	*එ.ජ.ඩො. මිලියන.*	*රු. මිලියන.*	*එ.ජ.ඩො. මිලියන.*	*රු. මිලියන.*
ලංකා බැංකුව	1,810.62	239,617	900	119,106	910.34	120,512
මහජන බැංකුව	1,318.16	174,415	650	86,021	668.16	88,424

ලැබිය යුතු ගිණුම්

රාජ්‍ය ආයතනවලින් හා පුද්ගලික ආයතනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පිළිවෙලින් රු.මිලියන15,416 ක් සහ රු. මිලියන 37,774 කින් සමන්විත මුළු ලැබිය යුතු වෙළඳ ශේෂය රු. මිලියන 53,190 ක් වූ අතර එයින් රු. මිලියන 340 ක් වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

හෙජින් ගනුදෙනු

සංස්ථාවේ හෙජින් ගනුදෙනුවලට අනුව, වාණිජ බැංකු කිහිපයක් සමඟ එළඹ තිබූ හෙජින් ගනුදෙනුවලට අදාල තීරක තීන්දු නඩුවෙහි පාර්ශවයක් වශයෙන් සංස්ථාව පෙනී සිට තිබුණි. ඒ අනුව පාර්ශවයන් දෙක අතර එළඹි නිරවුල් කිරීම් සහතිකය යටතේ එජඩො මිලියන 60 (රු. මිලියන 7,612) ක මුදලක් 2013 ජුනි 03 දින ස්ටෑන්ඩඩ් චාර්ටඩ් බැංකුවට (SCB) ගෙවා තිබුණි. තවද නීති හා වෙනත් ගාස්තු වශයෙන් එජඩො මිලියන 15.3 ක මුදලක් සංස්ථාව විසින් දරා තිබුණි. මේ අතර සිටි බැංකුව සමග වූ ගනුදෙනුවට අදාළව එජඩො මිලියන 1.3 (රු. මිලියන 153) ක් වූ තීරක ප්‍රදානයක් සංස්ථාවට හිතකර ලෙස ලබාදී තිබුණි.

තෙල් ප්‍රවාහනයේ නල මාර්ග ජාලය

පිරිපහදු කරන ලද ඛනිජතෙල් නිෂ්පාදිත කොලොන්නාව හා මුතුරාජවෙල පර්යන්තවල ගබඩා කරන අතර ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගමට (CPSTL) ආනයනික ඛනිජතෙල් නිෂ්පාදිත මාරුකිරීම සඳහා කොළඹ වරාය හා කොලොන්නාව අතර දිවෙන නල මාර්ග ජාලයක් ඇත.

පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැව්තෙල් ආදි නිමි ඛනිජතෙල් නිෂ්පාදිත කොළඹ වරාය සිට කොලොන්නාව ඛනිජතෙල් ස්ථාපිතය දක්වා ප්‍රවාහනය කිරීම සඳහා දශක කිහිපයකට පෙර ස්ථාපිත නල මාර්ග දැනට අළුත්වැඩියා කළ යුතු තත්ත්වයක පවතින අතර අළුත්වැඩියාවන් ඉක්මවන එහි පිරිහීම් තත්ත්වය හේතුවෙන් එම අළුත්වැඩියාවන් සමහරක් දැනටමත් අත්හැර දමා ඇති බව අනාවරණය විය. ජාතික අවශ්‍යතාවය වූ ඛනිජතෙල් නිෂ්පාදිතවල විශාල ප්‍රමාණයක් මෙම පිරිහී ගිය නල මාර්ග මගින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ප්‍රවාහනය සිදුකරන හෙයින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම ඉතා හදිසි අත්‍යවශ්‍ය කාරණයක් වේ. නිමි ඛනිජතෙල් නිෂ්පාදිත සඳහා රටේ පවතින ඉල්ලුම ප්‍රධාන වශයෙන් මෙම පිරිහී ගිය නල මාර්ග හරහා ආනයනය කෙරෙන බැවින් ඛරපතල ඉන්ධන අර්බුදයක් සහිතව රට සමස්ත වශයෙන් අඩපණවීමට තිබෙන ඉඩකඩ පිළිබඳ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.

වෙරළේ සිට කි.මී. 6 ක් හා මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2 ක් පමණ දුරින් මුහුද මැද ස්ථාපනය කර ඇති සිංගල් පොයින්ට් බෝයි මූරින් පහසුකම (SPBM) මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට සැපයීම් කෙරෙන අතර , මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථාවලදී හෝ එම පහසුකම පිළිබඳ (SPBM) නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවීය. ඒ අතරම අන්තර් පර්යන්ත නිෂ්පාදිත මාරුකිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොලොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධයක් නොවූ අතර, ඒ අනුව මෙම සීමාවන් හේතුවෙන් එම පර්යන්තයෙහි උපරිම උපයෝජනයට බාධා වී තිබුණි.

"රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය " ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද , එම ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

මානව සම්පත් කළමනාකරණය

2013 වර්ෂය සඳහා සියළුම සේවක වර්ගයන්හි අනුමත කාර්ය මණ්ඩලය වූ 3,284 න් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල තනතුරු (අභ්‍යන්තර විගණන කළමනාකරු , වාණිජ කළමනාකරු , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි අලෙවිකරණ ආදී තනතුරුවලින් සමන්විත) පුරප්පාඩු 153 ක් ඇතුළත්ව විවිධ වර්ගයන්හි තනතුරු 713 ක් 2013 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවති බව නිරීක්ෂණය විය. මේ අතර සියළු සේවක වර්ගයන්හි තනතුරු 10 ක් කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබූ අතර 2011 වර්ෂයේ මැද භාගයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි , මූල්‍ය ලෙස වැඩ බැලීමේ පදනම මත කටයුතු කරනු ලැබේ.

අධ්‍යාපනය

අමාත්‍යාංශයේ පරමාර්ථ පෙරදැරිව ක්‍රියාත්මකව පවත්නා අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන රාශියකි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය, ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ජාතික යුනෙස්කෝ කොමිසම එම ආයතන වේ. මීට අමතරව අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් කාර්යභාරය ඉටුකිරීම සඳහා විදේශාධාර ව්‍යාපෘති වලද දායකත්වය ලැබී තිබුණි.

අධ්‍යාපනය සඳහා 2009 වර්ෂයේ දී සලසන ලද රු.මිලියන 85,198 ක් වූ පුනරාවර්තන ප්‍රතිපාදනය සහ රු.මිලියන7,511 ක් වූ මූලධන ප්‍රතිපාදනය 2013 වර්ෂය වන විට පිළිවෙලින් රු.මිලියන 115,525 ක් සහ රු.මිලියන 39,135ක් දක්වා වර්ධනය වී තිබුණි. එයට අමතරව 2013 වර්ෂයේ දී ආර්ථික සංවර්ධන අමාතයාංශය විසින් ප්‍රාථමික පාසල් 5,000 ක සංවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 2,427 ක් ද දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1,373 ක් ද දැනුමැති කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය විසින් රු.මිලියන 242 ක් ද අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා වැයකර තිබුණි.

පාසල්, ශිෂ්‍ය හා ගුරුභවතුන්

2012 වර්ෂයේ දී 10,737 ක් වූ රජයේ පාසල් සංඛ්‍යාව 2013 වර්ෂය අවසානයට පාසල් 115 කින් වර්ධනය වී තිබුණි. 2012 වර්ෂයේ දී 4,004,059 ක් වූ රජයේ පාසල් වල ශිෂ්‍ය සංඛ්‍යාව 2013 වර්ෂයේ දී 4,037,001 ක් දක්වා වැඩි වී තිබූ අතර, 2013 වර්ෂයේ දී නවක සිසුන් 342,450 ක් රජයේ පාසල් වලට බඳවා ගෙන තිබුණි.

2009 සිට 2013 වර්ෂය දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් ගුරුභවතුන් 36,616 ක් බඳවාගෙන තිබූ අතර, 2013 වර්ෂය අවසානයට රජයේ පාසල් වල මුළු ගුරුභවතුන් සංඛ්‍යාව 226,983 ක් වූ අතර, 2009 වර්ෂය සමඟ සැසඳීමේ දී සියයට 16 ක වැඩිවීමක් විය.

ගුරුභවතුන් ස්ථානමාරු කිරීම සහ අනුයුක්ත කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ජාතික ගුරුමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ජාතික පාසැල් 24 ක වර්ෂ 10 ත් වර්ෂ 30ත් අතර කාලයක් එකම පාසැලක සේවය කරන ගුරුභවතුන් සංඛ්‍යාව 653 ක් වන බව නියැදි පරීක්ෂණයේ දී අනාවරණය විය.

විශේෂ අධ්‍යාපන ශික්ෂණ ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් අනුයුක්ත කිරීමේ දී විශේෂ අවශ්‍යතා සහිත සිසුන් 1,145 ක් ඉගෙනුම ලබන පාසැල් 128 කට එවැනි ගුරුභවතුන් අනුයුක්ත නොකොට විශේෂ අවශ්‍යතා සහිත සිසුන් නොමැති පාසල් 162 කට එවැනි ගුරුභවතුන් 176 දෙනෙකු අනුයුක්ත කර තිබුණි.

සිසු දරුවන් වෙත නොමිලේ නිල ඇඳුම් සැපයීම.

2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අතර කාලපරිච්ඡේදය තුළදී අමාත්‍යාංශය විසින් සිසු දරුවන් වෙත නොමිලේ ලබා දී තිබුණු නිල ඇඳුම් පැකට් ප්‍රමාණය හා වාර්ෂිකව වැය කර තිබුණු වියදම් පහත වගුවෙහි දැක්වෙන අතර, 2012 වර්ෂය හා සැසඳීමේ දී 2013 වර්ෂයේ දී වැයකර තිබුණු වියදමෙහි සියයට 1.2 ක වර්ධනයක් සිදුවී තිබුණි.

වර්ෂය	පැකට් ප්‍රමාණය	පැකට් ප්‍රමාණයට වැය වූ මුදල (ප්‍රවාහනය හා අනෙකුත් වියදම් හැර) රු.
2009	6,633,850	1,176,772,857
2010	6,127,502	1,137,958,013
2011	6,393,990	1,421,641,647
2012	7,089,500	1,698,944,372
2013	6,809.370	1,719,549,886

ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හා ළඟා කරගත් අරමුණු

සමාලෝචිත වර්ෂයේ දී අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේ තත්ත්වය පහත දැක්වේ.

දහසක් පාසල් ව්‍යාපෘතිය

2013 දෙසැම්බර් 31 දින වන විට දහසක් පාසල් ව්‍යාපෘතිය මගින් මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර ගොඩනැගිලි ඉදිකිරීමේ අදියර I සහ අදියර II යටතේ විද්‍යාගාර 817 ක ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කර තිබුණද වර්ෂය අවසාන වන විට රු.4,274,077,350 ක් වැය කරමින් විද්‍යාගාර 349 ක වැඩ පමණක් අවසන් කිරීමට හැකිවී තිබුණි. සැලසුම් කළ විද්‍යාගාර 817 න් විද්‍යාගාර 171 කට පමණක් රු. 223,374,489 ක් වැය කර ලී බඩු මිලදී ගෙන තිබුණි.

හුදකලා පාසැල්

සිසුන් 50 ට අඩු සංඛ්‍යාවක් සිටින හා භූගෝලීය වශයෙන් හුදකලා තත්ත්වයට පත් වූ පාසැල් 1,347 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් EKSP ව්‍යාපෘතිය යටතේ හඳුනාගෙන තිබුණද, එම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

නැණසල ව්‍යාපෘතිය

2009 ජුලි 05 දින ආරම්භ කර තිබුණු නැණසල දුරස්ථ අධ්‍යාපන වැඩසටහන සඳහා පෞද්ගලික ආයතනයකින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රූපවාහිනී යන්ත්‍ර 1,962 ක් පාසැල් 1,962 කට ලබා දී තිබූ අතර, 10 සහ 11 ශ්‍රේණි වල ගණිතය, විද්‍යාව විෂයයන් හා 5 ශ්‍රේණියේ ගණිතය, මව්බස, දෙවන බස විෂයයන් සඳහා පාඩම් මාලාවන් විකාශනය කිරීමට සැලසුම් කර තිබුණ නමුත් පාඩම් විකාශනය වන කාල පරාසය තුළදී එම විකාශනය වෙත යොමුවීමට අවැසි ලෙස පන්ති කාල සටහන් පිළියෙල කර නොතිබුණි.

පාසැල්වල තොරතුරු තාක්ෂණය භාවිතය

2013 දෙසැම්බර් 31 දින වන විට දිවයිනේ පිහිටි සමස්ත රජයේ පාසැල් සංඛ්‍යාව 10,852 ක් අතරින් පාසැල් 5,824 ක් හෙවත් මුළු පාසැල් සංඛ්‍යාවෙන් සියයට 58ක් වෙත පමණක් පරිගණක පහසුකම් ලබා දී තිබුණි. පරිගණක පහසුකම් සහිත පාසැල් සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීමේ අරමුණින් 2006 වර්ෂයේ දී පාසැල් පරිගණක ජාලය ස්ථාපිත කිරීම ආරම්භ කර තිබුණි. මේ සඳහා 2006 සිට 2008 වර්ෂ අතර කාල පරිච්ඡේදය තුළදී රු.37,090,000 කට ආසන්න මුදලක් ද, 2008 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින වන විට රු.579,140,248 ක් ද වැය කර තිබුණු අතර, 2013 දෙසැම්බර් 31 දින වන විට පාසැල් ඇතුලු ආයතන 1,724 ක් වෙත මෙම සම්බන්ධතාවය ලබාදී තිබුණි. නමුත් තොරතුරු කැඳවා තිබුණු පාසැල් හා ආයතන 1,724 ක් අතරින් තොරතුරු එවා තිබුණු පාසැල් හා ආයතන 414 ක්ම මෙම සේවාව භාවිතයේ ඵලදායිතාවය, කාර්යක්ෂමතාවය කෙරෙහි තෘප්තියක් නොමැති බව තහවුරු කර තිබුණි. මෙම පරිගණක ජාලය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දින වන විට රු.16,122,312 ක් වැය කරමින් ස්ථාපිතකර තිබුණු අධ්‍යාපනික කළමනාකරණ තොරතුරු පද්ධතිය ද අකර්මන්‍ය වී තිබුණි.

5 වසර ශිෂ්‍යත්වය සමත්වීම හා ජනප්‍රිය පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දුෂ්කරතාවය

අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණු පරිදි පන්තියක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව 42 සීමාව ඉක්මවා, 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා වූ පන්තිවලට වරින් වර ළමුන් ඇතුළත් කර තිබීම හේතුවෙන්, 2013 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසැල් 31 ක 5 ශ්‍රේණියේ පන්තිවල සිටිය යුතු ළමුන් සංඛ්‍යාවට වඩා ළමුන් 1.250 ක් සිටින බව සිදුකරන ලද නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. ඒ හේතුවෙන් 2013 වර්ෂයේ දී 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට විභාගය සමත්වී තිබුණු ශිෂ්‍යයින් 1,250 කට තමාගේ දක්ෂතා අනුව ජනප්‍රිය පාසැලකට

ඇතුළත් වීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි. විභාගයෙන් සමත් වූ සහ ජනප්‍රිය පාසැලක් ලැබී තිබුණු සිසු දරුවන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	ශිෂ්‍යත්වය සමත් ශිෂ්‍ය සංඛ්‍යාව	ජනප්‍රිය පාසලක් ලැබී තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව	විභාගය සමත් වුවත් ජනප්‍රිය පාසලක් නොලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු සංඛ්‍යාව හා සසඳන කල විභාගය සමත් වුවත් ජනප්‍රිය පාසලක් නොලැබූ ප්‍රතිශතය
2012	310,327	33,383	25,837	7,546	22.60
2013	322,455	32,517	27,415	5,102	15.69

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල

2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වසර 4 ක් තුළදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව	සමත්වූ සිසුන් සංඛ්‍යාව	සමත්වූ සිසුන් සංඛ්‍යාව, විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	සියළුම විෂයයන්ට විශිෂ්ඨ සාමාර්ථ ලබාගත් සිසුන් සංඛ්‍යාව	සියළුම විෂයයන් අසමත් සිසුන් සංඛ්‍යාව	සියළුම විෂයන් අසමත් සිසුන් මුළු ගණනින් ප්‍රතිශතයක් ලෙස
2010	271,644	164,527	60.57	3,057	14,411	5.3
2011	270,032	164,191	60.80	3,908	12,795	4.7
2012	268,995	174,160	64.74	4,509	11,100	4.1
2013	264,772	176,534	66.67	5,737	9,444	3.6

2010 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 6,872 කින් අඩුවී තිබුණ ද විභාගය සමත් වීමේ ප්‍රතිශතය සියයට 60.57 සිට සියයට 66.67 දක්වා වර්ධනය වී තිබුණි. 2010 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ සියලු විෂයයන් සඳහා විශිෂ්ඨ සාමාර්ථ ලබාගත් සිසුන් සංඛ්‍යාව සියයට 88 කින් වර්ධනය වී තිබුණි. එසේම සියලුම විෂයයන් අසමත් සංඛ්‍යාව සියයට 34කින් අඩුවී තිබුණි.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල

2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වර්ෂ 3ක් තුළදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	විභාගයට ඉදිරිපත්වී තිබුණු මුළු සිසුන් සංඛ්‍යාව	විභාගය සමත් වී තිබුණු මුළු සිසුන් සංඛ්‍යාව	සියළුම විෂයයන් අසමත් වී තිබුණු සිසුන් සංඛ්‍යාව	සියළුම විෂයයන්ට විශිෂ්ඨ සාමාර්ථ ලබාගත් සිසුන් සංඛ්‍යාව	විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව	විභාගය සමත් වී තිබුණු මුළු සිසුන්ගෙන් විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස
2011/2012	239,755	141,411	23,237	3,707	28,937	20.4
2012/2013	233,634	144,745	18,485	9,057	22,943	15.8
2013/2014	241,629	140,993	27,924	4,999	--	--

2011 වර්ෂයට සාපේකෂව 2013 වර්ෂයේ දී විභාගයට ඉදිරිපත් වී තිබුණු මුළු සිසුන් සංඛ්‍යාව, 1,854 කින් වැඩිවී තිබුණු අතර, විභාගය සමත් මුළු සිසුන් සංඛ්‍යාව 2011 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ දී 418 කින් අඩුවී තිබුණි. ඒ අනුව සමස්ත විභාග ප්‍රතිඵලයෙහි පසුබෑමක් නිරීක්ෂණය වූ අතර, 2011 වසරට සාපේක්ෂව විශිෂ්ඨ සාමාර්ථ ලබාගත් සිසුන්ගේ සියයට 35 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මත බඳවා ගත් සිසුන් ප්‍රමාණය ඉහළ දැමීම හේතුවෙන් 2011/2012 අධ්‍යයන වර්ෂයේ දී විශ්ව විද්‍යාල වලට බඳවාගත් සිසුන් සංඛ්‍යාවේ වර්ධනයක් දැක්විණ.

සෞඛ්‍ය සේවා

පුළුල්, උසස් තත්ත්වයකින් සමානාත්මක ලෙස , ඵලදායි සහ චිරස්ථායි සෞඛ්‍යය සේවාවක් ජනතාවට ලබා දීමේ අරමුණින් ක්‍රියාත්මක වන සෞඛ්‍ය අමාත්‍යාංශය දේශීය, ආර්ථික, සමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායකවන සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීමේ දැක්ම ඇතිව කටයුතු කරයි.

2013 වර්ෂයේදී රජය විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා රු.මිලියන 119,530 ක් වැය කර තිබුණු අතර, 2012 වර්ෂයේදි වැය කළ රු. මිලියන 98,999 හා සසඳන විට එය සියයට 21 කින් වැඩි වී තිබුණි. පසුගිය වර්ෂ 04 තුළ වියදමේ වැඩිවීම පහත පරිදි විය.

	වර්ෂය			
විස්තරය	2013	2012	2011	2010
සෞඛ්‍ය අමාත්‍යාංශ වියදම (රු.මිලියන)	92,994	71,506	63,353	53,730
මූලධන - තථ්‍ය වියදම (රු.මිලියන)	17,435	13,647	10,359	8,622
පුනරාවර්තන තථ්‍ය වියදම (රු.මිලියන)	75,559	57,859	52,994	45,108
මුළු සෞඛ්‍ය වියදම (රු.මිලියන)	119,530	98,999	89,217	73,835
පුනරාවර්තන (රු.මිලියන)	99,609	81,946	74,443	60,506
මූලධන (රු.මිලියන)	19,921	17,063	14,774	13,329
ඒක පුද්ගල මූලධන සෞඛ්‍ය වියදම (රු.)	5,836	4,870	4,274	3,573
මුළු සෞඛ්‍ය වියදම දළ දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	1.38	1.31	1.36	1.32

මූලාශ්‍රය - සෞඛ්‍ය අමාත්‍යාංශය / මහ බැංකු වාර්ෂික වාර්තාව

සෞඛ්‍ය අංශය

මූලධන හා පුනරාවර්තන වියදම් වශයෙන් පසුගිය වර්ෂ 05 තුළ පිළිවෙලින් රු. මිලියන 77,741 ක් හා රු.මිලියන375,293 ක් වශයෙන් රු.මිලියන 453,034 ක් වැය කර තිබුණි. 2009 වර්ෂයේදී රු. 3,496 ක් වූ ඒකපුද්ගල සෞඛ්‍ය වියදම 2013 වර්ෂය වන විට රු.5,836 ක් දක්වා සියයට 67 කින් වැඩි වී තිබුණි.

සෞඛ්‍ය ක්‍ෂේත්‍රය සම්බන්ධව පෞද්ගලික රෝහල් වලින් කෙරෙන දායකත්වය 2009 වර්ෂය හා සසඳන කළ 2013 වර්ෂයේදී පෞද්ගලික රෝහල් වල ඇඳන් සංඛ්‍යාව වැඩි වීමක් පෙන්නුම් කරයි. එමෙන්ම රජයේ රෝහල් සංඛ්‍යාවේ හා ඇඳන් සංඛ්‍යාවේ වැඩිවීමක් මෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සමස්ථ ශ්‍රම බලකායේ වැඩි වීමක්ද පෙන්නුම් කරයි.

පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමන සභාව 2006 වර්ෂයේ දී පිහිටුවා තිබුණි. යථෝක්ත පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව සභාව විසින් පෞද්ගලික වෛද්‍ය ආයතනවල තාක්ෂණික ප්‍රවීණතා සහ සේවාවන්හි ගුණාත්මක භාවය සහ පහසුකම් සහතික කිරීමේ කාර්යභාරය සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය පිළිබඳ නියාමනයන් නියාමන සභාව විසින් අමාත්‍යවරයා ලවා ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. පනත ක්‍රියාත්මක වී වසර 8 ක කාලයක් ගතවී තිබුණත් සෞඛ්‍ය ආයතන පාලනය සඳහා එවැනි නියාමනයන් සකසා නොතිබුණි. යථෝක්ත පනතේ 4(1) (i) හා (ii) වගන්ති ප්‍රකාරව සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන මෙම නියාමන සභාවේ ලියාපදිංචි විය යුතු වුවත් විවිධ අඩුපාඩු නිසා ලියාපදිංචි නොකරන ලද වෛද්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් 2007 වසරේ සිට 2013 වසර දක්වා ලියාපදිංචි සහතික නොලබා තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. ලියාපදිංචි කිරීමේ ආදායම්වලින් සියයට 50 ක් අදාල පළාත් සභාවලට ගෙවිය යුතු වුවත් , 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු. 26,552,000 ක් පළාත් සභාවලට ගෙවා නොතිබුණි. තවද 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

විලවුන් උපකරණ හා ඖෂධ ව්‍යවස්ථාපන අධිකාරිය

1980 අංක 27 දරන විලවුන්, උපකරණ හා ඖෂධ පනතට අනුව අධිකාරියේ පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව විලවුන් වර්ගයක් හෝ යම් උපකරණයක් ප්‍රචාරණය කරනු ලැබිය නොහැකිය. එසේ වුවද, 2013 වර්ෂයේදි ඒ සඳහා ලියාපදිංචි වීමට දැන්වීම් 420 ක් ඉදිරිපත් කර තිබු අතර, එයින් දැන්වීම් 206 කට ලියාපදිංචිය ලබාදී තිබූ අතර ලියාපදිංචිය ලබා නොගත් විලවුන්වලට අදාල දැන්වීම් 214 ක් අනුමැතියකින් තොරව ප්‍රචාරණ කටයුතු සිදු කර තිබුණි.

ඩෙංගු රෝගයේ ව්‍යාප්තිය හා මර්ධනය

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි සීග්‍ර ලෙස වර්ධනය වන ඩෙංගු රෝගය පිළිබඳ වර්ෂ කිහිපයක අදාල සංඛ්‍යා ලේඛන පහත දක්වා ඇත.

වර්ෂය	රෝගීන් සංඛ්‍යාව	මරණ සංඛ්‍යාව
2009	35,095	346
2010	34,188	246
2011	28,473	186
2012	44,461	181
2013	31,876	89

2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී ඩෙංගු රෝගය ව්‍යාප්ත විමේ අඩුවීමක් පෙන්නුම් කර තිබුණද, රෝග නිවාරණ කිරීමේ ක්‍රමවේදවල තිබු පසුගාමී තත්ත්වය නිසා රෝගය නැවත හිස එසවීමේ අවධානමක් පැවැතුණි. ඩෙංගු මර්ධන ඒකකය විසින් ඩෙංගු මදුරුවන් බෝවිම වැලැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල සාර්ථකභාවය යම් යම් කරුණු හේතුවෙන් ගැටළු සහගත වී තිබුණි. එනම් 2013 වර්ෂය සඳහා ඩෙංගු පාලන ක්‍රියාකාරකම් සඳහා රු. 42,125,195 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර පසුගිය වසර 5 තුළ වාර්තා වු ඩෙංගු රෝගින් ගණන හා මරණ සංඛ්‍යාව සැසදිමේදි රෝගින් හා මරණ සංඛ්‍යාව වැඩි ප්‍රදේශ සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී ප්‍රතිපාදන සළසා දී නොතිබුණු අතර බොහොමයක් පාලන වැඩසටහන් සම්බන්ධයෙන් සිදු කළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඒවායේ සාර්ථක අසාර්ථකභාවය පරික්ෂා කිරිමට අවශ්‍ය මාසික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. තවද මොස්කිටෝ ඩන්ක් නියාමන ව්‍යාපෘතිය නමින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය සඳහා රු.31,250,000 ක් වැය කර BTI කැට 125,000 ක් මිලදි ගෙන තිබුණි. එම කැට පාවිච්චිය පිළිබඳ දැනුවත් නොකිරිමත් නිසි පරිදි බෙදා නොහැරිමත් නිසා එය අසාර්ථක වී තිබුණි. බෙදා හැර නොතිබුණු ඉතිරි කැට 69,970 ක් (සියයට 60) පාවිච්චියෙන් තොරව වසර 2 කට ආසන්න කාලයක් ප්‍රයෝජනයට නොගෙන තිබු අතර, ඒවා 2014 ජුලි මාසය වන විට කල් ඉකුත් විමට නියමිතව තිබුණි. දියර BTI හා BTI කැට යොදා වඩා ඵලදායි මදුරු මර්ධන ක්‍රමය අධ්‍යයනය කිරිම ව්‍යාපෘතියේ අරමුණ වුවද, දියර BTI ද්‍රාවණය යොදා නියමු ව්‍යාපෘතිය සිදු කර නොතිබුණි.

ප්‍රවාහනය

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන සේවාවන් අතුරින් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාවට ඉතාමත් වැදගත් ස්ථානයක් හිමිවී ඇති අතර මෙම මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාව මූලික වශයෙන් රාජ්‍ය අංශය මගින් හා පෞද්ගලික අංශය මගින් සිදු කරනු ලබයි. රාජ්‍ය ප්‍රවාහන සේවාව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින්ද පෞද්ගලික ප්‍රවාහන සේවාව පෞද්ගලික බස් රථ මගින්ද සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

2005 අක 27 දරන පනත මගින් නැවත ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය රාජ්‍ය අංශයේ බස්රථවල හිමිකරුවා මෙන්ම ධාවකයා බවටද පත්ව ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සිය මගී ජනතාවට ආරක්ෂිත, කාර්යක්ෂම, ඵලදායී, විශ්වාසදායී සහ විධිමත් බස් සේවාවක් සැපයීමට කැප වෙමින් කටයුතු කරන අතර සාධාරණ ගාස්තු ක්‍රමයකට අනුව යමින් කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා බවට පත්වීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දැක්ම වේ. දැනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතුව ඩිපෝ 104ක් ද, උප ඩිපෝ 16ක් ද, වැඩපලවල් 11ක් ද, රියදුරු පාසැල් 07ක් ද පවතින අතර ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීය කාර්යාල 12ක් ද දිවයින පුරා පිහිටුවා ඇත. මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ තුනක් සඳහා වූ මණ්ඩලයේ ධාවන කාර්යසාධන තත්ත්වයන් පහත දැක්වේ.

ධාවන තත්ත්වය

	2013	2012	2011	2010
බස්රථ ඇණිය (සාමාන්‍ය)	7,607	7,756	7,821	8,403
කාලසටහන් අවශ්‍යතාවය බස්රථ (සාමාන්‍ය)	7,174	7,172	7,131	7,129
ධාවන තත්වයේ ඇති බස් රථ (සාමාන්‍ය)	4,720	4,694	4,933	5,119
දිනකට ධාවනය කරන ලද සාමාන්‍ය බස්රථ	4,373	4,314	4,365	4,441
කාලසටහන් අවශ්‍යතාවයෙන් ධාවනය කරන ලද බස්රථ ප්‍රමාණයේ ප්‍රතිශතය	61	60	61	62
ලේඛනගත ප්‍රමාණය කි.මී.	603,004,472	609,651,210	611,411,135	616,363,455
ධාවනය කළ කිලෝ මීටර් ප්‍රමාණය	343,691,735	337,830,439	340,840,718	341,617,984
සේවක සංඛ්‍යාව	33,168	34,092	34,263	34,772
ධාවන තත්වයේ ඇති එක් බස්රථයකට සේවක සංඛ්‍යාව	8	8	7	7

මූලාශ්‍රය - ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, සංවර්ධන හා සැලසුම් අංශ වාර්තාව

ඉහත වගුවට අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු මුළු බස්රථ සංඛ්‍යාව 2010 වර්ෂයේදී 8,403 ක් වූ අතර, 2013 වර්ෂයේදී එය 7,607 ක් දක්වා සියයට 15කින් අඩු වී තිබුණි. කාලසටහන් අවශ්‍යතාවය 2010 වර්ෂයේදී බස්රථ 7,129 වූ අතර, එය 2013 වර්ෂය වන විට 7,174 ක් දක්වා සියයට 0.6 කින් වැඩිවී තිබුණි. මේ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සපුරාගත හැකිව ඇත්තේ මුළු කාලසටහන් අවශ්‍යතාවයෙන් සියයට 61 ක් පමණි. තවද, ධාවනයට ඉලක්ක කරගත් කිලෝමීටර් ප්‍රමාණයෙන් ධාවනය කරන ලද කිලෝමීටර් ප්‍රමාණය පසුගිය වර්ෂවල සියයට 55 ක් වූ අතර එය 2013 වර්ෂයේදී සියයට 78 දක්වා වැඩිවී තිබුණද කාලසටහන් අවශ්‍යතාවය සපුරා ගැනීමට ප්‍රමාණවත් බස්රථ ඇණිය නොතිබුණි.

ආදායම, වියදම හා ලාභදායිත්වය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සැලසුම් අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා විගණනයට ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2013 ප්‍රවර්තන වර්ෂයේ හා පසුගිය වර්ෂ හතරක ආදායම්, වියදම් හා ලාභ අලාභ පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

	2013	2012	2011	2010
	රු.	රු.	රු.	රු.
<u>ආදායම</u>				
මගීන් ප්‍රවාහනයෙන් ලද ආදායම	19,430,655,484	18,209,846,344	15,085,144,469	14,588,374,538
අනෙකුත් ආදායම්	8,018,965,187	2,095,904,299	2,079,969,382	2,545,970,515
රජයේ ප්‍රදාන	2,741,785,656	5,997,619,174	5,353,866,486	5,616,459,435
මුළු ආදායම	**30,191,406,327**	**26,303,369,817**	**22,518,980,337**	**22,750,804,488**
ධාවනය කළ කිලෝ මීටරයකට මගී ප්‍රවාහනයෙන් ලද ආදායම	56.54	53.90	44.26	42.70
ධාවනය කළ කි.මීටරයට මුළු ආදායම	87.84	77.86	66.07	66.60
වියදම				
බස් මෙහෙයුම් වියදම	26,416,646,151	23,852,905,514	19,476,472,376	18,480,336,180
අනෙකුත් වියදම්	5,307,753,254	4,946,753,969	4,319,067,869	4,408,086,757
මුළු වියදම	**31,724,399,405**	**28,799,659,483**	**23,795,540,245**	**22,888,422,937**
ධාවනය කළ කිලෝ මීටරයකට	76.86	70.60	57.14	54.09

බස්මෙහෙයුම් වියදම				
ධාවනය කළ කිලෝ මීටරයකට මුළු වියදම	92.30	85.25	69.81	67.00
රජයේ ප්‍රදාන වලට පෙරමෙහෙයුම් අලාභය	4,274,778,734	8,493,908,840	6,630,426,394	5,754,077,884
රජයේ ප්‍රදාන වලින් පසුමෙහෙයුම් අලාභය	1,532,993,078	2,496,289,666	1,276,559,908	137,618,449
රජයේ ප්‍රදාන වලට පෙර ධාවනය කල කිලෝ මීටරයකට අලාභය	21.44	25.14	19.45	16.84
රජයේ ප්‍රදාන වලින් පසු කිලෝ මීටරයකට අලාභය	4.46	7.39	3.74	0.40

ඉහත වගුවට අනුව මගී ප්‍රවාහනයෙන් ලද ආදායම ක්‍රමයෙන් වර්ධනය වීමක් දක්නට ඇති අතර එය 2010 වර්ෂයට සාපේක්ෂව සියයට 31 ක වර්ධනයක්ද පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 6.7 ක වර්ධනයක්ද පෙන්නුම් කෙරේ. එහෙත් මුළු වියදම 2010 ට සාපේක්ෂව සියයට 38 කින් වර්ධනය වී ඇති අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව එය සියයට 10 කි. මේ අනුව ආදායම වර්ධනය වන වේගයට වඩා වැඩි වේගයකින් වියදම වර්ධනය වන බැවින් ආයතනය දිගින් දිගටම පාඩු ලබමින් පවතී. 2010 වර්ෂය වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාභ හෝ පාඩු නොමැතිව පවත්වාගෙන යාම සඳහා (Break Even Point) එක් කිලෝ මීටරයකට රු.65.54 ක් ඉපයිය යුතු අතර එය 2013 වන විට එය රු. 90.30 ක් දක්වා වැඩිවී ඇත. මෙසේ ආයතනය දිගින් දිගටම අලාභ ලැබෙමින් පැවතුනහොත් රජයේ හෝ භාණ්ඩාගාරයේ මූල්‍ය සහයක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් ඇතිවිය හැකිය.

නිරීක්ෂණය වූ පොදු අඩුපාඩු හා අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග

(අ) මණ්ඩලය සතු බස්රථ ඇණිය ප්‍රමාණවත් නොවීම

2013 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතු මුළු බස්රථ ඇණිය බස්රථ 7,143 ක් වන අතර, එයින් බස් රථ 4,245ක් වසර 10 කට වඩා පරණ ඒවා විය. ධාවන තත්වයේ ඇති බස් රථ සංඛ්‍යාව 4,699 කි. එහෙත් දැනට සැළසුම්කර ඇති පරිදි කාලසටහන් අවශ්‍යතාවය බස්රථ 7,174 ක් වේ. මේ අනුව මණ්ඩලයේ බස්රථ ඇණිය කාලසටහන් අවශ්‍යතාවයවත් සපුරා ගැනීමට ප්‍රමාණවත් නොවන අතරම යෝජිත ඒකාබද්ධ කාලසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියයට 40 ක් බස්රථ ප්‍රමාණය සපයා ගැනීමට නොහැකිවී ඇත.මේ නිසා මණ්ඩලයේ බස්රථ ඇණිය ශක්තිමත් කර ගැනීමට ඉතා ඉක්මනින් පියවර ගත යුතුවේ. මේ සඳහා මණ්ඩලය විසින් 2013 වර්ෂය තුළදී අළුත් බස්රථ 233 ක් ධාවනයට එක්කර තිබූ අතර තවත් බස් රථ 2,200 ක් 2014 වර්ෂය තුළදී මිළදී ගැනීමට සැලසුම් කර තිබුණි.

(ආ) ධාවනය කරනු ලබන මාර්ග ප්‍රමාණය අඩුවීම

ප්‍රමාණවත් බස්රථ ඇණියක් නොමැති වීමත් සහ පැරණි බස්රථ ධාවනයෙන් ඉවත්වීමත් සමගම ධාවනය කරවනු ලබන මාර්ග ක්‍රමයෙන් අඩු වෙමින් පවතින අතර දැනට ඇතැම් මාර්ගවල ශ්‍රී ලංගම බස් ධාවනය සම්පූර්ණයෙන් ඇණහිට ඇත. උදාහරණ ලෙස මාර්ග අංක 103 බොරැල්ල - කොටුව හා නාරාහේන්පිට - කොටුව යන මාර්ග දැක්විය හැකිය. මේ නිසා දැනට බොහෝ මණ්ඩලවල බස්රථ අනාර්ථික මාර්ගවලට පමණක් සීමාවී ඇත. මේ නිසා බස්රථ ඇණිය වැඩිකිරීමට පියවර ගතයුතු අතර, බස් රථ ඇණිය වැඩි කිරීම තුළින් මණ්ඩලයට අහිමිවී ගිය මාර්ගවල ධාවන කටයුතු නැවත ආරම්භ කිරීමට හා නව බස් මාර්ග ඇති කිරීමට හැකිවීම හා ඒ තුළින් මණ්ඩලය සතු සම්පත් වලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට ද හැකිවනු ඇත.

(ඇ) වාර්ෂිකව බස් ධාවන වියදම් වැඩිවීම

පසුගිය වර්ෂ කිහිපයකට අදාළව මණ්ඩලයේ වියදම වාර්ෂිකව වැඩිවෙමින් පවතින බව නිරීක්ෂණය වන අතර මෙසේ වියදම වැඩිවීමට ප්‍රධාන හේතුව ඉන්ධන, ටයර් හා ටියුබ්, අළුත්වැඩියා වියදම් හා අමතර කොටස්වල වියදම ඉහළ යාම නිසා බව නිරීක්ෂණය විය.ප්‍රධාන වියදම් කිහිපයක හැසිරීම පහත වගුවේ දැක්වේ.

	2013	2012	2011	2010
	රු.	රු.	රු.	රු.
ඉන්ධන හා ලිහිසි තෙල්	12,544,928,647	11,405,107,132	8,118,487,323	7,650,699,703
ටයර් හා ටියුබ්	1,799,416,147	1,421,908,482	1,588,854,899	1,196,568,809
බස්රථ අළුත්වැඩියා	168,930,616	125,423,630	122,304,598	165,836,532
අමතර කොටස්	1,098,627,197	879,514,919	1,200,417,694	1,172,902,212
එකතුව	15,611,902,607	13,831,954,163	11,030,064,514	10,186,007,256
ධාවනය වන බස් ගණන	4,720	4,694	4,933	5,119
එක් බස්රථයක් සඳහා වියදම	3,307,607	2,946,731	2,235,975	1,989,843

පසුගිය වර්ෂ කිහිපය තුළ බස්රථ ධාවනය කල කිලෝමීටර් ප්‍රමාණයේ සැළකිය යුතු වැඩිවීමක් සිදු නොවූවද ඉන්ධන සඳහා වූ වියදම 2010 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂය වනවිට සියයට 64 කින් පමණ වැඩිවී ඇති අතර වෙළඳපලේ ඉන්ධන මිළ ඉහළ යාම සිදුවී ඇත්තේ සියයට 17 කින් පමණය. මෙසේ

වැඩිවීමට ප්‍රධාන හේතු ලෙස ඉන්ධන නාස්තිය, අධික ඉන්ධන දහනය, බස්රථ නිසි ලෙස නඩත්තු නොකිරීම හා ඉන්ධන වංචාව වැනි හේතු නිසා බව නිරීක්ෂණය වේ. තවද බස් රථ අළුත්වැඩියාව සඳහා සහ බස් රථ අමතර කොටස් සඳහා විශාල වියදමක් දැරීමට සිදුවී ඇති අතර, තීරුබදු සහන ක්‍රමයක් යටතේ අඩු මිළට අමතර කොටස් මිළදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක සහය ලබාගෙන තිබූ නමුත් එයද සාර්ථකවී නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව විධිමත් වැඩපිළිවෙලක් සකස්කර ආර්ථිකමය වශයෙන් වාසිදායක තත්වයෙන් උසස් අමතර කොටස් මිළදී ගැනීමටත්, බස්රථ වල ඉන්ධන පාලනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමටත් වියදම් අධික පැරණි බස්රථ ඇණියෙන් ඉවත් කර ඒ වෙනුවට නව බස්රථ ඇණියට එකතු කිරීමක් කළයුතු වේ.

(ඈ) බස්ධාවනය සම්බන්ධයෙන් අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම

බස්රථ කාලසටහනකට අනුව නියමිත පරිදි ධාවනය වන්නේද යන්න ප්‍රමාණවත් අධීක්ෂණයක් ප්‍රධාන කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය මට්ටමින් හෝ ඩිපෝ මට්ටමින් හෝ සිදු නොකිරීම නිසා බොහෝ අවස්ථාවල ධාවන කටයුතු වල වගකීම රියදුරු කොන්දොස්තරවරු වෙත පවරා තිබීම ද නිරීක්ෂණය වේ. ජීපීඑස් තාක්ෂණය යටතේ බස් රථ වල අධීක්ෂණ කටයුතු කිරීම ද වැදගත් බව පෙන්වා දෙමි.

(ඉ) කොන්දොස්තරවරුන් විසින් දෛනික ආදායම අඩුවෙන් භාරදීම

කොන්දොස්තරවරුන් විසින් දෛනික ආදායම් අඩුවෙන් භාරදීම නිසා කොන්දොස්තර හිඟ මුදල් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතින අතර මෙම මුදල් අයකරගැනීමේ ප්‍රමාදයක්ද දක්නට ඇත. මේ නිසා මෙම තත්වය අවම කර ගැනීම සඳහා සහ ටිකට්පත් මගින් ලැබෙන මුදල් වංචා කිරීම අවම කර ගැනීමට සෑම ඩිපෝවක් සඳහාම ටිකට් මැෂින් ලබාදීම හා මාර්ග පරීක්ෂණ කටයුතු වැඩිකිරීම වැදගත් බව නිරීක්ෂණය වේ.

මණ්ඩලයේ වර්ධනය සඳහා ඉදිරියේදී ගතයුතු වෙනත් ක්‍රියා මාර්ග

- පෞද්ගලික හා පොදු ප්‍රවාහනයේ සියයට 60 හා සියයට 40 ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- මගීන් සඳහා පෙරගෙවුම් කාඩ්පත් ක්‍රමයක් හඳුන්වාදීම.
- මණ්ඩලය සතු රියදුරු පාසැල් වැඩිදියුණු කර රටට වැඩදායී මෙන්ම විනීත රියදුරන් බිහිකිරීම.
- මණ්ඩලයේ බස් රථ සඳහා අවශ්‍ය ටයර් අවශ්‍යතාවයන් සපුරාලනු වස්, අම්පාර ටයර් කම්හලේ ධාරිතාව වැඩිකර ගැනීම.
- භාවිතයෙන් තොරව ඇති මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීම.
- මණ්ඩලය තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳ සමාලෝචනයක් කර වර්තමාන තත්ත්වයට ගැලපෙන ආකාරයට නැවත සකස් කිරීම.

- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, ඔවුන් අභිප්‍රේරනය වන ආකාරයට කටයුතු කිරීම හා සැම විටම කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සඳහා ඉහළ කළමනාකරණය මැදිහත්වීම.
- ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත වලට අනුකූලව ගිණුම් පොත්පත් පිළියෙල කිරීම, ප්‍රමාදයකින් තොරව විගණනය සඳහා ගිණුම් ඉදිරිපත් කිරීම හා පරිගණකගත ගිණුම් ක්‍රමයක් හඳුන්වා දීම.
- අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම හා අභ්‍යන්තර විගණන අංශය විසින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ඉහළ කළමනාකරණය මැදිහත් වීම.
- ඉහළ කළමනාකාරිත්වය ඇතුළුව සියළුම කාර්ය මණ්ඩලය ආයතනයට අදාල වන බාහිර හා අභ්‍යන්තර නීතිරීති වලට අනුව කටයුතු කිරීම.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

රියදුරන්ගේ සෞඛ්‍ය ගැටළු මාර්ග අනතුරු සංඛ්‍යාව වැඩිවීමට සෘජුවම බලපා ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ රැකියා අපේක්ෂිත රියදුරු වෘත්තිය සඳහා අයැදුම් කරන සියළුම පුද්ගලයින් රිය පැදවීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිනවාද යන්න තීරනය කිරීමේ බලතල ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයට පවරා ඇත. මේ අනුව ශාරීරික හා මානසික යෝග්‍යතාවය ඇති අයදුම්කරුවන් සඳහා පමණක් වෛද්‍ය සහතික නිකුත් කිරීම මගින් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා සිය දායකත්වය ලබාදේ. සේවා පුළුල් කිරීමේ අරමුණින් 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් 1999 මැයි මස 01 දින සිට ජාතික ප්‍රවාහන වෛද්‍ය අයතනය නමින් මෙම ආයතනය ස්ථාපිත කරන ලද අතර දැනට ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ස්වයං ආදායම් උත්පාදන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ. “සෑම සුක්කානමක් පිටුපසම නිරෝගිමත් රියදුරෙකු හිඳුවීම” යන **දැක්ම** යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනයේ මෙහෙවර ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වෙමින් සියළු රියදුරු බලපත්‍ර අපේක්ෂයන්ට අධ්‍යාත්මික හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණ සිදුකර ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික කිරීම වේ. ආයතනයේ දැක්ම කරා ළඟාවීමටත්, මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසාත්, ප්‍රධාන කාර්යාලය ඇතුළුව ශාඛා කාර්යාල දහනවයක් ස්ථාපිත කර ඇති අතර ඒ සඳහා වෛද්‍ය නිලධාරීන් ඇතුළු සේවක මහත්ම මහත්මීන් 251 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා ඇත. ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ හා එහි ශාඛා වල 2013 වර්ෂයේ ආදායම් එකතුව රු. 328,962,497 හා වියදම් එකතුව රු. 217,481,289 වන අතර, අතිරික්තය රු.111,481,209 ක් විය. ආයතනයේ කාර්යසාධන තත්ත්වය සලකා බැලීමේ දී සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ තුනක ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මගින් සිදුකරනු ලැබූ වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව සහ අනතුරු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව පිළිබඳ දත්ත පහත දැක්වේ.

	2013	2012	2011	2010
මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව	371,796	164,652	274,605	302,214
රෝගී තත්ත්වය මත අසමත් සංඛ්‍යාව	29,593	12,146	18,019	19,278

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මගින් සිදුකරනු ලැබූ අනතුරු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව

	2013	2012	2011	2010
සිදුකරන ලද වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව	2,494	2,343	1,960	1,315
ශාරීරික යෝග්‍යතාව සහිත සංඛ්‍යාව	2,295	2,192	1,826	1,210
ශාරීරික යෝග්‍යතාව නොමැති සංඛ්‍යාව	199	151	134	105

ජාතික උරුමයන් හා ආගමික කටයුතු

යුනෙස්කෝ සංවිධානය සඳහන් කරන පරිදි, වර්තමාන වෙනස් වන හා එකිනෙකට සම්බන්ධ වූ ලෝකයෙහි රටක සංස්කෘතියට පැහැදිලි බලයක් ඇත. පුරාවිද්‍යා ස්මාරකයන්, කෞතුකාගාර යනාදියේ සිට සම්ප්‍රදායික හුරුපුරුදු සහ සමකාලීන කලා නිර්මාණයන් යනාදී ගණනය කළ නොහැකි තරම් වූ සාධක ගණනාවකින් සංස්කෘතීන් පෝෂණය කරන අතර විශේෂයෙන් ජාතික උරුමයන් තුළින් රටක අනන්‍යතාවය පෙන්නුම් කරනු ලබයි. එසේම ජාතික උරුමයන් හා නිර්මාණශීලීත්වය යන සාධක දීප්තිමත්, නිර්මාණශීලී හා සමෘද්ධිමත් දැනුම මත පදනම් වූ සමාජයක් ගොඩ නැගීමට ඉවහල් වේ.

ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් හා සම්බන්ධිත සියලුම කාර්යයන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබයි.

ජාතික අනන්‍යතාව ලොවට විදහා පාමින් ශ්‍රී ලාංකීය ස්පර්ශ හා අස්පර්ශ උරුමයන් සංරක්ෂණය කර අනාගත පරපුර වෙත දායාද කිරීමත් සමස්ත ආර්ථික හා සමාජයීය සංවර්ධන ක්‍රියාවලියට ඵලදායී ලෙස දායකවීමත් තුළින් ජාතික උරුම සංරක්ෂණයේ කලාපීය ප්‍රමුඛ අභිමානවත් ජාතිය බවට පත්කිරීම මෙම අමාත්‍යාංශයේ මෙහෙවර හා දැක්ම වේ.

රටට ආවේණික වූ හා අනන්‍ය වූ අග්‍රගණ්‍ය ජාතික උරුම සම්පත ලෝක ප්‍රජාවගේ ආකර්ෂණයට ලක් කිරීම තුළින් සංචාරක ප්‍රවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම, ජාතික උරුමයන් හා පාරම්පරික සිරිත් විරිත් සහ සමාජීය වටිනාකම් පිළිබඳ හැඟීම් තරුණ පරපුර වෙත ලබාදීම හා ජාතික උරුමයන්ගේ පරිහානියට හේතුවන සාධක හඳුනාගෙන ඒවා සංශෝධනය කිරීමේ ශක්තිය ජනතාවට ලබාදීම දේශාභිමානී චින්තනය තුළින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ බලවේගයන් ලෙස පෙරමුණ ගැනීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු වේ.

2013 වර්ෂය හා ඊට පෙර වර්ෂය සඳහා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවත්නා ආයතන වල අරමුණු ඉටුකර ගැනීමෙහිලා ඇස්තමේන්තුගත වියදම හා තත්‍ය වියදම පහත දැක්වේ.

ආයතනය	2013	2013	2013	2013	2012	2012	2012	2012
	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන	මූලධන
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
	(අ)	(අ)	(ආ)	(ආ)	(අ)	(අ)	(ආ)	(ආ)
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය	152.3	176.9	98.6	97.3	120.5	248.2	97.8	98.6

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	572.7	172.5	571.7	124.0	501.4	185.1	474.5	111.8
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	112.8	92.4	105.9	45.3	101.4	76.2	92.1	29.7
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව	81.9	294.2	77.4	67.5	60.9	316.9	59.7	240.4
ගාලු උරුමය පදනම	5.5	7.5	5.4	7.5	7.5	15.7	5.3	2.5
ජනකලා කේන්ද්‍රය	12.7	10	11.0	6.7	9.5	10.0	9.4	4.5

(අ) ඇස්තමේන්තුගත (ආ) සත්‍ය

2013 වර්ෂයේ ප්‍රගතිය

මුම්ටාස් මහල් නම්වූ පැරණි කථානායක නිල නිවස, එහි වාස්තු විද්‍යාත්මක වටිනාකම හේතුවෙන් සංරක්ෂණය කර සංචාරක මධ්‍යස්ථානයක් හා පුරාවිද්‍යා කෞතුකාගාරයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියද ත්‍රිකුණාමළයේ පිහිටි පැරණි ඕලන්ද නාවික කොමසාරිස් නිල නිවස කෞතුකාගාරයක් කිරීමේ ව්‍යාපෘතියද 2012 වර්ෂයේ නිම කිරීමට තීරණය කර තිබුණද අදාල ව්‍යාපෘති 2013 වර්ෂය අවසානය දක්වාම නිමකර නොතිබුණි. එසේම යාපනයෙහි පැරණි ඕලන්ද කොටුව නෙදර්ලන්ත රජයේ ආධාර මත රු. මිලියන 124.5 ක් වැයකර නිමකර තිබුණු අතර "අපේ උරුමය දරුවන්ටයි" යන තේමාව යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ජාතික අධ්‍යාපන ආයතනය එක්ව වැඩ සටහනක් ක්‍රියාත්මක කර තිබුණි.

මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් දීඝවාපී චෛත්‍යය, ඉඳිකටු සෑය අසල කළුගල් පොකුණ, තිවංක පිළිමගෙය හා තන්තිරිමලේ කෞතුකාගාරය යන ස්ථාන සංරක්ෂණය කිරීමේ වැඩ සටහන් ඉටුකිරීම සඳහා රු. මිලියන 117 ක් වෙන්කර තිබුණු අතර අදාල සංරක්ෂණ කටයුතු ආරම්භ කර ද තිබුණි. එසේ වුවත් මෙම කටයුතු අමාත්‍යාංශයේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂඥ පරීක්ෂාවකට ලක්කර නොතිබුණි. පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු පිළිබඳ ජාතික මට්ටමේ සැලැස්මක් නොතිබීම මෙයට ප්‍රධාන හේතුව වී තිබුණි.

ජාතික උරුමයන්

පුරාවස්තු හානි සිද්ධීන්

රටක පවතින පුරා වස්තු විවිධ ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් විනාශ කර දැමීමේ ප්‍රවනතාවයක් පසුගිය දශක කීපය තුල පැන නැගී තිබුණි. පුරාවිද්‍යා ආරක්ෂණ පොලිස් කොට්ඨාශය වෙත වාර්තා වී තිබූ පුරාවිද්‍යා ස්මාරක ඇති ස්ථාන වල පුරාවස්තු සොරකම්, අනවසර කැණීම් හා පුරාවස්තු විනාශය ඇතුළු පුරාවස්තු පනත යටතට ගැනෙන සිද්ධීන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වරදේ ස්වභාවය	2009	2010	2011	2012	2013
පුරාවස්තු සොරකම	17	12	32	74	43
පුරාවස්තු විනාශය	31	42	25	67	70
පුරාවස්තු සෙවීමට කැණීම් කිරීම	95	145	135	216	216
පුරාවස්තු පනතට ගැනෙන වෙනත් වැරදි	92	95	28	13	11
එකතුව	**235**	**294**	**220**	**370**	**340**

2013 වර්ෂය තුළදී වාර්තා වී ඇති පුරාවස්තු හානි සිද්ධීන් ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණ ද වැඩිම පුරාවස්තු හානි සිද්ධීන් ප්‍රමාණයක් වාර්තා වන පුරාවස්තු සෙවීමට කැණීම් කිරීමේ සිද්ධීන් සමාලෝචිත වර්ෂයේදී ද පෙර වර්ෂයේ ප්‍රමාණය වූ 216 ක් වාර්තා වී තිබුණි.

පළාත් අනුව පුරාවස්තු හානි සිද්ධීන් ගත්කළ 2012 වර්ෂයට සාපේක්ෂව උතුර හා උතුරුමැද පළාත් දෙකෙහි හානි සිද්ධීන් ප්‍රමාණය පිළිවෙලින් 08 සිට 18 දක්වා හා 82 සිට 116 දක්වා වැඩි වී තිබුණි. රටෙහි වැඩිම පුරාවිද්‍යා ස්මාරක ප්‍රමාණයක් ඇති හා සෑම වර්ෂයකම වැඩිම පුරාවස්තු හානි සිද්ධීන් ප්‍රමාණයක් වාර්තා වන උතුරුමැද පළාත තුළ 2013 වර්ෂයේදී වාර්තා වූ ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 41 කින් වැඩිවී තිබුණි.

2010 සිට 2013 දක්වා වූ වර්ෂ වල වාර්තා වී ඇති හානි සිද්ධීන් ප්‍රමාණය වූ 1,459 ක් අතුරින් මේ වන විට විමර්ශනය අවසන් කර ඇති සිද්ධීන් සංඛ්‍යාව 1,060 ක් වූ අතර, විමර්ශනය කරමින් පැවති සිද්ධීන් සංඛ්‍යාව 399 ක් වේ.

පුරාවස්තු හානි වැලැක්වීමට දායක වන්නන් දිරිමත් නොකිරීම.

පුරාවස්තු ආරක්ෂා කර ගැනීමට දායක වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, තොරතුරු සපයන්නන්ට හා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීම ඇතුළු අරමුණු කීපයක් මත 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත යටතේ පුරාවස්තු තෑගි අරමුදල පිහිටුවා තිබුණි. පුරාවස්තු හානි සිද්ධීන් මත උසාවි මගින් නියම කරනු ලබන දඩ මුදල් වලින් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවනු ලබන දඩමුදල් වල දායකයෙන් සෑදුම්ලත් මෙම අරමුදලේ 2013 වර්ෂය අවසානයේ දී රු. 44,619,540 ක් තිබුණ ද අරමුදල පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් එම මුදල් වැයකර නොතිබුණි.

ගල්වලවල් හේතුවෙන් සිදුවන පුරාවස්තු හානි

රටේ පවතින සීඝ්‍ර සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යා කළුගල් ලබාගැනීම සඳහා ගල් කැඩීමට බලපත්‍ර ලබාදීමේ සීඝ්‍ර වර්ධනයක් සිදුවී තිබුණි. එසේ වුවත් බලපත්‍ර ලබාදීමට පෙර එම ස්ථානවල ඇති පුරාවිද්‍යා වටිනාකම් පිළිබඳ සොයාබලා නොතිබීමත්, බලපත්‍ර ලබාදීමට පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වී කටයුතු නොකිරීමත් යන හේතූන් මත හා කළුගල් කැඩීම සඳහා බලපත්‍ර ලබාදීමේදී හා පසු විපරම් ක්‍රියාවලියේ පැවති අඩුපාඩු හේතුවෙන් ගල්වලවල් පවත්වාගෙන යන තැනැත්තන් විසින් පුරාවිද්‍යා ස්මාරක විනාශ කර තිබුණි. 2013 වර්ෂය තුල වාර්තා වූ පරිදි, පොළොන්නරුව සිරිපුර පළුදෙණිය පුරාවිද්‍යා ස්මාරකයට අයත් ක්‍රි.ව. 12 වන සියවස දක්වා කාල රාමුවට අයත් යැයි සැලකෙන ස්මාරක 08 ක් හා හම්බන්තොට සීනුක්කුගල පුරාවිද්‍යා ස්මාරක භූමියෙහි තිබුණු ස්ථූප ගොඩැල්ලක පාදම් සලකුණු ඇතුළු පුරාවිද්‍යා අවශේෂ විනාශ කර දමා තිබුණි.

ආගමික කටයුතු

බුද්ධ ශාසන හා අනෙකුත් ආගමික කටයුතු හා සම්බන්ධ කාර්යයන් බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබයි.

සාරධර්ම සපිරි ගුණ ගරුක සමාජයක් බිහිකිරීමේ ප්‍රමුඛතම පහසුකම් සපයන්නා බවට පත්වීමේදී දිගුකාලීන දැක්මක් හා ආගමික මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින්, බුදු දහම ප්‍රමුඛ සියලු ආගමික ඉගැන්වීම් මත පදනම් වෙමින් සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම තුලින් යහපත් ජීවන රටාවක් සහිත ගුණගරුක සමාජයක් බිහි කිරීමට උරදීමේ මෙහෙවර සහිතව බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි.

මෙම කාර්යයන් ඵලදායී ලෙස ඉටු කරගැනීම සඳහා අමාත්‍යාංශය යටතේ සියලු ආගම් නියෝජනය වන පරිදි බෞද්ධ කටයුතු, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු, ක්‍රිස්තියානි ආගමික කටයුතු, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු යන දෙපාර්තමේන්තු පිහිටුවා ඇති අතර මෙම දෙපාර්තමේන්තු 4 ට අමතරව මහා භාරකාර දෙපාර්තමේන්තුවද, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

කාර්ය සාධනය

බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2013 වර්ෂය තුලදී භෞතික සංවර්ධන වැඩ සටහන් 5 ක්ද, අධ්‍යාත්මික සංවර්ධන වැඩ සටහන් 5 ක්ද, පූජ්‍ය පක්ෂය ඉලක්ක කරගත් වැඩ සටහන් 2 ක් හා පූජා භූමි සංවර්ධන වැඩ සටහනක් ද වශයෙන් වැඩ සටහන් 13 ක් ක්‍රියාත්මක කර පවත්වා තිබුණු අතර ඒ සඳහා එකතුව

රු.මිලියන344 ක් වැයකර තිබුණි. එසේ වුවත් මෙම වැඩ සටහන් වල ප්‍රගතිය සැලසුම් කළ ආකාරයට ලබාගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ඉටුකරනු ලබන ඇතැම් කාර්යයන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව ඉටුකළ යුතුව තිබුණද එවැනි සමායෝජනයක් ඇතිව කටයුතු කර නොතිබුණි.

බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය

2013 වර්ෂයේ වියදමින් රු. මිලියන 451 ක් හෙවත් ප්‍රතිපාදිත මුදලින් සියයට 93 ක් ආගමික සිද්ධස්ථාන සංවර්ධනය සඳහා වැයකර තිබුණද ඒවායෙහි භෞතික කාර්ය සාධනය පරීක්ෂාව කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

භික්ෂූන් වහන්සේලාගේ අන්‍ය භාෂා පිළිබඳ දැනුම වර්ධනය කිරීමෙන් බෞද්ධ දර්ශනය දේශීයව හා විදේශීයව ප්‍රචලිත කිරීම හා අනෙකුත් ජාතීන් අතර සහයෝගීතාව වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් අන්‍ය භාෂා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 5 ක ප්‍රතිපාදන සලසා තිබුණද එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම පසුගිය වර්ෂ 03 ක කාලය තුළ මේ සඳහා සලසා තිබුණු රු.මිලියන 7.9 ක ප්‍රතිපාදන ද උපයෝජනය කර නොතිබුණි.

බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබුණු බුද්ධ ශාසන අරමුදලට අදාල පනතේ 6 වගන්තිය පරිදි "විදේශීය වුවද දේශීය වුවද කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන මුදල් භාරගැනීම සහ බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම අරභයා ඉතාමත්ම යෝග්‍ය යැයි මණ්ඩලය සලකන ආකාරයට කටයුතු කළයුතු වුවත්, අරමුදල තම ප්‍රධාන කාර්යය භාරය පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව සැලසුම් ගත වැඩසටහනක් යටතේ සිදුකර නොතිබුණි. උදාහරණයක් ලෙස 2012 හා 2013 වර්ෂ වලදී රු. මිලියන 664 කට වැඩි ආදායමක් ලැබී තිබුණද අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වැයකර තිබුණේ ඉන් රු. මිලියන 6 ක් පමණි.

සංචාරක ව්‍යාපාරය

2016 වසර වන විට සංචාරක ඉපයීම එ.ජ. ඩොලර් බිලියන 2.75 ක් වාර්තා කරමින් සංචාරකයින්ගේ පැමිණීම මිලියන 2.5 ක් ආකර්ශණය කර ගැනීම සංචාරක කර්මාන්තයේ ප්‍රධාන ඉලක්කය ලෙස සලකා සමාලෝචිත වර්ෂයේ දී වැඩ සටහන් මෙහෙයවා තිබුණි. සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා රජය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වශයෙන් ආයතන හතරක් බිහිකර ඇති අතර, එම ආයතන හතර පවත්වා ගෙන යාම සඳහා 2013 වර්ෂයේ දී රු.මිලියන 2,560 ක් රජය විසින් වැය කර තිබුණි. සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට චීනය, ඉන්දියාව හා රුසියාව යන රටවල රු.මිලියන 814 ක් වැය කර මහා පරිමාණ ප්‍රවර්ධන වැඩසටහන් සහ රු.මි. 92.4 ක් වැය කර වෙළෙඳපළ ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් ද පවත්වන ලදි. තවද ශ්‍රී ලංකාව ගමනාන්තයක් ලෙස ආකර්ශණය කිරීම සඳහා 2013 වර්ෂයේ දී අළුතෙන් ආරම්භ කරන ලද ස්ථිර ගුවන් ගමන් සේවා 4ක් සහ තාවකාලික ගුවන් ගමන් සේවා 5 ක් ද ආරම්භ වීම සංචාරක කර්මාන්තයේ උනන්තියට බෙහෙවින් බලපා තිබුණි. සංචාරක කර්මාන්තයේ වර්ධනය අඛණ්ඩව පවත්වා ගනිමින් 2012 වසර සඳහා සංචාරක පැමිණීම වූ 1,005,605 ක ප්‍රමාණය 2013 වසරේදී 1,274,593 දක්වා එනම්, සියයට 26.75 ක වර්ධනයක් අත්පත් කර ගැනීමට හැකි විය. මීට සමගාමීව සංචාරක කර්මාන්තයේ ඉපැයීම 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 65.1 ක සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කිරීම ශ්‍රී ලංකා ජාතික ආදායමේ සේවා ගිණුමේ අතිරික්තයක් ඇතිවීමට ප්‍රධාන සාධකයක් වී තිබුණි.

කලාපීය වශයෙන් සංචාරකයින්ගේ පැමිණීම සැලකීමේ දී බටහිර යුරෝපය තවදුරටත් ප්‍රමුඛ සංචාරක මූලය ලෙස අඛණ්ඩව පැවති අතර, එය 2013 දී මුළු පැමිණීම් වලින් සියයට 33 ක් පමණ විය. මීට අමතරව ඉහළම පැමිණීම පිළිවෙලින් දකුණු ආසියාව, නැගෙනහිර ආසියාව, නැගෙනහිර යුරෝපය, මැදපෙරදිග රටවල්, උතුරු ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව හා අප්‍රිකා යන කලාප වලින් වාර්තා වී තිබුණි. මෙම කලාප වලට වාර්තා නොවූ ලතින් ඇමෙරිකා හා කැරිබියන් ප්‍රදේශයෙන් ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් ප්‍රමාණය 2013 වර්ෂයෙ දී 3,166 ක් පමණ විය. එහෙත් එම ප්‍රමාණය 2012 වර්ෂය සමඟ සැසඳීමේ දී සියයට 94 ක වර්ධනයක් සහිත අගයක් බවට පත් වී තිබුණි.

රටට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාවට සරිලන අයුරින් පහසුකම් වැඩිකිරීම සඳහා කර්මාන්තයට අවශ්‍ය ආයෝජන සිදුකරමින් පවතින අතර, විවිධ ව්‍යාපෘති යටතේ සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම අරමුණු කරගෙන බෙන්තොට, පාසිකුඩා, කුච්චවේලි, කල්පිටිය, දෙද්දූව හා යාල පලටුපාන යන ප්‍රදේශවල සංචාරක කලාප වලට රජය විශාල ආයෝජනයන් කිරීමට අනුග්‍රහයක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී හා පෙර වර්ෂයේ දී පාසිකුඩා සංචාරක කලාපයේ පමණක් කාමර 854 කින් සමන්විත හෝටල් 13 ක් ඉදිකර සංචාරකයින්ගේ පහසුව සඳහා විවෘත කර තිබුණි. මීට අමතරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අළුතෙන් හඳුන්වා දී ඇති සංචාරක සත්කාරක නිවාස වැඩසටහන විශේෂයෙන්ම විදේශීය සංචාරකයින්ගේ ඉමහත් ආකර්ෂණයට ලක් වී

තිබුණ අතර, 2013 වර්ෂය අවසන් වන විට සංචාරක සත්කාරක නිවාස 151 ක් දක්වා ලියාපදිංචි කර තිබුණි. එහෙත් සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් 1968 සිට මේ දක්වා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට සහ එහි පූර්ප්‍රාන්තික ආයතනයට පවරා දුන් ඉඩම් වලින් අක්කර 2000 කට ආසන්න ප්‍රමාණයක් සංචාරක කර්මාන්තයට යෙදවීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණනයේ දී හෙළිදරව් වූ වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියට අයත් අක්කර 15 ක කොටසක් පෞද්ගලික ආයතනයක් අත්පත්කරගෙන තිබුණද එම ඉඩම් නැවත අත්පත් කර ගැනීම සඳහා අධිකාරිය ක්‍රියාකර නොතිබුණි.

- බෙන්තොට සංචාරක කලාපයේ හෝටල් දෙකකට සැපයූ ජලය සඳහා සාවද්‍ය ජල බිල්පත් ඉදිරිපත් කිරීම නිසා අධිකාරියට සිදුවී තිබූ අලාභය රු. 9,212,657 කි.

- බෙන්තොට පල්දොරු පද්ධතිය නඩත්තු කිරීම සඳහා අදාල කොන්ත්‍රාත්තරුට ගෙවන ලද සාවද්‍ය ගෙවීම රු. 6,608,749 කි.

- පළාත් සභා 04 ක් සඳහා රු. මිලියන 200 ක මුදලක් ලබා දී තිබුණද, ව්‍යාපෘති වල කාර්යසාධනය පිළිබඳ පරීක්ෂා කිරීමක් සිදු කර නොතිබුණි.

- බෙන්තොට සංචාරක නිකේතනයේ ආයතන 48 කින් අය විය යුතුව ඇති රු. 8,802,999 ක හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- කතරගම තානායමේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ දී කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ වැඩිපුර ගෙවීම රු. 2 ,428,613 කි.

- මොහොට්ටුවාරම ජැටිය ඉදිකිරීමට බුල්ඩෝසර් යන්ත්‍ර යොදාගත් බවට හා වාහන ලබා ගැනීමේ කුලීය වශයෙන් රු. 3,255,750 ක් ගෙවා තිබුණද, එම සේවය ලබාගත් බවට තහවුරු කළ හැකි සාක්ෂි නොතිබුණි.

- කල්පිටිය, තොරයිඩිය ජැටිය ඉදිකිරීමේ දී කළපුව අසල පාර දැමීම සඳහා කළුගල්, බොරළු සහ ඒ.බී.සී සැපයීමට මුදල් ගෙවීමේ දී කළුගල් සඳහා රු. 824,000 ක වැඩිපුර ගෙවීමක් ද, කළුගල් ඒ.බී.සී හා බොරළු සඳහා රු. 2,549,000 ක සාවද්‍ය ගෙවීමක් ද අනාවරණය විය.

- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වර්ග අඩි 4952 ක ප්‍රමාණයක් හඳුනානොගත් පුද්ගලයෙකුට සහ බාහිර ආයතන වලට අය කිරීමකින් තොරව උපයෝජනය කිරීමට දීම හේතුකොටගෙන අහිමි වී තිබූ මුදල රු. 16,379,700 ක් විය.

රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත්වීම

නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් දේශපාලන, ආරක්ෂක, ආර්ථික, වෙළඳ හා සංස්කෘතික ක්ෂේත්‍රයන්හි සබඳතා මිත්‍රශීලිව පවත්වා ගනිමින් ලෝක පාරිසරික හා දේශගුණික විපර්යාසයන් හා බැඳුණු ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් රටේ ගෞරවය හා අභිමානය සුරකෙන පරිදි ක්‍රියාකරමින් විදේශ රටවල ආකර්ශනය වර්ධනය කර ගැනීම විදේශ කටයුතු අමාත්‍යාංශය හා දූත මණ්ඩලයන්හි මූලික අරමුණ වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රධානතම ජාතික අභිලාෂයන් විදේශ රටවලදී ප්‍රවර්ධනය කිරිම සඳහා සහ සුරක්ෂා කිරිම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය ලොව පුරා රටවල් 50 ක පිහිටි දූත මණ්ඩල 65 ක ජාලයක් පිහිටුවා ඇත.

මෙම රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සක්‍රීයව සිදුකිරිම සඳහා 2013 වර්ෂයේ මැද භාගය වන විට දූත මණ්ඩලයන්හි ස්ථානීය නොවන තථ්‍ය සේවක සංඛ්‍යාව 463 ක් වූ අතර, පුරප්පාඩු 32 ක් විය. ස්ථානීය සේවක සංඛ්‍යාව 494 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 82 ක් විය.

දූත මණ්ඩලයන්හි ආදායම සහ වියදම්

* 2013 වර්ෂයේදී දූත මණ්ඩල මඟින් රුපියල් මිලියන 1,352 ක මුදලක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශ ගමන් බලපත්‍ර, නිකුත් කිරීම හා පොලිස් නිශ්කාෂණ කටයුතු වෙනුවෙන් එකතු කර තිබුණු අතර, වැඩිම ආදායම වන රුපියල් මිලියන 181ක් රැස්කොට තිබුණේ ඉතාලියේ රෝම තානාපති කාර්යාලය වන අතර, අඩුම ආදායම වන රුපියල් මිලියන 0.05 වාර්තා වන්නේ රමල්ලා දූත මණ්ඩලයෙනි. එමෙන්ම පැරිස් හා ලන්ඩන් දූත මණ්ඩල මඟින් රැස්කළ ආදායම රුපියල් මිලියන 100 ඉක්මවා පැවතුණි.

* සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශයේ ඇස්තමේන්තුගත තථ්‍ය පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

	2013 වර්ෂයේ ශුද්ධ වෙන් කිරිම	2013 වර්ෂයේ තථ්‍ය වියදම
	2013	2013
	රු. මිලියන	*රු. මිලියන*
පුනරාවර්තන	7,718	7,702
මූලධන	2,421	2,303

* අමාත්‍යාංශයේ වියදම් ව්‍යුහය අනුව වැඩිම ප්‍රතිශතයක් එනම් 78.6 ක් වැය කර තිබුණේ දූත මණ්ඩල සඳහා වන අතර, එකිනෙක දූත මණ්ඩල සැසඳීමේදී 2013 වර්ෂයේ වැඩිම වැය බරක් දරා තිබුණේ වොෂින්ටන් තානාපති කාර්යාලය සඳහා වන අතර, එය රුපියල් මිලියන 1,041 කි. අඩුම වැය බරක් දරා ඇත්තේ අළුතින් ආරම්භ කළ දූත මණ්ඩලයක් වන උගන්ඩා හැරුණු කොට රමල්ලා තානාපති කාර්යාලය සඳහාය. මෙය රුපියල් මිලියන 20 කි.

* 2013 මුළු වියදමින් දූත මණ්ඩලයන්හි මූලධන වියදම් සඳහා රුපියල් මිලියන 1,149 ක් හා පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 6,716 ක් වැය කර තිබුණි. පුනරාවර්තන වියදම්වලින් සියයට 50 ක් පමණ දරා තිබුණේ සේවක මණ්ඩල වෙනත් දීමනාවන්හි සඳහා වේ.

පුනරාවර්තන වියදම් වලින් රු.මිලියන 1,047ක් එනම්, සියයට 15.6 ක් ගොඩනැගිලි කුලී සඳහා වැයකර තිබුණි. මෙම තත්ත්වය මඟ හරවාගෙන රජයට ප්‍රතිලාභයක් ලැබෙන පරිදි අධිකාරීන් විසින් ගොඩනැගිලි ඉදිකිරීම හෝ අත්පත් කර ගැනීම සඳහා දිගුකාලීන සැලසුමක් පිළියෙල කර නොතිබුණි. අතීතයේ දී ගන්නා ලද සමහර තීරණ, විවිධ හේතූන් නිසා අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟාවීමට නොහැකි වූ බව නිරීක්ෂණය විය.

නොපියවූ අත්තිකාරම් ශේෂ

2013 දෙසැම්බර් 31 දිනට විදේශ දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් ශේෂය රු.333,055,195 ක් වූ අතර, මෙම ශේෂයන් පියවා ගැනීමට මේ දක්වා අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. පහත සඳහන් තානාපති කාර්යාලවල රු.මිලියන 15 ට වැඩි අත්තිකාරම් ශේෂ නොපියවා ඇති බැව් නිරීක්ෂණය වූ අතර, එය නොපියවූ මුළු අත්තිකාරම්වලින් සියයට 36.6 ක විය.

තානාපති කාර්යාලය	අත්තිකාරම් ශේෂය (රු.) මිලියන
ටෝකියෝ	15.60
නිව්යෝක්	20.08
වොෂින්ටන්	20.06
ලන්ඩන්	36.60
ටොරොන්ටෝ	29.80
එකතුව	**122.14**

අමාත්‍යාංශ අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල ශේෂයන් එදිනට නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂයන් හා විදේශ දූත මණ්ඩලවල මුදල් ශේෂයන්ද ඇතුලත්ව නොගැලපෙන තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර, විස්තර පහත දැක්වේ.

අග්‍රිම ගිණුම් අංකය	2013 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොත්වල දැක්වෙන අග්‍රිම ගිණුම් ශේෂ	නොපියවූ අත්තිකාරම්		
		අමාත්‍යාංශය	විදේශ දූත මණ්ඩල	එකතුව
	රු.	රු.	රු.	රු.
35/08	63,350,921	4,800,000	61,855,518	66,655,518
35/09	32,271,945		31,146,303	31,146,303
35/10	675,170,151	309,773	38,695,854	39,005,627
35/11	(463,557,480)		38,847,021	38,847,021
35/12	101,950,473		85,555,612	85,555,612
35/13	496,559,214	848,377	76,954,889	104,024,215
එකතුව	905,745,224	11,958,150	333,055,197	345,013,347
2013.12.31 දිනට නොපියවූ අත්තිකාරම් මුළු ශේෂය				345,013,347
2013.12.31 දිනට දූත මණ්ඩලවල වර්ෂ අවසාන මුදල් ශේෂය				382,965,393
අමාත්‍යාංශයේ තිබිය යුතු අග්‍රිම ශේෂය				727,978,740
විසර්ජන ගිණුමේ අමාත්‍යාංශ පොත් අනුව දක්වා ඇති 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල මුළු එකතුව				905,745,224
වෙනස				177,766,484

මේ අනුව අග්‍රිම ගිණුම හා තථ්‍ය අග්‍රිම ශේෂය අතර රු.177,766,484 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, භාණ්ඩාගාර අග්‍රිම ශේෂය ද රු.905,745,224 ක් වන බැවින් එම ගිණුම් අතර ද මෙම වෙනස නිරීක්ෂණය විය.

ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

පෘථිවි තලයෙන් සියයට 70 කට වඩා වැඩි ප්‍රමාණයක ජලය පැවතුනද, පානය කළ හැකි පිරිසිදු ජලය සියයට 1 ටත් අඩු ප්‍රමාණයක් පවතින බැවින් ජලය සම්පත් අතරින් ඉතාම වටිනා සීමිත සම්පතකි.නැවුම් පිරිසිදු ජලය සමස්ථ ජීවියාටම අත්‍යවශය වන අතර ඉදිරියේදී ජල ඉල්ලුමට සාපේක්ෂව පිරිසිදු ජල සැපයුම සීමා වී තිබෙන බැවින් සෞඛ්‍යාරක්ෂිත පිරිසිදු පානීය ජලය ලබාදීම ප්‍රධාන අභියෝගයක් බවට පත්ව ඇත.

නාගරික ජනගහනයේ සීග්‍ර වර්ධනය,කර්මාන්තකරණය හා දේශගුණික විපර්යාස, සහ ස්වාභාවික විපත් හේතු කොට ඇති වන වෙනස්කම් වලින් පිරිසිදු ජලය ආරක්ෂාකරගත යුතු වන අතර සමස්ථ සත්වයන්ගේ පැවැත්මට හා සනීපාරක්ෂාව සඳහා අවශ්‍ය වන ජලයට කිසිදු ආදේශකයක් නොමැති බැවින්ද එය ප්‍රමිතියකට පවත්වා ගැනීම රාජ්‍යයක හෝ සංවිධානයක වගකීම වනු ඇත.දේශීය වශයෙන් මෙම වගකීම ඉටු කිරීමට බැඳී සිටින ප්‍රධාන රාජ්‍ය ආයතන දෙක වන ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයත් ඒ යටතේ ක්‍රියාත්මක වන ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයත් විසින් පසුගිය වර්ෂ පහ තුල දරන ලද රාජ්‍ය වියදම් පහත දැක්වේ.

වර්ෂය	ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය රු. මිලියන	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රු. මිලියන	එකතුව රු.මිලියන
2009	287	22,930	23,217
2010	1,351	25,091	26,442
2011	439	26,783	27,222
2012	380	30,899	31,279
2013	640	25,436	26,076

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය

ජලමූලාශ්‍ර සහ පාරිසරික සමතුලිතතාවය සුරකිමින්, පවිත්‍ර වූ පානීය ජලයද, ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ද සැපයීම මෙහෙවර කර ගනිමින් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත. ජල සම්පාදනයට සම්බන්ධ දේශීය හා විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පානීය ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ පහසුකම් සැපයීම මඟින් සියළු පාර්ශවයන්ට පහසුකම් සැපයීම හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට නිසි මාර්ගෝපදේශකත්වය සැපයීමේ වගකීමට මෙම අමාත්‍යාංශය බැඳී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 1972 අංක 02 දරන පනතින් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති අතර එහි වගකීම වනුයේ ගෘහස්ථ පාරිභෝගියන්ට හා කාර්මික හා වානිජ අංශ වලට ප්‍රතිලාභ ලැබෙන පරිදි නල ජලය හා මළාපවහන පද්ධති සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම වේ. ජල පහසුකම් හා සනීපාරක්ෂක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දේශීය මෙන්ම විදේශීය අරමුදල් උපයෝජනයෙන් ව්‍යාපෘතීන් ගණනාවක් ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා විදේශ මුදල් උපයෝජනය පහත සටහනෙන් දැක්වේ.

ව්‍යාපෘතිය	2011			2012			2013		
	ප්‍රතිපාදනය	**උපයෝජනය**	**ප්‍රතිශතය**	**ප්‍රතිපාදනය**	**උපයෝජනය**	**ප්‍රතිශතය**	**ප්‍රතිපාදනය**	**උපයෝජනය**	**ප්‍රතිශතය**
	රු.මි	**රු.මි**	**රු.මි**	**රු.මි**	**රු.මි**	**රු.මි**	**රු.මි**	**රු.මි**	**රු.මි**
මහා පරිමාණ	26,632	26,511	99.55	30,265	27,469	90,76	29,218	24,399	83.51
සුළු හා මධ්‍යම	2,050	1,879	91.66	3,253	2,532	77.83	3,499	2,981	85.19
සුනාමි	1,156	947	81.92	1,598	1,644	102.87	902	706	78.27
ප්‍රජා ජල අංශය	--	--	--	210	95	45.23	1,145	405	35.37
එකතුව	**29,838**	**29,337**	**98.32**	**35,326**	**31,740**	**89.84**	**34,764**	**28,491**	**75.44**

දේශීය අරමුදල් හා විදේශීය ආධාර යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත දැක්වෙන දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

- ව්‍යාපෘතිවල මූලික සැලසුම හා අධ්‍යයනයන් අනුව එම ව්‍යාපෘතීන් නිම කිරීමේ අපේක්ෂිත කාලය තීරණය කර තිබුණද නියදි පරීක්ෂණයට භාජනය වූ ව්‍යාපෘති සියයට 90ක් අපේක්ෂිත කාලය තුල නිමකර නොතිබුණි. විවිධ හේතූන් ඊට බලපා තිබුණද අතිරේක වැඩ සහ මිල වැඩිවීම් හේතුවෙන් ව්‍යාපෘති පිරිවැය ඉහල යෑම ව්‍යාපෘති ප්‍රමාදවීමේ අතුරු ප්‍රතිඵල ලෙස නිරීක්ෂණය විය.

- නිශ්චිතව හඳුනාගත් ව්‍යාපෘති වෙනුවෙන් මහා භාණ්ඩාගාරය ලබාදෙන ප්‍රතිපාදන අදාල ව්‍යාපෘතිවලට නොයොදා අනුමැතියකින් තොරව වෙනත් ව්‍යාපෘතීන් සඳහා හා ජලසම්පාදන මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා යොදාගෙන තිබුණු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

- දේශීය අරමුදල් භාවිතයෙන් කුඩා පරිමාණයේ ව්‍යාපෘතීන් ගණනාවක් ආරම්භ කර දීර්ඝ කාලයක් ගතවී ඇතත් එම ව්‍යාපෘතීන් වැඩි ප්‍රමාණයක් නිම කර නොතිබු හෝ අතරමඟ නවතා දමා තිබුණු අතර මේ සඳහා අරමුදල් නියමිත පරිදි රජයෙන් නොලැබෙන බව හේතු වශයෙන් පෙන්වා තිබුණි.

- අපේක්ෂිත ජල ධාරිතාවයක් නොමැති වීම , ප්‍රජාවගේ සහභාගීත්වය අඩුවීම, ප්‍රජා සංවිධාන තුල දුර්වල මුල්‍යය පාලනය, සැලසුම් කිරීමේ දුර්වලතාවය හා සුපරීක්ෂණය දුර්වලවීම, ජල සම්පාදන මණ්ඩලයේ ජල මාර්ග වලින් ජලය ලබා ගැනීමට යොමුවීම හේතුවෙන් ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති 308 ක ප්‍රමාණයක් අතරමඟ නවතා තිබුණි.

මූල්‍ය ප්‍රතිඵලය

මණ්ඩලය විසින් ප්‍රකාශ කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂ කිහිපය තුල මණ්ඩලය අඛණ්ඩව අලාභ ලබා තිබූ නමුත් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල වාර්ෂිකව අඛණ්ඩව ලාභ ලබා තිබුණි.ඉකුත් වර්ෂ 6 තුල මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය පහත දැක්වේ.

වර්ෂය	ලාභය/(අලාභය)
	රු. මිලියන
2008	(2,914)
2009	(1,425)
2010	(5,955)
2011	684
2012	367
2013	1,003

මණ්ඩලයේ දළ ලාභයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළද ඉහළ පොදු කාර්යය පිරිවැය හේතුවෙන් 2008 සිට 2010 යන කාලපරිච්ඡේදය තුල අඛණ්ඩව ශුද්ධ අලාභයක් ලබන තත්ත්වයට පත්ව තිබුණි. 2012 වර්ෂය තුලදී ජල ගාස්තු සංශෝධනය හේතුවෙන් මණ්ඩලය මූල්‍ය තත්ත්වය යහපත් කර ගැනීමට සමත් වී තිබුණි. ඒ අනුව මණ්ඩලයේ ආදායම පසුගිය වසරට සාපේක්ෂව සියයට 19 ක වර්ධනයක් පෙන්නුම්කර තිබුණි. එහෙත් මෙහෙයුම් වියදම් වලින් සියයට 46 ක් පමණ සේවක පඩිනඩි සඳහා දරා තිබුණු අතර එය පසුගිය වසර හා සසඳන කල සියයට 13 කින් ද ජල නිෂ්පාදනය සඳහා ඍජුවම දායක වූ පිරිස සඳහා වන සේවක වියදම් වල සියයට 8 ක වර්ධනයක්ද පෙන්නුම් කෙරුණි.

අවුරුදු 2 ක් ඉක්ම වූ විසන්ධිකරන ලද සහ ජල කණු ණයගැති ශේෂය රු. මිලියන 840 ක් වන අතර අවුරුදු 3 ක් ඉක්මවූ මහ කොළඹ නගරසභාවේ සහ අනෙකුත් ණය ගැතියන්ගේ ශේෂය පිලිවෙලින් රු.මිලියන 28.5 ක් සහ රු.මිලියන 8.7 ක් විය.

2012 වර්ෂයේ ගිණුම්ගත ලාභය රු. මිලියන 367 ක් ලෙස පෙන්නුම් කරන අතර 2013 වසරේදී එය රු.මිලියන1,003 දක්වා එනම් සියයට 173 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි.

මණ්ඩලයේ මූල්‍ය තොරතුරු වලට අනුව නිෂ්පාදනය කර බෙදා හරින ජල ඒකකයක පිරිවැය හා ලාභ තත්වයන් පහත දැක්වේ.

	2013		2012		2011		2010		සාමාන්‍ය		ප්‍රතිශතය
	-------		--------		------		-------		----------		-----
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	
සාමාන්‍ය විකුණුම් මිල		44.72		38.93		33.71		33.28		37.66	
නිෂ්පාදන පිරිවැය											
සෘජු පිරිවැය	17.14		13.87		11.50		12.27		13.69		
ආදායම් නොලබන ජලයවෙනුවෙන් වු පිරිවැය	7.42	(24.56)	5.91	(19.78)	4.86	(16.36)	5.58	(17.85)	5.94	19.63	34.78
ඒකකයක මෙහෙයුම් ලාභය		20.16		19.15		17.35		15.43		18.02	15.10
අනෙකුත් පිරිවැය											
ක්ෂයවීම්		(5.23)		(4.58)		(5.94)		(10.83)	6.64		16.88
පරිපාලන වියදම්		(9.45)		(8.6)		(6.72)		(7.64)	8.10		20.59
මූල්‍ය වියදම්		(5.19)		(4.68)		(4.24)		(5.78)	4.97		12.63
මුළු වියදම		44.43		37.64		33.26		42.10	39.34		
ලාභය/ (අලාභය)		0.29		1.29		0.45		(8.82)	(1.68)		

- නිෂ්පාදන පිරිවැය හැරුණු විට සමස්ථ වියදමින් සියයට 17 ක් පමණ වත්කම් ක්ෂයවීම වෙනුවෙන් වැය වන අතර මෙමගින් මුල්‍ය ගලායාමක් සිදුනොවුවද දැනට පවත්නා වත්කම් වල දායකත්වය මගින් මෙහෙයුම් තත්ත්වය වැඩි කිරීමට උපකාරීවී ඇති අතර විශේෂයෙන්ම විදේශ ව්‍යාපෘති යටතේ ඉදිකෙරෙන වත්කම්වල ඉතා ඉහළ පිරිවැය මෙයට බලපා ඇත.

- පරිපාලන වියදම් වෙනුවෙන් සමස්ථ වියදමින් සියයට 21 ක් වැය කෙරෙන අතර ඉන් විශාල ප්‍රමාණයක් කාර්යමණ්ඩලයේ වැටුප් හා දීමනා වෙනුවෙන් වැයවෙන බව පෙනීයයි.ඉකුත් කාලය තුල කාර්යමණ්ඩල සේවක වැටුප් වැඩි කිරීමත් මෙයට බලපා තිබුණි.

- මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් ණය වෙනුවෙන් සමස්ථයක් ලෙස සෑම ජල ඒකකයකින්ම රු. 4.97 ක මුදලක් පොලී ලෙස ගෙවීමට සිදුවී ඇති අතර එය මුළු නිෂ්පාදන වියදමින් සියයට 12.63 ක් වේ.

ජල විකුණුම් ආදායම

2009 අයවැය යෝජනා අනුව ජල ඒකක 15 ට අඩුවෙන් පරිහරණය කෙරෙන පාරිභෝගිකයන් වෙනුවෙන් ලබා දිය යුතු වට්ටම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2012 දී මණ්ඩලයේ ආදායමින් දැරීමට සිදුවූ පිරිවැය රු. 118,614,518 ක් විය.

ආදයම් නොලබන ජල අනුපාතය

2013 වසර අවසාන වන විට ආදායම් නොලබන සමස්ථ ජලය සියයට 20.08 දක්වා අඩුකර ගැනීමට සැලසුම් කර තිබුණද එය සියයට 30.24 ක මට්ටමක පැවතුන අතර, කොළඹ නගරය තුල බෙදාහරින ආදායම් නොලබන ජල සැපයුම සියයට 47.71ක් ව පැවතුණි.

ආදායම් නොලබන ජලය අඩු කිරීමට ගෙන තිබුණු ක්‍රියාමාර්ග

පොදු ජල කරාම

ආදායම් නොලබන ජල අනුපාතය අඩු කිරීම සඳහා මණ්ඩලය විසින් විවිධ ව්‍යාපෘති හා උප ව්‍යාපෘති 6 ක් යටතේ රු.3,100,169,648 ක් වෙන්කර 2013 වසර වන විට ඉන් සියයට 50 ක් වියදම් දරා තිබුණු නමුත් ආදායම් නොලබන ජල අනුපාතය සැලකිය යුතු ලෙස පහත දැමීමට නොහැකි වී ඇති වී ඇති බව පසුගිය වසර 6 තුල ආදායම් නොලබන ජල අනුපාතයේ උච්චාවචනයන්ගෙන් තහවුරු වේ.

වර්ෂය	2013	2012	2011	2010	2009	2008
ආදායම් නොලබන ජල ප්‍රතිශතය	30.24	28.29	30.36	31.55	31.06	32.13

ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු

ග්‍රාමීය ප්‍රදේශයන්හි ජල හා සනීපාරක්ෂක අවශ්‍යතා හදුනා ගැනීම, ග්‍රාමීය ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය සහ ජල සම්පාදන මණ්ඩලය විසින් විවිධ ව්‍යාපෘති ආරම්භ කර තිබුණි එම ව්‍යාපෘති වලින් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක වන උතුර සහ නැගෙනහිර නැවත පදිංචි කරන්නවුන්ගේ ජලය, සනීපාරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ නියමු ව්‍යාපෘතිය, යාපනය කිලිනොච්චි දිස්ත්‍රික්කවල ප්‍රජා මූලික ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, මඩකලපුව මන්නාරම වවුනියාව ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය, බදුල්ල හා මොනරාගල ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියන් වල වැඩ හා කොන්ත්‍රාත් පිරිනැමීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

වියලි කලාපීය ජලයේ ගුණාත්මක බව

ලංකාවේ වියලි කලාපයේ වර්ෂය පුරා පවතින පොලොව මතුපිට ඇති ජල ප්‍රභවයන් හිග බැවින් , පානීය ජලය ලබා ගැනීම සඳහා වාරි ජලාශ තෝරාගෙන ඇතත්, ජල මූලාශ්‍ර අපවිත්‍රවීම ආරක්ෂිත පානීය ජල සැපයුමට තර්ජනයකි. ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ නිදන්ගත වකුගඩු රෝගය වසංගත මට්ටමක් දක්වා වර්ධනය වී ඇති අතර මණ්ඩලයේ නල ජල යෝජනාක්‍රම මඟින් බෙදා හරින පවිත්‍රිකරණය කරන ලද ජලය මඟින් මෙම රෝගය පාලනය කළ හැකි බව හදුනාගෙන ඇත.ඒ අනුව උතුරු, උතුරු මැද පළාත් ආවරණය කරමින් සමස්ථයටම නල ජල පහසුකම් ලබා දීමට නොහැකි බැවින් ජල සැපයුම නොමැති ගම්මාන වලට, වැසි ජලය රැස්කිරීම සඳහා වැසි ජල ටැංකි ඉදි කිරීම, බවුසර් මඟින් පිරිසිදු පානීය ජලය සැපයීම, ප්‍රජාමුල සංවිධාන මඟින් ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර ලබාදීම වැනි කෙටිකාලීන ක්‍රියා මාර්ග මණ්ඩලය විසින් ගෙන තිබුණි.

මළ අපවහන පද්ධති

විදේශාධාර ලබන මළ අපවහන ව්‍යාපෘති 7 ක් 2014 වර්ෂය වන විට ආරම්භ කර තිබුණු අතර ඒ අතරින් රු.මිලියන 36,018 පිරිවැය ඇස්තමේන්තු කර ඇති මහකොළඹ අපජල කලමණාකරණ ව්‍යාපෘතිය, මොරටුව - රත්මලාන - ඒකල - ජාඇල අපජල ව්‍යාපෘතිය, මහනුවර අපජල කළමණාකරන ව්‍යාපෘතිය හා නිවාස ගංගා ආශිත මළ අපවහන සම්බන්ධතා වර්ධනය කිරිම හා කොළඹ සනිපාරක්ෂක කටයුතු සඳහා විසඳුම් ක්‍රියාවලිය සඳහා වූ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල, කොන්ත්‍රාත් පිරිනැමීම හා වැඩ ප්‍රමාදයක් හේතුවෙන් ලැබී තිබුණු ණය හා ආධාර ඉතිරි වී තිබුණු අතර මණ්ඩලය විසින් මළ අපවහන පද්ධති මඟින් සේවා සැපයීම සම්බන්ධව ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොතිබුණි.

විශේෂයෙන්ම රු.මිලියන 16,300 කට ඇස්තමේන්තු කර ඇති මොරටුව, රත්මලාන, ජාඇල ඒකල අපජල ව්‍යාපෘතියේ වැඩ සමස්ථයක් ලෙස ප්‍රමාද වී තිබුණු අතර කොන්ත්‍රාත්කරු බංකොලොත්වී කොන්ත්‍රාත්තුව අතරමඟ නවතා දැමීම නිසා ව්‍යාපෘතියේ වැඩ තවදුරටත් ප්‍රමාදවී තිබුණි.

වරාය සේවා

1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරී පනතින් ශ්‍රී ලංකාව තුළ වරාය සේවා කටයුතු පවත්වා ගෙන යාම හා ඊට අදාල කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවා තිබෙන අතර, කොළඹ වරාය, දකුණු කොළඹ නව වරාය, ගාල්ල වරාය, හම්බන්තොට වරාය හා ත්‍රිකුණාමළ වරාය යන ප්‍රධාන වරායවල් පහ සහ කන්කසන්තුරෙයි හා ඔලුවිල් යන වරායවල් දෙක වරාය අධිකාරිය යටතේ පිහිටුවා ඇත. කන්කසන්තුරෙයි වරායේ මෙහෙයුම් කටයුතු නාවික හමුදාව මඟින් කරනු ලබන අතර, ඔලුවිල් වරායේ මෙහෙයුම් කටයුතු කිසිවක් ආරම්භයේ සිට කර නොතිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වසර 04 තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිපල පහත දැක්වේ.

වර්ෂය	2013	2012	2011	2010	2009
මුළු ශුද්ධ ආදායම (රු. මිලියන)	36,343	38,098	31,086	28,279	23,831
මුළු වියදම (රු. මිලියන)	33,916	32,886	30,829	29,530	21,970
බදු පසු ලාභය (අලාභය) (රු. මිලියන)	2,427	4,078	(18)	(1,065)	2,114

සමාලෝචිත 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලදී නිරීක්ෂණය වූ කැපීපෙනෙන වෙනස්වීම්,

- 2013 වර්ෂයේ දී මුළු ශුද්ධ ආදායම රු. මිලියන 36,343 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු ශුද්ධ ආදායම රු. මිලියන 1,755 කින් අඩු වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ආදායමෙන් සියයට 4.6ක අඩුවීමක් වේ.

- සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු. මිලියන 33,916 ක් වූ අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 1,030 කින් වර්ධනය වී තිබුණි. එය සියයට 3.13 කින් වැඩි වී තිබුණි.

- 2013 වර්ෂයේ බදු පසු ලාභය රු. මිලියන 2,427ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම ලාභය සමඟ සැසඳීමේ දී රු.මිලියන1,651කින් පහත වැටී තිබුණි. එය ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය සමඟ සැසඳීමේ දී සියයට 40.5ක ආසන්න බදු පසු ලාභයේ පහත වැටීමකි.

වර්ෂයේ කාර්යසාධන වාර්තා

ඉකුත් වර්ෂ පහ තුළ ශ්‍රී ලංකාවේ සියළු වරායන් වෙත පැමිණි නැව් සහ සියළු වරායන් වලින් මෙහෙයවන ලද බහළුම් ඒකක සහ සාම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණයන් පිළිබඳ විස්තර පහත දැක්වේ .

වර්ෂය	2013	2012	2011	2010	2009
නැව් පැමිණීම	4,799	4,931	5,153	4,657	5,162
මෙහෙවන ලද අඩි 20 ට සමාන බහළුම් ඒකක (ඒකක 000)	2,502	2,317	2,299	2,167	1,714
මෙහෙයවන ලද සාම්ප්‍රදායික නැව් බඩු ප්‍රමාණය (මෙ.ටො. 000)	5,664	6,505	6,265	5,463	4,984

- 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට පැමිණි මුළු නැව් ප්‍රමාණය 4,799 වූ අතර,එය ඉකුත් වර්ෂය සමඟ සසඳන කල නැව් පැමිණීමේ සංඛ්‍යාව සියයට 2.67 ක අඩුවීමකි.

- 2013 වර්ෂයේ දී මෙහෙයවන ලද අඩි 20 බහළුම් ඒකක ගණන දහස් වලින් 2,502 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 8ක වර්ධනයකි. කෙසේ වුවද, සම්ප්‍රදායික නැව් බඩු මෙහෙයවීම 2013 වර්ෂයේ දී මෙ.ටො. දහස් වලින් 5,664 වූ අතර, එය ඉකුත් වර්ෂ මෙහෙයුම් වලට සාපේක්ෂව සියයට 12.97 ක අඩුවීමකි.

ප්‍රධාන වරායවල් වල මෙහෙයුම් ප්‍රතිඵල

අධිකාරිය විසින් සපයන ලද තොරතුරුවලට අනුව ප්‍රධාන වරායන් තුන වන කොළඹ, ත්‍රිකුණාමළය සහ ගාල්ල වරායන්හි සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 02 හි ලාභ/අලාභ පහත වගුවෙන් දැක්වේ.

වර්ෂය	2013	2012	2011
	රු. මිලියන	*රු. මිලියන*	*රු. මිලියන*
කොළඹ මෙහෙයුම් ලාභය	2,755	5,499	705.2
ත්‍රිකුණාමලය මෙහෙයුම් අලාභය	(232)	(240)	(309.17)
ගාල්ල මෙහෙයුම් අලාභය	(96)	(47.84)	(139.17)

- ගාලු වරාය වසර 06ක් තුල අඛණ්ඩව අලාභ ලබා ඇති අතර, සමුච්චිත අලාභය රු. මිලියන 1,314 වේ.

- එසේම, ත්‍රිකුණාමල වරාය වසර 06ක් තුළ අඛණ්ඩව අලාභ ලබමින් පැවතුණු අතර, සමුච්චිත අලාභය රු.මිලියන1,862 කි.

වැදගත් විගණන නිරීක්ෂණ

දකුණු කොළඹ වරාය

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් ලෙස දකුණු කොළඹ වරාය දිය කඩනය, නාවික පිවිසුම් මාර්ගය සහ වරාය තටාංගනය ගැඹුරු කිරීම සිදුකල අතර, ඒ සඳහා දරා තිබූ මුළු වියදම රු. මිලියන 42,055 විය. (දේශීය අරමුදල් රු. මිලියන 9,876, විදේශීය අරමුදල් රු. මිලියන 32,179) එනමුත් රු.42,055 ක ප්‍රාග්ධනයක් සහිතව සිදුකල අදාල වරාය මෙහෙයුම් කටයුතු වරාය අධිකාරිය විසින් වසර 35 කින් ඉදිකර ආපසු භාරදීමේ පදනමට කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්තය නැමැති සමාගමට භාර දී තිබුණි.

ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ කොළඹ ජාත්‍යන්තර බහළුම් පර්යන්ත සමාගම අතර ඇති කර ගත් ගිවිසුම අනුව මුල් වසර 05 තුල එක් බහළුවක් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඩොලර් 3.9 ක පුරස්කාර කුලියක් පමණක් ලැබේ. මෙම පුරස්කාර කුළි ආදායම කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා යෙදූ ප්‍රාග්ධනයට අවම ප්‍රතිලාභයක්වත් නොලබන බව නිරීක්ෂණය වේ.

හම්බන්තොට වරාය

2008 පෙබරවාරි 15 වන දින හම්බන්තොට වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ පළමු අදියර ඉදිකිරීම් කටයුතු ආරම්භ වූ අතර, වරාය ඉදිකිරීම් කටයුතු 2013 වර්ෂය අවසාන වන විට දරන ලද මුළු වියදම රු. මිලියන 105,109 ක් වූ අතර, 2011 දෙසැම්බර් 31 දින වන විට හම්බන්තොට වරායේ පළමු අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් වී තිබුණි. කෙසේ වුවද, වරායේ ග්‍රැන්ට් දොඹකර සවිකර නොතිබීම නිසා බහළුම් මෙහෙයවීම කල නොහැකි වී තිබීමෙන් හම්බන්තොට වරායට පැමිණෙන නැව් ප්‍රමාණය මෝටර් රථ ප්‍රවාහනය කරන නාවික යාත්‍රා වලට පමණක් සීමා වී තිබුණි. කෙසේ වුවද ඇ.ඩොලර් මිලියන 808 ක විදේශ ණය මුදලක් යොදා ගනිමින් හම්බන්තොට දෙවන අදියර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ නාවික මෙහෙයුම් උපකරණ සවිකිරීම හා මෙහෙයුම් පර්යන්තය ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය 2015 අප්රේල් 14 වන දින අවසන් කිරීමට නියමිත වූ අතර, ව්‍යාපෘතියට අවශ්‍ය අරමුදල් චීනයේ EXIM බැංකුවෙන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. පළමු අදියරේ ඉදිකිරීම් සඳහා ලබාගත් ණය සඳහා ගෙවිය යුතු පොලී සහ වාරික පහත දැක්වේ.

වර්ෂය	පොලිය	ණය වාරික
	රු. මිලියන	*රු. මිලියන*
2012	2,208	-
2013	2,479	-

2014	2,233	1,826
2015	1,987	1,827
2016	1,742	1,827

කෙසේ වුවද, වරාය ඉදිකිරීමට ලබාගත් ණය සඳහා පොළිය හා ණය වාරික ගෙවීමට ප්‍රමාණවත් ඉපැයීමක් ලැබී නොතිබුණ අතර, 2011 සහ 2012 වර්ෂ තුළ හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු වලින් දරා තිබූ අලාභය පිළිවෙලින් රු. මිලියන 11.9 හා රු. මිලියන 25.5 ක් විය.

ඕලුවිල් වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ඩෙන්මාර්ක් රජයේ DANIDA ඒජන්සියෙන් ණය මුදලක් ලබාගෙන ඕලුවිල් වරාය ඉදිකිරීම 2013 සැප්තැම්බර් 01 දින අවසන් කර තිබූ අතර, යුරෝ මිලියන 38.96 (ශ්‍රී ලංකා මුදලින් රු. මිලියන 6,780) ක් ඒ සඳහා වැය කර තිබුණි. ඊට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය රු. මිලියන 444 ක් දරා තිබුණි. ඒ අනුව, ඕලුවිල් නාවික සහ ධීවර වරායවල් වෙන වෙනම ඉදිකර තිබුණ ද වරායේ මෙහෙයුම් කටයුතු සිදුකිරීමක් හෝ වරාය සඳහා නැව් පැමිණීමක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සිදු වී නොතිබුණි. එසේම ඕලුවිල් වරාය ඉතා අඩු ගැඹුරක් හෙවත් මීටර් 8ක් පමණක් ගැඹුරු වරායක් වන බැවින් පැමිණිය හැක්කේ ද ඉතාම කුඩා නාවික යාත්‍රා බව තහවුරු විය. කෙසේ වුවද, ඕලුවිල් වරාය සඳහා ඉදිකිරීමට ලබා ගත් විදේශ ණය ඉදිරි වසර 10ක් තුළ ආපසු ගෙවිය යුතු බැවින් හා එකී වරායෙන් අඩු ආදායමක් සහ වරාය මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදුවීමත් සලකන විට ලබාගත් විදේශ ණය සඳහා වාරික ආපසු ගෙවීමේ දී වරාය අධිකාරියට මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණදීමට සිදුනොවේය යන්න බැහැර කළ නොහැකි විය.

VI කොටස

තෝරාගත් විෂයය සම්බන්ධ විගණකාධිපති අදහස් දැක්වීම

වී මිලදී ගැනීම හා ගබඩා කරණය

වී තොග මිලදී ගැනීම, ගබඩා කිරීම හා නිකුත් කිරීම සම්බන්ධව 2012/2013 කාල සීමාව තුළ පහත සඳහන් පරිදි රු.මිලියන 578.4 ක අලාභයක් නිරීක්ෂණය විය.

	රු. මිලියන
හානි වූ තොග	17.4
තොග ඌනතාවය	506.1
මිල තීරණ තොරතුරු ව්‍යාජ වීම මත	54.8
එකතුව	**578.4**

වී තොග මිලදී ගැනීම, ගබඩා කිරීම හා නිකුත් කිරීම යනාදී ක්‍රියාවලීන් සම්බන්ධයෙන් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයන් නොමැතිවීම හා දුර්වල කළමනාකරණ තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර, ඉහත නියැදි පරීක්ෂාවට ලක්කළ කලාපයන්හි ගබඩාවල හානි වූ තොග වටිනාකම්, (රු.මිලියන 17.4) තොග වටිනාකමට නොගැලපීම නිසා හා විශේෂයෙන්ම නිසි තොග පාලන ක්‍රම පවත්වා ගෙන යාමේ දුෂ්කරතාවයන් පැවති උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල වී තොග ප්‍රමාණයන් පිළිබඳ අවනිශ්චිතතාවය මත හා නියමිත පරිදි තොග සත්‍යාපනය නොකිරීම නිසා වී අලෙවි මණ්ඩලයේ ගබඩාවල වාර්තා වී ඇති තොග අගය වූ රු.මිලියන 5,638.9 සම්බන්ධ නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. මණ්ඩලය විසින් 2013 ඔක්තෝබර් 31 දිනට පියවිය යුතු මුළු මුදල රු. මිලියන 10,883.5 ක් වූ අතර එදිනට ගෙවිය යුතු මුළු ණය පොලී මුදල රු.මිලියන 791.1 ක් විය.

මිලට ගැනීම හා ගඩබා කිරීම සම්බන්ධව නිරීක්ෂණය වූ අභ්‍යන්තර පාලන දුර්වලතා

- ගබඩා පාලන අත්පොතක් නොතිබීම.
- සමහර අවස්ථාවල ගබඩා කීපයක පාලනය එක් ගබඩා භාරකරුවෙකු වෙත පැවරීම හා රාජකාරි කටයුතු ලිඛිතව පවරා නොතිබීම.
- ගබඩා භාරකරුවන් එක් ගබඩාවකින් තවත් ගබඩාවකට මාරු කිරීමේදි නිසි පරිදි භාරදීමේ හා භාර ගැනීමේ ක්‍රම වේදයක් නොතිබීම.
- මාරු පත්‍රයක් නොමැතිව ගබඩාවකින් තවත් ගබඩාවකට තොග මාරු කර තිබීම.
- වී මිලදී ගැනීමේදි බොල් වී ප්‍රමාණය දැන ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම.
- වී ගබඩා කිරිම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සිදු නොවීම.

- තොග ලේඛන නිසි පරිදි පවත්වා ගෙන නොතිබීම.
- නිසි කිරුම් මිණුම් උපකරණ නොමැතිවීම.
- එක් ගොවියෙකුගෙන් මිලදී ගැනීම සඳහා නියම කර ඇති වී ප්‍රමාණය ඉක්මවා මිලදී ගෙන තිබීම.
- වී වල තිබිය යුතු උපරිම තෙතමනය ඉක්මවා තිබුණු වී තොග මිලට ගැනීම.

අවසාන වශයෙන් වී තොග මිළට ගැනීමට අදාල විස්තර පත්‍රිකාවේ ලැබුණු වී ප්‍රමාණය සටහන් කිරිම හා සහතික කිරිම, ලැබිම් නිවේදනය සකස් කිරිම හා සහතික කිරිම, ගෙවිම් නිවේදන සකස් කිරිම හා සහතික කිරිම, තොග පොත පවත්වා ගෙන යාම, ප්‍රමිතිය පරික්ෂා කිරිම, බර කිරිම යන සියළුම කාර්යයන් ගබඩා භාරකරු විසින් තනිවම සිදුකරනු ලබන බැවින් අභ්‍යන්තර පරික්ෂාවක් සිදුනොවීම හේතුවෙන් විවිධ අක්‍රමිකතා සිදු කිරීමට අවස්ථාවක් සැළසී තිබුණි.

වී තොග නිකුත් කිරීම හා අලෙවිය සම්බන්ධව නිරික්ෂණය වු අභ්‍යන්තර පාලන දූර්වලතා

- ප්‍රධාන කාර්යාලයේ වි තොග නිකුත් කිරීමේ නියෝගය නොමැතිව වී තොග නිකුත් කර තිබීම
- ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කිරිම සඳහා උපදෙස් දි තිබූ ගබඩාව හැර වෙනත් ගබඩාවන්ගෙන් වී තොග නිකුත් කර තිබීම හා එම තත්ත්වය ප්‍රධාන කාර්යාලයට දන්වා නොතිබීම

වී සඳහා මිල නියම කිරීම සම්බන්ධව පවතින දූර්වලතා

- 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 4(1) වගන්තිය අනුව, වී හා සහල් මිලදී ගැනීම, විකිණීම, සැපයීම හා බෙදාහැරීම සම්බන්ධව සියළු බලතල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශකත්වයෙන් පසුව ඇමතිවරයා විසින් මේ සම්බන්ධව සියළු විධිවිධාන හා බලාත්මක දිනයන් ඇතුළත් නියමයන් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධ කළ යුතුය. කෙසේ නමුත්, මෙම ක්‍රියාවලිය සම්බන්ධ විධිවිධාන ගැසට් පත්‍රයක් මඟින් ප්‍රසිද්ධ කිරීමට වී අලෙවි මණ්ඩලය නැවත මෙහෙයුම් කටයුතු ආරම්භ කළ 2008 වර්ෂයේ සිට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

- ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කිරීම වෙනුවට කමිටුවක් මගින් මිල තිරණය කිරිමට කටයුතු කර තිබූ අතර, මිල තිරණය කිරිමේදි කමිටුව සළකා බැලිය යුතු කරුණු හා ලබාගත යුතු තොරතුරු ලබා ගැනීමෙන් තොරව මිල ගණන් තිරණය කර තිබුණි. මෙම තත්ත්වය මත සිදුවි ඇති අලාභය දල වශයෙන් රු.මිලියන 54.86 ක් බව නිරික්ෂණය විය.

වනජීවී සම්පත් සංරක්ෂණය

වනජීවී සම්පත් සංරක්ෂණය යනු, අනාගත පරම්පරා වල අවශ්‍යතා හා අභිමතාර්ථ සපුරා ගැනීමට බාධා නොවන පරිදි සහ වත්මන් පරම්පරාවට අඛණ්ඩව උපරිම වාසි සැලසෙන පරිදි ජෛව ගෝලය ප්‍රයෝජනයට ගැනීම කළමනාකරණය කිරීමයි.

ජෛව ගෝලය ප්‍රයෝජනයට ගැනීම කලමනාකරණය කිරීමේ දී වන ජීවි සම්පත් එනම් වන සතුන් සහ වෘක්ෂලතා සංරක්ෂණය කිරීම ඉතා වැදගත් කාර්යයක් ලෙස සලකනු ලබයි. උදාහරණයක් ලෙස 20 වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකා භූමියෙන් සියයට 70ක් වූ වනගහනය සියවස අවසන් වන විට සියයට 22 ක් දක්වා අඩුවීම මෙහි සම්පත් කළමනාකරණයෙහි වැදගත්කම මනාව පෙන්නුම් කරන සාධකයක් වේ. වනජීවී සම්පත් සංරක්ෂණය කිරීමේ වගකීම වනජීවී සම්පත් අමාත්‍යාංශයට හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වේ.

ජෛව විවිධත්වය සංරක්ෂණය උදෙසා 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකාව අන්තර්ජාතික ජෛව විවිධත්ව සම්මුතියට අත්සන් තබා ඇති අතර, පරිසර සංරක්ෂණ නීති බලගැන්වීම සඳහා ජාතික පරිසර පනත, වන සංරක්ෂණ ආඥා පනත, වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත, වෙරළ සංරක්ෂණ පනත, ධීවර හා ජලජ සම්පත් පනත, ජාතික වනභූමි උරුම පනත, ශාබ ආරක්ෂක ආඥා පනත හා රේගු ආඥා පනත ආදී අණපනත් 1907 සිට 2009 දක්වා කාල පරිච්ඡේදය තුල හඳුන්වා දී ඇත.

මෙයින් වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා සෘජුව දායක වන, වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනත 1937 (Fauna Flora Protection Ordinance) (1964,1970,1993, හා 2009 වර්ෂවලදී සංශෝධනය වී ඇත) ශ්‍රී ලංකාවේ වන සතුන් හා වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමි ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම, එම වන සතුන් සහ වෘක්ෂලතා සහ ඒවායේ වාසභූමි වාණිජ ලෙස සහ වෙනත් ආකාරයට අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම වැලැක්වීම, ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම, 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ අරමුණු වේ.

වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනතේ II කොටස මගින් ජාතික ආරක්ෂක භූමි වලින් සහ අභයභූමි වලින් පිටත ප්‍රදේශ තුළ අලි ඇතුන් සහ මී හරක් ආරක්ෂා කිරීමේ විධිවිධාන සලසා ඇති අතර, ඒ අතරින් කැලයෙන් අල්ලාගත් අලි ඇතුන් විධිමත් බලපත්‍රයක් රහිතව ළඟ තබා ගැනීම බරපතළ වරදක් ලෙස දක්වා ඇත.

විගණනය විසින් ඉතා සංවේදී පාරිසරික ප්‍රශ්ණයක් වූ අලි මිනිස් ගැටුම අඩු කරලීම පිණිස අලිවැට ඉදිකිරීම් පිළිබඳ මෙන්ම අලි පැටවුන් කැලයෙන් අල්ලා ගෙනවිත් නීති විරෝධීව ළඟ තබා ගැනීම පිළිබඳව ද විගණන වාර්තා නිකුත් කරන ලදි.

වනජීවී සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව එම දෙපාර්තමේන්තුවට 2014 සැප්තැම්බර් අවසානය දක්වා අලි ඇතුන් 359ක් සඳහා බලපත්‍ර නිකුත් කර තිබුණි. මෙයින් විහාරස්ථානවල, සත්ව උද්‍යාන වල සහ ගෘහස්තව සිටින අලි ඇතුන් පිළිබඳ වෙනමම ලේඛණ දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි. ගෘහස්ථව සිටින බවට කරුණු දක්වා ලියාපදිංචි කර තිබුණු අලි ඇතුන් 14 දෙනෙකු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ලිපිගොනු විගණනය විසින් පරීක්ෂා කළ අතර, අනාවරණය වූ ප්‍රධාන අක්‍රමිකතා පහත පරිදි වේ.

- ගෘහස්ථව සිටින ඇතින්නක් ගැබ් ගැනීම පිළිබඳව 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධිත) පනතේ 10 හා 22 (9) වගන්තිය අනුව වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කර නොතිබීම.
- අලි පැටවුන්ගේ උපත ලේඛන ගතකර නොතිබීම සහ පනතට අනුව මිය ගිය අලි ඇතුන් පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කර නොතිබීම.
- අලි පැටවුන්ගේ උපත සනාථ කර, ග්‍රාම නිලධාරී සහතික ව්‍යාජ ලෙස සකස් කර තිබීම.
- ව්‍යාජ දිවුරුම් ප්‍රකාශ හා අයිතිය දැක්වෙන ලේඛන ඉදිරිපත් කර තිබීම.
- දෙපාර්තමේන්තු නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබීම හා ඇතැම් වාර්තා වංචනිකව ඉදිරිපත් කර තිබීම.
- විධිමත් පරිදි හා පිළිගත හැකි ආකාරයට ඩී.එන්.ඒ. වාර්තාව ඉදිරිපත් කර නොතිබීම.
- කලින් ලියාපදිංචි කර තිබුණු අලි ඇතුන්ගේ ලිපිගොනු වංචනික ලෙස වෙනස් කර අලි පැටවුන් ලියාපදිංචි කර තිබීම.
- අලි ඇතුන්ගේ උපතේදී ප්‍රතිකාර කළ පශු වෛද්‍යවරුන්ගේ විස්තර හා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නොතිබීම.

ඉහත කරුණු අනුව නිරීක්ෂණය වූයේ පරීක්ෂා කල සියළු ලිපිගොනු වලට අදාල අලි ඇතුන් නීති විරෝධී ලෙස කැලයෙන් අල්ලා ළඟ තබාගෙන පසුව ලියාපදිංචි කර බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර ඇති බවයි. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුව ද (රිට් 625/09 නඩුව) ආඥා පනතට අනුව ද ලියාපදිංචි නොකළ අලි ඇතුන් සන්තකව තබාගෙන ඇති පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු අතර, හීලෑ අලි ඇතුන් සම්බන්ධව කටයුතු කිරීමට මාර්ගෝපදේශයන් ද සැකසිය යුතුය. එසේ වුවත්, අලි ඇතුන් ලියාපදිංචි කිරීමට අදාළව දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර තිබුණු අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය, විශේෂයෙන් ලේඛනවල ආරක්ෂාව සම්බන්ධව ගෙන තිබුණු ක්‍රියාමාර්ග ඉතා දුර්වල තත්ත්වයක විය. මෙම හේතුව නිසා අලි ඇතුන් ලියාපදිංචිය සටහන් කිරීමට පවත්වාගෙන ගිය ලේඛන 06ක් අතරින් එක් ලේඛනයක් අස්ථානගත වී තිබුණි.

අලි ඇතුන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයෙහි දක්නට ලැබුණු දුර්වලතාවයන් පහත පරිදි විය.

- ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් නිකුත් කිරීමේදී අදාල ගාස්තු ගෙවීමෙන් පසු අයදුම්පත් නිකුත් කිරීමට ක්‍රමවේදයක් යොදා නොතිබුණි.

- ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත් කළ යුතු අලි ඇතුන්ගේ ඡායාරූපයේ අලියා හඳුනාගැනීම සඳහා ඡායාරූපයේ අන්තර්ගත විය යුතු අංග නිශ්චිතව සඳහන් කර නොතිබීම. (උදා - අලියාගේ කන, වලිගය, හොඬය, පැහැදිලිව හඳුනාගත හැකි පරිදි ආදිය)
- නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයේ හා වාර්ෂික බලපත්‍රයෙහි අලවා ඇති ඡායාරූපය ගලවා වෙනත් ඡායාරූපයක් ඇලවිය නොහැකි පරිදි ඡායාරූපය සීල් තැබීම හෝ වෙනත් ආරක්ෂිත ක්‍රමයක් අනුගමනය නොකිරීම.
- ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම සඳහා සැලකියයුතු කාලයක් ගතවන විට ලියාපදිංචි සහතිකය හා වාර්ෂික බලපත්‍රය නිකුත් කරන දිනය වන විට අදාල අලි ඇතුන්ගේ සත්‍ය වයස, උස, ඉදිරි පාදයේ වට ප්‍රමාණය අදාල සහතිකවල ඇතුළත් නොකර අයදුම්පතේ සඳහන් තොරතුරු ඇතුලත් කිරීම.
- අලි ඇතුන් සඳහා භාවිතා කරන නම් ලියාපදිංචි සහතිකයේ හා වාර්ෂික බලපත්‍රයේ ඇතුලත් නොකිරීම.
- වාර්ෂික බලපත්‍රය වසරක් පාසා බලපත්‍ර ගාස්තු ගෙවා දීර්ඝ කළ යුතුය. මෙහිදී පහත දුර්වලතාවයන් නිරීක්ෂණය විය.
  - වාර්ෂික බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ දී ඒ සඳහා ඉල්ලුම් කරන දිනයට අලි ඇත්නුගේ උස, වයස, ඉදිරි පාදයේ වට ප්‍රමාණය වෙනත් කැපී පෙනෙන ලක්ෂණ ආදිය තොරතුරු සමඟ අයදුම්පත්රයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, මේ සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දී නොතිබුණි.
  - වාර්ෂින බලපත්‍ර ගාස්තු ලබා ගැනීමේදී මුදල් ලබා ගැනීමේ කුවිතාන්සියේ හෝ මුදල් ගෙවීමේ වවුචරය අලි ඇතුන්ගේ ලියාපදිංචි අංකය හෝ කුමන අලියා වෙනුවෙන් මුදල් ගෙවන්නේ ද යන්න හඳුනාගත හැකි පරිදි විස්තර ඇතුළත් නොකිරීම.
  - වාර්ෂික බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේදී ඉදිරිපත් කළ යුතු ලියවිලි නිශ්චිතව සඳහන් කර නොතිබීම.
- DNA වාර්තා ලබා ගැනීම

  අලි ඇතුන් ලියාපදිංචි කිරීමේ දී හෝ වාර්ෂික බලපත්‍ර දීර්ඝ කිරීමේ දී DNA වාර්තා ලබාගැනීමේ නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී හෝ අනුගමනය කර නොතිබුණි.
  - DNA පරීක්ෂාව සඳහා ලේ සාම්පල් ලබා ගන්නා ආකාරය
  - වාර්තාවේ අන්තර්ගත විය යුතු කරුණු
  - වාර්තාවේ අලි ඇතුන්ගේ ඡායාරූප ඇතුළත් කිරීම හා ඡායාරූපයේ ස්වරූපය
  - වාර්තාවේ අන්තර්ගත විය යුතු අලියන් හෝ ඇතා පිළිබඳ තොරතුරු (උස, වයස, ඉදිරි පාදයේ වට ප්‍රමාණය ආදිය)

- බලපත්‍ර දීර්ඝ කිරීමේදී දීර්ඝ කළ බවට ලියවිල්ලක් හෝ සහතිකයක් නිකුත් කරන්නේ ද යන්න හෝ නිකුත් කර ඇති වාර්ෂික බලපත්‍රයේම සඳහන් කරන්නේ නම් දීර්ඝ කළ බව සඳහන් කරන ස්ථානය ආදිය පිළිබඳ නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.